

දැස්
Deas
Gayana s. Lakmali
ගයා
ගයනා එස්. ලක්මාලි

# 01

Madhuprabha

'' චූටි පුතේ... චූටි පුතේ... ''

ගජරාමෙට නින්දක් දාගෙන ඉද්දි කවුදෝ මන්දා මාව එහාටයි මෙහාටයි හොල්ලන්න ගත්තා. ඇත්තටම මොකාද මේ වසලයා...

'' චූටි පුතේ... ''

ඕං ආයෙත් පාරක්... මං ඇස් දෙකෙන් එක ඇහැක් විතරක් ඇරලා බැලුවා. ම්හ්... කට්ට කළුවරයි.

'' කොලුවො... නැගිටපං... ආං අර ඉසකුඩිච්චිය ඇවිත්...''

දෙයියනේ... මට ඒ පාර තමයි වැඩේ මීටර් උනේ. මේ අපේ ආච්චිනෙ. එයා ඇරුනම මට චූටි පුතේ කියලා කතා කරන්න වෙන කෙනෙක් නැහැ.

Chamodi Madhuprabha

ඒත් ආච්චි මොකද මේ ලයිට් එකවත් නොදා කාමරේට රිංගුවෙ. අනේ අම්මපා කොල්ලෙක් නිදන් ඉන්න කාමරේට මෙහෙමත් එනවද ගෑණු ළමයි...?

'' කවුද ආච්චියෙ ඉසකුඩිච්චිය...? ''

නින්ද කඩපු තරහට කටට සුද්ධ සිංහල වචන පේළියක්

ගලාගෙන ආවත් ආච්චිට ඕවා කියන්න පුළුවනෑ. ඉතිං මං දූහැමින් සෙමින් කතාවට බැස්සා.

'' වෙන කවුද ඉතිං අර තේ උඩිච්චි මිසක්... ''

'' ආච්චියෙ මේ... කියන දෙයක් තේරෙන්න කියනවද...? මට පට්ට නිදිමතයි... ''

ඇත්තනෙ අප්පා... ආච්චි කියලා මේ තරම් ඉවසන්න පුළුවන්ද? ඉසකුඩිච්චියලු... තේ උඩිච්චිලු... කවුරු ගැනද මෙයා මේ කියවන්නෙ.

'' අර ඇන්තනීගෙ දුව ඇවිත් මහ ජෝඩුව එක්කම... ''

කිරි සන්තෝ... ආච්චිගෙ කතාව අහලා මාව ඇඳේ ඉන්දුනා.

'' මේසනා...? ''

'' ඔව්... ඔව්... ඒ මේස ගර්ජනාව තමයි. විගහට හැංගියන්...''

අපේ ආච්චිනං බුදු වෙන්න ඕනෙ අප්පා. එයා මාර ඔත්තුවක් තමයි දුන්නෙ. මේසනා ඇත්තටම ඉසකුඩිච්චියක් තමයි. කොටින්ම ඒකි මගේ ඇඟේ එල්ලෙන්න බලන් ඉන්න චූයිංගම් එකක්. කෙලින්ම කියනවානං වාතයක්. අපේ ආච්චිටත් මේවා තේරෙන එකනෙ වැඩේ...

තව ඩිංගෙන් ඒ මේස ගර්ජනාව මගේ කාමරේට කඩාපාත් වෙයි.

'' ආච්චි කිව්වද මං ගෙදර ඉන්නවා කියලා...? ''

'' කියන්න මගෙත් කවුරුවත් අහන්න එපායැ... ඇහුවොත් මං උත්තර දෙන්නම්. උඹ විගහට සමරෙලගෙ දිහාට හරි





තොලොන්චි වෙයං... ''

එයා සමරෙලගෙ දිහා කිව්වෙ අපේ ලොකු මාමලගෙ ගෙදරට... වෙන විදියකින් කියනවානං එයාගෙම ලොකු පුතාගෙ ගෙදරට.

'' ඇත්තටම ආච්චියෙ... ඔයානං රත්තරං කෑදක්... උම්ම්ම්මා....''

කට්ට කළුවරේම ආච්චිගෙ ජායාව තිබුණ තැනට පැනපු මං එයාව තදේට අල්ලලා උම්මා එකක් දුන්නා. එතකොටමයි කාමරේ ලයිට් එක පත්තු උනේ.

කාලා හමාරයි. අපේ අක්කා....

දැන් ඉතිං දීපංකො උත්තර.

'' දෑස්...? මොකද මෙතන මේ වෙන්නෙ...? ''

අක්කා ඇහුවෙ ඉනට අත් දෙකකුත් තියාගෙන. එයාගෙ ඇස් දෙක නළලෙ. හුස්ම ගන්නත් අමතක වෙලාද කොහෙද... ඇත්තනෙ අප්පා. මේ වගේ හොල්මන් වෙලා යන අසභ්‍ය ජවනිකාවක් ඇස් ඉස්සරහා දර්ශනය වෙද්දි කවුද බය නොවෙන්නෙ. අනික මං හිටියෙ කොට කලිසම පිටින්.

'' ඇයි හලෝ දැක්කෙ නැද්ද...? මං ආච්චිට උම්මා එකක් දුන්නා.... ''

මං කිව්වෙ තත්පරේට දෙකට අතට අහුවෙන ටී ෂර්ට් එකක් දාගන්න ගමන්.

'' මෙතන වෙන ඒවා උඹට වැඩක් නෑ. උඹ පලයං කාමරේට. මේක මගෙයි චූටි පුතාගෙයි වැඩක්. ''

ආච්චි හැමදාම වගේ මගේ පැත්ත අරගෙන අක්කව

කපලා දැම්මා. අක්කා අපි දිහා බලාගෙන හිටියෙ කිසි දෙයක් හිතාගන්න බැරුව.

" මට ඔයාලගෙ ඔය විකාර බලන්න ඕනෙ නැහැ. අර ඇන්තනී අන්කල්ලා මෙයාව හොයනවා. ඒකයි මං බලන්න ආවෙ."

අක්කා කිව්වෙ පුපුරු ගගහා. පව් අනේ. වැඩ ඇරිලා ගෙට ගොඩඋන ගමන් ඔහොම තරහා ගන්න එක හරිද...?

" උඹ කිව්වද කොලුවා ගෙදර ඉන්නවයි කියලා...? "

" නෑ... මං මුකුත් කිව්වෙ නෑ. එයාලත් දැක්කා මං දැනුයි ගෙට ගොඩ උනේ කියලා. "

" එහෙනං උඹ දෙයියනේ කියලා කට පියාගෙන හිටපං. උන්ට කියන්න ඕන දේ මං කියන්නම්... "

ආච්චිගෙ තරවටුවට අක්කා හැරිලා යන්න ගියේ 'අල්ලගන්නම්කො' කියන්නා වගේ බැල්මක් දාගෙන. අල්ලයි මගේ වලිගෙ.

" උඹේ හොර පාරෙන්ම පලයං පුතේ... "

ආච්චි ඒ කිව්වෙ මං අවේලාවල් වල ගෙදරින් එළියට යන එන විකල්ප මාර්ගය. ඒ කිව්වෙ බැල්කනියෙ කණ්ඩියෙන් අනිත් පැත්තට මාරු වෙලා එතනින් අඹ ගහේ අත්ත දිගේ ගිහින් ගහ යට තියෙන සිමෙන්ති බංකුවට පැනලා අඩි දෙක තුනක් වත්ත හරහා ගිහින් තාප්පෙන් පැනලා එළියට යන අති මනරම් හයිවේ එක ගැන.

කොයිකටත් එළියට පනින්න කලින් මං ඔරලෝසුව දිහා බැලුවා. හතයි කාලයි. ඒ කියන්නෙ හවස තේ එක බීලා ඇඳට වැටුනට පස්සෙ මං පැය දෙකක් විතර නිදාගෙන.





" දෑස්... දෑස්... "

මේසනාගෙ කටහඬ පඩිපෙළ පැත්තෙන් ඇහෙද්දි ආච්චි මාව බැල්කනියට තල්ලු කරලා එතන දොර වහලා දැම්මා. ඊට ටිකකට පස්සෙ මගේ කාමරේ ලයිට් එක ඕෆ් වෙනවත් මං බලාගෙන.

හරි... දැන් තියෙන්නෙ දුර්ග තරණය.

මං බැල්කනියෙ කණ්ඩියෙන් අඹ ගහට මාරු උනා. ඒත් එක්කමයි කටහඬවල් දෙක තුනක් ඇහුනෙ. ඒ කතා කරන්නෙ කවුද කියලා හිතාගන්න බැරුව මං බිම බැලුවෙ නිකමට වගේ.

හරි... ඔය තියෙන්නෙ ස්වීප් එක ඇදිලා. තාත්තා ඇන්තනී අන්කල් එක්ක අඹ ගහ යට සෙට් වෙන්න හදන්නෙ. දෙන්නා ස්ටූල් එකකුත් තියාගෙන බයිට් එක ලෑස්ති කරගෙන පේ වෙනවා. දැන් කොහොමද මෙතනින් මාරු වෙන්නෙ.

" ඉන්න ඈනිතනී... මං ග්ලාස් දෙකක් අරන් එන්නම්..."

තාත්තා ගේ ඇතුළට යද්දිම මගේ කාමරේ පැත්තෙන් ලාවට එළියක් ආවා. ඒ කියන්නෙ මොකෙක්හරි සර්පයෙක් මගේ කාමරේට ආවා කියන එක තමයි.

" කෝ ආන්ටි... දෑස් කාමරේ නැනෙ... "

මේසනා මගේ කාමරේ ලයිට් එකත් දාලා බරබරේ දානවා මට කන අගිස්සෙන්ම ඇහුණා. මේකි නිකමට හරි බැල්කනියෙ දොර ඇරියොත් මං කපෝතියි. මං අඩියක් දෙකක් ඉස්සරහට ගිහින් අඹගහේ අතු අතරෙ හැංගෙද්දි යට හිටපු ඇන්තනී අන්කල් උඩ බලලා ආපහු ගේ දිහා බැලුවා.

" නලින්... මේ ගහ එකපාරටම හරි අමුතු විදියට

ගැස්සුණා.''

විදුරු දෙකකුත් අතින් උස්සගෙන අඹ සෙවනට සම්ප්‍රාප්ත උන අපේ තාත්තට ඇන්තනී අන්කල් කිව්වෙ බයෙන් වගේ.

'' ආහ්... ගණන් ගන්න එපා. මේ පැත්තට ළඟදි ඉඳලා වඳුරෝ රංචුවක් පුරුදු වෙලා. උන්ට වෙලාවක් අවේලාවක් නෑ ගහෙන් ගහට මාරු වෙනවා. ''

තාත්තා එයාගෙ වන් ඇන්ඩ් ඔන්ලි පුත්‍ර රත්නය වඳුරු නාම්බෙකුට සම කළා එහෙනං. ෂිට්... දුකේ බෑ...

කොහොමඋනත් වඳුරන්ට පින් සිද්ධ වෙන්න මං ෂේප්. ඒත් ඉතිං මේ දෙන්නගෙ ස්ටෙලා පාර ඉවරවෙනකල් මං ගහ උඩට වෙලා ඉන්නයෑ. මග හිටියත් තෝ නසී... ගෙදර ගියත් තෝ නසී වගේ වැඩක් තමයි මටත් උනේ.

'' වෙන්න බෑනෙ... මං දැක්කා මැච් එක බල බල ඉඳලා ඇවිත් නිදාගන්නවා... ''

මගේ කාමරේ ඇතුළෙන් පුදුමය පිරුණු කටහඬවල් එකින් එක ඇහෙනවා. ඒ පාර අපේ අම්මත් මේසනා එක්ක සෝදිසි මෙහෙයුමට එකතුවෙලා.

'' කලබල වෙන්න කාරි නෑ. කොලුවා සමරෙලගෙ දිහා යනවා කියලා දැන් පැයකට විතර කලින් පිටත් උනා...''

ආච්චි තඩි සයිස් මුසාවාදයක් ඇරියෙ මං අඹ ගහ උඩ පැද්දි පැද්දි ඉන්න වෙලාවෙමයි. දැන් ඉතිං අම්මා සමරෙ මාමලගෙ ගෙදරට කෝල් කළොත් මොකද වෙන්නෙ...?

ෆෝන් එක සාක්කුවෙ තිබුණයි කියලා සමරෙ මාමගෙ පුතා වෙච්ච ගිවන්තට කෝල් එකක් දෙන්නවත් පුළුවනෑ. එහෙම





උනොත් ඇන්තනී අන්කල් අහයි ගහ උඩ ඉඳගෙන කෝල් ගන්නෙත් වත්තට පැනපු වඳුරෝ රංචුවද කියලා.

'' අප්පොච්චියේ... ආහ්... අම්මෝ කෙල්ලේ... මෙහෙට වරෝ... අයියෝ මගේ කකුල... ''

ගේ ඇතුළෙන් එකපාරටම අපේ ආච්චි මරලතෝනි දෙනවා ඇහෙද්දි මගේ ඇගේ ලේ සීතල උනා. එයා උඩ කරණමක් ගහලා වගේ.

'' ඒ අම්මා නේද තලින් කෑ ගහන්නෙ... යමු යමු බලන්න... වැටිලද කොහෙද... ''

තාත්තයි ඇන්තනී අන්කලුයි උසේන් බොල්ට්ගෙ රෙකෝඩ් එක කඩාගෙන තරගෙට ගේ ඇතුළට දුවද්දි මං ඔන්චිලි චිලි චිල්ල මලේ කියලා සිමෙන්ති බංකුවට පැනලා තාප්පෙනුත් එහාට මාරු උනා. ඒ සේරටම තත්පර දහයක්වත් යන්න නැතුව ඇති.

මට මේ තරම් බකප් එකක් දීපු ආච්චිට කරදරයක් උන වෙලාවෙ මග ඇරලා යන එක හරි නෑ කියලා හිතට දැනුණත් සමරෙ මාමලගෙ දිහාට යන එක ඇරෙන්න වෙලාවෙ හැටියට වෙන කරන්න දෙයක් නෑ.

'' දැස් බේබි... කොහෙද මේ අවේලාවෙ...? අදත් අඩච්චක් අල්ලන්න වගේ නේද...? ''

හෙනහුරා වගේ මගේ ඇස් ඉස්සරහට කඩන් පාත් උනේ අල්ලපු ගෙදර මුදලාලි අන්කල්ගෙ චක් ගෝලයා සරත්. අපි ඌට කතා කලේ සරා කියලා.

මිනිහා හිටියෙ හිස් අතින් නෙමෙයි... තඩි සයිස් කළගෙඩියක් අතේ තියාගෙන.

" සරා අයියා දියට ගිහින් වගේ... "

අඩව් කතාව ඇහුණෙ නෑ වගේ මං කතාව මාරු කළා.

" මොන දියටද බේබි.... මං මේ පන්සලට ගිහින් එන්න කියලා ගියා. "

මොනවා... මූ පන්සලට පය ගැහුවා කියලා මං ඔය ඇහුවාමයි. අපි දන්න කාලෙ ඉඳලා මේ මනුස්සයා වැස්සකටවත් පන්සලකට ගොඩ වෙලා නෑ.

" ඇයි පන්සලේ වතුර කපලා කියලා හාමුදුරුවො මුදලාලි අන්කල්ට පණිවිඩයක්වත් එවලද...? "

" බේබිට මක්ස්ඈංද....? මට මේ දවස්වල නොසෑහෙන්න අපල. ඉතිං මං පන්සලට ගියා බෝධිය නාවලා එන්න... "

" මේකෙන්...? "

මං පුදුම වෙලා වගේ ඇහුවෙ මේ යකා මේ තඩි කළගෙඩියට වතුර පුරවගෙන කොහොම බෝධිය වටේ ගියාද කියලා හිතාගන්න බැරුව.

" මේකෙන් තමයි... පොඩි කළගෙඩියකින් දවස් හතක් නැව්වත් එකයි... මේකෙන් එක සැරයක් නැව්වත් එකයි... "

ඌ තමන්ගෙ වාසියට හදාගත්තු න්‍යායක් ඉදිරිපත් කරද්දි මට බකස් ගාලා හිනා ගියා.

" පුදුමයි බෝධීන් වහන්සේට හෙම්බිරිස්සාව හැදුනෙ නැති එක..."

" හෙම්බිරිස්සාව...? "

සරා ඇස් ගෙඩි දෙක ලොකු කරගෙන බලන් ඉද්දි මං





අඩියට දෙකට එතනින් මාරු උනා. ඌ එක්ක කතා කරන්න ගියොත් මටයි හෙම්බිරිස්සාව හැදෙන්නෙ.

ඊට පස්සෙ මං කෙලින්ම ගියේ සමරෙ මාමලගෙ ගෙදරට.

සමරෙ මාමගෙයි රුවන්ති නැන්දගෙයි ලොකු පුතා ගිවන්ත මට වඩා මාස පහයි වැඩිමල්. අපි ඉස්කෝලෙ ගියෙත් එකටමයි... හිටියෙත් එකම පන්තියෙ... වල බැස්සෙත් එකට... කෙල්ලො එනකල් පාරවල් අයිනට වෙලා කටු කෑවෙත් එකට. ඌ තමයි අදටත් මට ඉන්න මගේ අතිජාත සුමිතුරා. ඉතිං මට එහෙ යන්න වෙලාවක් අවේලාවක් තිබුණෙ නෑ. එක්කො මං එහෙ... නැත්තං ඌ මෙහෙ.

අඩිය ඉක්මන් කරලා ගිය නිසා විනාඩි පහේ දුර මං විනාඩි තුනෙන් ඉවර කරලා තිබ්බා. දැන් වැඩේ සමරෙ මාමගෙයි රුවන්ති නැන්දගෙයි ඇස් වහලා ගෙට පැන ගන්න එක.

එතනිනුත් කිසි අවුලක් නැතුව තාප්පෙ තරණය කරපු මං ගිවන්තයගෙ කාමරේ ජනේලෙ ගාව ඉඳන් අපි දෙන්නට විතරක් සුවිශේෂී උන රහස් සංඥාව නිකුත් කළා. ඒක විසිල් සද්දයක්. හැබැයි ඇහෙන්නෙ කුරුල්ලෙක් කෑ ගහනවා වගේ.

සද්දෙ ඇහිලා තත්පර පහක්වත් ගියේ නෑ ගිවන්තයා ජනේලෙ ඇරියා. උන්ගෙ ගෙදර ජනේල් වලට ග්‍රිල් ගහලා නැති නිසා හැමදාම සැකයේ වාසිය තිබුණෙ අපේ පැත්තට.

" දෑස්... උඹ... මේ වෙලාවෙ...? "

ගිවන්තගෙ මූණෙ ප්‍රශ්න කෝටියයි. එතකොටම මට ඇහුණා මෙහෙ ෆෝන් එක රින්ග් වෙනවා. ආයෙ කතා දෙකක් නෑ. ඔය අපේ ගෙදරින් තමයි. ආච්චිගෙ බේගලේ ඕ එන් ඒ එක ටෙස්ට් කරන්න හදන්නෙ.

" පුතා... පුතා... දැස් මෙහෙ ආවද...? "

ඒ රුවන්ති නැන්දා. ඒ ප්‍රශ්නෙට දෙන්න ඕන උත්තරේ මොකක්ද කියලා හිතාගන්න බැරුව වගේ ගිවන්ත මගේ මූණ බැලුවා.

" හ්ම්... පැයක්... "

මං කිව්වෙ හඬ පිට නොවන විදියට.

" ඔව් අම්මා... දූන් පැයක් විතර ඇති ඇවිත්... "

ගිවා ගේම ෂේප් කරද්දි මං උගේ ඇඳට පැනලා කොට්ටෙ ළඟ තිබුණු නවකතා පොතක් දිගැර ගත්තා.

ඒත් එක්කමයි රුවන්ති නැන්දා කාමරේට එබුනෙ.

" මට ඇහුනෙ නැහැනෙ සද්දයක්වත්... පුතා ඇවිත් පැයක් වෙනවද...? "

එයා සැකෙන් සැකෙන් වගේ එකම ප්‍රශ්නෙ දෙවෙනි පාරටත් ඇහුවා. මමත් හරියට ඇඳෙන් නැගිට්ටෙ පැය ගාණක් එකම ඉරියව්වෙන් ඉඳලා වගේ අමාරුවෙන් අතපය දික් කරගෙන.

" ඔව්... මං එද්දි නැන්දලා මොකක්දෝ මන්දා දියණියෙක්ගෙ කතාවක් බලනවා. ඒ පාර මං ඩිස්ටර්බ් කළේ නැතුව ගිවන්තගෙ කාමරේට ආවා. "

හය හමාර පහුවෙද්දි ගේ හොරු අරන් ගියත් අම්මලට මෙලෝ සිහියක් නෑ කියලා ගිවන්තයා හැමදාම කියන නිසා මං වැඩේ අවුලක් නැතුවම ෂේප් කරලා දැම්මා.

" අනේ ඔව් පුතා... අපි අභීත දියණි බල බල හිටියෙ. දන්නෙ නැද්ද... අපේ කෙල්ලටයි මටයි ඒක බැලුවෙ නැත්තං හරියට කෑවෙ නෑ වගේ... "





නැන්දා ඒක කිව්වෙ ලැජ්ජාවෙන් වගේ. එතකොටමයි ගිවන්තගෙ නංගි රශ්මි කාමරේට එබුනෙ. නමින් රශ්මි උනාට පවුලෙ හැමෝම එයාට කතා කළේ චූටි කියලා. මේ පාර ඒ ලෙවල් ලියන ළමයෙක් උනාට ඒකි තාම චූටියි තමයි.

කෙල්ල මේ අවේලාවෙ දිගට දිගේ කොට කලිසමකුයි කහ පාට ස්කිනියකුයි ගහලා සෝ කියුට් අප්පා.

" ආන්... ඔයාව හොයන්න ගිහින් තිලකාච්චි පඩියෙන් වැටිලලු. "

චූටි කිව්වෙ මගේ උරහිසට පාරක් දීලා අදින ගමන්.

" ඒ කියන්නෙ ඒ කතාව ඇත්තද...? "

මං ඇහුවෙ පුදුම වෙලා. ඒක අහපු තාලෙ මොකක්හරි දෝසයක් තිබුණ නිසාද මන්දා නැන්දයි චූටියි දෙන්නම ඇස් පුංචි කරලා මගේ දිහා බැලුවා.

" ඒ කතාව කිව්වෙ...? "

ඒ ඇහුවෙ චූටි.

" ආච්චි මොකටද මාව හොයන්නෙ...? මං එයාට කියලනෙ ආවෙ. මේ... මේ... ඇත්තටම ආච්චි වැටිලද චූටි...? "

" වැටිලා තමයි හලෝ... ඉක්මනට ගෙදර ගිහින් බලනවා."

" චූටි... මොකද ඔය අයියලට කතා කරන විදිය... යනවා... ගිහින් අපිට බොන්න මොනවාහරි ගේනවා. "

සිද්ධ වෙච්ච දේවල් වල අගක් මුලක් නොදන්න ගිවන්ත උගේ නංගිව කාමරෙන් එළවගත්තා.

" චූටියෝ... බොන්න දෙයක් නෙමෙයි... කන්න දෙයක්

ගේනවෝ.... ''

මං කිව්වෙ කෙල්ල කාමරෙන් ගියාටත් පස්සෙ.

'' අද මොකක්ද පෙරළගත්තු බාල්දිය...? ''

ශිවන්තයා මගේ මූණට එබුණා.

'' බාල්දියක් නෙමෙයි බං... අර හෝන්තුව කඩාපාත් උනා. මේසනා.... ''

'' ආහ්... උඹේ ලව් එක... ''

ඌ කිව්වෙ චාටර් හිනාවක් දාන ගමන්.

'' අනේ මේ... මගෙන් දෙකක් අහගන්නෙ නැතුව හිටපං...''

'' ඒක නෙමෙයි... මොකක්ද අර ආච්චි වැටිලයි කියලා කියපු කතාව...? ''

'' උඹට කියන්න කලින් මං ඒ ගැන දැනන් ඉන්න එපැයි... එද්දි සද්දයක්නං ඇහුණා. හිටපංකො... ''

ශිවන්තට උත්තර දෙන්න කලින් මං අපේ ගෙදරට කෝල් එකක් ගත්තා. ෆෝන් එක ගත්තෙ අම්මා.

'' හෙලෝ අම්මා... ආච්චිට මොකද...? ''

ගත්ත ගමන්ම මං අටුවා ටීකා නැතුව කෙලින්ම ප්‍රශ්නෙට බැස්සා.

' දැස්... කොයි වෙලාවෙද ඔයා ඔහෙ ගියේ...? ඇයි නිකමටවත් අපිට කියලා ගියෙ නැත්තෙ...? මං හිතන් හිටියෙ ඔයා නිදි කියලා... ''

ඕකනෙ ඉතිං බැරි. අහපු දේට උත්තර දෙනවා වෙනුවට එයා ප්‍රශ්න පත්තරයක් අහනවනෙ.





'' ඇයි අම්මා මං ආච්චිට කියලනෙ ගියේ.... ''

'' මෙහෙ දියන් ඕක... ආ... චූටි පුතේ... ''

අම්මට උත්තරේ දීලා ඉවර වෙන්නත් කලින්ම ආච්චි ෆෝන් එක උදුරගෙන මට කතා කළා.

'' අනේ මන්දා... දැන් ඇවිදගන්නත් බෑ කියලා කෙඳිරි ගගා හිටිය කෙනා ඔය යස අගේට ෆෝන් එකට දුවන් ආවෙ. ''

අම්මා එතනින් ගියේ ආච්චිට බැන බැන.

'' චූටි පුතේ... ''

'' ආච්චි... ඔයාට මොකද උනේ...? ''

'' මුකුත් නෑ... ''

'' මුකුත් නෑ... ආච්චි වැටුණා නේද...? ''

මං ඇහුවෙ පුදුම වෙලා.

'' නෑ... නෑ... '' ආච්චි උත්තර දෙන්නෙ ඔව් නෑ බෑ බාසාවෙන් විතරයි. මගේ හිතට පොඩි සැකයක් ආවා.

'' ආච්චි කෑ ගහන සද්දෙ මට ඇහුනනෙ. එතකොට ඒක බොරුවක්ද...? ''

'' ආ... ඔව්... මේ.. මේ.. ''

එයා මොකක්දෝ මන්දා කියාගන්න බැරුව තටමනවා. ඒ කියන්නෙ ෂුවර් එකටම කවුරුහරි ළඟපාත ඇති. සමහරවිට අපේ අම්මම වෙන්න ඇති ළඟට වෙලා ඉන්නවා ඇත්තෙ.

'' මට පැනගන්න බැරුව හිටිය නිසාද ආච්චි එහෙම කෑ ගැහුවෙ... ''

'' හරියට හරි... ''

ෂුහ්... ආච්චි මාර පොරක්නෙ. මං ගහළඩ කොටු වෙලා ඉන්නවා කියලා තේරිලා තමයි එයා එහෙනං ගේම දීලා තියෙන්නෙ. ඒ කියන්නෙ තාත්තවයි ඇන්තනී අන්කල්වයි ගේ ඇතුළට ගෙන්නගන්න ඕනාවට.

" ඔයා නම් මාරයි ආච්චියෙ... ඇත්තටම ළඟ හිටියනං මං අර එන්න කලින් දුන්නා වගේ තව එකක් දෙනවා. "

" හපොයි හපොයි.... ඒක හොඳටම ඇති. තවනං එපා..."

ආච්චි බය වෙලා... සමහරවිට මගේ උම්මා එක නිසා එයාට සීයව මතක් වෙන්න ඇති.

" මේ.... එහෙනං ඔය ලොකු පුතාගෙ වැඩේ ඉවරයක් කරලා දීලම වරෙන්... හදිස්සියක් නෑ... ඕන්න මං තිබ්බා... මගේ කකුල ඇදුම් කනවා..."

ගෙදර එන්න හදිස්සි වෙන්න එපා කියලා නොකියා කියලා ආච්චි ෆෝන් එක තිබ්බා. ඒ කියන්නෙ තාම ඇන්තනී අන්කල්ලා ගිහින් නෑ. ඔව් ඉතිං... කොහෙ යන්නද... තාත්තලා දෙන්නා තාම ස්ටෙලානෙ.

" මොකද වෙලා තියෙන්නෙ...? "

ගිවා අපේ දුරකථන සංවාදය අහගෙන ඉඳලද කොහෙද. මං ඌට මුළු සිද්ධියම ඒ ටු ඉසෙඩ් පහදලා දුන්නා.

" අනේ මන්දා... තිලකාච්චිත් උඹටම හරියන බඩ්ඩ. "

ඌ කිව්වෙ හිනා වෙවී.

" මට විතරද...? ඇයි ආච්චි උඹේ කේස් වලටත් ඔය වගේ අනපේක්ෂිත උදව් කරලා නැද්ද...? "

" ඔව් ඉතිං... මං නෑ කිව්වෙ නැනෙ. "





" ඒක නෙමෙයි... ලැප් එක දියන් ටිකකට... "

ආපහු සැරයක් ඇඳට පනින ගමන් මං කිව්වෙ මූණු පොතේ සුන්දරී එක්ක වචනයක් දෙකක් කතා කරන්න හිතාගෙන.

" එෆ් බී යන්න නේ...? තාම ඒක අතෑරියෙ නැද්ද...? "

ගිවන්තයා ලැප්ටොප් එකයි ඩොන්ගල් එකයි දෙකම මගේ අතට දුන්නෙ චාටර් හිනාවක් දාන ගමන්.

" ඇයි යකෝ... උඹට ප්‍රොෆයිල් දෙක තුනකින් ලොග් වෙලා කෙල්ලො හත්අට දෙනෙක් අමාරුවෙ දාන්න පුළුවන්. මං මේ එක මලක් කඩන එක තමයි දිරවන්න අමාරු... "

" නෑ නෑ මස්සිනා... මට ඒකෙ කිසි අවුලක් නෑ. ඒත් උඹ ඕවා සිරා ගනීද කියන එක තමයි මට තියෙන අවුල... "

" හොඳයි කියලා හිතුනොත් සිරා කරනවා. "

මං ඒක කිව්වෙ නිකං කටට ආවට මිසක් ඇත්තටම එහෙම කරන්න හිතාගෙන නෙමෙයි.

" පිස්සුද දැස්... ඔය කෙල්ලො එෆ් බී එන්නෙ කොල්ලන්ව බයිට් කරන්න... උප්පැන්නෙ මල්කාන්ති කියලා නම් තියෙන එවුන් ප්‍රොෆයිල් හදන්නෙ මල්කි කියලා. ගමට සිරියලතා එෆ් බී එකේදි ශ්‍රියා... සෙනෙහෙලතා ස්නේහා... අපිත් ඒවට සූදානම් ශරීරෙන් ඉන්න ඕනෙ. ඕකුන් කොයි තරම් චැට් කළත් අපිට එක කෝල් එකක් දෙනවද... එක දවසක්වත් හම්බවෙන්න එනවද...? නෑනෙ. උන් කාලෙ කාගන්න අපිව අන්දනවා... "

ගිවා දීපු දේශනෙත් ගතයුතු යමක් තියෙනවා.

ඇත්තටම මං එක්ක දවසගානෙ චැට් කරන කෙල්ල දූහැමි අංජනාත් ඒ වගේ කෙනෙක්ද...? ඒත් දූහැමිනං ගිවන්ත

කියනවා වගේ ගොඩේ කෙල්ලෙක් නෙමෙයි වෙන්න ඇති.

" කෝ... ඔන් කරගත්තද...? පෙන්නපංකො උඹ ඔය දූහැමින් සෙමින් ආශ්‍රය කරන කෙල්ල... "

ඌ ලැප් එකේ ස්ක්‍රීන් එකට එබෙද්දි තමයි මට ඇත්තටම ලැජ්ජ හිතුනෙ. දූහැමි කවදාවත් එයාගෙ ෆොටෝ එකක් එෆ් බී දාලා නෑ. ඒ වගේම තමයි එයා හැම වෙලේම හැසිරෙන්නෙ එයාගෙ අනන්‍යතාවය වෙන කෙනෙක්ට හොයාගන්න බැරි විදියට.

" ඒකි ඔන් ලයින් නෑ තාම. මං වෙන වෙලාවක ෆොටෝ එකක් පෙන්නන්නම්කො... "

දඩිබිඩි ගාලා ලොගවුට් උනු මං ගිවන්තට ලැප් එක දීලා ඇඳෙන් නැගිට්ටා.

" ෆොටෝ බලන්න ඔන් ලයින් එන්න ඕනෙයැ...? "

ඌ මං දිහා බැලුවෙ සැකෙන් වගේ.

* * * * * * *

අම්මගෙ පොඩි මල්ලි හෙවත් අපේ ආච්චිගෙ පොඩි පුතා උන ශාන්ත මාමගෙ නෝනා මීට අවුරුදු දෙකකට කලින් එයාව දාලා ගිහින්.

ඉතිං මාමයි එයාගෙ අවුරුදු තුනක් උන සුදු දූවයි දෙන්නත් හිටියෙ අපේ ගෙදරටම අල්ලලා තිබුණු ඇනෙක්ස් එකේ. මහා සද්දන්ත විදියට තට්ටු තුනකට හදලා තිබුණු අපේ ගෙදර ඇති තරම් ඉඩ තියෙන නිසා අම්මයි තාත්තයි දෙන්නා කොයි තරම් කතා කළත් චූටි මාමා ගෙදරට එන්න කැමති උනේ නෑ. ඒත් එහෙමයි කියලා අපි කවදාවත් පවුල් දෙකක් උනේ නෑ.

ඒ සම්බන්ධතාවය වැඩිපුරම රැකුනෙ චූටි මාමගෙ දූව





එනුරි හෙවත් සුදූ නිසා. අම්මා නැති එක කිසිම ප්‍රශ්නයක් කරගත්තෙ නැති පොඩි එකී සිරියාවන්තකමට ගෙවල් දෙක අතර දුවලා පැනලා හැදුනා.

ඉතිං... මේ ගෙවල් දෙකේ උදවියට තිබුණු ලොකුම අර්බුදය තමයි ආහාර අර්බුදය. ඒ සල්ලි නැතුව නෙමෙයි.... ගෙදර සාමාජිකයො ගාණ වැඩි උන එක හා වර්ග කිරීම් වැඩි උන නිසා.

එක එක්කෙනාට එක එක ඒවා ඕනෙ. අම්මටයි අක්කටයි පිට්ටු ඉඳිආප්ප වගේ දෙයක්... අපේ පොඩි මාමගෙ චූටි දූවට බනිස්... එහෙමත් නැත්තං අයිසින් දාපු කේක් කෑල්ලක්, ලැවරියා එකක් වගේ දෙයක්. මාමානං ඔය ගේන ඕන දෙයක් කනවා. හැබැයි අපේ ආච්චිටයි තාත්තටයිනං නොවරදවාම බත් ඕනෙ. ඒ නිසා ඒ දෙන්නට රතු බතක් සම්බෝලයක් වගේ දෙයක් ගෙදර හදනවා.

මේ විදියට වෛවාරන කෑම ජාති තෝරන්න වෙන නිසා අපේ කට්ටිය කවුරුවත් උදේට කඩේ යන්න කැමති නෑ. ගියත් ගේන්නෙ තමන් කන්න ආස දෙයක් විතරයි. ඉතිං හැමදාම උදේට අපේ ගෙදර ගෝරි. ගෙදර තියෙන මේ කව කචේ අහන් ඉන්න බැරිනිසා මං ඒ ඩියුටි එක බාර ගත්තා.

විශේෂෙන්ම මාමගෙ අවුරුදු තුනක් වයස එනුරි දූවගෙ හිත සනසන්න. මොකද එයා කැමති දෙයක් ගෙනාවෙ නැත්තං කෙල්ල දවසම මූකුත් නොකා මූණ එල්ලගෙන ඉන්නවා.

අදත් මං වෙනදා වගේ සුපුරුදු විදියට උදේම මගේ දඬු මොණරෙට නැගලා අපේ ගෙදර කට්ටියට කන්න ගේන්න හන්දියට ගියා.

ඉඳිආප්ප, ක්‍රීම් බනිස්, පාන්, වඩේ වගේ ජාති කීපයක්ම

අරගෙන මං ආපහු ගෙදර එනකොට අපේ වත්තෙ පරණ ත්‍රීවිල් කට්ටක් නවත්තලා තිබුණා. ඒක වෙන කාගෙවත් නෙමෙයි සහන් අයියගෙ.

සහන් කියන්නෙ ඇන්තනී අන්කල්ගෙ පුතා. වෙන විදියකින් කියනවානං මේඝනාගෙ අයියා. ඇන්තනී අන්කල් හොඳ මනුස්සයා උනාට එයාගෙ පුතානං කයිවාරු විමානෙ. කට ඇරියොත් මොකාක් හරි පම්පෝරියක් තමයි. අපි ගොඩක් වෙලාවට එයාව හැඳින්නුවෙ බෝස්තිං කියලා. මේ මිනිහා මොකට මේ වෙලාවෙ අපේ ගෙදරට පාත් උනාද මන්දා.

එහෙම හිතලා මං වත්තට ඇතුල් වෙනකොටයි දැක්කෙ අපේ ගෙදර මිනිස්සු සේරම උදේම මිදුලට බැහැලා. සහන් උදේම ඇවිත් ඒ අයට මොකක්දෝ මන්දා නූල් සූත්තරයක් පෙන්නනවා. අපේ කට්ටියත් ගජරාමෙට වටවෙලා ඒක දිහා බලන් ඉන්නවා. ඇත්තටම ඒක මොකක් වෙන්න බැරිද...?

'' දැස් අයියා... බබාට බයිස් ගෙනාවද...? ''

ගෙදර කිසි කෙනෙක්ට මගේ බයිසිකල් සද්දෙ ගාණක් නැති උනාට මං ගාවට දුවගෙන ආවෙ එනුරි දූ විතරයි.

'' ගෙනාවා... ගෙනාවා... ආ මෙන්න. ''

මං මුලින්ම කළේ වෙනම බෑග් එකක දාලා තිබුණ එයාගෙ කෑම එක අතට දීපු එක.

'' මොකක්ද පැටියො ඔය පෙන්නන්නෙ...? ''

අපේ කට්ටියට අමතරව සහන්කාරයයි එයාගෙ තව යාළුවො දෙන්නෙකුයි හිටපු නිසා මං එකපාරටම එතනට නොගිහින් ඇහුවා.





aralivihara@gmail.com

'' සාන් මාමි හප්පෙක් ගෙනල්ලා... ''

'' හප්පෙක්...? ''

'' ඔව්... ඔකු හප්පෙක්...''

පොඩි එකී කටත් ඇද කරලා ඇස් දෙකත් ලොකු කරලා කියපු තාලෙට මට හිනත් ගියා. ඒත් ඒ කියපු හප්පා මොකාද කියලානං මට තේරුණේ නෑ.

'' ආ... දැස්.. ඔයා ආවද...? මේ බලන්නකො සහන් අයියා අරන් ඇවිත් තියෙන්නෙ මොකෙක්ද කියලා...''

සඳුගෙ සද්දෙටද මන්දා මෙච්චර වෙලා බිම තිබුණ දේකට යොමු වෙලා තිබුණ අපේ අම්මගෙ ඇස් දෙක මගේ දිහාට හැරුණා. ඒත් එක්කමයි මං ඒ අය ළඟට ගියේ.

අප්පට සිරි... නයෙක්... නිකම් නයෙක් නෙමෙයි දාර සයිස් බඩුවක්.

'' සහන්ගෙ නෑයෙක්ද මේ...? ''

මං ඇහුවෙ එයත් අරින තරමක් අරින්නෙ නයි නිසා.

'' මේ තමයි දැස් මං අර කියපු සුදූ මහත්තයගෙ වත්තෙ ඉඳලා අල්ලගත්තු නයා... ''

මං කියපු දේ නොතේරුණු කුක්කු බබෙක් වගේ සහන් නයාව හඳුන්වා දෙනවා.

'' සුදූ මහත්තයගෙ...? ''

'' ඔව්... අර නානායම් වත්තෙ ඉඳලා හාට් ඇටෑක් එකකින් නැති උනේ. ඒ මහත්තයා එංගලන්තෙ ඉඳලා එද්දි ගෙනාවයි කියන නයා තමයි මූ... ''

ඔන්න මිනිහා නවත් කෙබරයක් අතැරියා. එංගලන්තෙ ඉඳලා එහෙම හිතුමතේට නයි ගේන්න පුළුවන්යෑ. මොකෝ නයින්ට පාස්පෝට් හදලා ගේන්නද...? ඒත් ඉතිං අපේ ආච්චිටනං ඒ කතාව ඇත්ත. එයා බෙල්ලත් උලුක් කරගෙන දත් නැති කටත් ඇරගෙන කොන්දත් නමාගෙන නයාගෙ හැඩරුව බලනවා.

එතකොටම නයා ආච්චිට පෙනේ දික් කළා. ෂුහ්... ඒ පෙනේ පීරිසියක් විතර ලොකුයි. ඒකෙ තිබුණෙ තඩි සයිස් 'ප'යන්නක්. එතකොටම සහන් ආඩම්බර ලීලාවෙන් මගේ දිහා බැලුවා.

" කොහොමද දෑස් පෙනේ...? "

" ඔයා කොහොමද හරියටම කියන්නෙ මූ එංගලන්තෙන් ගෙනාවා කියලා...? "

මං ඇහුවෙ නෝන්ඩියට වගේ.

" මූ තමයි හලෝ ඒ සුද්දගෙ නයා. බොරුනං බලන්නකො සයිස් එක... "

" අනේ යනවා හලෝ යන්න... මූ කොහොමද පිටරට නයෙක් වෙන්නෙ... ඔය අගේට 'ප' යන්න තියෙන්නෙ ඔළුවෙ..."

ඔන්න ඒ පාර අපේ ගෙදර උදවියගෙ ඇස් හෙමීට මගේ දිහාට හැරුණා.

" නයින්ට 'ප'යන්න තියෙනවා නේන්නං... "

" 'ප' යන්න තියෙන්නෙ ලංකාවෙ නයින්ටනෙ. එංගලන්තෙ නයින්ට තියෙන්න ඕනෙ 'p' අකුර. "

මං ඇහැකුත් වහලා එහෙම කියද්දි අපේ කට්ටියගෙ මූණු හිනාවෙන් පිරිලා ගියා. කොටින්ම සහන්ගෙ යාළුවො





දෙන්නටත් හිනා. සහන්ගෙ මූණ නිකං ඇද ගහපු කොණ්ඩ කැවුමක් වගේ උනා.

" උඹෙ කටේ සූකිරි කැටයක් දාන්න වටිනවා චූටි පුතේ... මාත් මේ කැරකි කැරකි බැලුවෙ මූගෙ ඇඟේ කොයි හරියෙද ඉංගිරීසි අකුරක් තියෙන්නෙ කියලා... "

අපේ ආච්චිත් ලොඹු කට නටව නටව කියද්දි සහන් අයියට තද උනාද කොහෙද.

" අනේ යන්න ආච්චියෙ යන්න... පච් කියලා පෙන්නන්න ගෙදරටම ගෙනාවට මේවා හොඳ පාඩම්... "

එයාගෙ යාළුවො දෙන්නා නයාව අල්ලලා පෙට්ටියකට දාගත්තට පස්සෙ සහන් ත්‍රීවිලර් එක ස්ටාට් කරගෙන යන්න ගියා.

ත්‍රීවිලර් එකේ පිටිපස්සෙ ගහලා තිබුණු 'අපේම නයි... අපිවම කයි...' කියන වැකිය දැකලා මං හිනා නොවී හිටියෙ බොහොම අමාරුවෙන්. මූට පුදුම නයි අමාරුවක්නෙ තියෙන්නෙ.

" අම්මලටත් පිස්සු... කට්ටියම මොකටද උගේ බොරුවට අහුවෙලා මිදුලට බැස්සෙ...? හරියට මිනිහගෙ හැටි නොදැන වගේ..."

සහන් යන්න ගියාට පස්සෙ මං කෑම ටික ගෙට අරගෙන ගියේ අම්මට බැන බැන.

" මං ගිය ඇති එකක් නෑ. ඔයාලගෙ ආච්චි තමයි මිදුලෙ ඉඳලා කෑ ගැහුවෙ 'මේං නයෙක්...' කියලා. ඒ පාර තමයි අපි සේරම දුවලා ගියේ. "

අම්මා වැරැද්ද ආච්චිගෙ පිට පටවද්දි ආච්චි එයාට නෙමෙයි වගේ කාමරේට රිංග ගත්තා.

* * * * * * *

# 02

පාන්දරම ඇඳෙන් බැහැලා බිම තිබුණු සරම අහුලගෙන ඒකට රිංගගත්තු මං අද දවසට කරන්න තියෙන විශේෂ රාජකාරී මොනවද කියලා කල්පනා කළා.

ඒ ලෙවල් ඉවර වෙලා ගෙදරට වෙලා හිටපු එකේ මේ දවස්වල කරන්න තරම් ලොකු දේවල් තිබුණෙ නෑ. විභාගෙ ඉවර උන ගමන්ම රස්සාවල් කරන්න ඕනෙ නෑ කියලා අපේ තාත්තලා ගිවන්තවයි මාවයි මැනේජ්මන්ට් ඩිප්ලෝමා එකක් කරන්න දැම්මා. ඒකටත් අපි ගියේ තාත්තලට ඕනාවට මිසක් අපිට ඕනාවට නෙමෙයි. කොහොම උනත් ළඟදි ඒ ඩිප්ලෝමා එකත් ඉවර උනා. දැන් ඉතිං අපි ෆුල් ටයිම් වර්ක් කරන්නෙ එෆ් බී එකේ.

මේ ටිකේ ටිකක් දත කාලා මගේ එෆ් බී යාළුවා දැහැමි ගැන හොයලා බැලුවොත් හොඳයි කියන අදහස මගේ ඔළුවට ආවෙ නිකම්මයි. ඒකට උදව් ගන්න හොඳම කෙනා තමයි ගිවන්ත.

'' දැස් ඉක්මනට ලෑස්ති වෙන්න... අද රෙජිනෝල්ඩ් අන්කල්ගෙ අලුත් මැගසින් එක දොරට වඩින උත්සවේ... කල්තරටම යන්නත් ඕනෙනෙ. ඒ නිසා තාත්තා කිව්වා උදෙන්ම





පිටත් වෙමු කියලා.''

පාන්දරින්ම මගේ කල්පනා ලෝකෙ කඩලා බිඳලා දැම්මෙ වෙන කවුරුවත් නෙමෙයි අපේ අම්මා. එයා එක දවසක්වත් මට නිදහසේ හුස්මක් ගන්න දෙන්නෙ නැති හැටි. හැමදාම කොහෙ හරි යන්න කතා කරනවා.

'' රෙජිනෝල්ඩ් අන්කල් කියන්නෙ තාත්තගෙ යාළුවෙක් විතරනෙ. ඔය දෙන්නා ගිහින් එන්න. මටයි ගිවාටයි අද පොඩි වැඩක් තියෙනවා. ''

මං බණ්ඩක්කා තියරියක් දාලා බැලුවා.

'' ඔයාටයි ලොකු පුතාටයි ඉතිං කවදද වැඩක් නොතිබුණේ...? අනික චූටි මාමත් යනවා. ''

අම්මා කතා කළේ මූණ ඇද කරගෙන. වෙන හේතුවකට නෙමෙයි... මාව තනියම දාලා යන්න අම්මා බයයි. විශේෂයෙන් ගිවන්තත් එක්ක දාලා යන්න. ඇයි ඉතිං එද්දි මොන මොන බාල්දි පෙරලලා තියෙයිද දන්නෙ නැහැනෙ.

'' එතකොට ආච්චියි සුදුයි...? ''

මං ඇහුවෙ අපේ ආච්චි ඔය වගේ දුර ගමන් වලට වැඩි කැමැත්තක් නෑ කියලා දන්න නිසාමයි.

'' එයාලා සමරෙ මාමලගෙ දිහාට යනවයි කිව්වා. අපිට රෑ එන ගමන් එක්කගෙන එන්න පුළුවන්නෙ... ''

'' අනේ අම්මෙ... මේං වැන්ඳා... මමත් ආච්චි එක්ක එහෙ යන්නං.... ඔන්න ආයෙ කතා කරන්නනං එපා... ''

මාව බලෙන් ඇදන් යන්න බැරිකමට තනියෙම මුණු මුණු ගගා ලෑස්ති උන අම්මා අන්තිමේ කට්ටිය එක්ක යන්න පිට

උනේ මටයි ආච්චිටයි දාහක් උපදෙස් දීලා.

'' දැස්... ඔයාලා සමරෙ මාමලගෙ දිහා යනවානං මේ ලයිට් ෆෑන් එහෙම හරියට ඕෆ් කරලා යන්න. ටීවී එක එහෙම නිකං බොරුවට දාගෙන ඉන්න එපා. දැන් කරන්ට් බිල් එකත් සෑහෙන්න වැඩියි... ''

ළඟදි ඉඳලා අපේ අම්මා හරියට විදුලිය පිරිමහනවා. මීට කලිනුත් ඔය විදියට පිරිමහලා වැඩ කළානං අපේ තාත්තට තව තට්ටු දෙකේ ගෙයක් හදන්න තිබ්බා.

'' හරි... හරි... උඹ බය නොවී ගිහින් වරෙන්කො දුවේ. චූටි පුතා නැතුවට මං ඉන්නවනෙ. මං බලලා කරලා ඕවා නිවලා දාන්නං... ''

අපේ ආච්චි සිරියාවන්තකමට හිනාවෙලා කිව්වට පස්සෙ තමයි අම්මගෙ මූණට හිනාවක් ආවෙ.

'' සුදූ ඔයත් දඟ කරන්න එපා හොඳද...? අපි එනකල් කියන දේ අහගෙන ඉන්න ඕනෙ... ''

ඒ කිව්වෙ චූටි මාමා. එයා දූකෙන් වගේ කෙල්ලව දාලා ගියාට පොඩි එකීටනං ඒක ගාණක්වත් නෑ. එයාට ඕනෙ කට්ටිය එක්ක ගැවසෙන්න. අනික මං ජේන මානෙක ඉන්නවානං කෙල්ල ෂේප්.

ඕං ඉතිං දෙයියනේ බුදුනේ කියලා කට්ටිය ගියා.

'' ආච්චියෙ... ඔයා දූන්මම ලොකු මාමලගෙ දිහා යනවද...?''

උදේම ගිවා එක්ක සෙට් වෙන්න හිතාගෙන මං ඇහුවා.

'' පිස්සුද කොලුවො... අද අර සොලමන් ඛාන්ගෙ පික්චර්





එක යනවා. මං මේ තකහනියෙ නැවතුණේ ඒක බලන්න. උඹට ඕනෙනං සමරෙලගෙ දිහාට පලයං... මං ඒක බලලා ඉවරයක් කරලා එන්නං... ''

ඕන්න බලාපල්ලකො අපේ ආච්චිගෙ හැටි. අපේ අම්මට විදුලි බිල ඉතිරි කරන්න පොරොන්දු වෙලා කට්ටිය ගිය හැටියෙ ෆිල්ම් බලන්න ලෑස්තිය.

කොහොමටත් අපේ ආච්චිට ඒ කාලෙ ඉඳලම හින්දි උණ කියලානං අපි කවුරුත් දන්නවා.

'' මොකක්ද ආච්චියෙ අද යන පික්චර් එක...? ''

මෙයා මේ තකහනියක්ම ජේ වෙලා බලන්න හදන්න වටිනා කියන ෆිල්ම් එක මොකක්ද කියා මට හිතා ගන්න බැරි උනා.

'' අර.... හම දිලිසේ මොකේ සබන්ද... මන්දා කියලා චිත්තරපටියක් තියෙන්නෙ... ආං ඒක. ''

'' මොකක්...? ''

'' අර අඬේ දේව්ගන්... සොලමන් ඛාන්... එහෙමත් ඉන්නෙ... ''

ආච්චිගෙ කතාවට මට හිනාව ඉස්මෝල්ලෙ යන්න වගේ ආවා. එයා හම දිලිසේ මොකේ සබන්ද මන්දා කියලා කිව්වෙ 'හම් දිල් දේ චුකේ සනම්' ෆිල්ම් එකට වෙන්න ඕනෙ. සබන් ගාපුවම හම කොහොමත් දිලිසෙන නිසා අපේ ආච්චි නම ඒ විදියට සිංහලේට පරිවර්තනය කරගන්න ඇති. එක අතකට ඒකත් මරු.

ඒත් වැඩේ කියන්නෙ ආච්චිව තට්ට තනියම ගෙදර දාලා මං කොහොමද ගිවා හම්බවෙන්න යන්නෙ. කවුරුහරි ආච්චිව

උස්සගෙන ගියොත්...

" බය වෙන්න එපා චූටි පුතේ... උඹ ගිහින් මේ පොඩි එකිව රුවන්තිට බාර දීලා උඹේ වැඩක් බලාගෙන නිවාඩු පාඩුවෙ වරෙන්. උඹ මාව තනියම දාලා ගියා කියලා මං කාටවත් කියන්නෙ නෑ. "

මං කල්පනා කරද්දි අපේ ආච්චි දන්නවා හේතුව. අනික එයා මාව පාවලා දෙන්නෙ නෑ කියලත් මං හොඳටම දන්නවා. ඒත්.... මට කල්පනා කරලා ඉවර කරන්න ලැබුනෙ නෑ. ගෙදර ෆෝන් එක රින්ග් උනා.

" දෑස්... උඹලා තාම ගෙදරද...? මං මේ ආච්චියි උඹයි දෙන්නා එනකල් බලන් ඉන්නවා.... "

කතා කළේ ගිවා. ඒ කියන්නෙ අපේ අම්මලා ගෙදරින් පිට උන සැණින් අපිව ගෙන්න ගන්න කියලා ලොකු මාමලගෙ ගෙදරට පණිවිඩේ දීලා.

" එන්නනං ඕනෙ බං. ඒත් මේ ආච්චි මොකක්දෝ මන්දා ෆිල්ම් එකක් බලන්න ඕනෙ කියනවනෙ. "

" ඔය අර සිරසෙ යනවයි කිව්ව ෆිල්ම් එක වෙන්න ඇති. අපේ නංගිත් ඒක බලන්න ඕනෙ කියලා අද කොහෙවත් යන්නත් බෑ කිව්වා. ආච්චිව මෙහෙ එක්ක වරෙන්. දෙන්නා ජෝඩු දාලා බලන්නෙ නැතෑ. "

ඒ කෝල් එකෙන් පස්සෙ මං ආච්චිවත් ලෑස්ති කරගෙන සුදූවත් අරන් බයික් එකේ නගින්න ලෑස්ති උනා.

" මේ අඩි දහය යන්න ඕක මොකටද බොල චූටි පුතේ...? පයින් යන්න බැරුවයෑ..."





ආච්චි කොහොමටත් බයික් එකේ යන්න හරි බයයි. හදිස්සි ගමනක් යන්න බලෙන්ම වගේ නග්ග ගත්තත් බයික් එක පදින එකාගෙ හුස්ම ටික හිරවෙන තරම් වේගෙන් ඌව මිරිකලා අල්ල ගන්නවා.

" අනේ දෑස් අයියා... බබාට බූම් එකේ යන්න ඕනෙ..."

පොඩි කෙල්ල කිව්වෙ ආච්චි දිහා රවලා බලන ගමන්.

" එහෙනං උඹ දරුවව අරන් ප්‍රවේසමට පලයං. මං මේ ටික පයින් එන්නං..."

අතේ තිබුණු කබල් කුඩේ දිගෑරගත්තු ආච්චි පාරට බැස්සා.

මං සුදූවත් ඉස්සරහින් ඉන්දගෙන බයික් එක පාරට ගද්දිම මට ඇහුනෙ මුදලාලි අන්කල්ගෙ කටහඬ. නිකම්ම නෙමෙයි... එයා අම්මා මෝ නැතුව කාටදෝ මන්දා ලයිම් කට් කරනවා.

" අනේ මන්දා... තොපිලා වගේ හෝඩි පොතේ අකුරක් නොදන්න එවුන්ට බත් තම්බ තම්බ ගිල්ලනවට මේවා මට හොඳ පාඩම්.... "

ඒ සද්දෙට මං නිකමට වගේ මුදලාලි අන්කල්ලගෙ ගේ දිහා බැලුවා.... අප්පට සිරි... ගෙදර දොර ගාව ඉඳලා පාරට වෙනකල් ගෑණු පෝළිමයි... අන්කල් මහිලා සමිතියක්වත් පටන් ගන්න යනවද මන්දා. අසල්වාසීන්ට අකරතැබ්බයක් වෙලා තියෙද්දි ඇස්කන් පියාගෙන පිටවෙන එක හරි නැනෙ. ඉතිං... මං බයික් එක මුදලාලි අන්කල්ලගෙ ගේට්ටුව ඉස්සරහින් නතර කළා.

" අන්කල්... මොකක්ද සීන් එක...? ඇයි මේ කට්ටිය පෝළිම් ගැහිලා...?

" බලන්න දෑස් පුතා... මේ අසමත්ජාතියා මගේ සායම

ඇරලනෙ... ''

එයා ඇස් කොණෙන් පෙන්නුවෙ සරාව. පොර ඇටි කෙහෙල් කාපු උගුඩුවා වගේ බිම බලාගෙන ඇඹරි ඇඹරි ඉන්නවා. මිනිහා උදේ පාන්දරම මොන ජල්ලියක් අල්ලලද දන්නෙ නෑ.

'' මොකක්ද දැන් වෙලා තියෙන්නෙ...? ''

මං ආයෙත් වතාවක් ඇහුවෙ වෙච්ච දේ හිතාගන්න බැරුව.

'' මේකයි පුතා උනේ... මගේ පරණ ලොරියෙ බොඩිය දැන් සැහෙන්න අබලන් වෙලා. ඉතිං මං ඒක විකුණලා දාන්න හිතාගෙන පත්තරේට දැන්වීමක් ලියලා මේකගෙ අතේ ඒක පත්තර ඒජන්සියට ඇරියා. මේ ගොන් හරකා එතන ෆෝම් එක පුරවලා තියෙන්නෙ වචන මාරු කරලා.... ''

'' ඒ කිව්වෙ...? ''

අන්කල් මට පත්තර පිටුවක් දික් කලේ දත්මිටි කන ගමන්. ඒකෙ එක දැන්වීමක් තිල් පෑනෙන් රවුම් කරලා තියෙනවා දැකලා මං ඒක තප්පරේට දෙකට කියෙව්වා.

'' බොඩි ලොරියක් විකිණීමට තිබේ.... ''

දැන්වීම පළ වෙලා තිබුණෙ එහෙම. මට මැරෙන්න හිනා.

'' මං උදේ නැගිටලා බලද්දි ගමේම ඉන්න ගෑනු ටික අපේ ගේ ඉස්සරහා... ''

අන්කල් අර ගෑනු පෝළිම දිහා බලන ගමන් ආයෙත් සරාට බනින්න පටන් ගත්තා.

'' කමක් නෑ අන්කල්... උදේ පාන්දර දොර ඇරිය ගමන් මේ වගේ සුන්දර ලලනාවො ටිකක් දකින්න ලැබීමත් වාසනාවක්





කියලා හිතලා වැඩේ ගොඩින් බේරලා දාන්න...''

මං අන්කල්ගෙ හිත හැදෙන්න වචන දෙක තුනක් කියලා සුදුවත් අරන් එතනින් මාරු උනා.

'' සුදූ... කොහොමද...? තාත්තිලා එක්ක යන්නෙ නැතුව හොරා වගේ නැවතුනා නේද? ''

අපි එහෙ ගේට්ටුවෙන් ඇතුල් වෙද්දිම ඉස්සරහට දුවගෙන ආවෙ රුවන්ති නැන්දා. එයා සුදුව බයික් එකෙන් උස්සලා බිමට ගත්තා.

'' මං ඔකු අම්මා බලන්න ආවා.... ''

කෙල්ල කිව්වෙ කටත් උල් කරලා.

'' එහෙනං එන්නකො... ලොකු අම්මා බබාට අද රසම රස බයියන් එකක් හදලා දෙන්නම්. ''

කට්ටිය එහෙට මෙහෙට වෙනකල් ඉදලා මං ගිවාගෙ කාමරේට රිංගගත්තා.

'' කොහෙද බං උඹලගෙ ගෙදර අය පේ වෙලා ගියේ...?''

ඌ කිව්වෙ සුපුරුදු විදියට කම්පියුටරේට මූණ ඔබාගෙන ඉන්න අතරතුරේ.

'' අපේ තාත්තගෙ යාළුවෙක්ගෙ මොකක්දෝ මන්දා මැගසින් එකක් දොරට වඩිනවලු... ''

'' ඇයි බං හැම මළ ඉලව්වක්ම දොරට වඩින්නෙ...? ''

ගිවන්තගෙ කතාව මොකක්ද කියලා මට තේරුණේ නෑ.

'' ඒ කිව්වෙ...? ''

'' නෑ මං කිව්වෙ... දොරට නැතුව ඕවට බැරිද

ජනේලෙකට උළුවහුවකට වගේ දේකට වඩින්න... පොඩි වෙනසකටත් එක්ක.... ''

මූටනං හොඳටම පිස්සු... නැත්තං මේ වගේ විකාර කතා කියවයියැ.

'' ඒක නෙමෙයි දෑස්... මොනවද අද දවසේ ප්ලෑන්ස්...? අද මගේ යාළුවෙක්ගෙ බර්ත්ඩේ එකක් තියෙනවා. යමුද ඒ පැත්තෙ ගිහින් එන්න... ''

ජනේලෙට වඩින එක සම්බන්ධයෙන් මං අදහස් ප්‍රකාශ කලේ නැති නිසා මිනිහා මාතෘකාව වෙනස් කළා.

'' කවුද උඹේ ඔය මං නොදන්න යාළුවා...? ''

'' කෙල්ලෙක්... කෙල්ලෙක්... එෆ් බී එකෙන් සෙට් උනේ... ඒකි මට ඉන්වයිට් කළා ලන්ච් එකට එන්න කියලා. ඔන්න ඔහෙ අපි ගිහින් කාලා බීලා එමු මචං. ''

ගිවන්තට නොදන්න කෙල්ලෙක් උනත් කමක් නෑ කන්න දෙනවානං.

'' ඒකි එන්න කිව්වෙ උඹට මිසක් මට නෙමෙයිනෙ. ගියාට පස්සෙ මට කිව්වොත් එළියෙන් වාඩි වෙලා ඉන්න කියලා... හයියෝ... විලි ලැජ්ජාවෙ පණ යනවා. ''

'' එහෙම වෙන්න දෙනවද මං...? වරෙන්කො... ගිහින් බලලා එමු. ''

'' අනේ මචෝ... තරහා වෙන්න එපා. උඹ ඔය කියන ගමන ගිහින් දෙයියනේ කියලා පරිස්සමට ගෙදර වරෙන්. මං මෙහෙට වෙලා දූහැමින් සෙමින් රාජ්‍යය පාලනේ කරන්නම්...''

ගිවාට නොවදිනා වැඳුම් වැඳලා මං ගමන මගෑරියා.





අම්මා මග දිගටම කියලා ගියේ එයාලා එනකල් මෙහෙට වෙලා ඉන්න කියලා. මං කොහෙහරි ගියොත් ඒක මුලින්ම අපේ අම්මගෙ කනේ තියන්නෙ සුදූ.

දවසේ මුලින්ම ඔළුවට ආපු සිතුවිල්ල ක්‍රියාත්මක කරන්න හිතාගෙන මං ගිවාගෙ ලැප් එක ඔඩොක්කුවට අරගත්තා.

'' මචං... මේ කිට හොඳයිද...? ''

ඌ ටික වෙලාවකට පස්සෙ ඇහුවෙ මැක්සා කිට් එකක් ඇඳගෙන.

'' එළ... අපේ ආච්චි කියන විදියට උඹ දූන් සොලමන් බාන් වගේ... ''

'' මචෝ... එහෙනං උඹේ බයික් එකේ ගිහින් මාව හන්දියට දාලා වරෙන්කො... ''

'' අයියෝ... මොනාද වස්තුවේ.... උඹ බයික් එක අරන් වද නොදී පලයංකො... ''

මං කෑ ගැහුවෙ ෆේස් බුක් එකට ලොග් උන ගමන්ම ඌ වද දෙන්න ගත්තු නිසා.

'' මං තනියම ඕක අරගෙන යන්න ගියොත් අපේ අම්මා බර බරේ දානවා බං... උඹ දන්නවනෙ. එහෙම උනොත් මටත් අකුලගෙන ගෙට වෙලා ඉන්න තමයි සිද්ධ වෙන්නෙ. අනේ පුතේ... මාව හන්දියට දාපංකො... ''

ලස්සන කිට් එකක් ගහලා කොණ්ඩෙ ජෙල් ගාලා බෙකම් වගේ හදලා නහය ගලෝගෙන යන තරමට පර්ෆියුම් උලාගෙන ඉන්න මේ කොල්ලා ලැජ්ජ නැතුව මං ඉස්සරහා පින්සෙණ්ඩු වෙනවා. ෂිට්... පිරිමිකමටත් ලැජ්ජයි.

" අයියණ්ඩි බිය නොවන්න.... හන්දියට යන හැටි මං පෙන්නන්නම්.... "

උගේ අඳෝනාව අහගෙන ඉන්න බැරිම තැන මං යතුර අතට අරන් නැගිට්ටා.

" දැස් අයියා.... "

අපි දෙන්නා කාමරෙන් එළියට එද්දිම සුදූ සල්ලි කොලේකුත් අතේ ගුලි කරගෙන අපේ ඉස්සරහට දුවගෙන ආවා.

" ඔකු අම්මි බබාකියු සෝස් එකක් ගේන්න කුවා. ආ..."

පොඩි එකී ගේන්න කිව්ව හරුපෙ මටනං හරියට තේරුණේ නෑ.

" බබාකියු සෝස්....? "

මං ගිවන්ත දිහා බැලුවෙ ඒ අමුතු ජාතියෙ සෝස් එක මොකක්ද කියලා දැනගන්න.

" බාබකියු සෝස් වෙන්නැති බං අම්මා කියන්න ඇත්තෙ..."

අප්පට සිරි... රුවන්ති නැන්දා බාබකියු පාරක් දාන්නද හදන්නෙ... එළනෙ.

" උඹ මොකටද බං අද පිටින් කන්නෙ... ගේ ඇතුළෙම බාබකියු දාද්දි...? "

මං කිව්වෙ ගෙදරින් පිට නොයන්න ගත්තු තීරණේ ගැන සතුටු වෙන ගමන්.

" අපේ අම්මගෙ බබාකියු එක මං නිතරම කනවා. ඒ නිසා අවුලක් නෑ. මෙන්න මෙහෙ වරෙන් යන්න. "

සුදූගෙ අතේ තිබුණු රුපියල් දාහෙ කොලේ ගත්තු මං





බයික් එක ස්ටාට් කර ගත්තා.

* * * * * * *

දවස් දෙක තුනක් තිස්සෙම මං හිටියෙ ෆේස් බුක් එකේ. උදේ ඉඳලා රෑ වෙනකල් ඔන් ලයින්. ඒ හැමදාකම වගේ දෑහැමිත් මාත් එක්ක චැට් එකේ හිටියා.

" නංගි... මට ඔයාගෙ ෆොටෝ එකක් බලන්න ආසයි..."

රටේ නැති දාහක් දේවල් ගැන කතා කරලා කෙල්ල උපරිමේට ෆිට් උනාට පස්සෙ මං හිතේ තියෙන ආසාව එළියට දැම්මා.

" අනේ අයියා... මං හරි කැතයි... ෆොටෝ එකක් දැක්කොත් ඔයා ආපහු මාත් එක්ක කතා කරන්නෙත් නැති වෙයි. "

ඒකි හැරෙන තැපෑලෙන් රිප්ලයි එවලා තිබුණෙ ඒ විදියට. ගිවන්ත කිව්වා වගේම දැහැමි මේ කරන්නෙ බොරුවක්ද...?

" ඔයා මට ෆොටෝ එකක් එවන්නෙත් නෑ... කෝල් කරන්නෙත් නෑ... ස්කයිප් එන්නෙත් නෑ... ඔයාට මාව සැකනං අපි මේ යාළුකම නතර කරලා දාමු... "

මේකට කෙල්ල කෙලින් උත්තරයක් නොදුන්නොත් වැඩේ අතෑරලාම දානවා කියලා හිතාගෙන තමයි මං ඇහුවෙ.

" අනේ.... "

එච්චරයි... දෑහැමිගෙ උත්තරේ එච්චරයි. යකා නැග්ග මං ලොගවුට් උනා.

ඊටපස්සෙ දවස් ගාණක්ම එෆ් බී ගියේ නෑ. අනික ලොග් උනත් මං හිටියෙ ඕෆ් ලයින්. තත්පරේකට දෙකකට ගිහින් බලලා එනවා දෑහැමිගෙන් මැසේජ් එකක් හරි තියෙනවද කියලා.

දවස් දෙකක් විතර ආඩම්බරේට සද්ද නොකර හිටපු කෙල්ල ඊට පස්සෙ දිගට හරහට මැසේජ් එවලා තිබුණා. මට මතක් උනේ ගිවන්ත නිතරම කියන කතාව. අපි කෙල්ලන්ගෙ පස්සෙ ගියාම උන් අපිව පයිසෙකට ගණන් ගන්නෙ නෑ වගේ ඉදලා අපි සද්ද නැතුව ඉද්දිදි උන් ලෝකෙ පීරගෙන හරි අපිව හොයනවා කියන එක.

කොහොමහරි මගෙන් උත්තරයක් නැති නිසා වෙන්නැති කෙල්ල මට අන්තිමේදි එයාගෙ ෆොටෝ එකක් එවලා තිබුණා. ඒ ෆොටෝ එකේනං හිටියෙ මට පූර්ව දැනුම් දීමක් කරලා තිබුණු විදියෙ කැත කෙල්ලෙක් නෙමෙයි. දැක්කම සුමානයක් විතර බඩ පිරෙන ජාතියෙ සිරා ඩයල් එකක්. දැහැමි කියන නමටම උචිත අහිංසක කෙල්ලෙක්.

මේ තත්ත්වෙ තනියම හිතේ තියාගෙන ඉන්න බැරි උන පාර මං සිද්ධිය ගිවන්තට කිව්වා.

" මං කිව්වෙ බොරුද මස්සිනා... උඹ දැහැමි ගැන ඕවර් යනවා. කෙල්ල කරන්නෙ බොරුවක් කියලා තේරෙනවනෙ. ඒ නිසා ඕක අතෑරලා දාපං. වැඩිය හිතන්න යන්න එපා. "

" ඒකි කරන්නෙ බොරුවක් කියලා මට හිතෙන්නෙ නෑ ගිවා. ඒකි මට ෆොටෝ එකකුත් එවලා තිබුණා. අනික කෙල්ල කතා කරන්නෙ ෆුල් සීරියස්.... "

" කතා කරන්නෙ කිව්වට ඒකි උඹට කෝල් කරන්නෙ නැහැනෙ. චැට් කරනවා විතරනෙ. උඹ ඒක වරදවා වටහාගෙන. ඕවා හිතට ගන්නෙපා. මේ මං වගේ රිලැක්ස් පිට හිටපං දෑස්... "

ගිවන්තගෙ කතාවට මගෙන් ලොකු හුස්මක් පිට උනේ මං බලාපොරොත්තු උන විදියෙ ප්‍රතිචාරයක් උගෙන් නොලැබුණු





නිසා වෙන්නැති.

" උඹට කෙල්ල ගැන හොයන්නම ඕනෙද...? "

" ඔව්... "

මං කෙටියෙන් උත්තර දුන්නා.

" රයිටෝ.... එහෙනං පෙන්නපං ඔය කියන පින්වන්ත මූණු පොඩ්ඩ... "

ඒ වෙලාවෙ අපි දෙන්නා හිටියෙ අපේ ගෙදර මගේ කාමරේ ඇතුළෙ නිසා මට ගිවන්තට ෆොටෝ එක පෙන්නන වැඩේ වැඩිය අමාරු උනේ නෑ.

" මේකි... "

" ඔව්... උඹ මෙයාව අඳුරනවද...? "

" මේ කෙල්ලව මං කොහෙදි හරි දැකලා තියෙනවා. ඒත් ඒ කොහෙදිද කියලා මට මීටර් වෙන්නැනෙ බං. "

ගිවන්තයා ඇස් ගෙඩි දෙකත් ලොකු කරගෙන දැහැමිගෙ ෆොටෝ එක දිහා කන්න වගේ බලාගෙන කිව්වා.

" අපි මේකෙ ප්‍රින්ට් අවුට් ටිකක් ගහලා අර බෝක්කුව ගාව හන්දියෙ අලවමු සොයා දෙන්න කියලා... ඕනෙනං උඹේ ෆෝන් නම්බර් එකත් දාමු... මොකෝ කියන්නෙ...? "

ගිවන්ත ඇහුවෙ උෟට නිකං සුපර් ප්ලෑන් එකක් මතක් උන තාලෙට. ඇයි දෙයියනේ මූට ඔළුවෙ අමාරුවක්වත් හැදිලද...? කෙල්ලෙක්ව සොයා දෙන්න කියලා මගේ ෆෝන් නම්බර් එක බෝක්කුව ගාව හන්දියේ එල්ලුවොත් අපේ ගෙදර උදවිය මට ෆ්‍රී ඔෆ් චාර්ජ් වීසා හදලා දෙයි අංගොඩට..

" උඹට පිස්සුද යකෝ...? එහෙම උනොත් මං කොහොමද

රෙද්දක් ඇදගෙන පාරෙ බැහැලා යන්නෙ...? ''

'' උඹ මොන ඉලව්වකටද බං රෙදි ඇඳගෙන යන්නෙ...? රෙදි අඳින්නෙ ගෑණුනෙ. උඹ දෙයියනේ කියලා කලිසමක් ඇඳගෙන නම්බු පිට පලයං.... ''

මෙකගෙ කතා වලට මට හොම්බට අනින්න තරම් කේන්තියක් ආවා.

'' හරි... හරි.... ඔකට ඉතිං ගෑණු ළමයා වගේ මූණ එල්ලගන්න ඕනෙ නෑනෙ මල්ලි. මං දවස් දෙකක් ඇතුළත කෙල්ල ගැන හොයලා උඹට ගෙදරටම ඇවිත් පණිවිඩේ කියන්නම්... දැන් මට තුවායක් දීපං පොඩි වොෂ් එකක් දාගන්න... ''

හිතේ තිබුණු තරහටම මං ඇඳුම් රැක් එකේ පහළින්ම දාලා තිබුණු අයින් කරපු පරණ තුවාය අරන් උඟට දුන්නා.

'' මේක දූන් නෙමෙයි... රැට තිබ්බානං මරු... ''

'' රැට...? ''

'' ඔව්... බලපංකො... මේක හොඳයි රාමලාන් සඳ බලන්න...''

ගිවන්ත කිව්වෙ තුවායෙ තිබුණු තඩි හිලකට ඇහැ තියන ගමන්. කොයි තරම් ඔරවගෙන ඉන්න හැඳුවත් ගිවා බලන් හිටපු තාලෙට ඇත්තමයි මට හිනා ගියා.

'' චූටි පුතේ... චූටි පුතේ... අනේ මෙහෙ වරෙන්කො කොල්ලො ඩිංගකට... ''

ඒ බෙරිහන් දුන්නෙ ආච්චි. එයා කතා කරන්නෙ මොකක්හරි කුණු කේස් එකකට කියලා දන්න නිසා ගිවා අඩිබිඩි ගාලා බාත්රූම් එකට රිංගලා දොර වහගන්නවා මං බලාගෙන.





එතකොටම අපේ ආච්චි මගේ කාමරේ දොර ළඟ.

'' අනේ චූටි පුතේ... ආන් අර ටෙලිවිසොන් අටමගලෙ වැඩ කරන්නෙ නෑ. අනේ පුතේ ඒක ඩිංගක් බලහන්කො... ''

ආච්චි කතා කළේ හරිම දුක්මුසු ලීලාවෙන්.

'' ඇයි ආච්චි... ඊයෙ රෑත් ඒක යස අගේට වැඩ කළානෙ.''

'' ඒක තේනන්ං මමත් කියන්නෙ. අපරාදෙ.... මං මේ ඕල් හිස් වැඩසටහන බලන්න හැදුවා විතරයි... ''

'' ඕල් හිස්...? ඒ මොකක්ද ආච්චියෙ....? ''

'' ඇයි බං අර පරණ සින්දු යන වැඩසටහන...''

ආහ්.... අපේ ආච්චි ඕල් හිස් කියලා තියෙන්නෙ ඕල්ඩ් හිට්ස් කියන එකටනෙ.

'' ඉක්මනට ඇවිත් ඒක හදලා දීපංකො පුතේ... මෙලහකටත් සින්දු දෙක තුනක්වත් ගිහින් ඉවර ඇති...''

ආච්චි නහයෙන් අඬන ගමන් මට රිමෝට් එක දුන්නා. ම්හ්... දන්න සෙල්ලම් ඔක්කොම දැම්මත් වැඩක් උනේ නෑ. ආච්චි කිව්වා වගේම මේ ටෙලිවිසොන් අටමගලෙට මොකාක් හරි අකරතැබ්බයක් වෙලා තමයි.

'' මේකෙ ලයින් එකවත් ඩිස්කනෙක්ට් කරලද දන්නෑ ආච්චියෙ. නැත්තං එකපාරටම වැඩ නොකර යන්න හේතුවක් නෑනෙ... ''

මං එහෙම කිව්වෙ අපේ ගෙදර තිබුණෙ ඩයලොග් ටීවී කනෙක්ෂන් එකක් නිසා. ඒත් අපේ අම්මා සාමාන්‍යයෙන් එහෙම බිල් ඇරියස් වෙන්න තියෙන්නෙ නෑ. තාත්තගෙ පොකට් එකට හොරෙන් විදලා හරි වෙලාවට බිල් ටික ගෙවනවා.

'' හිටහංකො මං කෙලීගෙන් අහන්න මේකෙ බිල ගෙව්වෙ නැද්ද කියලා... ''

වෙලාවට සින්දු ටික බලාගන්න බැරි උන දුකටද මන්දා ආච්චි රෙද්දත් කරට අරගෙන අම්මව හොයන්න පටන් ගත්තා.

ආපහු සැරයක් වයර් ටික චෙක් කරද්දි තමයි මට සිද්ධිය මීටර් උනේ. ඇන්ටනා වයර් එක කෑලි දෙකකට එල්ලෙනවා. ඒකෙ චූටි චූටි කුඩු බිම හැලිලා. ඒ කියන්නෙ ලයින් එක ඩිස්කනෙක්ට් කරලා තියෙන්නෙ මීයෙක්.... එහෙම නැතුව ඩයලොග් එකෙන් නෙමෙයි...

* * * * * * *



# 03

'' දෑස්... අර බලනවකො හලෝ... ''

ඇස් දෙකත් පියාගෙන ආතල් එකේ නිදි දෙව්දුවට උම්මා එකක් දෙන්න හදනකොටම අපේ අක්කා මගේ උරහිසෙන් අල්ලලා හොල්ලන්න ගත්තා.

'' මොකද හලෝ...? ''

අක්කගෙ හලෝ බාසාවෙන්ම මං ඇහුවෙ තඩි ඇනුමක් අරින ගමන්.

'' මේ තරම් ගති ෆිල්ම් එකක් යන වෙලාවෙත් අර ඉස්සරහා ඉන්න මනුස්සයා නිදිනෙ. මහා මුස්පේන්තුවෙක්... ''

අක්කගෙ ඒ කතාවෙන් තමයි මං පියවි සිහියට ආවෙ. ඒ කියන්නෙ අපි මේ ඉන්නෙ ෆිල්ම් හෝල් එක ඇතුළෙ නේද...?

ඔව්නෙ... අක්කටයි ආච්චිටයි මොකක්දෝ මන්දා ෆිල්ම් එකක් බලන්න ඕනෙ කියලා කුරු කුරු ගාලා අන්තිමේදි තනියට මාවත් ඇදගෙන ආවනෙ. ඒ දෙන්නට ෆිල්ම් බලන ආසාව තිබුණට මටනං ඒක ඒ තරම් ඉන්ටරස්ට් උනේ නෑ. ඉතිං මං ආව වෙලාවෙ

ඉදලා කලේ නිදා ගත්තු එක.

" ඇහුනද...? "

අක්කා ආයෙත් තට්ටුවක් දැම්මා.

" මොනවද...? "

" මං කිව්වෙ මේ තරම් ගති ෆිල්ම් එකක් යද්දිත් අර මනුස්සයා නිදි කියලා.... "

" ඉතිං හලෝ ඕක කියන්නද තමුසෙ මාව ඇහැරෙව්වෙ...?"

මං ඇහුවෙ පත ඇනුමකුත් අරින ගමන්.

" ඒ කියන්නෙ හලෝ තමුසෙත් හිටියෙ නිදාගෙනද...?"

අක්කා අඩ අඳුරෙ ඉඳගෙන මගේ දිහා බැලුවෙ අමුතු සතෙක් දිහා බලනවා වගේ. මං කිව්වෙ ඇත්තනෙ. ඇහැරගෙන ඉන්න තිබ්බා ළඟපාත බලන්න කියලා ලස්සන කෙල්ලෙක්වත් ඉන්නවානං. ඉන්න කෙල්ලොත් සේරම ඉන්නෙ කොල්ලන්ට තුරුල් වෙලානෙ.

" ගණන් ගන්න එපා. ඒ කොල්ලත් මං වගේ බලහත්කාරෙන් කිඩ්නැප් කරගෙන ආව එකෙක් වෙන්න ඇති. "

මගේ කතාවට අක්කා ගස්සලා අහක බලාගත්තා. අපි බයවෙයි ඕවට...

අපේ ආච්චිත් දත් නැති කට ඇරගෙන මෙලෝ සිහියක් නැතුව ස්ක්‍රීන් එක දිහා බලාගෙන. ඉතිං... මං ආයෙත් ඇස් දෙක පියාගත්තා.

" ඔයි... කුම්භකරණයා... නැගිටිනවා. ෆිල්ම් එක ඉවරයි..."





අක්කගෙ සද්දෙ දෙවෙනි පාර ඇහුණෙ මං හන්තානෙ නගින්න ඔන්න මෙන්න ඉන්දැද්දි.

" අම්මෝ... ඇති යන්තං... ඉවරද මල ඉලව්ව....? "

මං සීට් එකෙන් නැගිටිද්දි ආච්චි බුරුස් ගාලා නහය උඩට අදින සද්දෙ මට ඇහුණා. අඩේ... අපේ ආච්චි අඬනවා නේද...?

" මොකක්ද සීන් එක...? "

මං ඇහුවෙ අක්කගෙන්.

" අන්තිමේදි කොල්ලා මළා... "

අක්කත් උත්තර දුන්නෙ ආච්චි වගේම සෝක මූඩ් එකකින්.

" කොයි කොල්ලද...? "

මං ඇහුවෙ උඩ බිම බලන ගමන්. ඇයි යකඩෝ මං නොදැනුවත්ව මළගෙයක් උනා කියන්නෙ ඒක සී අයි ඩී එකට දෙන්න වටින කේස් එකක්නෙ.

" ෆිල්ම් එකේ අප්පා.... "

දෙයියනේ මේ ෆිල්ම් එකේ චරිතයක් මැරුණ එකටද අපේ ආච්චි කැහි හොටු පෙරාගෙන අඬන්නෙ...? මිනිස්සු දන්නවානං පස්ස පැත්තෙනුත් හිනාවෙයි.

" අක්කෙ මේ... ඔයා කොයි එකටත් ආච්චිගෙ අතින් අල්ලගෙන ඉස්සර වෙන්න... මං ටිකක් සයිඩ් එකට වෙලා එන්නම්..."

ඕං ඒ පාර අක්කා ආයෙත් ඇස් ලොකු කර ගත්තා හරියට ඇයි කියලා අහන්න වගේ....

'' ඇයි දෙයියනේ... මෙයා මෙහෙම හොටු පෙර පෙර ෆිල්ම් හෝල් එකෙන් එළියට යද්දි දකින මිනිස්සු හිතයි ආච්චිට මේක ඇතුළෙදි මොකාක් හරි අතවරයක් වෙලා කියලා. ඒක මේ කොල්ලගෙ වරිතෙට හොඳ නෑනෙ... ''

'' අනේ මගේ කට... තමුසෙ ආච්චිට කරන අතවර මං නොදන්නවයැ... මෙහෙ එනවා කට වහගෙන... ''

අක්කා ගස්සගෙන යන්න ගියා. මොකක්ද යකෝ ඒ හරුපෙ තේරුම...? ආ... මෙයා සමහරවිට කියන්න ඇත්තෙ මං ආච්චිට අර පට්ට කළුවරේ උම්මා එක දීපු සිද්ධිය ගැන වෙන්න ඇති. පෙර වැරදි තිබීම අවාසියට කරුණක් කියලා කියන්නෙ නිකමටයැ. මමත් කට වහගෙනම අක්කලා පස්සෙන් ගියා.

අපි පාරට ඇවිත් බස් එකේ නගින්න හදනකොටම මං දැක්කෙ හීනෙකින්වත් දකින්න බලාපොරොත්තු නොවුන දෙයක්. අපි නගින්න ලෑස්ති උන බස් එකේ අන්තිම සීට් එකේ කොල්ලෙක් එක්ක කයියක් දාගෙන හිටියෙ වෙන කවුරුවත් නෙමෙයි අපේ චූටි. ඒ කිව්වෙ ගිවන්තගෙ නංගි.

'' අපෝ.. මේ බස් එකේ සෙනඟ. අපි අනිත් එකේ යං...''

අක්කයි ආච්චියි බස් එකට කිට්ටු වෙද්දිම මං පස්ස ගැහුවා. මොකද චූටිව මේ දෙන්නා දැක්කානං කෙල්ල අද ගෙදර ගිහින් ඉවරයි.

'' අනේ ඔව් ලොක්කියෙ... මගෙත් හන්දිපත් රුදාව. අපි ඉඳගන්න පුළුවන් එකක යං... ''

ආච්චිත් කත් කෙඳිරි ගාද්දි බස් එක ඇද්දුවා.

කොහොමහරි අපිට යන්න උනේ ඒ බස් එක ගිහින් පැය





කාලකට විතර පස්සෙ සම්ප්‍රාප්ත උන හුටු හුටු ලඩියක. ඒක අපේ ගේ ගාව හන්දියෙන් නවත්තද්දි අපි තුන්දෙනාටම පිටගැස්ම හැදිලා ඉවරයි.

'' අක්කෙ... ඔයා ආච්චිත් එක්ක ගෙදර යන්න. මං මෙහෙම්ම සමරෙ මාමලගෙ දිහාට ගොඩවෙලා එන්නම්... ''

පාරෙ ටික දුරක් ඇවිදගෙන එද්දි මගේ කකුල් ඉබේටම පළවෙනි පටුමග දිහාට හැරුණා.

'' ඔව් ඉතිං... මෙයා හැමදාම මොකාක් හරි බොරුවක් හදාගෙන යනවා පොත අත්සන් කරලා එන්න... ''

'' පොත...? මොකක්ද යකඩෝ ඒ මං නොදන්න පොත...?''

මං එහෙම ඇහුවෙ අක්කව නග්ගන්න හිතාගෙන නෙමෙයි. ඇත්තටම අක්කා ඒ කියපු වහෙන් ඔරෝ කතාව තේරුම් ගන්න බැරුව. ඒත් එයා ඒකට උත්තර නොදී ආච්චිගෙ අතත් අල්ලගෙන ඉස්සර උනා. මමත් ඒ ගැන හිතන එක නතර කරලා දාලා ගිවන්තලගෙ දිහාට හැරුනෙ චූටි ගෙදර ඇවිත්ද කියලා දැනගන්න.

'' ආ.... දැස් පුතා... ''

ඒ හිනා වෙවී ඉස්සරහට ආවෙ රුවන්ති නැන්දා.

'' කෝ නැන්දෙ ගිවා...? ''

මට දැනගන්න ඕනෙ චූටි ගැන උනත් මං ඇහුවෙ ගිවන්තව.

'' ඕං උදේ ඉඳලා ගේ අස්සට රිංගගෙන අහස පොළොව ගැටගහන්න වගේ කල්පනා කරනවා.... අනේ මන්දා මොකක්හරි අසනීපයක්වත් හැදීගෙන එනවද කියලා... ''

රුවන්ති නැන්දා කිව්වෙ මහා පදම කතාවක්. ගිවන්තයා කිසිම දෙයක් ඕනවට වඩා කල්පනා කරන එකෙක් නෙමෙයි.

'' මං ගිහින් බලන්නම්කො නැන්දෙ.... ''

රුවන්ති නැන්දා තව මොනවාහරි කියන්න ඉස්සර වෙලා මං ගිවාගෙ කාමරේට රිංගගත්තා. නැන්දා කිව්වා හරි... මිනිහා ඇඳේ උඩු කුරුන්දන් ගහගෙන කල්පනා ලෝකෙ පීනනවා...

'' කල්පනා ලොව මල් වනේ....

සිහින රජ දහනේ..... ආදරේ.... // ''

මගේ සද්දෙට ගිවා උඩ ගියා. ඌ හිතන්න නැතුව ඇති මම මේ වෙලාවෙ අපනයා වගේ මෙතනට කඩන් පාත්වෙයි කියලා.

'' උඹ ආවෙ හොඳ වෙලාවට මචං... මං අරක හොයා ගත්තා. ''

ඌ ඇඳේ ඉඳගත්තෙ කට පුරෝලා හිනාවෙන ගමන්. රුවන්ති නැන්දගෙ කතාව ඇත්ත. මූටනං දෙයියන්ගෙ හාල් කැවිලා. නැත්තං මේ විදියට කල්පනා කරන්නයි හිනා වෙන්නයි තියා ගනීද...? අනික මොනවද හොයා ගත්තත්ලු. ඒකත් අර ඇල්බට් අයන්ස්ටයින් මහත්තයා නාන බේසමේ බැහැලා ඉන්න වෙලාවෙ සාපේක්ෂතාවාදය හොයා ගත්තා වගේ දෙයක්ද දන්නෙ නැහැ.

'' මොකක්ද හොයා ගත්තෙ...? ''

'' දැහැමි කියන්නෙ කවුද කියලා මං හොයා ගත්තා...''

අප්පද බොල... ගිවා දෙයියෙක්නෙ. ඒත් මූ මේකත් පිස්සුවෙන් කරන දෙඩවිල්ලක්ද දන්නෙ නෑ.

'' කවුද දැහැමි කියන්නෙ...? ''





මං ඇහුවෙ හදිස්සියක් උනොත් ඇඳෙන් නැගිට්ටින්න බලාගෙන.

'' දැහැමි කියන්නෙ උඹෙ කෙල්ලනෙ... ''

මිනිහා කිව්වෙ හරියට මාස තුනක පර්යේෂණයකින් පස්සෙ මදුරුවා බිත්තර දාන්නෙ වතුරෙ කියලා හොයාගත්තා වගේ කතාවක්. දැහැමි කියන්නෙ මගේ නිල නොලත් සූකිරි බෝලෙ නේන්නං... ඕකෙ ඉතිං අමුතුවෙන් හොයාගන්න දෙයක් ඉතුරු වෙලා තියනවයැ...

'' ඒකි අපේ චූටිගෙ යාළුවෙක්. ඉන්නෙ වීදියවත්ත පැත්තෙ. කතා දෙකක් නැහැ කෙල්ල උඹ අර පෙන්නුව ෆොටෝ එකේ හිටපු කෙල්ලම තමයි.... ඒ කියන්නෙ ඒකි දැහැමිම තමයි...''

අම්මේ... දැනුයි මගේ හුස්ම හරියට වැටෙන්න පටන් ගත්තෙ. ඒ දැහැමි ගැන විස්තර හොයාගත්ත නිසා නෙමෙයි. ගිවාට පිස්සු නෑ කියලා තේරුණ නිසා.

'' රුවන්ති නැන්දා කිව්වෙ උඹ උදේ ඉඳලා කාමරේට වෙලා අහස පොළොව ගැට ගහන්න කල්පනා කරනවා කියලා. දැහැමි ගැනද උඹ ඔය තරම් කල්පනා කළේ...? ''

'' නෑ බං... අපේ චූටි ගැන... ''

'' මොකක්... චූටි ගැන....? ''

'' ඔව් දෑස්... චූටි ළඟදී ඉඳලා හරි වෙනස්. ඕන වෙලාවක ෆෝන් එකෙන් කාත් එක්කද කුටු කුටු ගානවා. තනියම පැය ගණන් කල්පනා කරනවා. හිටපු ගමන් ඇස් වල කඳුළු පුරෝගෙන බලාගත්තු අත බලාගෙන ඉන්නවා. ''

මමත් කඩිමුඩියෙ මෙහෙ දුවගෙන ආවෙ චූටි ගැන

ආරංචියක් අරගෙන නේන්නං. මේකට පිස්සු හැදිලා කියපු නිසා මට ඒකත් අමතක උනානෙ.

" මචෝ... චූටිට හැදිලා තියෙන්නෙ ලව් සික් එක... උඹ ඔය කිව්ව මූලික රෝග ලක්‍ෂණ වලින් අනිවාර්යයෙන්ම කියවෙන්නෙ ඒක තමයි.... "

ගිවා ඔළුව දෙපැත්තට වැනුවෙ ඒක වෙන්න බෑ කියලා කියන්න වගේ. වෙන්න බැරි කොහෙද මං අද ඇස් දෙකටම දැක්කෙ ඒකෙ ප්‍රතිඵල.

" උඹ දැන් දන්නවද මං මේ කතහනියෙ මෙහෙ දුවගෙන ආවෙ ඇයි කියලා... "

මං ගිවාට සිද්ධිය කියන්න ලෑස්ති උනා.

" උඹ ඉතිං හැමදාම මෙහෙ දුවගෙන එන්නෙ හේතුවක් තිබිලයෑ... "

ඌ ඇහුවෙ චාටර් හිනාවක් දාන ගමන්. මේ තරම් ෂවර් හයි කරලා තියෙද්දි ළිඳේ පතිට්ටුවෙන් ඇදගෙන නාන්න යනවට අපිටත් මේවා හොඳ පාඩම්. එහෙමයි කියලා දැන් ඉතිං කියන්න ආපු දේ නොකියා යන්න ඕනෙ නැහැනෙ. මං කතාව කියන්න පටන් ගත්තා.

" මම අද අපේ අක්කයි ආච්චියි එක්ක ෆිල්ම් එකක් බලන්න ගියා... ඒ ගිහින් එද්දි... "

" නෑ.... මොකක්ද ලව් ස්ටෝරියක්ද බලන්න ගියේ...? "

මූ දෙයක් කියලා ඉවර වෙන්න කලින් අර මොකාද එකා වගේ මැද්දට පනිනවනෙ.

" ස්ටෝරියනං මොකක්ද මන්දා බං... අහපංකො ඉතිං... "





" ෆිල්ම් එකේ නම මොකක්ද...? "

" දන්නෑ බං... හින්දි එකක්.... "

" උඹ දැන් මහ ලොකුවට කිව්වෙ ෆිල්ම් එකක් බලන්න ගියා කියලා. උඹ ගිහින් මොනවද බැලුවෙ....? "

ගිවා ඇහුවෙ නෝන්ඩියට වගේ.

" මං බලපු ඇති කෙහෙල්මලක් නෑ. මං ගියේ ඒ දෙන්නගෙ මූරටයි... ෆිල්ම් එක වෙලාවට නිදා ගන්නයි.... ඉන්ටවල් එකට අක්කා අරන් දෙන අයිස් චොක් එක කන්නයි... අහපංකො මං මේ කියන දේ... "

ගිවන්ත මං දිහා බලන් හිටියෙ අනේ මචං උඹට ගිය කලක් වගේ වේදනාත්මක ඉරියව්වකින්.

" අපි එද්දි නගින්න හදපු බස් එකේ චූටි හිටියා... "

" ආ... අද නංගිට ක්ලාස්නෙ. ඒ ගිහින් එන ගමන් වෙන්නැති... "

ඌ කිව්වෙ කිසි ගාණක් නැතුව.

" ක්ලාස් ගිහින් එන ගමන්නං වෙන්න ඇති... ඒත් චූටි හිටියෙ බස් එකේ පෙම් මුල්ලෙ. තව කොල්ලෙක් එක්ක කදේ දාගෙන. "

ඒ කතාව ඇහුනා විතරයි ගිවන්තයගෙ මූණෙ හිනාව අතුරුදහන් උනා.

" ඔය ඇත්තමද මචං...? "

" මං මොකටද උඹට බොරු කියන්නෙ...? මං අක්කලව ගෙදර ඇරලා මේ පැත්තට ආවෙ ඒ ගැන අහන්න තමයි... "

" මං කිව්වෙ බොරුද දැස්... බලපං.... මෙකිගෙ විභාගෙට තව මාස කීයද තියෙන්නෙ.... මේ විදියට කොල්ලො එක්ක රෝන්දෙ ගහන්න ගියාම මෙච්චර කල් වෙච්ච මහන්සිය අපතෙනෙ... "

ගිවා කියවන්න ගත්තෙ හරියට චූටි මිනියක් මරපු ගානට.

" ඕවට කලබල වෙලා බෑ මල්ලි... ඕකට කියන්නෙ වයසෙ වැරැද්ද කියලා. අනික බං අපි චූටි චූටි කිව්වට කෙල්ලට දැන් වයස අවුරුදු දහ නවයක්නෙ. උඹට මතකද උඹයි මමයි මුලින්ම කෙල්ලෙක්ගෙ පස්සෙන් ගියේ වයස කීයෙදිද කියලා.... අවුරුදු දොළහෙදි. "

" ඇත්තට...? "

ගිවා ඇහුවෙ අපි ජීවිතේට කෙල්ලෙක්ගෙ පස්සෙන් ගිහින් නැති ගානට.

" ඇයි බං... අපි දහම්පාසලේ හත වසරෙ ඉද්දි අර අලුතෙන් ආව සුදු කෙල්ලෙක්ට ට්‍රයි කළා මතක නැද්ද...? අපි දවසක් බුද්ධ පූජාවට තියපු බිත්තරේ කාලා ලොකු හාමුදුරුවො අපිව අව්වෙ දණ ගස්සලා තිබ්බ දවසෙන් පස්සෙ ඒකි අපේ මූණවත් බලන්නෙ නැතුව හිටියෙ. උඹට ඒ කිසි දෙයක් මතක නැද්ද...? "

" චිකේ... උඹ ඕක කෑ ගහලා කියන්න එපා. අම්මත් ගෙදර ඉන්නවා. උඹ දන්නවද දැස්... මං එදා ඉඳලා තමයි බිත්තර තම්බලා කන එක නතර කළේ. මං අදටත් කන්නෙ ඔම්ලට් විතරයි."

මුලින් දැහැමිගෙන් පටන් ගත්ත කතාව ඊට පස්සෙ චූටිගෙ පැත්තට හැරුණා. ඕං දැන් ඒක බිත්තරයක් පැත්තට හැරීගෙන යන්න හදන්නෙ. තව චුට්ටකින් මේකා කුකුල් පැටියෙක්





ගැන කියවයිද මන්දා.

" ඒක නෙමෙයි දැස්... අපි මේ චූටිගෙ කේස් එකට මොකද කරන්නෙ...? මං කෙලින්ම ඒකිගෙන් අහන්නද...? "

මට කලින්ම ගිවන්ත ට්‍රැක් එක පැන්නා.

" පිස්සුද...? ඕක කාටවත් කියන්න එපා. අඩුම ගානෙ රුවන්ති නැන්දටවත් දැනගන්න ඉඩ තියන්න එපා. අපි මුලින්ම හොයලා බලමු කෙල්ල යාළු වෙලා ඉන්නෙ කාත් එක්කද... ඌ අපේ පවුලට ගැලපෙනවද... ඕක සිරා කරන සීන් එකක්ද වගේ දේවල්... අනික්වා පසුවට සලකා බලමු... "

" හ්ම්... එහෙමවත් කරමුකො... "

" කෝ දැන් චූටි...? "

" මං හිතන්නෙ බාත් රූම් එකේ වෙන්නැති... තව පැයකටවත් එන එකක් නෑ... "

" එහෙනං මං ගිහින් එන්නම්... උඹ දැනට චූටිගෙන් මුකුත් අහන්නෙ නැතුව හිටපං... "

ගිවන්තට උපදෙස් දීලා මං ඉක්මනට පාරට ආවා. පළවෙනි පටුමඟ බෝඩ් එක ළඟට එද්දිම මගේ ඉස්සරහට ආවෙ සරා. මේ මනුස්සයත් නැති තැනක් නෑ අම්මපා....

" දැස් බේබි.... බලන්නකො... අපිට පොඩි කරදරයක් වෙලානෙ.... "

මං මොකක්හරි විහිළුවක් කරන්න හිතද්දිම සරා දුක හිතෙන විදියට කතා කරන්න ගත්තා. ඒක කියපු තාලෙට මුදලාලි අන්කල්ට හාට් ඇටෑක් එකක්වත් ඇවිත්ද දන්නෙ නෑ...

" මොකක්ද සරා අයියෙ කරදරේ...? අපේ මුදලාලි

අන්කල්ටවත් මොකක්හරි.... ''

'' නෑ.... නෑ... බේබි. මුදලාලියට මොන හෙනයක්වත් නෑ. ඔය ඉන්නෙ ජුරාසික්පාක් එකේ ගලිවරයා වගේ මටම සත්තම දදා... මං කරදරයක් කිව්වෙ අපේ අයියා ගැන. ''

'' මොකක්...? ''

ජුරාසික්පාක් එකේ ගලිවර් කෙනෙක් හිටියා කියලා මං ඔය ඇහුවමයි. ඒත් සරා හිතුවෙ මං එයාගෙ අයියා ගැන අහලා පුදුම උනා කියලා.

'' අපේ අයියා වාහනේක හැප්පිලා ඉස්පිරිතාලෙ නතර කරලා. මං මේ බලලා එන ගමන්... ''

ආ... මේ කියන්නෙ අර මුදලාලි අන්කල් නිතරම කියන අයියා ගැන වෙන්න ඇති. අර බිබී ඇවිදිනවයි කියන එක්කෙනා.

'' ගොඩක් අමාරුද සරා අයියෙ...? ''

මිනිහා එක්කම ගෙවල් පැත්තට ඇවිදගෙන යන අතරෙ මං ඇහුවා.

'' කකුල් දෙකම තුවාලයි බේබි... හරියකට ඇවිද ගන්නත් අමාරුයි... ''

සරාට නිකං ඇඬෙන්න වගේ.

'' ඔය තරම් තුවාල වෙන්න මොකකටද හැප්පිලා තියෙන්නෙ...? ''

'' ප්‍රයිවට් බස් එකකටලු.... ''

'' දැන් කාලෙ බස් කොහොමත් රේස් යන එකනෙ කරන්නෙ. ඕක නිකං අතාරින්න එපා සරා අයියෙ. නඩු කියලා ලොකු වන්දියක් ගන්න බලන්න... ''





'' මොන වන්දිද බේබි... අපේ අයියා හැප්පිලා තියෙන්නෙ නවත්තලා තිබුණු බස් එකකට.... ''

ඈ.... මොකක්ද බොලේ ඒ හරුපෙ. මිනිස්සු නවත්තලා තියෙන බස් වලත් හැප්පිලා තුවාල වෙනවද...? මං ඇහුවමයි ඔය වගේ අපබ්‍රංශ කතාවක්.

'' කොහොමද සරා අයියෙ එහෙම උනේ...? ''

'' බේබි ඉතිං දන්නවා ඇතිනෙ අපේ අයියා ඔය ඉඳලා හිටලා හැමදාම වගේ පොඩි අඩියක් ගහනවා කියලා. එයා පෙරෙයිදා ඒ වගේ චුට්ටක් වෙරි වෙන්න බීලා ගෙදර එනකොට පාර අයිනෙ නවත්තලා තිබුණු බස එකක හැප්පිලා එතන තිබුණ කාණුවකට වැටිලා. ඒ කාණුවෙ කොන්ක්‍රීට් එකට තමයි අයියගෙ කකුල් තුවාල වෙලා තියෙන්නෙ. ''

'' මරු වැඩේ... ''

මං ඒක කිව්වා නෙමෙයි... හිනාව නවත්තගන්න බැරිතැන මට ඒක කියවුනා.

'' මොනාද බේබි නිකං කැත විදියට හිනාවෙන්නෙ. මනුස්සයෙක්ගෙ දුක දැකලා ඔහොම සමච්චල් කරන එක හොඳද මං අහන්නෙ... ''

මේං යකඩෝ සරා ගොයියට ඩෝං ගිහින්. මිනිහා තවත් මොනවදෝ මන්දා කුරු කුරු ගාලා කියවන ගමන් මාවත් දාලා යන්න ගියා.

මං ගෙදර ගියෙත් හිනා වෙවී. කොටින්ම සරාගෙ අයියා බස් එකේ හැප්පුන හැටි මං එදා රෑ හීනෙනුත් දැක්කා.

* * * * * * *

# 04

අද ශ්‍රී ලංකා පිලයි පකිස්ථාන් පිලයි අතර උණුසුම් ක්‍රිකට් මැච් එකක්. මං හිටියෙ ඇස් කන් විතරක් නෙමෙයි මුළු සර්වාංගෙන් භාගයක්ම ටී වී එක දිහාට යොමු කරගෙන.

" කවුද බං චූටි පුතේ දිනන්න යන්නෙ...? "

අපේ ආච්චිත් කොහෙදෝ මන්දා ඉඳලා ඇවිත් මගේ ළඟින්ම ඉඳගත්තා.

" වෙන කවුරු දිනන්නද ආච්චියෙ... අපේ කොල්ලො ටික අද ලස්සනට ගේම ගහනවා. බලන්නකො.... "

මං උත්තර දුන්නෙ ආච්චි දිහා ඇස් කොනකින්වත් බලන්නෙ නැතුව. ඒත් මගේ අවධානය එක තැන රඳවගන්න බැරි උනේ එක දිගටම ගෙදර ෆෝන් එක කෑ ගහන්න ගත්තු නිසා.

" ආච්චියේ බලන්නකො ගිහින්... "

" අනේ උඹ බලහං පුතේ.... දැන් දැන් මගේ මේ කන ඩිංගක් ඇහෙනවා හොරයි. ඕක අස්සෙන් එක එකා කුරු කුරු ගාලා කෙඳිරිගාන සද්ද මට හරියට ඇහෙන්නෙ නෑ. "





ආච්චි කාරුණික විදියට මගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරපු නිසා මං පුටුවෙන් නැගිට්ටා.

" එහෙනං ආච්චි පොඩ්ඩක් මේ ටීවී එක දිහා බලාගෙන ඉඳලා මොනවාහරි විශේෂ දෙයක් උනොත් මට කියන්නකො..."

මං එහෙම කිව්වෙ ෆෝන් එක තියෙන තැනට ටී වී එක හරියට පේන්නෙ නැති නිසා. කොහොමහරි ෆෝන් එකට යනකොට ලයින් එකේ හිටියෙ හැමදාම මාව අමතන එකා තමයි. ඒ කිව්වෙ ගිවන්තයා.

" අයියෝ ලොකු අයියෙ... උඹ මට නිදහසේ මැච් එක බලන්නවත් දෙන්නෙ නැද්ද ආ...? "

මං ගිවාට ලොකු අයියා කියලා කිව්වෙ නෑ කමට මිනිහා ඇත්තටම මගේ අයියා වෙන නිසා.

" මොන මැච්ද මලයා... උඹ දැන් මගෙත් එක්ක ගමනක් යන්න එන්න ඕනෙ. මං අද උඹව සර්ප්‍රයිස් කරන්න හදන්නෙ. "

" අපෝ... දැන්නං කොහෙවත් යන්න එන්න බෑ. තව ඕවර්ස් දහයයි තියෙන්නෙ. යන ගමනක් ඒක ඉවර වෙලා යං. "

" එතකොට පෙරහැර ගිහින් තියෙයි. මං තව පැය භාගෙකින් උඹලගෙ දිහා එනවා. උඹ ලෑස්ති වෙලා හිටපං..."

ගිවා අණදෙන නිලධාරියා වගේ සත්තම දාලා ෆෝන් එක තියලත් ඉවරයි.

" චූටි පුතේ ඉක්මනට වරෝ... මේං රනා කොලුවා අවුට් උනා. අර පිටිපස්සෙ හිටෝලා තිබුණ කෝට්ටකුත් බිම වැටුනා..."

අපේ ආච්චිගෙ සද්දෙට මං ටීවී එක ළඟට දුවගෙන ආවෙ අවුට් උනේ කවුද කියලා බලන්න. ආච්චි කෑ ගැහුවෙනං

කෙනෙක් අපේ ටීම් එකේ නැනෙ.

රනා කොලුවා අවුට් උනා කියලා. ඒත් රනා කියලා ක්‍රිකට්

" අවුට් උන එක්කෙනාගෙ නම මොකක් කියලද ආච්චියෙ කිව්වෙ....? "

" රනා... "

ආච්චි කිසි බයක් සැකක් නැතුව හරි විශ්වාසෙන් උත්තර දුන්නා. ටීවි එකෙත් ඇඩ් එකක් යනවා. හරි විස්තරයක් දැනගන්න විදියක් නෑ.

" මං හිතන්නෙ ආච්චිට වැරදිලා ඇහෙන්න ඇති. රනා කියලා එකෙක් අපේ ටීම් එකේ නෑ ආච්චියෙ.... "

" යන්තං වයසට ගිය පළියට උඹ හිතුවද මගේ කන් දෙක ඇහෙන්නෙ නෑ කියලා. මං හූනා කියන්නා වගේ තක්කෙටම කියනවා.... අවුට් උනේ රනා තමයි. "

දැන් ටිකකට කලින් මගේ කන හරියට ඇහෙන්නෙ නෑ නෑ චූටි පුතේ ඔය කෝල් එක ගනිං කියපු අපේ ආච්චි ඒ ඩිංගට කියනවා වයසට ගියාට මගේ කන් දෙක ඇහෙනවා කියලා. කාට කියන නඩුද මේවා.

ආච්චි එක්ක තර්ක කරන්න යනවට වඩා උනේ මොකක්ද කියලා ටීවී එකෙන්ම දැනගන්න එක හොඳ නිසා මං කට වහගත්තා.

එතකොටම තමයි කලින් අවුට් එක ආපහු සැරයක් ටීවී එකේ පෙන්නුවෙ. ඉංග්‍රීසි නිවේදකයත් කටේ උපරිම සද්ද දාලා ' 'ඉට්ස් රනා....වුට්... ' කියලා කෑ ගහද්දි ආච්චි හරි ආඩම්බරෙන් මගේ දිහා බැලුවා.

" හහ්... මං බොරුද කිව්වෙ උඹට... ඒ යකඩ කටෙන් කෑ





ගහපු හාදයා කිව්වෙ රනා කියන එකා අවුට් කියලා නෙමෙයිද...?''

මං හිනාව නවත්තගෙන හිටියෙ බොහොම අමාරුවෙන්. අපේ ආච්චි මේ 'රනාවුට්' කියලා කියපු එකනෙ රනා අවුට් කියලා විසන්ධි කරලා අරන් තියෙන්නෙ. ආච්චි රනා කියලා අන්වර්ථ නාමයක් දීලා තියෙන්නෙ අපේ සුපිරි ක්‍රීඩක සංගක්කාරට. එයා දුවද්දි ඇවී ගිහින්.

සංගක්කාර කියන්නෙ මගේ ප්‍රියතම ක්‍රීඩකයා. එයා අවුට් උනාට පස්සෙ මැච් එක බලන්නත් නිකං මොකක්ද මොකක්ද වගේ. ඒ නිසා මං ගිවන්ත කියපු තැන නොදන්න ගමන යන්න ලෑස්ති උනා. කොහොම උනත් ගිවන්ත ආවෙ මැච් එක ඉවර වෙන්න ඔන්න මෙන්න තියෙද්දි.

" යමං... "

ආව ගමන්ම මෙලෝ සිහියක් නැතුව මිනිහා මගේ හෙල්මට් දෙකෙන් එකක් අරන් දා ගත්තා.

" ඒ පාර මේ දෙන්නා කොහෙ යන්නද මේ ලෑස්තිය...?''

ගිවන්තගෙ සද්දෙට අපේ අම්මත් එළියට ඇවිත්. ආච්චි එක්ක වැඩේ ලේසියෙන් ගොඩ දාගත්තට අම්මා එක්කනං වැඩේ ලේසි වෙන්නෙ නෑ. එයා නිතරම අපි යන එන තැන් ගැන හොයනවා.

" නැන්දෙ... කාටවත් දැන්මම දැනගන්න තියන්න එපා. මං දැස්ව ෆැබ් එකට එක්කගෙන යන්න ආවෙ. "

ගිවන්ත කිව්වෙ අපේ අම්මගෙ කනට කරලා. මූ මේ හදිස්සියෙ මාව ෆැබ් එකට අරන් යන්න හදන්නෙ මට බලහත්කාරයෙන් කේක් ගෙඩියක්වත් ගිල්ලවන්නද දන්නෙ නෑ.

'' අර මොකටද ලොකු පුතේ...? ''

'' ලබන සතියෙ අපේ තාත්තගෙ බර්ත්ඩේ එකනෙ. ඉතිං අපි පොඩි සර්ප්‍රයිස් පාටියක් ඇරේන්ජ් කරන්න යන්නෙ. මේ කේක් ඩිසයින් ටිකක් බලන්න යන ගමන්. ''

ගිවා ඒක කියපු විදියනං මට ඇල්ලුවෙ නෑ. මිනිහා මොකක්හරි මගඩියක් කරන්න යන පාටයි. කොහොම උනත් තමන්ගෙ එක කුස උපන් සහෝදරයට පාටියක් ඇරේන්ජ් කරන්න යනවා කිව්වා විතරයි අපේ අම්මගෙ සැකේ නැති වෙලා ගිහින් මූණට ලොකු හිනාවකුත් ආවා.

'' ඇත්තටම අයියගෙ උපනේදිනේ ලබන සතියෙ නේන්නම්.... මට නිකමටවත් මතක තිබුණෙ නැහැනෙ. අපේ මනුස්සයත් ඉතිං හැමදේම ඔයා එක්ක හොරෙන් කරනවා මිසක් අපට කියන එකක්යැ. ''

අම්මා ඒ බර බරේ දැම්මෙ මට. ඒත් ඉතිං අම්මා හිතන් ඉන්න විදියෙ දෙයක් ඇත්තටම මෙතන උනේ නැහැනෙ.

'' කමක් නෑ... ඔයාලා හොඳ විදියක් බලලා කරන්නකො. මොනවාහරි බරපැනක් එහෙම තියෙනවානං නලින් මාමටත් කියන්නකො ලොකු පුතේ... ''

අම්මා බර පැන දරන වැඩේට අපේ තාත්තව ඇල්ලුවා. එක අතකට ඒකෙ ඇති වැරැද්දකුත් නැහැ. අපේ මේ පවුල් දෙක තුන ඇන්ඩ් කොම්පැනිය වගේ නිසා වට්ටියෙන් වියදම් උනත් එකයි පෙට්ටියෙන් වියදම් උනත් එකයි.

'' එහෙනං අපි ගිහින් එන්නම් නැන්දෙ... ''

ගිවන්ත මගේ හෙල්මට් එකත් අතට අරගෙන මිදුලට





බහිද්දි ආච්චි ලොකු හදිස්සියකින් වගේ දුවගෙන ආවා. එයත් හැත්තෑව පැන්නා කියලා නෑ. වෙලාවකට අපේ අක්කටත් හපන්.

'' ඕං ඔය වැඩේ හෙටට කල් දාපං චූටි පුතේ... අද අර සමිතියට කට්ටියව බඳවගන්න ගෙවල් වලට එනවා කියලා මට අර සරත් කොලුවා කිව්වා. මං ලොක්කිටත් කිව්වා අද වැඩට නොගිහින් ගෙදර හිටපං කියලා... කෝ.... ඒකි මං කියන දෙයක් කනකටවත් ගන්නවා කියලයැ. අඩු තරමෙ උඹලා දෙන්නාවත් ගෙදරට වෙලා හිටපංකො... ''

ආච්චි නන්ස්ටොප් කියවන අතරෙ ගිවන්ත ඇස් දෙකත් පුංචි කරලා මගේ දිහා බැලුවෙ ඔය කියන සමිතිය මොකක්ද කියලා දැනගන්න වගේ. ඇත්තටම ඒ ගැන මං දැනගෙන හිටයෙත් නෑ.

'' මොකක්ද අම්මෙ ඔය සමිතිය...? ''

මටයි ගිවන්තටයි දෙන්නටම දැනගන්න ඕන වෙලා තිබුණු දේ ආච්චිගෙන් ඇහුවෙ අපේ අම්මා.

'' අර ඡන්දෙ දිනපු ජයසුමනයා පටන්ගන්නවයි කියන සමිතිය.... ''

'' අපෝ ආච්චි.... දේශපාලන සමිතියක්ද....? අපිනං නෑ ඕවට. අනික ජයසුමන මහත්තයා කියන්නෙ ආච්චි ඡන්දෙ දීලා ප්‍රාදේශීය සභාවට පත් කරපු නිළධාරියනෙ. ඒ නිසා ආච්චි බැඳුනම ඇති. අපි ඕනෙ නෑ... ''

ගිවන්ත ඒ ගැහුවෙ හින්ට් එකක්. මොකද අපේ ආච්චි ජයසුමන මහත්තයට ඡන්දෙ දීලා තිබුණෙ මරු විදියකට. ඒ මනුස්සයා ඡන්දෙ ඉල්ලලා තිබුණෙ බුලත් කොළේ ලකුණෙන්. අංකෙ දහසය.

ජයසුමන හරි හිත හොඳ මිනිහා කියලා ආච්චි උදෙන්ම ගිහින් අංක දාසයට කතිරෙ ගහලා ඇවිත් තිබුණා. හැබැයි ආච්චි අපි දන්න කාලෙ ඉඳලම යූ ඇන් පී කරයෙක්. ඉතිං ඒ පුරුද්දට අලියට ගහන කතිරෙනං වෙනස් කරලා නෑ. ඒ කතාව අහලා අපේ ගෙදර මිනිස්සු දවස් ගානක් යනකල් හිනා උනා මට තාමත් මතකයි.

කොහොමහරි ජයසුමන මහත්තයා දින්නට පස්සෙ ගෙවල් ගානෙ ස්තූති කරන්න ආපු වෙලාවෙත් ආච්චි හරි උජාරුවෙන් කිව්වා මමත් ඡන්දෙ දුන්නෙ ඔය ළමයට තමයි කියලා.

'' ඒ ළමයි දෙන්නා ඔය ගමන ගිහින් ආවදෙන්කො අම්මෙ. අර කිව්වත් වගේ අම්මට ඕනෙනං ඒ කියන සමිතියට බැඳෙන්න.''

මං ආච්චි ඡන්දෙ දාපු හැටි මතක් කර කර ඉද්දි අම්මා අපේ ගමනට පර්මිෂන් දුන්නා.

''ඒක ඉතිං මට උඹලා කියන්න ඕනෙ නෑ. මං මේ කොහොමටත් උදේ ඉඳලා ලෑස්ති වෙලා ඉන්නෙ ඒ ළමයි ටික එනකල් තමයි. ''

අම්මගෙ කතාවට ආච්චිට ඩෝං ගිහින්.

'' මොකක්ද ආච්චියෙ ඔය සමිතියෙ නම ...? ''

ඒ ප්‍රශ්නෙ ඇහුවෙ ගිවන්ත.

'' යොවුන් බලකායද මොකක්ද මන්දා නමක් කිව්වා වගේ මතකයි...''

ආච්චි උත්තර දුන්නෙ තටම තටම.

'' අප්පට සිරි... ආච්චි මේ බැඳෙන්න යන්නෙ යොවුන්





සමිතියකටද...? එහෙනං කතා දෙකක් නෑ ලේකම් තනතුරවත් හම්බවෙයි. ඕං අපි ගියා... ''

අම්මත් හිනාව තද කරගෙන ගේ ඇතුළට යද්දි මං බයික් එක ස්ටාට් කර ගත්තා.

'' අපි දැන් මේ කොහෙද යන්නෙ...? ''

මං ඇහුවෙ මහ පාරට ආවට පස්සෙ.

'' යන්නනං තැන් දෙකක් තියෙනවා. එකක් අපේ නංගිගෙ ක්ලාස් එක ළඟට. අනික වීදියවත්තට.... ''

'' වීදියවත්තට...? ඒ කිව්වෙ දැහැමිලගෙ ගෙවල් පාර නේද...? ''

'' ඔව්... මං උඹට දැහැමිගෙ ගේ පෙන්නන්න යන්නෙ...''

'' දැහැමි චූටිගෙ යාළුවෙක් කිව්වා නේද...? එහෙමනං එයත් චූටිගෙ වයසෙම වෙන්න ඇතිනෙ. ඒ කියන්නෙ මේ පාර විභාගෙ ලියන කෙනෙක්... ''

මං බයික් එක පාර අයිනට කරලා නතර කරගන්න ගමන් ඇහුවා.

'' උඹ දැහැමිගෙ වයස කීයද කියලා මගෙන්ද අහන්නෙ...? අනේ යකෝ... ''

'' නෑ ඉතිං මං ඇහුවෙ... ''

'' හරි හරි... කතාව නවත්තලා උඹ පිටිපස්සට නැගපංකො. මං යන්න ඕන තැනට උඹව අරන් යන්නම්... ''

ගිවන්ත මාව බයික් එකේ පිටිපස්සට නග්ගගෙන කෙලින්ම ගියේ ටවුන් එක පැත්තට. වීදියවත්ත තිබුණෙ ටවුමෙ ඉඳලා තව කිලෝමීටර දෙක තුනක් විතර එහායින්. වීදිය වත්තට

හැරෙව්වට පස්සෙත් අපි තව මීටර් පන්සීයක් විතර ඇතුළට ගියා. ගිහින් තවත් අතුරු පාරකට හැරෙව්වා.

" බලපං අංක තිස් දෙක බී ගහලා තියෙන්නෙ කොයි ගෙදරද කියලා... "

අපි ඒ වෙද්දි හිටියෙ බොහොම පොඩි පැල්පත් වගේ ගෙවල් තිබුණ ඉසව්වක. මං මීට කලින් වීදියවත්තට ඇවිත් තිබුණට මේ හරියට ඇවිත් නෑ. ගිවන්ත මේ ආවෙ හරි පැත්තටද කියලා මට පොඩි සැකයක් තිබුණා. දැහැමි මේ වගේ පැත්තක ඉන්න ළමයෙක්ද...? ඒ කියන්නෙ එයා ගොඩක් දුප්පත්ද...?

" දැස්.... ආං අර සුදු පාට වැස්සියෙක් බැඳලා ඉන්න කඩුල්ල ළඟ ගහලා තියෙන්නෙ තිස් දෙක බී නේද...? "

ගිවන්ත පෙන්නුව අංක තහඩුවෙ තිබුණෙනං ඒ අංකෙ තමයි. ඒත් ඒ කඩුල්ලත් එක්ක හරි කෙලින් පෙනුන ගේ දැක්කම මගේ පපුව හෝස් ගාලා පත්තු වෙලා ගියා. මොකද ඒක බ්ලොක් ගල් වලින් තග්ගලා තිබුණු බොහොම පුංචි ගෙයක්. අඩුම තරමෙ කපරාදු කරලාවත් නෑ. ජනේල් වලට පියන් තිබුණෙත් නෑ. ඒවට ගහලා තිබුණෙ ඉටිකොල.

" මේ තැන හරිද ගිවා...? ඇත්තටම මේක දැහැමිගෙ ගෙදරද...? "

මං ඇහුවෙ මේ කිසි දෙයක් විශ්වාස කරන්න බැරි නිසා.

" මටත් පුදුමයි මචං... මං උනත් විශ්වාස කළේ නෑ මේ වගේ දෙයක්. කොහොම උනත් ඇඩ්රස් එකනං වරදින්න විදියක් නෑ. මං ඒක හොයාගත්තෙ මේ පාරෙම ඉන්න එකෙක්ට කියලා."

අපි දෙන්නා දැහැමිලගෙ ගෙවල් කිට්ටුව බයික් එක





නතර කරලා කතා කර කර ඉද්දි එහා පැත්තෙ තිබුණු හිස් වත්තක ඉඳලා පොල් අතු දෙකකුත් ඇදගෙන ගෑණු කෙනෙක් ආවා. බොහොම අහිංසක මූණක් තිබුණ ඒ ගෑණු කෙනා අපි දිහා බැලුවෙ කාවද හොයන්නෙ වගේ බැල්මක් මූණෙ තියාගෙන.

" අංක තිස් අට කොයි හරියෙද අම්මා...? "

මං ගල් වෙලා වගේ බලාගෙන ඉද්දි ගිවන්ත කිසිම සැකයක් නොහිතෙන විදියට ඇහුවා.

" මේ පාරෙ කොනේම ගේ අංක තිස් පහ මහත්තයො. ඉන් එහා අංක තියෙන්නෙ අර වෙලෙන් එගොඩහ. "

" හරි අම්මෙ... බොහොම ස්තුතියි. අපි ගිහින් බලන්නම්..."

ගිවා බයික් එක ස්ටාට් කරගත්තම අර ගෑණු කෙනා පොල් අතු දෙකත් ඇදගෙන කෙලින්ම ගියේ දැහැමිලගෙ ගෙවල් දිහාට. එතකොට එයා දැහැමිගෙ අම්මාවත්ද...?

" මචං... දැන් මොකද කරන්නෙ...? කෙල්ල පට්ට දුප්පත් වගේ... "

" මටත් ඒ ගේ දැකලා ඔළුව අවුල් උනා ගිවා. උඹ ටිකක් හිතපං... මට දැහැමිව හම්බඋනේ එෆ් බී එකේදි. ඒ ගේ දැක්කම උඹට හිතෙනවද ඒ ගෙදර ඉන්ටර්නෙට් තියා අඩු තරමෙ කම්පියුටරයක්වත් ඇති කියලා. "

" එෆ් බී ඉන්න ඔක්කොම එවුන්ගෙ ගෙවල්වල ඉන්ටර්නෙට් නෑ බං. ඒවා සුරංගනා කතා.... එහෙමනං මේක ලංකාව නෙමෙයි ඇමරිකාව වෙන්න ඕනෙ. ඒත්.... කමක් නෑ... අපි යංකො චූටිලගෙ ක්ලාස් එක පැත්තට... "

කල්පනා කරන එක පස්සට කල්දාපු අපි දෙන්නා

කෙලින්ම ගියේ සසෙක්ස් ටියුෂන් ක්ලාස් එක පැත්තට. ඒත් ... වෙද්දි ක්ලාස් ඇරිලා නෑ. ඒ නිසා ගිවයි මමයි දෙන්නා ක්ලා... එකට ටිකක් ඉස්සරහින් තිබුණු පේස්ට්‍රි ෂොප් එකට ගිහි... ප්ලේන්ටියක් ගහන්න පටන් ගත්තා.

'' මචං... මට මේකට කෙලින් උත්තරයක් දීපං.... දැහැමි කියන්නෙ ඇත්තටම අපි ඒ දැක්ක දූප්පත් ගෙදර ඉන්... කෙල්ලෙක්නං උඹ ඒකිට ආදරේ කරනවද...? ''

බීබී හිටපු ප්ලේන්ටිය මේසෙ උඩින් තිබ්බ ගිවා මගේ ඇස් දෙකට එබුනෙ මගෙන් සෘජු උත්තරයක් බලාපොරොත්තුවෙන්.

ඒත් මට ඒකට දෙන්න තරම් පැහැදිලි උත්තරයක් තිබුණෙ නෑ. දැහැමියි මමයි මේ වෙද්දි මුහුණු පොතේ යාළුවො දෙන්නෙක් විතරයි. නිතර නිතර චැට් කරපු නිසා අපේ හිත් දුරදිග ගියපු බව ඇත්ත. ඒත් අපි අතර ආදරයක් කියලා දෙයක් තියෙනවද කියන එක ඇත්තටම ප්‍රශ්නයක්. එහෙම දෙයක් තිබුණත් අපේ ගෙවල් වලින් ඒ වගේ දේකට කැමති වෙයිද...? මොකද අපේ පවුල සෑහෙන වත්පොහොසත්කම් තිබුණු පවුලක්. මේ පැත්තටම තිබුණ ලොකුම ලෑන්ඩ් සේල් එකේ අයිතිය තිබුණෙත් අපිට. ඉතිං එච්චර දෙයක් තියෙද්දි අපේ අම්මලා තාත්තලා කැමති වෙන එකක් නෑ අපි අන්ත දූප්පත් පවුලකින් කසාදයක් කරගන්නවට.

'' මං උඹෙන් ඇහුවෙ ඔය තරම් කල්පනා කරන්න තරම් දෙයක්ද...? ''

ගිවන්ත මෙච්චර වෙලා මගේ මූණ දිහා බලාගෙන හිටියා කියලා මට මතක් උනේ ඒ වෙලාවෙ.

'' මට කිසිදෙයක් හිතාගන්න බෑ ගිවන්ත.... ''





'' ඕං ඕක තමයි කියන්නෙ මිනිස්සු මොන බයිලා ගැහුවත් දූප්පත්කම ඉස්සරහා ආදරේ පලා යනවා කියලා. ''

'' උඹ හිතන විදියෙ දෙයක් මෙතන නෑ. කොටින්ම අපි අතර ලව් එෆෙයාර් එකක් කියලා දෙයක් ඇත්තෙම නෑ. ඒත් දැහැමි අවංකවම මට ආදරේ කරන්න කැමතිනං මට එයාගෙ දූප්පත්කම ප්‍රශ්නයක් නෙමෙයි. මොකද අම්මලා තාත්තලගෙ බූදලේ නැතුවට මට රස්සාවක් කරලා පවුලක් නඩත්තු කරන්න පුළුවන්.''

'' දාපං මස්සිනා පහක්. අන්න ඔහොම තමයි කොල්ලො උනාම ඉන්න ඕනෙ. ''

'' ඒත් දැහැමි ගොඩක් දූප්පත් කියලා දැනෙද්දි හිතට මොකක්දෝ මන්දා ලොකු වේදනාවක් දැනෙනවා ගිවා.... ''

මං ඒ කතාවනං කිව්වෙ හිතට එකඟවමයි.

'' අපි තව ටිකක් මේ ගැන හොයලා බලමු. කතාව ඇත්තනං කරන්න ඕන දේ දෙවනුව හිතලා බලමු. ''

ගිවා මං වෙනුවෙන් ඕන දෙයක් කරන්න ඉදිරිපත් වෙන යාළුවෙක් කියලා මං කොහොමටත් දැනගෙන හිටියා.

'' අන්න ක්ලාස් එක ඇරිලා. ''

පාර දිගේ එක පොදියට වගේ ළමයි ඇදෙන්න ගත්තා විතරයි අපි දෙන්නා ඉක්මනට තේ බීලා ඉවර වෙලා හෙල්මට් දෙක අතට ගත්තා. ක්ලාස් එකේ ඉඳලා ආව සමහර ළමයි අපි හිටපු කඩේට ආව නිසා අපිව කැපිලා පේන ගතියක් තිබුණෙ නෑ. ඒ නිසා චූටිට උනත් අපිව පේන්න තියෙන ඉඩකඩ අඩුයි.

'' මේ ක්ලාස් එකේ කොච්චර විතර ළමයි ඉන්නවද මචං...? ''

නිකංහරි චූටිව අපිට මග ඇරුනොත් කියන සැකේ නිසා මං ඇහුවා.

'' නංගි කියලා තියෙන විදියටනං මේකෙ ග්‍රෑප් බෙදලා තියෙන ක්ලාස් එකක්ලු. ඒ නිසා එච්චර ළමයි ඉන්න විදියක් නෑ.''

'' එහෙනං තව ටිකක් බලමුකො... දැන් එයිනෙ. ''

මං කිව්වෙ පාර දිගේ ඇදෙන ළමයි දිහා ඇස් පිල්ලම්වත් නොගහා බලාගෙන ඉන්න ගමන්. ඒ අතරෙ තමයි මං දැක්කෙ එදා බස් එකේ චූටි එක්ක කතා කර කර ගියපු කොල්ලා තව පිරිමි ළමයි දෙන්නෙක් එක්ක කතා කර කර එනවා.

'' ගිවා... ආං උඹේ මස්සිනා එනවා. ''

'' කවුරු...? ''

මෙච්චර වෙලා පාර දිහා බලාගෙන හිටපු ගිවන්තයා ඇස් දෙක විතරක් නෙමෙයි ඇඟත් මගේ පැත්තට හරවලා බැලුවා.

'' අර රතුයි කළුයි ඉරි ඉරි ටී ෂර්ට් එක ඇඳගෙන එන කොල්ලා එක්ක තමයි එදා චූටි බස් එකේ කතා කර කර ආවෙ. ''

වැල් වටාරම් කිය කිය හිටියොත් කොල්ලා අන්තරස්දාන් වෙයි කියලා හිතුන නිසා මං තප්පරේට දෙකට සිද්ධිය කිව්වා.

'' ඇත්තද... ''

ගිවන්ත දඩි බිඩි ගාලා කඩේ පඩිපෙළ බහින්න හදද්දිම මං මිනිහව නවත්ත ගත්තෙ ඒ කොල්ලට පිටිපස්සෙන් චූටිත් එනවා දැක්ක නිසා.

'' ෂිට්... ''

මං ඇස් දෙකෙන් කෙල්ලව පෙන්නුවා විතරයි ගිවා අත





මිට මොලවලා කඩේ ඉස්සරහා සිමෙන්ති කණුවට පාරක් දීලා ඇරියා.

'' ඒයි සෙනුරයා.... ඉක්මනට වරෙන්. අන්න විනෝද් එනවා. අදනං ඕකගෙන් පාටියක් ගන්නම ඕනෙ. ''

ඒ සද්දෙ ඇහුනෙ කඩේ ඇතුළෙ හිටපු කොල්ලො කට්ටියකගෙන්. පෙනුන විදියටනං සෙනුර කියලා කිව්වෙ කඩේ ඇතුළෙ සිගරට් එකක් බිබී හිටපු කොල්ලෙක්.

'' උඹලා දුවගෙන ගියාට වැඩක් නෑ මචං... රශ්මි තාම විනෝද්ට බහ දීලා නෑ. ''

පාරට පැනගත්තු කොල්ලො ටික මං පෙන්නපු කොල්ලා ඉන්න පැත්තට දුවගෙන යද්දි සෙනුර කියපු එකා කෑ ගැහුවා. ඒ කතාවට මං ගිවන්තගෙ මූණ බැලුවෙ ගල් වෙලා වගේ. ඇයි ඉතිං රශ්මි කියන්නෙ අපේ චූටිගෙ නමනෙ.

'' එතකොට... ''

'' ෂ්... ''

ගිවන්ත මොකක්දෝ මන්දා දෙයක් කියන්න කට අරින්න හදද්දිම මං කටට ඇඟිල්ල තියලා ඒක නතර කළා. මොකද මේ වෙද්දි අපිට කලබල වෙන්න තරම් දෙයක් ඉතුරු වෙලා නෑ. අපි වැඩට බැස්ස පළවෙනි දවසෙම නිතරගයෙන් කාරණා දෙකක් දැනගෙන ඉවරයි. එකක් ඒ කොල්ලගෙ නම විනෝද් කියන එක. අනික චූටි තාම විනෝද්ට කැමැත්ත දීලා නෑ කියන එක. තාම අපිව චූටිට අහු උනෙත් නැති එකේ අපි මොකටද නිකං කලබල වෙන්නෙ. වෙන දේ පාඩුවෙ බලාගෙන ඉන්නවා මිසක්.

සෙනුර කියන කොල්ලා බිබී හිටපු සිගරට් එක උගුරටම

ඇදලා ඒක ඇත තිබුණු ගහක් මුලට විසි කරලා දාලා පාරට දුවද්දි විනෝද්ලා අපේ දර්ශන පථයෙන් ඇත් වෙන මට්ටමේ හිටියෙ.

" දැන් ෆලෝ කරමු... හැබැයි චූටිට පේන්නෙ නැති වෙන්න. මොකද අපි ෆුල් ෆේස් හෙල්මට් දාලා හිටියට වැඩක් නෑ කෙල්ල මේ බයික් එක දැක්ක ගමන් අපිව අඳුරගන්නවා. "

මං ශිවන්තට කිව්වෙ කට්ටිය අතුරු පාරෙන් ප්‍රධාන පාරට සේන්දු වෙන්න ළං වෙද්දි. අපි බයික් එකේ නැග්ගට ස්පීඩ් කරලා ගියේ නෑ. කට්ටිය බස් ස්ටෑන්ඩ් එකට ගියාට පස්සෙ අපි ඒක පේන නොපෙනෙන මානෙ බයිසිකලේ නතර කර ගත්තා. ඒ වෙද්දිත් චූටිගෙ වැරැද්දක් පේන්න තිබුණෙ නෑ.

වැරැද්ද උනේ ඊට පස්සෙ. මොකද අපේ පාරෙ බස් එකක් ඇවිල්ලත් චූටි ඒකට නැග්ගෙ නෑ. හෝල්ට් එකේ සෙනඟ තරමක් අඩු උනාට පස්සෙ කෙල්ල බස් හෝල්ට් එකේ සයිඩ් එකක් අල්ලගෙන අර විනෝද් කියන හාදයා එක්ක සුහද කතා බහක් ඇරඹුවා. දැන් ඉතිං මක්කද කරන්නෙ...? මුං දෙන්නා කීයට හරි කතා කරලා ඉවර වෙනකල් අපි මෙතනට වෙලා ඉන්නද...? අනික තාම දවල්ට කාලත් නෑ. හොඳටම පරක්කුත් වෙලා.

" ශිවා... මොකද කරන්නෙ මචං...? "

" මට අද කොහොමහරි මූ ඉන්න තැනක් දැනගන්න ඕනෙ. "

ශිවන්ත කිව්වෙ ඇස් පිය නොගහා චූටිලා ඉන්න පැත්ත බලාගෙනමයි.

" රා...යිට්... අපි ඌව ෆලෝ කරමු. "

මං කිව්ව වැඩේ අපිට ඉක්මනටම පටන් ගන්න පුළුවන්





උනේ හතරවෙනි නැත්තං පස්වෙනි බස් එකේ චූටිට ගෙදර යන්න අදහසක් පහළ උන නිසා.

කොහොමහරි ජෝඩුවම එකම බස් එකට නැගලා එක ළඟ සීට් එකකත් ඉඳ ගන්නවා අපි බලාගෙන.

" දැන් ලෝකෙ කෙළවරට යනකල් හරි අපි දෙන්නා මූගෙ පස්සෙන් යං. "

අපි දෙන්නා සෑහෙන වෙලාවක් තිස්සෙ බස් එක පස්සෙන් ගියත් කිසි විශේෂ දෙයක් සිද්ධ උනේ නෑ. අපේ ගෙවල් ගාව හෝල්ට් එකෙන් චූටි බැහැලා ගියා. විනෝද් බැහැගත්තෙ ටවුන් එකේ තියෙන බෝයිස් ස්කූල් එක ළඟින්.

" අද සෙනසුරාදා උනාට මූට ඉස්කෝලෙත් පංතියක් තියෙනවද කොහෙද...? මොකද කියන්නෙ ලොකු අයියෙ... මූ වැඩේ ඉවර කරගෙන එනකල් අපි මෙතනට වෙලා බලාගෙන ඉන්නවද... නැත්තං... "

" මෙතනට වෙලා ඉඳලා දැන් ඉතිං පොල් ගාන්නද...? යමං ගෙදර... "

ශිවා ඒක කිව්වෙ නොසෑහෙන්න කේන්තියෙන්.

* * * * * * *

# 05

" බේබීඊඊඊඊ....... දැස් බේබීඊඊඊ.... "

උදේ පාන්දරම කන ගාවින් සණ්ඨාර සද්දයක් ඇහෙද්දි මාව උඩ ගිහින් ඇහැරුණේ. කවුද යකෝ මගේ මේ සාමකාමී නින්දට බාධා කරන අපතයා.

" දැස් බේබී... අනේ නැගිටින්නකො... "

මං ඇස් දෙකෙන් එක ඇහැක් විතරක් ඇරලා මගේ ඇඳ ගාව අඳෝනා දෙන එකා මොකාද කියලා බැලුවා. ෂුහ්... මේ අපේ සරා අයියනෙ. මිනිහා මොකද පාන්දරම අපේ ගෙදරට කඩත් පාත් උනේ.

" මොකෝ සරා අයියෙ මේ පාන්දර.... මුදලාලි අන්කල් ගෙදරින් එලෙව්වද...? "

" මොන පාන්දරද බේබි... දැන් වෙලාව දහයටත් ළඟයිනෙ..."

ඇත්තද...? මං සරා අයියට හොරෙන් ඔරලෝසුව දිහා බැලුවා. ඇත්තනෙ යකෝ.... වෙලාව දහයට දහයයිනෙ. මං මෙච්චර





වෙලා නිදාගෙනද...? කොහොම උනත් මං බෙඩ්ෂීට් එකත් පැත්තකට දාලා ඇඳෙන් බැස්සා.

" දැන් මොකද කියන්නකො මේ බෙරිහන් දෙන්නෙ...?"

" මං මේ තකහනියක් ආවෙ දැස් බේබිගෙන් පොඩි උදව්වක් ඉල්ලන්න... "

" උදව්වක්... මොකක්ද අප්පේ ඒ....? "

" බේබි ඉංගිරීසි දන්නවා නේද...? "

" ම්... ටිකක් විතර දන්නවා... "

මං උත්තර දුන්නෙ තරමක් කල්පනා කරලා... කියන්න බැහැනෙ මූ මට සුද්දියෙක්වත් කසාද බන්දලා දෙන්න හදනවද කියලා.

" බේබිට පුළුවන්ද මටත් ඉංගිරිස් ටිකක් කියලා දෙන්න..."

සරා ගොයියට එංගලන්තෙට වීසා එකක්වත් හම්බවෙලාද දන්නෙ නෑ. නැතුව ඉතිං මේ මුදලාලි අන්කල්ගෙ කුණු වැඩ වලට ඉන්න සරාට ඉංග්‍රීසි මොකටද අප්පා...?

" මොකද දැන් මේ හදිස්සියෙම ඉංගිරීසි ඉගෙනගන්න හිතුනෙ...? "

" මං තුගත් මෝඩයා කියලා අර මුදලාලියා හැමදාම වෙලාවෙම මට සත්තම දානවා බේබි... අම්මපා මං කවදාහරි හොඳට ඉංගිරීසි ටිකක් ඉගෙනගෙන ඕකට ඉංගිරිස් වලින්ම බනිනවා... ඔව් ඇත්තමයි... "

මිනිහගෙ කතාවට මට මැරෙන්න හිනා. මූ මේ තකහනියෙ ඉංග්‍රීසි ඉගෙනගන්න හදන්නෙ අපේ මුදලාලි අන්කල්ට බනින්නලු.

ඔව් ඉතිං... මට මතකයි මේකා එදා ලොරි බොඩියට බොඩි ලොරිය කියලා ලියපු එකට මුදලාලි අන්කල් මලපොතේ අකුරක් දන්නැති එකා කියලා බැනපු බැනිල්ල.

'' දැන් කවදා ඉඳලද සරා අයියට ඉංගිරිසි ඉගෙන ගන්න ඕනෙ...? ''

'' කවදා ඉඳලද අහන්නෙ ආයෙ... අද ඉඳලා... මේ දැන් ඉඳලා... ''

සරා ඇඳන් හිටපු කොට කලිසමේ සාක්කුව අස්සෙ හංගලා තිබුණු පරණ නෝට් බුක් එකකුත් එළියට ඇදලා ගත්තා. ඒ කියන්නෙ මං මේ ඇඳෙන් බැහැපු හැටියෙ කුණු කෙළ පිටින්ම මූට ඉංග්‍රීසි කියලා දෙන්න ඕනෙද...?

'' අපි මෙහෙම කරමු. අපි ඔය පන්තිය හවස් වරුවට දා ගමු. එතකොට සරා අයියට දවසෙ වැඩ ටික ඉවර කරලා මුදලාලි අන්කල් නින්දක් දාන වෙලාවට මෙහෙට එන්න පුළුවන්නෙ. ''

'' ම්... ඒකත් ඇත්ත තමයි. මං මේ දැන් ආවෙත් මාළු ගේන්න හන්දියට යනවා කියලා. ''

සරා හැදුවෙ පොත නමලා ආපහු සාක්කුවට දාගන්න.

'' මාළු ගේන්න යනවානං මං සරා අයියට කියලා දෙන්නම් මාළුන්ට ඉංග්‍රීසියෙන් කියන නම් ටිකක්. එතකොට ඔයාට පුළුවන්නෙ මාළු කඩේට ගිහින් ඉංග්‍රීසියෙන් මාළු ඉල්ලන්න... ''

මගේ කතාවට මිනිහා කට පුරෝලා හිනා වෙලා අයෙත් වතාවක් පොත පෙරළ ගත්තා.

'' එහෙනං ලියා ගන්නකො... බල මාළුන්ට කියන්නෙ පවර් ෆිෂ්. ම්... ''





'' බේබි... මං ඔය ඉංගිරිස් කෑල්ල සිංහලෙන් ලිව්වට කමක් නෑ නේද...? ''

සරා හරි අහිංසක විදියට ඇහුවා. පව් අප්පා... ඒ මූණ දැක්කම මට ඇඬෙන්න වගේ.

'' කමක් නෑ සරා අයියෙ... ඔයාට තේරෙන බාසාවකින් ලියා ගන්නකො... ම්... එතකොට... හාල් මැස්සන්ට කියන්නෙ රයිස් ෆ්ලයිස්... පියා මැස්සො ෆාදර් ෆ්ලයිස්... ''

'' එතකොට බේබි ගල් මාළු...? ''

මුදලාලි අන්කල් නිතරම බයිට් එකට ගල් මාළු ගේන නිසාද මන්දා සරා ඒකත් ඇහුවා.

'' ආ... ගල් මාළුන්ට කියන්නෙ ස්ටෝන් ෆිෂ්... එතකොට...''

'' ඔය ඇති බේබි... මුදලාලියා ඔය රටේ නැති මාළු ජාති ගේනවා කියලයැ... අනික ඔය තරම් ගොඩක් මට එකපාරට මතක තියා ගන්නත් බෑ. ''

මාළු හතරපස් දෙනෙක්ගෙ නම් කිව්වා විතරයි සරාට ඉංගිරිසී ඇති උනා.

'' එහෙමනං මං කියනවට යන්න කලින් මේ මාළුවත් ලියාගන්නකො. ආන මාළු... උන්ට කියන්නෙ ආනෆිෂ්... ''

'' ආ... ආනෆිෂ්ලවනං මුදලාලි නිතරම ගේනවා තමයි...ඔය මදෑ බේබි... මං ගිහින් එන්නම්... ''

මිනිහා දඩි බිඩි ගාලා නැගිටගත්තෙ ආයෙ හෙට දිහාට එන්නම් කියලා.

සරා යන්න ගියාට පස්සෙ මං මූණ කට හෝදගෙන ෆෝන් එක අතට ගත්තා. කෝල් එකක් ගන්න කියලා හදනකොටයි

මට මතක් උනේ ඊයෙ ගෙනාව ෆෝන් කාඩ් එක දැම්මෙ තැ කියලා. ඒත් හොයලා බලද්දි මං තියලා තිබුණු තැන කාඩ් එක තැ

ඇත්තටම කෝ ඒක...? අපේ අක්කාවත් හොරෙන් එයාගෙ ෆෝන් එකට දාගත්තද දන්නෙ නෑ.

" අම්මේ.... මෙතන තිබුණු මගේ ෆෝන් කාඩ් එක කෝ...?"

මං කෑ ගැහුවෙ ගෙදර ඉන්න ඔක්කෝටම ඇහෙන්න. මෙන්න යකෝ ඒ සද්දෙට අපේ අක්කත් කාමරෙන් එබිලා බැලුවා. ඒ කියන්නෙ අද මෙයා වැඩට ගිහින් නෑ.

" මොකද මේ බොරුවට බෙරිහන් දෙන්නෙ...? තියපු තැනකින් හොයාගන්නවකො.... "

අක්කා වචනයක් කතා කළත් මාත් එක්ක කොක්කටමයි එන්නෙ...

" තියපු තැන නැති හන්දා නේන්නං ඇහුවෙ. මං බැලුවෙ කාඩ් එකට කකුල් ඇවිත් ඒක වෙන කාගෙ හරි ෆෝන් එකක් ඇතුළට රිංගලද කියලා... "

" මොකක්ද මොකක්ද ඒ කැත කතාවෙ තේරුම...? තමුසෙ හිතුවෙ තමුසෙගෙ ඔය හිඟන පනහෙ කාඩ් එක මං ගත්තා කියලද...? "

" ආන් අහුඋනා... තමුසෙ කොහොමද හරියටම දන්නෙ මං ගෙනත් තිබ්බෙ පනහෙ කාඩ් එකක් කියලා. "

මං පොල්ලෙන් ගැහුවා වගේ අහද්දි අක්කා ටිකක් විතර අප්සෙට් උනා. ඒ කියන්නෙ ඇත්තටම කාඩ් එක ඉස්සුවෙ අක්කාවත්ද...?

" මොකද ළමයිනේ මේ කරදරේ... දෙන්නා එක





විනාඩියකට එකතු උනොත් ඉවරයි. "

අම්මා කුස්සියෙ ඉඳලා ආවෙම අපි දෙන්නට බැන බැන.

" බලන්න අම්මා... මේ අක්කා මගේ ෆෝන් කාඩ් එක උස්සලා... "

" මට මොකටද අම්මා මෙයාගෙ ෆෝන් කාඩ්... අර එහා ගෙදර සරා ගොයියා මෙයාගෙ කාමරේ ඉඳලා යනවා මං දැක්කා. සමහරවිට එයා ගෙනියන්න ඇති... "

ඕං අක්කා ලස්සනට බෝලෙ පාස් කළා. අතේ සතේ නැති උනත් සරා කවදාවත් ඒ වගේ බලු වැඩක් කරන එකෙක් නෙමෙයි කියලා මං අත්දැකීමෙන්ම දන්නවා. මිනිහා අතේ තියෙන දේ දීලා යනවා මිසක් අපේ දෙයක් උස්සන් යන්නෙ නෑ.

" බොරුවට ඒ අහිංසකයව ඔය ගොල්ලන්ගෙ ප්‍රශ්න වලට ගාවගන්න එපා ලොකු... සරා එහෙම දේවල් කරන්නෙ නෑ කීයටවත්... "

අපේ අම්මා මොනවා උනත් සරාව බේර ගත්තා.

" ඔව් ඉතිං... අම්මටත් මට වඩා පිට එවුන්ව විස්වාසයිනෙ."

අක්කා ඒක කිව්වෙ කටින් නෙමෙයි නහයෙන්.

" මං කිව්වෙ නැහැනෙ ඔයා ඒක ගත්තා කියලා. බොරුවට නිකං පොඩි එවුන් වගේ කෑ ගහන්න එපා... "

" චූටි පුතේ... ඒ කාඩ් එක ඕං මං ඊයෙ හවස උඹෙ පෝන් එකට දාලා දැම්මා. "

අප්පච්චියේ... ඒ කතාව පිට උනේ අපේ ආච්චිගෙන් නේද...? එයා කොයි වෙලේද මගේ ෆෝන් එකට කාඩ් එක

දැම්මෙ...? අනික මං දැනන් හිටියෙ නැහැනෙ අපේ ආච්චි ෆෝන් එකට කාඩ් දාන්න දන්නවා කියලා.

මං ෆෝන් එක අතට අරන් බැලන්ස් එක චෙක් කරන්න හදද්දි අක්කා මට දිව දික්කරලා පල් එකකුත් දැම්මා. ඒත් එයාට රිටන් එක දෙන්න තරම්වත් මට කල්පනාවක් නොවුනෙ ඔබගෙ ගිණුමේ ශේෂය රුපියල් බින්දුවයි කියලා ඇහුන නිසා. එතකොට ආච්චි දැම්මයි කිව්ව කාඩ් එකට මොකද උනේ...?

'' ආච්චි... ඔයා මේකට කාඩ් එක දැම්මා කියලා ෂුවර්ද...? මේකෙ සල්ලි නැහැනෙ... ''

මගේ කතාවට හැරිලා යන්න හදපු අම්මයි අක්කයි දෙන්නා ආයෙත් නතර උනා.

'' වෙන්න බැහැනෙ චූටි පුතේ... ඒක එහෙ මෙහෙ වෙයි කියලා හිතලා මංමයි පෝන් එකට දාලා දැම්මෙ... මෙහෙ දියත් බලන්න... ''

ආච්චි ලෝඩ් වගේ මගේ අතේ තියෙන ෆෝන් එක ඉල්ලගනිද්දි අක්කා ආච්චි දිහා පුදුමෙන් වගේ බලන් හිටියෙ ඇස් දෙකත් ලොකු කරගෙන. ආච්චි කරන්න හදන දේ දැක්කම අක්කගෙ විතරක් නෙමෙයි මගෙත් ඇස් දෙක ලොකු උනා.

මෙයා මේ හදන්නෙ මගේ ෆෝන් එකේ පිටිපස්සෙ ෆ්ලැප් එක ගලවන්න නේද...? ඔව්නෙ... ආච්චි අමාරුවෙන් නියපොත්ත තියලා ෆෝන් එකේ ෆ්ලැප් එක ඇරියා. ඒ පාර මොකක්ද කරන්න යන්නෙ... බැට්රියවත් ගලවන්නද...? එහෙම හිතලා ඉවර වෙන්න හම්බඋනේ නෑ බැට්රිය උඩින් හරි පරිස්සමට තියලා තිබුණු ෆෝන් කාඩ් එකක් රූටලා බිමට වැටුණා.





මං තත්පරේට දෙකට ඒක අතට අරන් දෙපැත්ත හරවලා බැලුවෙ මොකක්ද සීන් එක කියලා දැනගන්න. මේ මං ඊයෙ ගෙනාව විදියෙම පනහෙ කාඩ් එකක් තමයි. හැබැයි ඒක හූරලාවත් නෑ. ඒ කියන්නෙ ආච්චි මේ විදියටද ෆෝන් එකට කාඩ් එක දාලා තියෙන්නෙ...?

'' ඕං බලාපං මං කිව්වෙ බොරුද කියලා. ඔය තියෙන්නෙ මං ඊයෙ දාපු කාඩ් එක... ''

ආච්චි දත් නැති කට පුරෝලා සිරියාවන්තකමට හිනා වෙද්දි මට හිතුනෙ කෑ ගහලා අඬන්න. හැබැයි අපේ අම්මයි අක්කයි දෙන්නානනං එකසිය ගාණට බඩවල් අල්ලගෙන හිනා වෙනවා.

'' උඹලා දෙන්නා ඒ පාර මොකද ඔච්චමට වගේ හිනා වෙන්නෙ. බලාපංකො චූටි පුතේ... ''

ආච්චි මගේ පැත්තට හැරිලා කියද්දිම ෆෝන් එකයි කාඩ් දෙකයි දෙකම අරන් මං කාමරේට රිංගගත්තා. දැන් අපේ අක්කා මේ සිද්ධිය එයාගෙ මුළු හත්මුතු පරම්පරාවටම කියනවා. අයෙ ඒකෙ හෝදන්න දෙයක් නෑ.

* * * * * * *

මේෂ වෘෂභ මිථුන කටක...
මෙස කකුල වැටිලා වලක...
කාසි නැතුව විඳින මෙදුක...
මීට හොඳයි නිදියන එක...

ගෙදරින් එළියට බහින්න අතේ සතේ නැතුව ඉන්න අතරෙ මට කවි සිතුවිලිත් පහළ වෙනවා අම්මපා... ඇත්තටම

අපේ තාත්තා කියනවා වගේ සේල් එකේ ජොබ් එකටවත් ගියානං කොයි තරම් හොඳද කියලා හිතෙන්නෙ මේ වගේ වෙලාවට තමයි. එහෙමනං මෙහෙම වේලෙන්න ඕනෙ නෑ.

අඩුම තරමෙ බයිසිකලේට තෙල් ගහන්නවත් රුපියල් පන්සීයක් නෑ. තාත්තා දවස් කීපෙකට සැරයක් දෙන පොකට් මනියි ඔය ඉඳලා හිටලා අම්මා හරි ආච්චි හරි දෙන සල්ලියි සේරම පහුගිය ටිකේ ගමන් වලට වියදම් වෙලා ඉවරයි.

පොඩිකාලෙනං ගිවන්තයි මායි කඩචෝරු කන්න සල්ලි එකතු කරගත්තෙ අපේ ආච්චිගෙ සුදු කෙස් ගස් කපලා. මොකද ආච්චි ඒ කාලෙ කොණ්ඩෙ ඉදිලා කියලා පිට මිනිස්සුන්ට අඟවන්න කැමති නෑ. ඩයි කරන්න ගත්තම අනිත් කෙස් ගසුත් ඉදෙනවා කියලා එයා කළේ අපිට කියලා එයාගෙ සුදු කෙස් ගස් කප්පවගත්තු එක.

එයා එක සුදු කෙස් ගහක් කපනවට අපිට රුපියලක් දුන්නා. ඉතිං ගිවන්තයි මායි හරි ආසාවෙන් තමයි ආච්චිගෙ සුදු කෙස් කපන්න එකතු උනේ. අපි සමහර දවස් වලට එක කෙස් ගහ මැදින් කපලා දෙකක් විදියට පෙන්නලා රුපියල් දෙකක් ගත්තා. ගිවන්තනං ආච්චි විසි කරන්න දෙන කෙස් හංගලා තියලා පහුවෙනිදටත් ඒවම පෙන්නලා සල්ලි ගන්නවා.

අන්තිමේ අපේ ඔය සෙල්ලම නිසා ආච්චි ඇත්තටම හිතුවෙ එයාගෙ කොණ්ඩෙන් භාගයක්ම ඉදිලා කියලා. අපි බලහත්කාරෙන් වගේ කපන කැපිල්ලට එයාගෙ තට්ටෙත් පෑදෙයි කියලා බයවෙලා ආච්චි සුදු කෙස් කපන එක නතර කරලා ඩයි කරන්න පටන් ගත්තා.

අපේ හොර වැඩේ දැනගෙන හිටපු අපේ අක්කානං





කිව්වෙ අපි බෙදාගෙන කන්න තියෙන දේ වවාගෙන කාපු නිසා හොඳ වැඩේ කියලා.

සල්ලි ප්‍රශ්නෙ නිසා එළියට බහින්න විදියක් නැතුව ඇඳේ පතබරියම් වෙලා හිටපු මගේ අවධානය බිඳුනෙ අපේ සුදූ කාත් එක්කද මන්දා කතා කරන සද්දෙකට.

'' දැස් අයියා දොයි... ඌවා වෙලා... ''

සුදූ කාමරේට ඇවිත් කෑ ගහන නිසා මං සනීප නෑ කියලා කෙල්ලව එළවගත්තනෙ. එයා ඒ බොරුවම ආපු මනුස්සයට කියනවා මට ඇහුනා. ඒ කියන්නෙ ආවෙ මොකා උනත් ඌ ඇවිත් තියෙන්නෙ මාව හොයාගෙන වෙන්න ඕනෙ. කොයි එකටත් කියලා මං රෙද්දත් බෙල්ලට වෙනකල්ම පොරවගෙන ඇස් දෙකත් තද වෙන්න වහ ගත්තා. දැන් බලමුකො මොකද වෙන්නෙ කියලා...

ම්හු... කිසිම හැල හොල්මනක් නෑ. ඒ කියන්නෙ ඇවිත් තියෙන එකා මගේ කාමරේ පැත්තට එන එකක් නැද්ද...? මං ඇස් දෙක අරින්න හදද්දිම වගේ කාගෙදෝ මන්දා සීතලම සීතල අතක් ඇවිත් මගේ නලළෙ නතර උනා. ඒ වගේම මෘදු කොළොන් සුවඳකුත් ආවා. මේ කවුරු වෙන්න ඇතිද...? මගේ පස්සෙන් එන පරාල ඇණේ මේසනාද...? නෑ නෑ... මේසනා ඇතින් යද්දිත් එන්නෙ නහය කඩාගෙන යන විදියෙ සැර සෙන්ට් සුවඳක්නෙ.

එතකොට මේ මෘදු සුවඳ... මේ සීතල සිනිඳු අත කාගෙ වෙන්න පුළුවන්ද...? ම්... දැහැමිවත් ඇවිත්ද...? මගේ හිතනං කිව්වෙ ඇස් දෙක ඇරපං පුතා කියලා. ඒත් මං හිත තව ටිකක් තද කරගෙන ඉවසගෙන හිටියා. ඕං ඒ පාර අත මගේ බෙල්ලට ගියා. කවුද යකෝ කිසි බයක් සැකක් නැතුව මගේ කාමරේටම ඇවිත්

මාව අතපතගාන මේ සුන්දරී....? හපොයි... ඉවසනවා කියන එකෙත් සීමාවක් තියෙන්න එපැයි. මං ඇස් දෙකෙන් එක ඇහැක් ලාවට වගේ ඇරලා බැලුවා. දෙවියනේ.... මේ දැහැමිවත් මේසනාවත් නෙමෙයි... මේ අපේ චූටි හෙවත් රශ්මිනෙ.... තවත් මොකටද හොර නින්දෙ ඉන්නෙ. මං ඒ පාර ඇස් දෙකම ඇරියා. චූටි එයාගෙ අත අහකට ගත්තෙ ගැස්සිලා වගේ.

" චූටි...? "

" දෑස් අයියා... මං... මේ... "

පව් අප්පා... එයාට ගොතත් ගැහෙනවා.

" මොකද මේ මහ දවාලෙ යකෙක් ගහලා වගේ බයවෙලා...? "

මං ඇහුවෙ හෙමින් සීරුවේ රෙද්දෙන් එළියට එන ගමන්.

" මං මේ තිලකාච්චි බලන්න ආවා... "

" තිලකාච්චි කොහෙද මගේ කාමරේ...? "

මං ඇහුවෙ නෝන්ඩියට වගේ.

" තිලකාච්චි මේක අස්සෙ නෑ කියලා මමත් දන්නවා හලෝ... ඔයාට අසනීපයි කියලා සුදූ කියපු නිසා මනුස්සකමට බලන්න ආවෙ... "

ඕං කෙල්ල දැන් සුපුරුදු ට්‍රැක් එකට වැටිලා. හුහ්... මනුස්සකමටලු මාව බලන්න ආවෙ.

" මනුස්සකමට උනත් හැන්ඩි කොල්ලෙක්ගෙ කාමරේට ලස්සන කෙල්ලෙක් තනියම එන එක ශරීර සෞඛ්‍යයට හොඳ මදි... තේරුණාද ගෑණු ළමයට...? "

" හපෝ... මෙයාගෙ මහලොකු හැන්ඩිය... "





චූටි ඒක කිව්වෙ හරි ලස්සනට කටත් ඇද කරලා.

" ඔව් ඉතිං... මං ඔය සමහරු තරම් හැන්ඩි නැතුව ඇති... ඒත් මගේ ඇස් දෙක ලස්සනයිනෙ හලෝ... ඒකනෙ හැමෝම මට දෑස් කියන්නෙ... "

පොරවගත්තු රෙද්ද ෆුට් බෝලයක් තරමට ගුලි කරලා කකුල් දෙක අස්සෙ ගහගෙනම මං කෙල්ලගෙ ඇස් දෙකට එබුණා. පවුලෙ ලස්සනම ඇස් දෙක තියෙන්නෙ මට කියලා හැමෝම වගේ කිව්වට ඒ වෙලාවෙනං මට චූටිගෙ ඇස් දෙක මගේ ඇස් වලටත් වඩා ලස්සනට පෙනුණා. ඒ සමහරවිට කෙල්ල බයවෙලා වගේ මගේ දිහා බලන් හිටපු නිසා වෙන්න ඇති.

" කවුද දෑස් අයියෙ සමහරු කිව්වෙ...? "

" මං කිව්වෙ මම විනෝද් තරම් හැන්ඩි නැතුව ඇති කියලා. "

මේ තරම් තඩියට ගෙවල් වල දොරවල් හදලා තියෙද්දි ආයෙ මොකටද ජනේල් වලින් ඇතුළට පනින්නෙ. මං කෙලින්ම මාතෘකාවට බැස්සා.

" ඔයා... ඔයා කොහොමද විනෝද් ගැන දන්නෙ...? "

චූටිගෙ ඇස් දෙක දැන්නං පොඩ්ඩක්වත් චූටි නෑ. ඒවා බයටම ලොකු වෙලා.

" මං ඌ ගැන කිව්ව ටිකට ඔයාට මොකද මේ දාඩියත් දාලා....? විනෝද් කියන්නෙ ඔයාගෙ... '

" ඒයි... නවත්ත ගන්න... විනෝද් කියන්නෙ මගෙ කවුරුවත් නෙමෙයි... "

කෙල්ල ඒක කිව්වෙ නිකම්ම නෙමෙයි. එයාගෙ අර

" එයා තාම ඔයාගෙ කවුරුවත් නෙමෙයි කියන්න…
අපිත් දන්නවා. මං කිව්වෙ තව ඉස්සරහට කවුරුහරි වෙයිද දන්න…
කියලා.... "

ඕං ඒ පාර සුදු මූණ ආපහු රතු උනා.

" ඔව්.... සමහරවිට ඒක එහෙම වෙන්නත් බැරි නෑ…

දැන් තත්පරේකට කලින් මාව මරන් කන්න තරම් තරහෙන්…
හිටපු කෙල්ල ඒ උත්තරේ දුන්නෙ සැහෙන කූල් ඩවුන් වෙලා…

" චූටි... මේ බලන්න... "

විහිළු කිරිල්ල පැත්තක තියලා මං චූටිගෙ මූණ මෙ…
ඇස් දෙක දිහාට හරව ගත්තා. කෙල්ල ඉන්නෙ සැහෙන අඩ…
වෙලා කියලා ඒ මූණ දැක්කම හිතාගන්න පුළුවන්.

" බබා... අපේ මේ වයස තියෙන්නෙ ආදරේ කරන්න…
තමයි. ඒත්... ඔයාගෙ විභාගෙට තව මාස කීපයයි තියෙන්නෙ…
ආදරයක් නිසා අවුරුදු දහතුනක් තිස්සෙ කරපු කැප කිරීම් සේ…
වතුරෙ අරින්න එපා. තේරුණාද...? "

මගේ කතාව ඇහුවා විතරයි ඒ ඇස් දෙක කඳුලින් පිරුණා…
යකඩෝ... මං අඬන්න තරම් දෙයක් කිව්වයැ.

" ආදරේ කරන එක වැරැද්දක්ද අයියා...? "

" කවුද කිව්වෙ ඒක වැරැද්දක් කියලා. මං කිව්වෙ ආදර…
නිසා ඉගෙනීම කඩාකප්පල් කරගන්න එපා කියලා විතරයි. "

" විභාගෙ ඉවරවෙලා ආදරේ කළොත්...? "

මෙයා මොනවද මේ අහන්නෙ...? මං හිතන්නෙ කෙල්ල…
ආදරේ නිසා පිස්සු හැදෙන තත්ත්වෙට පත්වෙලා ඉන්නෙ.





" කරකව කරකව එකම දේ අහන්න එපා බබා. මං ඔයාගෙ ප්‍රශ්නෙට උත්තර දීලා ඉවරයි. "

මං ඇඳෙන් බැස්සෙ මේ කතාව මෙතනින් නතර කරන එක හොඳයි කියලා දැනුණ නිසා.

" දැස් අයියා.... "

" ම්.... ? "

" ඔයා කාටහරි ආදරේ කරනවද...? "

මං කතාව ඉවර කරන්න හැදුවට චූටිට ඒක ඉවර කරන්න අදහසක් නෑ වගේ. කෙල්ල ඒ පාර වෙන පොටකින් මාතෘකාවට එන්න හදන්නෙ.

" මට ඒකට දැන්ම උත්තරයක් දෙන්න විදියක් නෑ. "

මං විධායක බලතල පාවිච්චි කරලා කියලා දැම්මා.

" ඇයි ඒ...? "

" ඒකට හේතුවක් තියෙනවා. "

" මට කියන්න බැරි හේතුවක්ද...? "

" ඔව්... "

එතනින් එහා අපේ චූටි නංගියා කිසි දෙයක් ඇහුවෙ නැතුව හොර පූසියෙක් වගේ කාමරෙන් එළියට ගියා. පව් අප්පා...

* * * * * * *

වලිඟිල්ල මගේ මූණටම ළං කරලා.

'' එයා තාම ඔයාගෙ කවුරුවත් නෙමෙයි කියන්නනම් අපිත් දන්නවා. මං කිව්වෙ තව ඉස්සරහට කවුරුහරි වෙයිද දන්නෑ කියලා.... ''

ඕං ඒ පාර සුදු මූණ ආපහු රතු උනා.

'' ඔව්.... සමහරවිට ඒක එහෙම වෙන්නත් බැරි නෑ... ''

දැන් තත්පරේකට කලින් මාව මරන් කන්න තරම් තරහින් හිටපු කෙල්ල ඒ උත්තරේ දුන්නෙ සෑහෙන කුල් ඩවුන් වෙලා.

'' චූටි... මේ බලන්න... ''

විහිළු කිරිල්ල පැත්තක තියලා මං චූටිගෙ මූණ මගේ ඇස් දෙක දිහාට හරව ගත්තා. කෙල්ල ඉන්නෙ සෑහෙන අවුල් වෙලා කියලා ඒ මූණ දැක්කම හිතාගන්න පුළුවන්.

'' බබා... අපේ මේ වයස තියෙන්නෙ ආදරේ කරන්න තමයි. ඒත්... ඔයාගෙ විභාගෙට තව මාස කීපයයි තියෙන්නෙ. ආදරයක් නිසා අවුරුදු දහතුනක් තිස්සෙ කරපු කැප කිරීම් සේරම වතුරෙ අරින්න එපා. තේරුණාද...? ''

මගේ කතාව ඇහුවා විතරයි ඒ ඇස් දෙක කඳුළින් පිරුණා. යකඩෝ... මං අඬන්න තරම් දෙයක් කිව්වයැ.

'' ආදරේ කරන එක වැරැද්දක්ද අයියා...? ''

'' කවුද කිව්වෙ ඒක වැරැද්දක් කියලා. මං කිව්වෙ ආදරේ නිසා ඉගෙනීම කඩාකප්පල් කරගන්න එපා කියලා විතරයි. ''

'' විභාගෙ ඉවරවෙලා ආදරේ කළොත්...? ''

මෙයා මොනවද මේ අහන්නෙ...? මං හිතන්නෙ කෙල්ල ආදරේ නිසා පිස්සු හැදෙන තත්ත්වෙට පත්වෙලා ඉන්නෙ.





'' කරකව කරකව එකම දේ අහන්න එපා බබා. මං ඔයාගෙ ප්‍රශ්නෙට උත්තර දීලා ඉවරයි. ''

මං ඇඳෙන් බැස්සෙ මේ කතාව මෙතනින් නතර කරන එක හොඳයි කියලා දැනුණ නිසා.

'' දැස් අයියා.... ''

'' ම්.... ? ''

'' ඔයා කාටහරි ආදරේ කරනවද...? ''

මං කතාව ඉවර කරන්න හැදුවට චූටිට ඒක ඉවර කරන්න අදහසක් නෑ වගේ. කෙල්ල ඒ පාර වෙන පොටකින් මාතෘකාවට එන්න හදන්නෙ.

'' මට ඒකට දැන්ම උත්තරයක් දෙන්න විදියක් නෑ. ''

මං විධායක බලතල පාවිච්චි කරලා කියලා දැම්මා.

'' ඇයි ඒ...? ''

'' ඒකට හේතුවක් තියෙනවා. ''

'' මට කියන්න බැරි හේතුවක්ද...? ''

'' ඔව්... ''

එතනින් එහා අපේ චූටි නංගියා කිසි දෙයක් ඇහුවෙ නැතුව හොර පූසියෙක් වගේ කාමරෙන් එළියට ගියා. පව් අප්පා...

* * * * * * *

# 06

'' මේ වැඩේ හරි යන්නෙ නෑ බේබි... මං ඉංගිරිසි ඉගෙන ගන්න අදහස අතෑරලා දැම්මා... ''

දවසක් දවල් වරුවෙ අපේ ගෙදරට දුවගෙන ආව සරා ගොයියා දුක සේ කතාව ඇරඹුවා. පේන විදියටනං මිනිහා ඇදගෙන නාලා වගේ. සමහරවිට එදා මං කියලා දීපු නම් වලින් මාළු ඉල්ලන්න ගිහින් මාළුකාරයාගෙන් ගුටිකෑවද දන්නෙ නෑ.

'' හැබෑටම මොකද සරා අයියෙ උනේ...? ''

'' අපි වගේ උදවිය ඉංගිරිස් කතා කරන එක මිනිස්සුන්ට විහිළුවක් වගේ බේබි. ඕං අපිත් ටයි පොලු කෑල්ලක් බෙල්ලෙ ගැටගහගෙන කකුල් දෙකටම දිග කලිසමක් ඇඳලා හිටියානං අපිටත් අගේට සෑර් කියලා කතා කරයි. ''

මනුස්සයා ඇඳගෙන හිටපු හම ගිය කොට කලිසමයි අත් නැති ටී ෂර්ට් එකයි දිහා බලලා කිව්වෙ හරිම අසරණ ලීලාවෙන්.

'' දැන් කවුද සරා අයියට මොනවත් කිව්වෙ...? අපේ මුදලාලි අන්කල්ද...? ''





'' අපොයි නෑ. මට ඉංගිරිස් පුළුවන් කියලා තාම මුදලාලියා දන්නෙ නෑ. ''

සරා කතා කළේ කඩ්ඩ පොලිෂ් වෙච්ච ගානට. තාම මේ මාළු ජාති තුන හතරකගෙ නම් කියලා දුන්නා විතරයි ඌට ඉංගිරිස් පුළුවන්ලු. මං ඒත් වෙනසක් නොපෙන්වා කතාව අහගෙන හිටියා.

'' එහෙමනං කවුද...? ''

'' දවසක් බේබි මාව හන්දියෙ ඉඳලා බයිසිකලේ දාගෙන එන අතරෙ කෑම එකක් ගන්න අර රාමසිංහ හෝටලේ ළඟ නතර කළා මතකයිනෙ. ''

'' ඔව්... ''

මිනිහා රජ කාලෙ ඉතිහාස කතාවක් මෙතනට ඇඳ ගත්තෙ ඇයි කියලා මට හිතාගන්න බැරි උනා.

'' බේබි එදා කෑම එක ඉල්ලපුවම උන් හිනා උනාද...? ''

'' නෑනෙ... ''

'' ඒකනෙ කියන්නෙ. මමත් ඊයෙ ඒ හෝටලේට ගිහින් බේබි ඉල්ලපු විදියටම කෑම එකක් ඉල්ලුවා. ඒ කඩේ මුදලාලියයි වටේ හිටපු සෙනඟයි සේරම ටික මට හිනා උනානෙ. බලන්නකො...''

'' සරා අයියා කොහොමද කෑම එක ඉල්ලුවෙ...? ''

මං ඒ ප්‍රශ්නෙ ඇහුවෙ මං එදා ඉල්ලපු විදිය ගැන මට විශේෂ මතකයක් තිබුණෙ නැති නිසා.

'' මං කිව්වෙ මට ලන්ච් පැකට් එකක් දෙන්න කියලා...''

ඇත්තනෙ බොලේ... ඒකෙ හිනා වෙන්න දෙයක් නෑ

තේන්නම්. ඒත් මුදලාලියි වටේ මිනිස්සුයි සේරම හිනා උනා කියන්නෙ සරාගෙ කතාවෙ මොකක් හරි කොස්සක් තිබිලා තියෙනවා කියන එකනෙ. ඒක මොකක්ද කියලා මටත් හිතාගන්න බැරි උනා.

'' මං කියපු දේ මොකක්හරි වැරැද්දක් තියෙනවද බේබි...?''

'' කිසිම වැරැද්දක් නෑ සරා අයියෙ... තිතටම හරි. ''

සරාගෙ ඇස් දෙක සතුටින් ලොකු උනේ එයාගෙ ඉංග්‍රීසි වචනෙ හරි කියපු නිසා වෙන්න ඇති.

'' ඒකනෙ... මං එදා බේබි කියපු වචනෙ හරියටම මතක තියාගෙන හිටියා. ඒත් ඊයෙ රෑ වෙච්ච වැඩේ නිසා මට ඉංගිරිසි එපාම උනා. ''

'' මොකක්ද සරා අයියෙ කිව්වෙ...? ඊයෙ රෑ...? ''

'' ඔව්... ඊයෙ රෑ තමයි මං රාමසිංහ එකට ගියේ... ''

අප්පට සිරි... සරා ලන්ච් පැකට් එක ඉල්ලලා තියෙන්නෙ රෑද...? පිට මිනිස්සු හිනා නොවී ඉදියිද දෙයියනේ ඉතිං... මං එතන හිටියනං මමත් හිනා වෙනවනෙ.

'' ඇයි බේබි නිකං අමුතුවට බැලුවෙ...? ''

මගේ මූණෙ වෙනස සරාටත් තේරිලාද කොහෙද...

'' සරා අයියෙ... ලන්ච් පැකට් ඉල්ලන්නෙ දවල්ට.... මොකද අපි දවල් කෑමටනෙ ලන්ච් එක කියලා කියන්නෙ... ''

'' ඇත්තම තේන්නං... එදා බේබියි මමයි රාමසිංහ එකට ගියේ දවල්නෙ. ඒත් මං හිතං හිටියෙ ලන්ච් පැකට් කියන එකේ තේරුම බත් පැකට් එකක් කියලයි. ''





'' ඒකනෙ සරා අයියා පටලගෙනනෙ. ඒකයි මිනිස්සු හිනා වෙලා තියෙන්නෙ... ''

'' එතකොට බේබි දවල් කෑම වේල ලන්ච්නම් රෑ කෑම වේලට කියන්නෙ මොකක්ද...? ''

'' රෑ කෑම වේලට කියන්නෙ 'ඩිනර්' කියලා... ''

සරා හරි උවමනාවෙන් ඒක අහගෙන ඉඳලා මූණට අමුතු හිනාවක් නගාගත්තා.

'' හරි එහෙනං... මං අද රෑට ගිහින් ඩිනර් පැකට් එකක් ඉල්ලන්නම්කො... හැබැයි බේබි ඕකුත් අදත් මට හිනා උනොත්නං මං එකෙක් දෙන්නෙක්ගෙ දත් ඇඳි බඩට යවලා තමයි ගෙදර එන්නෙ. උන් දන්නෑ මේ සරාගෙ හැටි... ''

මං මොනවත් කියන්න කලින්ම සරා තනියම බැන බැන යන්න ගියා.

'' කාටද පුතා ඒ හාදයා බැන බැන යන්නෙ...? ''

එතනින් ගිය අපේ තාත්තටත් සරාගෙ බැනිල්ල ඇහිලා.

'' අර රාමසිංහ එකේ මුදලාලිට... ''

'' ඒ මොකෝ...? ''

'' ඊයෙ රෑ හෝටලේට ගිහින් ලන්ච් පැකට් එකක් ඉල්ලලා... ඒකට මුදලාලි හිනා උනා කියලා කේන්ති ගිහින්. ''

ඒ කතාවට අපේ තාත්තටත් හිනා ගියා.

'' මේ ඒක නෙමෙයි... අද හවස මොනවත් වැඩ දාගන්න එපා. මං සමරෙලටත් හවස් වරුවෙ මේ පැත්තෙ ඇවිත් යන්න එන්න කිව්වා. ''

තාත්තා ඒ දුන්නෙ විධානයක්. ඒත් ඉතිං ඒකට බය වෙන්
දෙයක් නෑ. මං යන හැම ගමනක්ම යන්නෙ ගිවන්ත එක්ක
හවස් වරුවෙ මිනිහත් මෙහෙ එනවානං ආයෙ මොකවද
ගෙදරින් පිට යන්නෙ.

හැබැයි අපේ අක්කාටනං මගෙයි ගිවන්තගෙයි
අතිසාර මිත්‍රත්වය වැඩිය දිරවන්නෙ නෑ. එයා කියන්නෙ
ගිවන්තයි ගිවන්තට මාවයි නැතිව බැරි නිසා අපි දෙන්නා ගැ
මිනිහයි වගේ කියලා. ඕවා ඉතිං ඊරිසියාවට කියන කතා නිසා
ගිවාටවත් මටවත් ඒක ඒ හැටි ගාණක් නෑ.

කොහොමහරි හවස හතර විතර වෙද්දි සමරෙ මාමා
රුවන්ති නැන්දයි චූටියි ගිවන්තයි හතර දෙනාම අපේ ගෙදර
ආවා. ඒ විතරක් නෙමෙයි... කාලෙකට පස්සෙ අපේ චූටි මාමත්
කලින් ඇවිත්. ඒ කියන්නෙ මේක මහා මණ්ඩලයේ සාමාජිකයන්
කලින් තීරණය කරලා රැස් වෙච්ච සමුළුවක්.

'' කෝ... ලොකු දුව තාම ආවෙ නැද්ද...? ''

ඒ ඇහුවෙ සමරෙ මාමා.

'' ලොකු බාත් රූම් එකේ. තව ටිකකින් එයි. ''

අම්මා උත්තර දෙද්දි ආච්චිත් කිරි කෝඩු සමනලී වගේ
ඇවිත් සබේ මැද්දෙන්ම ඉඳගත්තා. ගිවන්තයා මගේ මූණ දිහා
බලලා ඔළුව හෙල්ලුවෙ මේක ගැන කලින් දන්නවද කියලා අහන්න
වගේ. මමත් නෑ කියලා ඔළුවෙන්ම උත්තර දුන්නා.

'' සුදූ ටීවී එක දාගෙන කාටූන් එකක් බලන්නකො... ''

අක්කා නාලා ආවට පස්සෙ අපේ අම්මා පොඩි එකීට
ටීවී එකත් දාගන්න අවසර දුන්නා. හරි... දැන් තියෙන්නෙ වැඩේ





පටන් ගන්න.

දවස් තුන්සිය හැට පහෙන් අඩුම තරමෙ තුන්සීයක්වත්
හඹබවෙන අපේ කට්ටිය අද නිකං ආගන්තුකයො වගේ සෙටියෙ
හරිබරි ගැහිලා වාඩිවෙලා බලගෙන ඉන්නවා. මේකෙ අගක් මුලක්
නොදැන හිටපු මමයි ගිවන්තයි දෙන්නා පුටු දෙකක් පිටිපස්සට
කරගෙන ඉඳගත්තා.

'' ඔයාලා දෙන්නා පස්සට ගියාට අපි අද මේක ලැස්ති
කළෙත් ඔයාලා එක්ක කතා කරන්න තමයි. ''

ඒ කතාව කිව්වෙ අපේ තාත්තා. ඇයි හත් දෙයියනේ...
තාත්තලට මායි ගිවන්තයි එක්ක කතා කරන්න මීටින් තියන්න
ඕනෙයැ. කියන්න තියෙන දෙයක් ඕය ඕන වෙලාවක කියන්න
බැරියැ. ඒත් සමහරවිට මේක ගිවන්තටයි මටයි කසාදයක් කරලා
දෙන්න යනවා වගේ සීන් එකක්වත්ද දන්නැනෙ. හප්පා... මතක්
වෙද්දිත් ඇඟ කිළිපොලා යනවා.

'' ළමයි දෙන්නා බයවෙලා ඉන්නෙ අයියෙ. අපි කෙළින්ම
කාරණාවට බහිමු.... ''

ඕං අපේ චූටි මාමට වැරදිලා. අපි බය කියන දේ දන්නෙත්
නෑ. අපි දෙන්නා මේ ඉන්නෙ පුදුම වෙලා.

'' මට මුලින්ම කියන්නකො ඔය දෙන්නගෙ ඩිප්ලෝමා
කෝස් එකේ තත්ත්වෙ කොහොමද කියලා... ''

තාත්තා ඒ ඇහුවෙ අපේ මැනේජ්මන්ට් ඩිප්ලෝමා එක
ගැන.

'' ඒකෙ විභාගෙ ගිය මාසෙත් ඉවරයි තාත්තෙ. මාසෙකින්
තමයි රිසල්ට් දෙනවා කිව්වෙ. රිසල්ට් බලලා ඕනෙනං උසස්

ඩිප්ලෝමා එකට යන්න පුළුවන්... ''

මං ගිවන්ත දිහත් බලලා උත්තර දුන්නා.

'' හරි... අපි ඔය දෙන්නව ඒ කෝස් එක කරන්න දැම්මෙ හේතු දෙකක් මත. එකක් ඔයාලගෙ දැනුම වර්ධනය කරගන්න. අනික ඔයාලව ඒ ලෙවල් කරපු ගමන්ම රස්සාවකට දාන්න බැරිකමට. ''

අපේ තාත්තා හරි වෘත්තීයමය විදියට සභාව අමතගෙන ගියා.

'' ඔව් ඉතිං... අපිටත් ඔය වගේ කොලු කාලයක් තිබ්බනෙ නේද නලින්...? පොඩි රස්තියාදුවක් ගහලා කෙල්ලෙක්ට ඇහැක් ගහලා ටිකක් විනෝදෙන් ඉන්න තමයි අපි අවුරුදු එකහමාරක් විතර ඔයාලට දෙන්න තීරණය කළේ. ''

සමරෙ මාමා කතාව මැද්දට පැනලා පොඩි ජෝක් වෝක් එකක් දැම්මා. ඒත් ඒකට මටනං හිනා ගියේ නෑ. මොකද මෙයාලා ඊළඟට කියන්න හදන්නෙ අපේ ඒ ෆනී පීරියඩ් එකට නැවතීමේ තිත තියන දෙයක් ගැන වෙන්න ඇති කියලා මට ඉවෙන් වගේ දැනිලයි තිබුණෙ.

'' එතකොට ලොකු දූවගෙ ට්‍රේනින් එක...? ''

'' ඒක මේ අවුරුද්දෙ අන්තිමට ඉවර වෙන්නෙ තාත්තා. මොකද ඔඩිට් ට්‍රේනින් එක කම්ප්ලීට් නොකර චාටර්ඩ් කම්ප්ලීට් කරන්න බෑ. ''

'' හරි... ඒ කියන්නෙ ඔයාව අපිට තව මාස කීපයක් රිලීස් කරන්න පුළුවන්. ඒත් ඉලන්දාරි දෙන්නා දැන් රස්තියාදු ගැහිල්ල නතර කරලා ඉඳලා හිටලාවත් කම්පනි එක පැත්තෙ





ඇවිත් ටික ටික වැඩ ඉගෙන ගන්න ඕනෙ. එතකොට ඔයාලට තව මාස දෙකකින් රිසල්ට් එහෙම බලලා ෆුල් ටයිම් වැඩ කරන්න පුළුවන්. තේරුණාද...? ''

මගේ අනුමානය සීයට පන්සීයක්ම නිවැරදි කරමින් අපේ තාත්තා ඊතලේ විද්දා. ඒ කතාවට ගිවන්තගෙ කටත් බාගෙට ඇරෙනවා මං බලාගෙන.

'' ඔයාලා දන්නවා ඇතිනෙ පුතා... අපි බොහොම පුංචියට ව්‍යාපාර ආරම්භ කරපු මිනිස්සු. ඔයාලගෙ මේ තිලකාච්චි ඒකට සාක්කි දරයි.

සීයයි ආච්චියි හරියට එදා වේල කන්න නැතිව ඉඳපු කාලයක් තිබිලා තියෙනවා. ඒ වෙද්දි ඔයාලගෙ අම්මාවත් මාමලා දෙන්නාවත් කසාද බැඳලා ඉඳලා නෑ. එතකොට සමරෙ කැම්පස් යනවා. අම්මා විභාගෙ ඉවර කළාට එයාව රස්සාවකට අරින්න සීයා කැමති වෙලා නෑ. චූටි මල්ලි ඉස්කෝලෙ යනවා. එහෙම නේද...? ''

තාත්තා එහෙම නේද කියලා ඇහුවෙ සමරෙ මාමගෙන්.

'' ඔව් නලින්... මං කැම්පස් එකේ සෙකන්ඩ් ඉයර් ඉද්දි ඔයා තර්ඩ් ඉයර් හිටියෙ. ඒ ඉද්දිනෙ අපි හොඳ යාළුවො උනේ... ඊටත් පස්සෙනෙ ඔයා අපේ ගෙදර යන්න එන්න පටන් අරන්... ''

'' අනේ අයියෙ මේ අනවශ්‍ය කතා මෙතනට ඇදගන්නෙ නැතුව කියන්න ආපු දේ කියන්නකො... ''

අපේ අම්මා සමරෙ මාමගෙ කතාවට තහංචි දැම්මා විතරයි රුවන්ති නැන්දත් හිනාව හංගගන්නවා මං දැක්කා. ඔය ඉතිහාස කතාවනං අමුතුවෙන් කියන්න දෙයක් නෑ. තාත්තා සමරෙ

මාමව හම්බවෙන්න වගේ මේ ගෙදර ඇවිත් අපේ අම්මව දැලේ දාගත්ත හැටි අපි මීට කලින් අහලා තියෙනවා.

" කැම්පස් ගියාට මමත් වත්පොහොසත්කම් තිබුණු පවුලක කෙනෙක් නෙමෙයි. අපේ තාත්තා මං පුංචි කාලෙදිම නැති වෙලා. අම්මා තනියම දුක් විඳලා තමයි මාව හදාවඩාගත්තෙ. මං කැම්පස් එකේ ඉන්න කාලෙ මං නැති පාළුව දරා ගන්න බැරිවද මන්දා අපේ අම්මත් ලෙඩ වෙලා ඉඳලා අන්තරා උනා. සමරෙ කිව්වා හරි...

මං කැම්පස් ඉන්න කාලෙ එයා එක්ක නිතර නිතර මේ ගෙදර ආවා ගියා තමයි. කොයි තරම් අගහිඟකම් තිබුණත් මේ ගෙදර තිබුණ සමගිය සමාදානය ගැන මගේ හිත පැහැදුනා. අම්මා තාත්තා නැතිව හිටපු මං මේ අම්මා තාත්තගෙන් ආදරේ වින්දා. ඒකයි මං මේ පවුලට එකතු වෙන්න තීරණේ කළේ. "

තාත්තා කතාව කරගෙන යන අතරෙ අපේ ආච්චි බුරුස් ගාලා තහය උඩට අදින සද්දෙ අපි හැමෝටම ඇහුණා. ඒත් කවුරුවත් එයා ගැන විශේෂ අවධානයක් යොමු කළේ නෑ. මගේනං ඇස් දෙක ඒ වෙද්දි නතර වෙලා තිබුණෙ බිත්තියෙ ගහලා තිබුණු අපේ සීයගෙ පින්තූරෙ දිහාට. තාත්තගෙ කතාවත් එක්ක කවදාවත් හැබැහින් දැකලා නොතිබුණු අපේ සීයා ගැන අමුතුම විදියෙ ආදරයක් ගෞරවයක් මගේ හිතට දැනෙන්න පටන් අරන් තිබුණා.

" නලින් අපේ නංගිව කසාද බැඳලා මෙහෙ ඉන්න කාලෙ තමයි අපේ තාත්තගෙ යාළුවෙක් එයාගෙ පොල් වත්ත විකුණලා දෙන්න කියලා අපේ තාත්තට පංගඩත්තු කරලා තිබුණෙ. ඒත් ඒ වත්ත අක්කර කීපයක් විශාල එකක් නිසා තනි මනුස්සයෙක්ට ඒක සල්ලි දීලා ගන්න අමාරු උනා.





ඒ දවස්වල නලින් තමයි තාත්තට යෝජනා කළේ ලෑන්ඩ් සේල් කරන එක හොඳ ඉන්කම් එකක් එන වැඩක් කියලා. ඒත් අපිට ඒ වෙද්දි තිබුණෙ මේ ඉන්න ඉඩමෙනුත් පර්චස් දොළහක් විතරයි. එතකොට මමයි රුවන්තියයිත් යාළු වෙලා හිටියෙ. ඉතිං අපි කට්ටියම එකතු වෙලා අපේ රත්තරන් බඩු බැංකු වල උකස් තියලා ලෝන් දාලා ඒ පොල් වත්ත අරගත්තා. ඒක අපේ තාත්තා අඳුරන කෙනෙක්ගෙ නිසා අපිට තරමක් අඩු මිලට ගන්නත් පුළුවන් උනා. පස්සෙ අපි ඒක ඉඩම් කට්ටි තුන හතරකට බෙදලා වෙන වෙනම විකුණලා තරමක ආදායමක් ගත්තා. ඒකෙන් තව එකක් ගත්තා.... ඒවත් පොඩි ගාණක් තියාගෙන වික්කා. ඔහොම ඔහොම කාලයක් කරගෙන යද්දි අපේ අතේ තරමක මුදලක් ගැවසුනා. අපි බැංකු ණය ගෙව්වෙ උකස් තියපු බඩු බේරුවෙ සෑහෙන කාලයක් ගියාට පස්සෙ. ඒ වෙද්දි අපේ සමහර රත්තරන් බඩු සින්න වෙලත් තිබුණා නේද නංගි...?"

සමරෙ මාමගෙ කතාවට අම්මා ඔළුව වැනුවෙ හරිම හැඟීම්බර විදියට.

" අපි ඒ විදියට මේක අමාරුවෙන් ගොඩගනාගෙන යද්දි තමයි සීයා හදිස්සියෙ අන්තරා උනේ. ඒත් අපි අපේ ව්‍යාපාරය වැටෙන්න දුන්නෙ නෑ. මමයි සමරෙයි අපේ උපාධි පැත්තක තියලා අඩුවට ඉඩම් හොයන්න කෝච්චි වලිනුයි බස් වලිනුයි රට වටේ ඇවිද්දා. පස්සෙ තමයි අපි එහා වත්තෙ මුදලාලි අයියලගෙන් තව පර්චස් තිහක් සල්ලි දීලා අරගෙන මේ ගේ ලොකු කරලා ගැහුවෙ. "

" තාත්තා නැති උනාට පස්සෙ අපේ පවුලෙ හැම බරක්ම කරට ගත්තෙ නලින්. එයා කවදාවත් ආත්මාර්ථකාමී අදහස් තිබුණු

කෙනෙක් නෙමෙයි. හැම වෙලාවෙම කටයුතු කළේ අපේ කියන හැඟීමෙන්. නලින් තමයි චූටි මල්ලිගෙ කසාදෙත් ඉහළින්ම කරලා අපිටත් එහා පාරෙන් ලොකු ඉඩමක් අරන් දීලා ගේ හදලා දුන්නෙ.''

සමරෙ මාමා හරි ලෙන්ගතු විදියට අපේ තාත්තා ගැන කතා කරගෙන යද්දි තාත්තා ඒකට විරුද්ධ උනා.

'' නෑ සමරෙ. ඒ කිසි දෙයක් මං තනියම කරපු දේවල් නෙමෙයි. ඔයාලා හැමෝම හැම වෙලාවෙම මං වටේ ඉඳගෙන මට උදව් දුන්නා. අද මේ දේවල් මේ තරම් ශක්තිමත් විදියට ගොඩ නැගිලා තියෙන්නෙ අපේ ඒ උත්සහය එකමුතුව නිසා. තේරුණාද ඔයාලට...? ''

තාත්තා කතාව පටන්ගත්තෙ සමරෙ මාමා දිහා බලාගෙන උනත් ඒක ඉවර කළේ මමයි ගිවන්තයි දිහා බලාගෙන. අපි දෙන්නම ඒක තේරුම් ගත්තා වගේ ඔළුව වැනුවා.

'' දැන් අපි මේ පළාතෙ නමක් හදාගෙන ඉවරයි ලොකු පුතා. ඒ වගේම අපි මිනිස්සුන්ට කවදාවත් වංචාවල් කරලා ඉඩම් විකුණලා නෑ. ඒ නිසා අපිට ජනතා විශ්වාසයත් ලැබිලා තියෙනවා. අපිට දැන් අවශ්‍ය අපෙන් පස්සෙ මේ දේවල් දියුණු කරගෙන ඉස්සරහට ගෙනියන්න පුළුවන් පිරිසක්. ''

'' මට හිතෙන්නෙ නලින් අපිට ඒ පිරිස පිටින් හොයන්න අවශ්‍ය නෑ. අපේ ළමයින්ගෙ උගත්කමේ හැටියට මේ අය අපේ මැනේජ්මන්ට් එක බාරගන්න පුළුවන් තත්ත්වයෙ ඉන්නවා. ''

'' ඒක තමයි සමරෙ මමත් කියන්නෙ. අපේ කොල්ලො දෙන්නට දැන් මේවා බාර දීලා අපි නිදහස් වෙන්න ඕනෙ. අනික ඒ කාලෙ ඔයයි මමයි අතර තිබුණ මිත්‍රත්වයට වඩා වැඩි මිත්‍රත්වයක් මේ දෙන්නා අතර තියෙන එකත් අපිට ලොකු චාන්ස් එකක්.





එහෙම නේද ඉලන්දාරි දෙන්නා...? ''

'' අපෝ ඒ ගැනනම් අමුතුවෙන් කියන්න දෙයක් නෑ. අපේ ලොක්කා එයාගෙ කාමරේ ජනේල් වලට ග්‍රිල් දාන්න දෙන්නෙ නැත්තෙත් ඔය අතිජාත යාළුකම නිසානෙ. ''

ඕං මෙච්චර වෙලා කට වහගෙන හොඳ ළමයා වගේ හිටපු රුවන්ති නැන්දා අනවශ්‍ය ප්‍රකාශයක් මාධ්‍යයට මුදා හැරියා. තාත්තයි සමරෙ මාමයි දෙන්නත් ඒක අහලා හිනා උනේ ඒ රහස එයාලත් දැනගෙන හිටියා කියන්න වගේ අදහසකින්.

'' එහෙනං ළමයි දෙන්නා ලබන මාසෙ පළවෙනිදා ඉඳලා ඔයාලට පුළුවන් වෙලාවල් වලට කම්පැනි එක පැත්තෙ ඇවිත් අපිට උදව් වෙන්න. හැබැයි මේක ඔළුවට බරක් කියලා හිතන්න එපා. මොකද කෙනෙක්ව බලෙන් දේකට යොමු කරවන එකෙන් එයාගෙ නියම කැපෑසිටි එක ගන්න බැරි වෙනවා. චූටි දූවටත් ඕනෙනං බැරියැ විභාගෙ ඉවර උනාට පස්සෙ අයියලා දෙන්නා එක්ක එකතු වෙන්න. ''

'' ලබන මාසෙ වෙනකල් ඉන්න ඕනෙ නෑ නේද ලොකු අයියෙ. අපි දෙන්නා හෙට ඉඳලා උනත් වැඩට එන්න ලෑස්තියි. ''

මං ගිවාගෙ කරට අතදාගෙන කියපු ඒ කතාවට අම්මලා තාත්තලගෙ මූණු වල ආඩම්බර හිනාවක් නැගුණා.

'' දැන් ඉතිං මටත් දෙයියනේ කියලා සන්තෝසෙන් ඇහැ පියවගන්න පුළුවන් පුතේ. ''

අපි හැමෝගෙම කතා මෙච්චර වෙලා අහගෙන හිටපු අපේ ආච්චි අන්තිම මොහොතෙ ඕන්නැති කතාවක් කිව්වා. ඒකට මගේ ඇඟ හිරි වැටිලා ගියේ මං කවදාවත් ඒ වගේ මූසල දවසක්

ගැන විහිළුවටවත් හිතලා තිබුණෙ නැති නිසා.

'' මොනවද අම්මෙ මේ කියන අවකැපෙන කතා. බලන්න... ඒ ටිකට අපේ කොල්ලගෙ ඇස් වලට කඳුළුත් ඇවිත්.''

අපේ අම්මට මගේ වෙනස හරි අපූරුවට තේරිලා තිබුණා. කොහොමටත් ආච්චි පවුලෙන් වැඩිපුරම ලැදි මට කියන එක අපේ කාටවත් රහසක් නෙමෙයි.

'' හරි හරි... අම්මා මේ තරම් නිරෝගීව ඉඳගෙන ඕනෙ නැති කතා කියන්න එපා. අපේ ළමයි විතරක් නෙමෙයි... අපේ ළමයින්ගෙ ළමයිනුත් නළවන්න අම්මා ඉන්න ඕනෙ... ''

ආච්චිගෙ ළමයි තුන්දෙනාටම කලින් ඒ කතාව කිව්වෙ අපේ තාත්තා. ඒ විතරක් නෙමෙයි... එයා ඊට පස්සෙ ඉඳගෙන හිටපු පුටුවෙනුත් නැගිට්ටා. ඒ කියන්නෙ මාධ්‍ය සාකච්ඡාව ඉවරයි කියන එකද...?

'' එහෙනං ඉතිං නෝනලා දෙන්නා අපේ ඩිනර් එක ලෑස්ති කරන්න... අපිට පොඩි වැඩ වගයක් තියෙනවා... නේද නලින්...? ''

තාත්තා නැගිට්ට සැණින්ම සමරෙ මාමත් නැගිට්ටෙ එහෙම කියාගෙන. රුවන්ති නැන්දානං කටත් ඇද කරලා මාමා දිහා බැලුවෙ ඔය කියන වැඩේ අපි දන්නවා කියන්න වගේ හැඟීමකින්.

'' අම්මලා දෙන්නයි ආච්චියි කුස්සියටයි තාත්තයි මාමලා දෙන්නයි මිදුලටයි ගියාට පස්සෙ සාලෙ ඉතුරු උනේ බාල පරපුර විතරයි. සුදූනං තාමත් කිසි හැල හොල්මනක් නැතුව ටීවී බලනවා. කෙල්ලට කාටුන් තියෙනවානං කන්න බොන්න ඕනෙත් නෑ.





'' දන්නවද තාත්තලා හදිස්සියෙම ඔයාලා දෙන්නව කම්පනියට බඳවගන්න තීරණය කළේ ඇයි කියලා...? ''

සභාතොමෝ විසිර ගියාට පස්සෙ අක්කා රහසිගත සාකච්ඡාවකට මුල පිරුවා. ඒ පාර මොකක්ද මෙයා මේ කියන්න යන්නෙ...?

'' තාත්තලා ඔය ඉඩම් හොයන වැඩ වලට ඇන්තනී අන්කල්වත් හවුල් කරගෙනනෙ ඉන්නෙ. ''

'' ඉතිං...? ''

අක්කා එකපාරටම මේසනාගෙ තාත්තා ගැන කතාවක් ඇදලා ගත්තා විතරයි ගිවන්තත් ඇස් දෙක ලොකු කරගෙන අක්කා දිහාවට හැරුණා.

'' ඇන්තනී අන්කල් හොඳ ඉඩම් හොයලා දෙන එක වෙනුවෙන් අපේ කම්පනියෙන් ගාණක් ගන්නවනෙ... ඒ වගේම එයා ඒ ඉඩම් විකුණලා දෙන එක වෙනුවෙන් ඉඩම් අයිතිකාරයන්ගෙනුත් සල්ලි ගන්නවලු... ''

'' නෑ.... ''

මං ඒ කතාවට පුදුම උනා. ඇන්තනී අන්කල් හොඳ කෙනෙක් කියලයි මං මේ වෙනකල් හිතාගෙන හිටියෙ. ඒත් බලාගෙන යද්දි එයා බෝස්තිංට හපන් ඩයල් එකක්නෙ.

'' නෑ නෙමෙයි හලෝ ඔව්. ඒ දේවල් ගැන තාත්තලා ටික ටික දැනගෙන හිටියට මුකුත් ඇක්ශන් එකක් අරගෙන නෑ. ඒත් මේ ළඟදි තාත්තලට ආරංචි වෙලා තියෙනවා එයා ඉඩම් සල්ලි දීලා ගන්න හොයන මිනිස්සුන්ව සෙට් කරගෙන එයාලට අපේ කම්පනිය හරහා ඉඩම් අරන් දීලා එයාලගෙනුත් කමිෂන්

එකක් ගන්නවා කියලා. ඒ විතරක් නෙමෙයි... දවසක් අපේ ඔෆිස් එකට මනුස්සයෙක් ඇවිත් තියෙනවා වෙන්දේසි ඉඩමකින් ඉඩම් කට්ටියක් අරගන්න. එයාට ඕනෙ වෙලා තියෙන්නෙ පාරට මායිම් වෙලා තියෙන ඉඩමක්ලු කඩයක් දාන්න. ඒත් ඒ වෙද්දි පාර අයිනෙ ඉඩම් සේරම විකිණිලා ඉවරයිලු... චූටි මාමා ඒ ගැන ඒ ආපු කස්ටමර්ට පහදලා දීලා.

ඒ වෙලාවෙ ඇන්තනී අන්කලුත් අපේ තාත්තව හම්බවෙන්න ආපු ගමන් ඔෆිස් එකේ ඉඳලා තියෙනවා. අර මනුස්සයා හැරිලා යන අතරෙ ඇන්තනී අන්කලුත් ඒ පස්සෙන් යනවා චූටි මාමා දැකලා. අන්තිමේ බලද්දි අර කියපු වෙන්දේසි ඉඩමෙන් කොහොමහරි පාරෙ අයිනෙ කෑල්ලක් අරන් දෙන්නම් කියලා ඇන්තනී අන්කල් අර මනුස්සයාගෙන් ගාණක් කඩාගෙන.''

'' යකෝ මූ මාර බඩුවක්නෙ... කොහොමද ඕක ලීක් වෙලා තියෙන්නෙ...? ''

ගිවන්තයා ඇහුවෙ දත්මිටි කකා.

'' ඒ සිද්ධිය වෙච්ච දවසට පහුවෙනිදා ඇන්තනී අන්කල් ආයෙත් ඔෆිස් එකට ගිහින් තාත්තට කිව්වලු එයාගෙ හොඳ යාළුවෙක්ට ඉඩමක් හොයනවා... පුළුවන්නම් අර වෙන්දේසි වත්තෙන් පාර අයිනෙ කෑල්ලක් වෙන් කරලා දෙන්න කියලා. තාත්තා කියලා ඒකෙ පාර අයිනෙ කෑලි සේරම දීලා ඉවරයි කියලා. ඒ පාර ඒ මිනිහා කිව්වලු ඇඩ්වාන්ස් විතරක් ගත්ත කෙනෙක්ගෙන් ඇඩ්වාන්ස් එක රිටන් කරලා හරි කමක් නෑ එයාට ඒ උදව්ව කරන්න කියලා. ඒකට තාත්තට යකා නැගලා. එයා ඇන්තනී අන්කල්ට හොඳටම කෑ ගහලා එළවගෙන. පස්සෙ තමයි චූටි මාමා තාත්තට කියලා තියෙන්නෙ කලින් දවසෙ වෙච්ච සිද්ධිය.





හොඳම වැඩේ ඒක නෙමෙයි... පෙරෙයිදා අර කඩේ දාන්න අහපු මනුස්සයා ආපහු ඔෆිස් එකට ඇවිත් එයාගෙ වැඩේ හරිද ඇහුවලු. තාත්තා අහලා මොන වැඩේද කියලා... එයා කියලා ඔයාලගෙ කම්පැනියෙ වැඩ කරන මිස්ටර් ඇන්තනී මගේ වැඩේ කරලා දෙන්න රුපියල් දහදාහක ඇඩ්වාන්ස් එකක් අරගත්තු කතාව... ''

'' නෑ... දහදාහක්..? ''

'' ඔව්... පොරොන්දු උනේ විසිපන්දාහක්ලු. එයා කියලා වැඩේ කෙරුනම ඉතුරු පහළොස්දාහ දෙන්නම් කියලා... ඒ පාර අපේ තාත්තා ඒ මනුස්සයට කියලා ඇන්තනී අපේ කම්පැනියෙ වැඩ කරන කෙනෙක් නෙමෙයි කියලා... මිනිහා ගිහින් තියෙන්නෙ ඇන්තනියව ආයෙ දැක්කම හතර හන්දි කඩනවා කියලා බැන බැනලු... ''

'' හොඳ වැඩේ ඕකට... මං හිතුවෙ සහන්ටයි මේසනාටයි පිස්සු උනාට මහ උන් වැදගත් ඇති කියලා. බලන් යද්දි උන් ඊට අන්ත සක්කිලිනෙ... ''

ගිවන්තයා දිගට හරහට ඇන්තනී අන්කල්ගෙ සායම අරිනවා. ඇත්ත තමයි... ඒ කතාව අහලා මටත් හොඳටම කේන්ති ගියා. අපේ කම්පැනිය මෙච්චර කාලයක් තියාගෙන ආව විශ්වාසෙ මේ පිට ඉන්න බූරුවෙක් නිසා නැති වෙන්න දෙන්න පුළුවන්ද...?

'' අක්කා කොහොමද මේ ගැන දන්නෙ...? තාත්තලා නිකමටවත් ඒ කතාව ගැන කිව්වෙ නැහැනෙ... ''

'' මං දැනගත්තෙ අම්මගෙන්. තාත්තලා අපි ඉස්සරහා ඒ ගැන කියන්න නැතුව ඇත්තෙ අපි සහන්ලව මේසනාලව ආශ්‍රය කරන නිසා වෙන්න ඇති... ''

හේතුවක් ඉදිරිපත් කළා.

අක්කා අනුමාන වශයෙන් හේතුවක් ඉදිරිපත් කළා.

" කවුද යකෝ ඒ සෝත කරුම දෙක ආශ්‍රය කරන්නෙ...? ඕං මමයි දැසුයිනං ඕවට නෑ හරි... "

අක්කයි චූටියි දෙන්නා සාලෙ බලාගෙන ඉද්දි ගිවත්ත මාවත් ඇදගෙන එතනින් එළියට ආවා.

* * * * * * *



# 07

අපි හෙට ඉඳලා උනත් වැඩට එන්න ලෑස්තියි කියලා තාත්තලට කැමැත්ත ප්‍රකාශ කළාට තාත්තයි සමරෙ මාමයි කිව්වෙ අපි පළවෙනිදා ඉඳලා ආවම ඇති කියලා. ඒ කියන්නෙ අපිට තව දවස් දොළහක විතර කාලයක් ඉතුරු වෙලා තියෙනවා කියන එකනෙ. ඒ දවස් දොළහෙන් උපරිම ප්‍රයෝජන ගන්න හිතාගෙන මං බයික් එක ස්ටාට් කරගත්තා.

" දැස් අයියා... "

බයිසිකලේ වත්තෙන් එළියට ගන්න හදද්දිම කෑ ගහගෙන දුවන් ආවෙ අපේ සුදූ.

" ඇයි බබා...? "

චූටි ජංගි කොටයක් ඇඳගෙන හුරතල් විදියට දුවන් එන පොඩි එකීව දැකලා මං නතර උනා.

" ඔකූ අක්කා ලී ලෝඩ් එකක් ගේන්න කුවා... "

මොකක්... ලී ලෝඩ් එකක්...? අපේ අක්කට...? එයා අලුතෙන් ගෙයක්වත් හදන්න යනවද...

'' දෙකේ දෙකේ ඒවද...? දෙකේ හතරෙ ඒවද...? ''

මං ටිකක් සද්දෙට ඇහුවෙ අක්කා පේන මානෙක ඉන්නවානං උත්තර දෙයි කියලා හිතාගෙන. ඒත් අපේ අක්කගෙ මයිලක්වත් පේන්න නෑ. මං අහපු දෙකේ දෙකේ කතාව නොතේරුණු සුදූ අතේ ගුලි කරගෙන හිටපු රුපියල් සීයෙ කොලයක් මගේ අතට දුන්නා.

ආ... දැන්නෙ මට වැඩේ මීටර් උනේ. අක්කට ලී ලෝඩ් එකක් නෙමෙයි ඕනෙ වෙලා ඇත්තෙ රී ලෝඩ් එකක්. නැත්තං රුපියල් සීයකට කොහෙද ලී ලෝඩ් දෙන්නෙ. මේක මේ අපේ චූටි කෙල්ලගෙ උච්චාරණයේ වැරැද්දක්නෙ.

'' රෑ වෙද්දි ගෙනත් දෙන්නම් කියලා කියන්න. ඔයාටත් මං එද්දි චොකෝ එකක් අරන් එන්නම්... බායි... ''

කෙල්ලට අත වනපු මං ආපහු දඬු මොණරෙ පාරට ගත්තා. වෙනදා වගේ පළවෙනි පටුමඟ ළඟින් යද්දි ඉබේටම බයික් එක ස්ලෝ උනත් මං ඒ පැත්තට හැරෙව්වෙ නෑ. මං කෙළින්ම ගියේ ටවුන් එක පැත්තට. එතනින් වීදියවත්තට. ඒ කිව්වෙ දැහැමිලගෙ ගෙවල් පාරට.

කාටවත් නොකිය තට්ට තනියම කෙල්ලෙක්ගෙ විස්තර හොයන්න යනවා කියන එකත් කොයි තරම් ගති වැඩක්ද කියලා මට හිතුනෙ දැහැමිලගෙ ගෙවල් කිට්ටු වෙද්දි. තාම උදේ වරුව නිසා පරිසරයෙ තිබුණෙ බොහොම සාමකාමීබවක්. බයික් එකේ වේගෙ සැහෙන්න අඩු කරගෙන මං එදා දැකපු ගේ පහුකරගෙන පාරෙ ඇතුල් පැත්තට ගියා. ඒත් මට වැඩි දුරක් ඒ වගේ යන්න බැරි උනේ තව ඉඩම් දෙක තුනකින් පස්සෙ පාර වෙලකට මායිම් වෙලා ඉවර උන නිසා. දැන් ඉතිං මොකද කරන්නෙ... මං ආයෙත්





බයික් එක හරවගත්තා. දෙවෙනි පාර ගේ ඉස්සරහින් යන්න හදද්දිම මං හොයපු රූපෙ ගෙට වම් පැත්තෙ තිබුණු ගස් පේළියක් අතරින් මතු උනා. නිකම්ම නෙමෙයි... බාල්දියකුත් අතින් අරගෙන, කොණ්ඩෙත් කඩලා දාලා, පුංචි මල් වැටුණු චීත්ත ගවුමකුත් ඇඳලා. පේන විදියටනං දැහැමි නාන්න ගිහින් වගේ.

මොකද කරන්නෙ...? සද්දයක් දාලා කෙල්ලව වැට ගාවට ගෙන්න ගන්නවද...? නැත්තං ලෝඩ් වගේ වත්ත ඇතුළටම බයික් එක දාලා කතා කරනවද...? එහෙමත් නැත්තං දැක්කෙ නෑ වගේ හැරිලා යනවද...? ඔය තීරණ තුනෙන් එකක් ගන්නකල් කියලා මං කොයි එකටත් බයිසිකලේ පාරෙ හෙවන තියෙන තැනකින් නතර කළා. කෙල්ලට මාව එච්චර නෝටි උනේ නෑ. එයා බාල්දියේ තිබුණු රෙදි වගයක් වැලට වනනවා.

තව දවස් කීපෙකින් අපිට වැඩට යන්න වෙනවා. ඒ කියන්නෙ මේ වගේ නිදහසේ ඇවිදින්න තියෙන චාන්ස් එක නැතිවෙනවා. ඒ නිසා තවත් කල් නොදමා දැහැමි එක්ක කතා කරන්න මං තීරණය කළා.

'' ස්..... නංගි.... ''

කෙළින්ම ගෙට ගිහින් කතා කරන එක නම්බුයි කියලා හිතුවට වටපිටාවෙ තත්ත්වෙ අපි දන්නෙ නැහැනෙ. ඒ නිසා මං වැට ගාව ඉඳලා පොඩි සද්දයක් දැම්මා.

මගේ සද්දෙට ඒ ඇස් බයෙන් වගේ පාර පැත්තට යොමු වෙනවා මං දැක්කා. ඊටත් පස්සෙ එයා ගේ දිහා බැලුවා. ආයෙත් පාර දෙපැත්තම බැලුවා. අන්තිමේ තමයි අඩි කීපයක් මං ඉන්න පැත්තට එන්න ගෑණු ළමයා තීරණේ කළේ.

'' කවුද...? ''

අප්පට සිරි.... මං ඉන්නෙ ෆුල් ෆේස් හෙල්මට් එක දාලා කියලා මට අමතක උනානෙ. ඉතිං කෙල්ල කොහොමද මාව අඳුරගන්නෙ. මං වයිසර් එක විතරක් ඉස්සුවෙ ප්‍රතිචාරෙ කොහොමද කියලා බලන්න.

එක පාරටම ඒ ඇස් පුංචි උනා... ඊටත් පස්සෙ ලොකු උනා.

" අයියා... සුවහස්.... "

ඕන්න මං කාලෙකට පස්සෙ මගේ උප්පැන්නෙ තියෙන නම කන් දෙකට ඇහුවා. ඇයි ඉතිං දන්න කියන හැමෝම දෑස් කියනවා මිසක් මගේ ඇත්ත නමින් කතා කරනවයැ. ඒත් දැහැමි ඒ නමින් මාව දැනගන්න විදියක් නැහැනෙ. මගේ ෆේස් බුක් ප්‍රොෆයිල් එක තියෙන්නෙ සුවහස් ධනංජය කියලනෙ.

" දැහැමි... "

" මට අංජු කියන්න අයියෙ... "

මට වගේම දැහැමිටත් මුලින්ම ප්‍රශ්නයක් උනේ එයාගෙ නම. සමහරවිට හැමෝම මට දෑස් කියනවා වගේ එයාට අංජු කියනවද දන්නෑ. කෙල්ලගෙ නම දැහැමි අංජනානෙ.

" එහෙනං ඔයත් මට දෑස් කියන්න. මොකද ඔය සුවහස් කියන නම මට එච්චර හුරු නෑ. "

" අයියා කොහොමද අපේ ගේ හොයාගත්තෙ...? "

අහිංසකකමේ ප්‍රතිමූර්තයක් වගේ හිටිය දැහැමි ඒක ඇහුවෙත් බයෙන් ගැහෙන ගමන්.

" ඕනකම තියෙනවානං හොයාගන්න බැරි දෙයක් නෑ අංජු... "





" අයියා දැන් යන්න. මං ඔයාට කතා කරන්නම්... "

ආවා විතරයි මේ ළමයා මාව එළවගන්න වගේ හදන්නෙ.

" ඔයා කොහොමද කතා කරන්නෙ මගේ ෆෝන් නම්බර් එකක්වත් නැති එකේ...? "

" මං කිව්වෙ ෆේස් බුක් එකෙන්. "

" චැට් කරනවා කිව්වට ඒක කතා කිරිල්ලක් නෙමෙයිනෙ බබා. "

" අයියා යන්න දැන්. මට බයයි... "

කෙල්ල ඒකනං කිව්වෙ ඇත්තටම අඬන්න වගේ ඇස් වල කඳුළු පුරවගෙන. මට තවත් එයාව බය කරන්න ඕනකම තිබුණෙ නෑ. අනික දැහැමිගෙ කියාගන්න බැරි අහිංසකකම පිටිපස්සෙ මොකක්දෝ ලොකු කතාවක් තියෙනවා කියලා මට නිකමට වගේ හිතුනා.

" හරි... ඔයා ගෙට යන්න එහෙනං. බුදු සරණයි. "

මං බයිසිකලේ ස්ටාට් කරද්දිම ලාවට වගේ බුදු සරණයි කියන සද්දයක් ඇහුණා. මං ඒ මූණ දිහා බැලුවෙ හෙල්මට් එකේ වයිසර් එකත් පාත් කරගෙනමයි. අනේ... ඒ ඇස් දෙක දිගේ කඳුළු වැල් දෙකක් පහතට ගලාගෙන යනවා.

හිතට මොකක්දෝ මන්දා ලොකු වෙනසක් දැනෙද්දි මං තවත් එතන රැඳෙන්නෙ නැතුව පිටවෙලා ආවා. වීදිය වත්තෙන් බයිසිකලේ මහ පාරට දාද්දිම මගේ දර්ශන පථයට අහු උනේ දැකලා පුරුදු රූපයක්. ඒ වෙන කවුරුවත් නෙමෙයි අපේ චූටිගෙ ආදරේ විනෝද්. ඌ මොකද මෙහෙ කරන්නෙ...? සමහරවිට දැහැමිගෙ වගේම විනෝද්ගෙ ගෙවල් තියෙන්නෙත් වීදිය වත්තෙද

දන්නෙ නෑ. එදා පණ දාගෙන ෆලෝ කරලත් හොයා ගන්න බැරි උන දේ අද අතටම අහුඋනාද කියලා හිතෙද්දි මං මිනිහගෙ කකුල් දෙක ඉස්සරහම බයික් එක නතර කර ගත්තා.

'' ඒ... ''

මගේ සුපුරුදු විසිල් පාර දාන ගමන් මං ඒ මූණ හොඳට බැලුවෙ මූ අපේ චූටිගෙ හිත ගිය මනමාල පොඩ්ඩ නේද කියලා කල්පනා කරන ගමන්. මිනිහව මීට කලින් දවස් දෙකක් දැකලා තිබුණට අද මං ඌව ඒ දවස් දෙකටම වඩා හැන්ඩියට දැක්කා. ඇත්තටම විනෝද් කියන්නෙ කෙල්ලෙක්ගෙ හිත ඇදලා ගන්න පුළුවන් තරම් ගති රූපයක් තියෙන කොල්ලෙක් තමයි. අපේ චූටි මූට වශී උන එකේ පුදුමයක් නෑ.

'' ඇයි...? ''

මිනිහා ඇහුවෙ එගේන්ස් එකට වගේ.

'' ඇයි කියලා තමයි මමත් අහන්නෙ...? ''

මමත් තදයා වගේ උත්තර දෙද්දි පොර අන්දුන් කුන්දුන් වෙලා මගේ මූණ.... නෑ... මගේ හෙල්මට් එක දිහා බැලුවා.

'' මචං මේ... කියන දෙයක් කෙලින් කියනවද...? මොකද මම උඹව මීට කලින් දැකලා නෑ. ''

හැන්ඩියා මගේ හෙල්මට් එක දිහා බලාගෙන කියනවා මාව මීට කලින් දැකලා නැලු. මට ඉතිං කියන්න වෙන්නෙ වැඩක් බලන් යනවා මනුස්සයො යන්න කියලා තමයි.

'' මාව නොදැක්කට කමක් නෑ... මට කියනවා තමුසෙ රශ්මිව ආශ්‍රය කරන්නෙ මොන පරමාර්ථයෙන්ද කියලා...? ''

'' රශ්මි...? ''





ඔන්න කොල්ලා ටිකක් අවුල් උනා.

'' ඔව් රශ්මි තමයි... තමුසෙ මාව දන්නෙ නෑ වගේ රශ්මිවත් දන්නෙ නෑ කියලද කියන්න හදන්නෙ...? ''

'' ර... රශ්මි... මගේ යාළුවෙක්... ''

ඌ ඒක කිව්වෙ ටිකක් බයෙන් වගේ.

'' ඒ කියන්නෙ ඒක නිකම්ම නිකං යාළුකමක් විතරයි...''

මගේ ප්‍රශ්නෙට මිනිහා උත්තර දන්නෙ ඔළුව උඩට පහළට වනලා.

'' ඒ නිසාද බස් හෝල්ට් වලයි බස් වලයි ඒකිත් එක්ක මුකුළු කරන්නෙ...? ''

'' ඔයා කවුද...? ''

කොල්ලා බය වෙච්ච පාර ඔයා මෙයා බාසාවෙන් මාව අමතන්න පටන් ගත්තා. පව් අප්පා.... ආදරේ කරද්දි මොන මොන අනපේක්ෂිත සිදුවීම් වලට මූණ දෙන්න වෙනවද කියලා කවුද දන්නෙ.

'' මං රශ්මිගෙ අයියා... ''

'' හහ්... ගිවන්ත අයියා.... ''

අඩේ... බලාගෙන ගියාම මූ රශ්මිගෙ අයියා ගිවන්ත කියන එකත් දන්නවනෙ. කමක් නෑ. ඌ මාව ගිවන්ත කියලම හිතා ගත්තුදෙන්. ඒක කොයි එකටත් හොඳයි.

'' ඒක එෆෙයාර් එකක් උනත් යාළුකමක් උනත් මගේ නංගිගෙ ඉගෙනීමට මොනම විදියකවත් බාධාවක් වෙන්න බෑ හරි... ''

මං ඒක කිව්වෙ කළු පාට ග්ලවුස් දෙක දාගෙන හිටපු අත ඌගෙ මූණ ළඟටම ළං කරලා.

" උඹේ ඉස්කෝලෙ මොකක්ද...? "

" ටවුමෙ බෝයිස්කූල් එක... "

" එතකොට ගෙවල්...? "

" පන්සල පාරෙ... "

යකෝ පන්සල පාරෙ එකා මොකද එතකොට මෙහෙ කරන්නෙ... ? ඒ ප්‍රශ්නෙ අහන්නත් හදලා මං ආයෙත් කමක් නෑ කියලා බයික් එක ස්ටාට් කරලා මහ පාරට ගත්තා.

* * * * * * *

" දැස් බේබි... "

ගෙදර මිදුලෙ තිබුණු අඹ ගහ යටට වෙලා අපේ අක්කා හදලා දුන්නු අච්චාරුවෙ රස බල බල ඉන්න වෙලාවක සරා අයියා හෙමින් සීරුවේ ගේට්ටුව පැත්තෙන් මතු උනා. මනුස්සයට අදත් ඉංග්‍රීසි ඉගෙන ගන්න හිතිලද දන්නෑ.

" එන්න සරා අයියෙ... කමුද අච්චාරු ටිකක්...? "

මං සරා අයියට අච්චාරු එක දික් කළේ ආගන්තුකයින්ට සත්කාර කිරීම හොඳ පුරුද්දක් නිසා. ඒත් අච්චාරු කියන නම ඇහුවා විතරයි මිනිහා කටත් ඇඹුල් කරළා ඇඟ හකුළුව ගත්තා. අනෙ යකෝ මූගෙ කැටයම්...

" ආපෝ... මටනං එපා බේබි. ඕවා කාපුවම මගේ දත්ටික ඇඹුල් වෙලා යනවා. "

" එහෙමද... හොඳ වෙලාවට... "





මේ තරම් රස අච්චාරුව තනියම කන්න වාසනාව ලැබුණු එකට සරාට හිතෙන් පින් දෙන ගමන් දික් කරපු අත මං ආයෙත් ඇදලා ගත්තා.

" අපේ අයියව ඉස්පිරිතාලෙන් ටිකට් කපලා ගෙදර යවලා බේබි... "

" ආ... ඇත්තද...? මට අහන්නත් බැරි උනා. දැන් අයියට හොඳයිද...? "

" ඒ හැටි ගුණයක් නෑ. අනික ආණ්ඩුවෙ ඉස්පිරිතාලවල ගෙවන ඒවයෙ වගේ කරුණාවෙන් සලකන්නෙත් නැනෙ. අමාරු තියෙද්දිමයි ටිකට් කපලා යවලා තියෙන්නෙ... "

සරා කිව්වෙ බිම ඇන තියලා වාඩිවෙන ගමන්.

" ඇයි... අයියට හරියට වෙලාවට බෙහෙත් දීලා නැද්ද...?"

" මොන වෙලාවටද...? දෙන ඉන්ජැක්සන් එක දීලා තියෙන්නෙත් බැන බැන... "

සරාගෙ ඉන්ජැක්සන් කතාවට හිනා යන්න ආවත් මං ඒක බොහොම මාරුවෙන් තද කරගෙන හිටියා.

" මොනවා කියලද බැනලා තියෙන්නෙ...? "

" එක දවසක් කෑ ගහලා මේ බේබද්දන්ට දෙන සේලයින් එකත් අපරාදෙ... ඒක වෙන අහිංසක මනුස්සයෙක්ට දෙන එක පිනක් කියලා... "

ඔව් ඉතිං මුළු ඉස්පිරිතාලෙම අය දන්නවා ඇති සරාගෙ අයියව ගෙනත් තියෙන්නෙ බීලා පයින් යද්දි නවත්තලා තියෙන වාහනේක හැප්පිලා කියලා.

" තව දවසක නර්ස් කෙනෙක් ' මට මුළු ලොවම ඔබයි...'

කියලා සින්දුවකුත් කිය කිය ඇවිත් අයියට ඉන්ජැක්සන් එකක් විදලා. ඒක රිදුන නිසා අයියා නර්ස්ගෙ අතේ එල්ලිලා. ''

'' නෑ... ''

'' නෑ නෙමෙයි බේබි... ඔව්. ඒකට කේන්ති ගිහින් නර්ස් අයියට නොසෑහෙන්න කෑ ගහලා. ඒ පාර අපේ අයියා කිව්වලු මිසීට මුළු ලොවම ඔබනකල් ඉන්න පුළුවන්... අපි පොඩ්ඩක් අතින් ඇල්លුවම තමයි ඩෝං යන්නෙ කියලා. ඒ කතාව කිව්වයි කියලා ලොකු දොස්තර මහත්තයා පහුවදාම අයියගෙ ටිකට් කපලා ගෙදර යවලා. ''

'' අම්මපා...? ''

'' ඔව්නෙ... මාත් එක්කම තමයි ටවුන් එකට ඇවිත් ගමට යන බැස් එකට නැග්ගෙ. තාමත් කකුල කොර ගහනවා... පව් අපේ අයියා. ''

සරා කැත නැතුව නහය බ්රෑස් ගාලා හූරලා ඇඳන් හිටපු සරමෙන් පිහිද ගත්තා.

'' දැන් සරා අයියෙ තකහනියෙ මෙහෙ දුවගෙන ආවෙ ඕක කියන්නද...? මං හිතුවා ඉංග්‍රීසි ඉගෙන ගන්න කියලා. ''

'' මං ආවෙ ඔය කාරණා දෙකටම නෙමෙයි බේබි... මට ආරංචියක් ආවා බේබි ළඟදි ඉඳලා වැඩට යන්න හදනවා කියලා. අනේ ඉතිං එහෙම උනොත් මට තමයි තිවාඩු පාඩු වෙලාවක කතා කරන්නවත් කෙනෙක් නැතුව යන්නෙ. ''

මිනිහා හරි දුක්මුසු ලීලාවෙන් ඒ කතාව කියද්දිනම් මට ඇත්තටම දුක හිතුණා. මොකද මොන හේතුව තිබුණත් සරා මට ලෙන්ගතුයි කියලා මං දන්නවා.





'' දුක් වෙන්න එපා සරා අයියෙ... මං වැඩට ගියා කියලා තාම ෆුල් ටයිම් ඩියුටි බාර ගත්තෙ නෑ. තාත්තා මේ දවස් වල ටිකක් ඔෆිස් එක පැත්තෙ ඇවිත් යන්න කිව්වෙ වැඩ ඉගෙන ගන්න විතරයි. අනික සතියට දවසක් දෙකක් ඔෆිස් එක පැත්තෙ ගියත් අපිට තව ඕනතරම් දවස් තියෙන්නෙ කතා කරන්න. ''

'' බේබි මගේ හිත හදන්න ඔය මොන කතා කිව්වත් අම්මපා මට දුකයි. මට දැන් කවුද ඉංගිරිසි කියලා දෙන්නෙ... කවුද මගේ දුක අහන්නෙ... ''

'' සරා අයියට දුක කියන්න කෙනෙක් ඇත්තෙම නැත්තං ඔය දවල් වරුවක ඇවිත් ඒක අපේ ආච්චිට කියලා යන්න. මොකද එයා හරි කැමතියි අනුන්ගෙ දුක අහන්න... ''

සරා ඒක කිව්වම මගේ මූණ දිහා බැලුවෙ බය වෙලා වගේ. ඇයි අප්පා මං බය වෙන්න තරම් දෙයක් කිව්වයැ.

'' අපොයි ලොකු නෝනටනම් එක එක ඒවා කියන්න කියලා මට කියන්න එපා. එයාට කියන ඔක්කොම ඇහෙන්නෙ අනිත් පැත්තට. අනික කට ඇරියොත් සොනී ඩියොල් ගැනයි... ජූහි චව්ලා ගැනයිනෙ කතා කරන්නෙ. ''

'' හරි එහෙනං මං වැඩට යන්න කලින් සරා අයියට කතාවක් කියලා දෙන්නද...? ''

'' හා... හා... මුදලාලිත් කාලා දැනුයි නිදා ගත්තෙ... මමත් වස කම්මැලිකමේ හිටියෙ. ''

'' ඕන්න දවසක් සරා අයියගෙ අයියා වගේ මනුස්සයෙක් තව කට්ටියක් එක්ක යාළුවෙක්ගෙ ගෙදර අවුරුදු පාටියකට ගියාලු... ඒ කිව්වෙ මේ ඉඳලා හිටලා හැමදාම වගේ අරක්කු බොන

එක්කෙනෙක්. ''

'' හ්ම්... ''

මං පොඩි එකෙක්ව නිදි කරන්න කතන්දර කියනවා වගේ සරාට කතාව කියන්න ගත්තා විතරයි මනුස්සයා හරි උනන්දුවෙන් ඒකට ඇහුම්කන් දුන්නා.

'' දැන් කට්ටිය බීලා... ඊට පස්සෙ කාලා... පස්සෙ ආයෙත් බීලා සින්දුවක් එහෙම කියලා ඉවර වෙද්දි සෑහෙන්න රෑ වෙලාලු. ඒ වෙද්දි අර අපේ යාළුවට ලොකු මුත්‍රා බරක් හැදිලා... ඉතිං එයා හෙමින් සීරුවේ ගේ ඇතුළට ගිහින් බරත් සැහැල්ලු කරගෙන කරුවලේම එහෙන් පිට වෙලා ඇවිත්.

කොහොමහරි පහුවෙනිදා උදේ බලද්දි එයාගෙ අතේ බඳින ඔරලෝසුව අර යාළුවගෙ ගෙදර දාලා ඇවිත්ලු. ඒත් ඒක ගේන්න යන්න එයාට ඒ යාළුවගෙ ගේ තිබුණ තැන හරියටම මතක නැලු... ''

'' ඇයි බේබි... යන්නයි එන්නයි මතකයිනම් පහුවෙනිදට ඒක අමතක වෙනවද...? ''

සරා කාලෙකට පස්සෙ වැදගත් ප්‍රශ්නයක් ඇහුවා.

'' මෙකයි සරා අයියෙ වෙලා තියෙන්නෙ... එයා ගිහින් තියෙන්නෙ යාළුවො කට්ටියක් එක්ක වෑන් එකේනෙ. එද්දිත් ආවෙ වෙරිමරගාතෙ කළුවරේනෙ. ඉතිං ගිය පැත්ත මතක තිබුණට හරියටම ගේ තියෙන තැන මතක තිබිලා නෑ. ඒ උනාට ඒ ගෙදර රත්තරන් පාට කොමෝඩ් එකක් තිබුණා එයාට මතක තිබිලා තියෙනවා. ''

'' රත්තරන් පාට එකක්...? ''





'' ඔව්... ඒක ටිකක් විශේෂ සලකුණක්නෙ. ඉතිං මෙයා උදේම යාළුවගෙ ගෙවල් තිබුණු පාර පැත්තට ගියාලු රත්තරන් පාට කොමෝඩ් එකක් තිබුණ ගේ හොයාගන්න. එහෙම හිතාගෙන පාරෙ ටික දුරක් යනකොට එක ගෙදරක මිදුලෙ හිටිය ගෑණු කෙනෙක් හයියෙන් කෑ ගහනවා ඇහුනලු ' මේ ඇහුනද... ආං ඊයෙ අපේ ග්‍රැමෆෝන් එකට චූ කරපු මිනිහා අදත් මේ පැත්තට එනවා' කියලා... ''

'' හෑ... ''

සරාට කතාව තේරුන නිසාද නොතේරුන නිසාද දන්නෑ මිනිහගෙ කට ඉබේටම ඇරුණා.

'' ඒකනං මරු කතාව පුතේ... ''

එකපාරටම අමුතු ගොරහැඬි කටහඬක් ආවෙ කොහෙන්ද කියලා බලන්න මං ඔළුව උස්සද්දි මගේ ඉස්සරහා හේර කඳයා වගේ හිටගෙන හිටියෙ ඇන්තනී අන්කල්.

අක්කා එදා ඇන්තනී අන්කල් ගැන කියපු කතාව නිසා මට එයාව දකිද්දි වෙනදා දැනෙන ලෙන්ගතුකම දැනුණෙ නෑ. ඒ වෙනුවට හිතට ආවෙ තරහක්.

'' ඇයි අන්කල්...? ''

මං ඇහුවෙ මිනිහව වැඩිය ගණන් ගන්නෙ නැති සයිස් එකකින්.

'' මං ආවෙ ඔයාලගෙ අම්මව පොඩ්ඩක් හම්බවෙලා කතා කරන්න... ''

අම්මව හම්බවෙන්න... මේ ගල් ඉබ්බා කවදාවත් නැතුව මොකටද මේ අවේලාවෙ අපේ අම්මව හම්බවෙන්න ආවෙ...?

" අම්මා කුස්සියෙ වැඩක්... "

මගේ කතාවට ඇන්තනීකාරයා උගේ ගෙදර කුස්සියට යනවා වගේ හුරුපුරුදු විදියට කුස්සිය පැත්තට හැරුණා.

" සරා අයියෙ... ඔයා දැන් ගිහින් වෙන වෙලාවක එන්න... අපි නිදහසේ කතා කරමු... "

ඇන්තනියා මොකාටද එන්න හදන්නෙ කියලා නොතේරුණු නිසාම මං සරා අයියව පිටත් කරලා අඩියට දෙකට ගේ වටෙන් කුස්සියෙ ජනේලෙ ළඟට ආවා. කියන්න බැනෙ එදා අපේ තාත්තා බැනපු එකේ තරහට මිනිහා අපේ අම්මව උස්සන්නවත් යනවද කියලා.

" ඇන්තනී ඇයි මේ වෙලාවෙ ආවෙ...? දන්නවනෙ නලින් මේ වෙලාවට ගෙදර නෑ කියලා. එයා ඔෆිස් ගිහින්... "

මට මුලින්ම ඇහුනෙ අපේ අම්මගෙ කටහඬ. මං එහෙම්ම බිත්තියට හේත්තු වෙලා සංවාදයට ඇහුම්කන් දුන්නා.

" මං ආවෙ නලින්ව හම්බවෙන්න නෙමෙයි මංගලා... ඔයා එක්ක ටිකක් කතා කරන්න. "

" මං එක්ක කතා කරන්න... අපි දෙන්නට මොනවද ඇන්තනී කතා කරන්න තියෙන්නෙ...? අනික මේ ළමයිනුත් ගෙදර නැති වෙලාවෙ... "

අපේ අම්මා පුදුම වෙලා වගේ ඒක ඇහුවෙ. එයා හිතුවද දන්නෑ මං හෙමින් සීරුවෙ සමරෙ මාමලගෙ ගෙදර ගිහින් කියලා.

" කවුරුවත් නැති වෙන්නෙ කොහොමද...? ඔය පුතාණ්ඩියා මිදුලෙ ඉන්නෙ අර එහා ගෙදර හාදයා එක්ක කතන්දර කිය කිය..."

" හරි හරි... ඒවයින් වැඩක් නෑ. මට මුලින්ම කියන්නකො





ඇන්තනී ආවෙ ඇයි කියලා.... මොනවද මාත් එක්ක කතා කරන්න තියෙන්නෙ...? "

ඔෆිස් එකේ වෙච්ච සිද්ධිය අම්මගෙත් හිත ඇතුළෙ පැසව පැසව තිබුණ නිසාද දන්නෑ එයා වෙනදා වගේ ඇන්තනී අන්කල්ට තේකක්වත් හදලා දෙන්න ඇහුවෙ නෑ.

" නලින් ඔෆිස් එකේ වෙච්ච මොකක්හරි සිද්ධියක් මංගලා එක්ක කිව්වද...? "

" අනේ මං ඔය ඔෆිස් එකේ වෙන දේවල් නලින්ගෙන් අහන්න යන්නෙ නෑ එයා දෙයක් කිව්වොත් ඇරෙන්න. ඇයි දැන් මොකද වෙලා තියෙන්නෙ...? "

අම්මත් බබා ටයිප් එකෙන්ම ඇන්තනීගෙ කටින් සිද්ධිය එළියට ගන්න හදනවා කියලා මට තේරුණා.

" නලින් මේ පුංචි ප්‍රශ්නයක් නිසා මාත් එක්ක හිත හොඳ නැති වෙලා. අපේ යාළුකම අද ඊයෙ ඇති වෙච්ච එකක් නෙමෙයි කියන්න මංගලත් දන්නවනෙ. එහෙව් එකේ මේ සුළු සුළු සිද්ධි නිසා ඒ හිතවත්කම් නැති කරලා දාන එක වටිනවද මං අහන්නෙ...? "

" අපේ නලින් ඔය කියන විදියෙ සුළු සිද්ධි නිසා හිතවත්කම් නැති කරලා දාන කෙනෙක් නෙමෙයි ඇන්තනී. මොකද ඔයාට වඩා හොඳට මං එයා ගැන දන්නවා. ඔය දෙන්නා අතර මොකක්හරි ලොකු දෙයක් වෙන්න ඇති... "

අම්මා ගාණට කරකවලා බෝලෙ මිඩ්ල් එකටම එළ්ල කළා. ඔහොම යං අම්මෙ...

" ඔන්න ඉතිං මංගලා ඔයත් උනේ මොකක්ද කියලා

නොදැන නලින්ව සුද්ධ කරන්න හදනවා. මං මේ කියන්නෙ නලින් වැරැද්දක් කළා කියලා නෙමෙයි. එයා පොඩි සිද්ධියක් නිසා මාව වරදවා වටහාගෙන. ඔය ලෑන්ඩ් සේල් එක වෙනුවෙන් මමත් කොයි තරම් මහන්සියක් වෙලා තියෙනවද කියලා මංගලා දන්නවනෙ...? ''

'' අපෝ... ඒක අමුතුවෙන් කියන්න ඕනෙ නෑ. මං ඒ ගැන හොඳට දන්නවා... ''

ඇන්තනී මොලේ තියෙන බූරුවෙක්නං අම්මා ඒ ගැහුවෙ හින්ට් එකක් කියන එක තේරෙන්න ඕනෙ. ඒත් මිනිහා ඒ ගැන වගක්වත් නෑ වගේ ඔහේ දොඩවනවා.

'' මං මෑතක අර රුක්මල්වත්තෙ වෙන්දේසි ඉඩමෙන් මගේ යාළුවෙක්ට පාර අයිනෙ කෑල්ලක් වෙන් කරලා දෙන්න කියලා කිව්වා විතරයි නලින්ට යකා නැග්ගනෙ... '' පොර සූදනා වෙලා ගාණට වැරැද්ද අපේ තාත්තගෙ පිට පැටෙව්වා.

'' මං දන්න තරමින් රුක්මල් වත්තෙ ඉඩම් මේ වෙද්දි විකිණිලා ඉවරයි. අනික මට ඔය ගැන කියන්න ආවා කියලා වැඩක් වෙන්නෙ නැනෙ ඇන්තනී. මං ඔය බිස්නස් වලට ඉන්වෝල් වෙන්නෙ නෑ. ඒ සේරම හැන්ඩ්ල් කරන්නෙ නලිනුයි අපේ අයියලා මල්ලිලයිනෙ.''

'' ඒක මං දන්නවා ළමයො... ඒකනෙ මං තකහනියක්ම ඔයාව හොයාගෙන ආවෙ. ''

අඩේ... මූ ඒ පාර අපේ අම්මට ළමයොලු... ඒ පැණි ටෝක් එකට මගේ ඇඟේ මාළු නටන්න පටන් ගත්තා. ගල් ඉබ්බා





නිකං හරි අපේ අම්මගෙ ඇඟිල්ලකින්හරි අල්ලපියකො බලන්න. වැඩිහිටිකම පැත්තකින් තියලා මූව මං සූප් කරනවා. ආයෙ ඒකෙ දෙකක් නෑ.

'' මේ ඇන්තනී... කියන දෙයක් තේරෙන බාසාවෙන් කියනවද...? තව ටිකකින් අපේ අම්මා නැගිට්ටොත් මේ දේවල් වරදවා තේරුම් අරගන්නත් බැරි නෑ. ''

අපේ අම්මා ඇන්තනීට පල නොකියා පළා බෙදන්න පටන් ගත්තා විතරයි මගේ හිතටත් මාර ගතියක් ආවා.

'' ඔයා කරන්න ඕනෙ මෙච්චරයි මංගලා. අපේ හිතවත්කම ගැනවත් සලකලා බලලා මට ඒ කියපු ඉඩමෙන් පාර අයිනෙ කෑල්ලක් ඉල්ලලා දෙන්න. මොකද මං මේ මගේ යාළුවට මූණ දීගන්න බැරුව ඉන්නෙ. අනික එහෙම සමාදානෙකට එන එක අපේ අනාගත නෑදෑකම්වලටත් හොඳයිනෙ. ''

ඕං බළලා මල්ලෙන් එළියට පැන්නා.

මං මෙච්චරකල් හිතාගෙන හිටියෙ මේසනා ඉස්කුරුප්පුව වගේ බලෙන් මගේ කරේ එල්ලෙන්න හැදුවට මහ ජෝඩුව ඒක දන්නෙ නෑ කියලා. දැන් බලන් යද්දි මේක මාස්ටර් ප්ලෑන් එකක්ද කොහෙද. බලමුකො මූ මොකාටද එන්න හදන්නෙ කියලා.

'' වෙරි සොරි ඇන්තනී. කම්පනියෙ දේවල් වලට මට ඇඟිලි ගහන්න බෑ. අනික එයාලා ගන්න ඩිසිෂන් වලට උඩින් යන්නත් මට බෑ. ඔයා ඒක දැනගෙන ඉන්න එක හොඳයි. මේ... ඒක නෙමෙයි... මොකක්ද අර කියපු අනාගත නෑදෑකම් ගැන කතාව...? ''

අම්මා එළකිරි වගේ උත්තරයක් දීලා අන්තිමේ මට

දැනගන්න ඔහකරලා තිබුණු කතාවත් ඇහුවා.

'' නෑ ඉතිං... අපි අපේ දරුවො ගැන තීරණයක් ගන්න හිතාගෙන ඉන්න එකේ මේ වගේ විරසකකම් තියාගෙන බෑනෙ...''

අප්පා... බලහල්ලකො මේ ගෑදයගෙ කතාව. ඌත් එහෙනං හිතාගෙන ඇති මේසනාව මගේ කරේ එල්ලලා අපේ බිස්නස් වලට හොම්බ දාන්න.

'' කවුද ඇන්තනී අපේ දරුවො ගැන තීරණයක් ගන්න හිතාගෙන ඉන්නෙ...? අපි කවදද එහෙම දෙයක් කතා උනේ...? ''

අම්මා ඇහුවෙ හරි ආවේගශීලී විදියට. එයා මේ තරම් තරහින් ඉන්නෙ ඇන්තනීගෙ ඇත්ත තත්වෙ දැනගත්තයින් පස්සෙ කියලයි මටනං හිතෙන්නෙ. නැතුව අම්මට ඉස්සර මේසනාව මේ තරම් වහ කදුරු වෙලා තිබුණෙ නැනෙ. මොනවා උනත් වෙලා තියෙන්නෙනම් හොඳ දෙයක්.

'' ඇයි ළමයො... අපි කාලයක් තිස්සෙ ආශ්‍රය කලේ ඒ අරමුණෙන් නෙමෙයිද...? මං උනත් ඔයාලගෙ සේල් එකට මේ තරම් උදව් කලේ ඒක අපේ දෙයක් කියලා හිතලා මිසක් ලාභ ප්‍රයෝජන බලාගෙන නෙමෙයි... ''

මං ජේන්න හිටියානං අහනවා සේල් එක මුවාවෙන් හතර වටෙන් සල්ලි කඩා ගත්තෙත් ඒක තමුන්ගෙ දෙයක් නිසාද කියලා. කොහෙද... අපේ අම්මා වෙලාවකට ඉවසනවා වැඩියි.

'' අපේ නලින් කවදාහරි ඇන්තනීලා එක්ක ඒ වගේ දෙයක් කියලා තියෙනවද කියලානං මං දන්නෙ නෑ. හැබැයි මගේ හිතේනං එහෙම හැඟීමක් තිබුණෙ නෑ. ඒ අයට නිකං යාළුවො විදියට ආශ්‍රය කරන්න ඉඩ ඇරියා මිසක් අපි කසාද බැන්දිල්ලක් ගැන හිතලා තිබුණෙම නෑ. අනික කම්පැනියෙ දේවල් වලට මං





අත දාන්නෙ නැති උනාට නලින්ට දරුවො ගැන තනි තීරණ ගන්න දෙන්න බෑ. ඒ මගෙත් ළමයි... ''

අම්මා ඒ කිව්වෙ එයා මේසනාවයි මාවයි බන්දනවට කැමති නෑ කියලා.

'' ඔයාලා දෙන්නා මොන තීරණ ගත්තත් වැඩක් වෙන්නෙ නෑ මංගලා. ඔයාලගෙ කොල්ලා අපේ කෙල්ලට කැමතියි. ජේනවා ඇතිනෙ අපේ ළමයා මෙහෙ ආව වෙලාවකට උනත් කාමරේටම ගෙන්නගෙන කතා කරන අප්පුරුව... ''

යකෝ... මූගෙ කට කොටියම කන්න එපායැ මේ දෙසාබාන කෙබර වලට. මං ගෙන්නගන්නවයැ. ඒකි කිසි ලැජ්ජාවක් බයක් නැතුව මගේ කාමරේට රිංගනවා මිසක්.

'' මං හිතන්නනෑ මගේ කොල්ලා කවදාවත් ඒ වගේ ගොන් තීරණයක් ගනියි කියලා.... ''

අම්මා ඒක කියනවත් එක්කම ප්ලාස්ටික් පුටුවක් බිම දිගේ ඇදිලා යන සද්දයක් ආවා. අඩේ... මූ අපේ අම්මට පුටුවෙන් තඩිබාන්නවත් යනවද...? මම දඩිබිඩි ගාලා ජනේලෙන් ඔළුව ටිකාක් විතර ඇතුළට දාලා බැලුවා. ඒත් ඒක නෙමෙයි වෙලා තිබුණෙ. ඇන්තනියට ඒ කතාව දිරවගන්න බැරුව මිනිහා යන්න නැගිට්ටද කොහෙද...

'' ආයෙත් ඔය වගේ දේවල් කතා කරන්න මෙහෙ නාවට කමක් නෑ ඇන්තනී... ''

'' හොඳයි මං බලා ගන්නම්කො... ''

ඇන්තනීගෙ බිරිල්ල ඇහෙද්දි මං තප්පරේට දෙකට අඩිය තියලා කලින් අච්චාරු කකා හිටපු බංකුවට ඇවිත් ඉඳගත්තා.

මිනිහා කුස්සය පැත්තෙන් මතු උනේ ඊට ටික වෙලාවකට පස්සෙ...

'' ආ... අම්මා හිටියා නේද අන්කල්...? ''

මං මුකුත් නොදන්න කිරි සප්පයා වගේ ඇහුවෙ මිනිහගෙ ප්‍රතිචාරෙ කොහොමද කියලා දැනගන්න.

'' ඔව්... ඔව්. මං එහෙනං ගිහින් එන්නම්කො පුතා. ආ... මේසනා කිව්වා පුතාව ආදරෙන් මතක් කළා කියන්න කියලා. කෙල්ල ඉඩ ලැබුණු ගමන් පුතාව බලලා යන්න එයි... ''

මනුස්සයා යන්න කලින් අතේ ඉතුරු වෙලා තිබුණු අන්තිම තුරුම්පුවත් ගහලා යන්න අමතක කළේ නෑ. මං ඒකට මුකුත්ම කියන්න නොගියෙ දැන් අපේ අම්මයි තාත්තයි දෙන්නත් මගේ පැත්තෙ ඉන්න නිසා.

* * * * * * *



# 08

මේ දවස් ටිකේ මං දිගටම වගේ ෆේස් බුක් ලොග් උනාට දැහැමි පේන්න හිටියෙ නෑ. එහෙමත් නැත්තං කෙල්ල ලොග් උනාට ඕෆ් ලයින් හිටියෙ. ඉඳලා හිටලා ආදරේ හිතෙන නිසදැසක් වගේ දෙයක් එවනවා මිසක් වෙනදා වගේ මැසේජ් එකක්වත් එවුවෙ නෑ. ඒකට හරි හේතුවක් හොයාගන්න විදියක් නැතුව මං දහ අතේ කල්පනා කළා.

සමහරවිට මං ගෙදර හොයාගෙන ගිය එකට කෙල්ල අප්සෙට් වෙලාද මන්දා. එයා පේන්න නොහිටියට මංනං දිගටම වගේ එයාට මැසේජ් යැව්වා. මගේ මොබයිල් නම්බර් එකත් යැව්වා. ඒවට රිප්ලයි නොකළොත් මං ආයෙත් ගෙදරටම එනවා කියලත් කිව්වා.

බැරිම තැන තමයි මං සිද්ධිය ගිවන්තට කිව්වෙ.

'' උඹ ඉතිං අපෙන් උපදෙසක් ගන්න එන්නෙ වැඩේ අනාගත්තට පස්සෙ තමයි. යකෝ... ඔය විදියට කෙල්ලෙක්ගෙ ගේකට කඩන්පාත් උනාම මොන කෙල්ලද බං බය වෙන්නෙ නැත්තෙ...? ''

chamodi madhuprabha

මං දැහැමිලගෙ ගෙදර ගියා කිව්වට පස්සෙ ගිවන්තයා කෑ ගහන්න ගත්තා.

'' මං ගෙදරටම ගියේ නෑනෙ බං. යාන්තමට පාර ගාවට ගියා විතරනෙ... ''

'' යකෝ... ගෙට ගියත් එකයි... පාරට ගියත් එකයි. උඹ එළ හරක් වැඩක්නෙ කරලා තියෙන්නෙ. ටිකක් හිතපං... කෙල්ල ඉන්න තැනක්වත් යන ඉස්කෝලෙවත් හරි වයසවත් අඩු තරමෙ ෆෝටෝ එකක්වත් නොදා හිටියෙ ඇයි කියලා. ඒකිගෙ අනන්‍යතාවය සඟවගන්නනෙ. එච්චර දෙයක් වෙලා තියෙද්දිත් උඹ ඉන්න තැන හොයාගෙන ආවා කියන්නෙ ඒකි හිතන්න ඇති උඹ පැපරාසියෙක් කියලා. මං හිතන්නෙ නෑ ඒ කෙල්ල ආයෙත් චැට් කරන්නවත් එයි කියලා... ''

ෆේස් බුක් එකේ ඉන්න සුන්දරියන්ගෙන් අනේකවාරයක් අත්දැකීම් ලබලා තිබුණු ගිවන්ත මහදැනමුත්තා වගේ එහෙම කිව්වට මටනං හිතුනෙ දැහැමි කීයටවත් මට ඒ වගේ වැඩක් කරන එකක් නෑ කියලයි.

'' ඒකි උඹ හිතන ජාතියෙ කෙල්ලෙක් නෙමෙයි ගිවා. උඹම මට දවසක් කිව්වා නේද ප්‍රොෆයිල් පික්චර් එකට නළු නිළියන්ගෙ රූප දාන්නෙ තමන්ගෙ රූපෙ දැක්කම ඔක්කාරෙට එන අය කියලා. ඒත් දැහැමි කොයි තරම් ලස්සන කෙල්ලෙක්ද කියලා උඹ ඇස් දෙකෙන්ම දැකලා තියෙනවනෙ. ඒ විතරක්ද ඒකිගෙ අහිංසකකම. ''

'' හරි හරි මස්සිනා... ඒ කතාව ඇත්ත කියලා මමත් පිළිගන්නවා. ඒත් ටිකක් හිතපං ඒකි උඹත් එක්ක එෆ් බී එකේදි ඔය තරම් ආදරේ හිතෙන විදියට තිසදැස් හුවමාරු කරගෙන





තියෙද්දිත් මුණ ගැහුණම මේ තරම් කට්ටි පනින්නෙ ඇයි කියලා...?''

'' අන්න ඒක තමයි මචෝ මටත් හොයාගන්න ඕනකරලා තියෙන්නෙ. මට හිතෙන විදියට මේ කතාව ඇතුළෙ අපි නොදන්න මොකක්දෝ මන්දා රහසක් තියෙනවා. ''

මං කිව්වෙ සීරියස් විදියට.

'' අපිට හොයා ගන්න දෙයක් වැඩිය කල් අරින්නෙ නැතුව හොයාගන්න වෙනවා මල්ලි. මොකද අපේ වීසා කැන්සල් වෙන්න ඒ හැටි දවසක් නෑ. ''

ඌ ඒ කිව්වෙ අපේ ජොබ් එක ගැන.

'' ඒ නිසාම තමයි මං උඹටවත් නොකියා මේ ගමන ගියේ...''

'' ගිහින් ඔය කොරගෙන තියෙන්නෙ වැඩේ... ''

'' ආ... උඹ එහෙම කිව්වට එදා ගිය ගමන නිසා මං තව දෙයක් හොයාගත්තා. ''

එහෙම කියලා මං ගිවන්තට කිව්වා මට විනෝද්ව හම්බඋන සිද්ධිය ගැන. මං රශ්මිගෙ අයියා කිව්වම මගේ නම ගිවන්ත නේද කියලා ඌ අහපු එක ගැන කියද්දි ගිවන්තයගෙ ඇස් දෙක ලොකු වෙනවා මං බලාගෙන.

'' අඩෝ... ඌ මාර බඩ්ඩක්නෙ. ඌ එහෙනං මාවත් දන්නවා... ''

'' චූටි උඹ ගැන විස්තර ඌට කියලා ඇති. කෙල්ලො එහෙමනෙ බං... දවසත් දෙකක් අඳුරගන්න එකෙක් එක්ක උනත් මුළු ජාතකේම කියවනවනෙ. ඒත් දෙන්නගෙම කතා වලින් තේරෙන විදියට උන් දෙන්නා තාම එෆෙයාර් එකක් පටන් අරන් නෑ. ''

'' උඹ එහෙම කිව්වට මට චූටිගෙ සෑහෙන වෙනසක් දැනෙනවා දැස්. මං පෙරෙයිදා හවස ඒකිගෙ කාමරේට යනකොට කෙල්ල අඬනවා. මාව දැක්කා විතරයි ටක්ගාලා කඳුළු පිහිදගත්තා.''

ගිවන්තත් ඌ දන්න විස්තර මාත් එක්ක කියන්න පටන් ගත්තා.

'' ඒ කියන්නෙ චූටිගෙ සීන් එකෙත් මොකක්හරි අවුලක් තියෙනවා කියන එකද...? ''

'' මට තේරෙන්නෙ නෑ බං ඒකිත් මොනවා කරන්න යනවද කියලා. හැමදාම වගේ පන්ති යනවා කියලා යනවා. හවස ඇවිත් බලාගත්තු අත බලාගෙන ඉන්නවා. පාඩම් කරන බවක්වත් පේන්නෙ නෑ. මං හිතන විදියට අපේ අම්මටත් වැඬේ නෝට් වෙලා වගේ තියෙන්නෙ...? ''

'' ඇයි රුවන්ති නැන්දා මොනවාහරි කිව්වද...? ''

'' අම්මත් කියනවා චූටි ළඟදි ඉඳලා ෆෝන් එකෙන් කුටු කුටු ගානවා වැඩියිලු. ළඟට එනකොට කට් කරගන්නවලු. අම්මා අහපුවම කියලා යාළුවෙක් එක්ක කතා කරන්නෙ කියලා. ''

'' ඉතිං අපි දවසක ඒකිගෙ ෆෝන් එකෙන් ඒ නම්බර් එක උස්සමුකො. එතකොට අපිට බලන්න පුළුවන්නෙ ඒ කියන යාළුවා විනෝද්ද එහෙම නැත්තං වෙන එකෙක්ද කියලා. ''

මං කිව්වෙ ක්ෂණිකව මගෙ [illegible] ආපු අදහස.

'' ඒකනං මරු අයිඩියා එක තමයි. අපි ඕනෙනං අදම ඒ වැඩේ කරමු. මොකද නංගි අද ගෙදර. ''

ගිවන්ත වැඬේ එක පයින්ම අනුමත කරපු නිසා අපි දෙන්නා එවලෙම උන්ගෙ ගෙදර ගියා. එතකොට වෙලාව උදේ





දහයට විතර ඇති. එවලෙ රුවන්ති නැන්දා මිදුල අතුගානවා.

'' ආ... දැස් පුතාව දවස් දෙකකින් විතර දැක්කෙ. මං හිතුවා වැඩට යන්න කලින්ම ලොකු මිනිස්සු වෙලා කියලා. ''

මාව දැක්කා විතරයි රුවන්ති නැන්දා බරබරයක් දාන්න පටන් ගත්තා. ඒ කියන්නෙ මං දවස් දෙකක් පේන්න නැති උනාම ඒක අනිත් මිනිස්සුන්ට තදේට දැනෙනවා කියන එකද...?

'' ඒකනෙ... මං මේ නැන්දවයි චූටිවයි බලලා යන්න කියලා ආවා... ''

මං ගිවන්තගෙ පස්සෙන් ගෙට රිංගන්න හැදුවෙ රුවන්ති නැන්දට ෂේප්මන්ට් එකක් දාන ගමන්මයි.

'' අපේ කෙල්ලනං ඔන්න පන්ති යන්න හදන්නෙ... ''

'' පංති... ඇයි නංගි ඊයෙ කිව්වා නේද අද එයාට පන්ති නෑ කියලා... ''

ගේ ඇතුළට ගිය ගිවන්ත හැරිලා ආවෙ රුවන්ති නැන්දා දිහා පුදුමයෙන් බලන ගමන්.

'' ඔව්... ඒ උනාට දැන් ටිකකට කලින් කෝල් එකක් ආවා දවල්ට රිවිෂන් ක්ලාස් එකක් දාලා කියලා. ''

ඒක අහලා මං ගිවන්ත දිහා බැලුවෙයි ඌ මං දිහා බැලුවෙයි එකම වෙලාවෙ. චූටිට ඇත්තටම අද ක්ලාස්ද...? එහෙමත් නැත්තං...

'' වරෙන්කො... ''

ගිවන්ත මාවත් ඇදගෙන කාමරේට රිංගගත්තෙ හරි කලබලෙන් වගේ.

'' මොකද මචං කරන්නෙ...? අපේ ප්ලෑන අප්සෙට් යයි

වගේනෙ... ''

මං කිව්වෙ චූටි ගියොත් ඒකිගෙ ෆෝන් එක උස්සන වැඩේ කරන්න බැරි වෙන නිසා. ඒත් ශිවන්තනං ඒක ගාණක් නෑ වගේ හිනාවෙන් ගත්තා.

'' ඒක අප්සෙට් ගියාට කමක් නෑ මස්සිනා. අපි අලුත් ප්ලෑනක් ගහමු... ''

'' ඒ කිව්වෙ...? ''

'' පොඩ්ඩක් හිටපංකො... ඔක්කෝටම කලින් චූටි කෝ කියලා මං බලලා එන්නම්... ''

ඌ ගේ කාමරෙන් එළියට ගියාට පස්සෙ මං මිනිහගෙ ඇඳේ දිගා වෙලා කල්පනා කරන්න ගත්තා. මට ශිවන්ත එක්ක එකතු වෙලා හොයන්න ඕන උනේ දැහැමි ගැන උනත් අන්තිමේදි හොයන්න සිද්ධ උනේ චූටි ගැන. ඒ ගැන පොඩි දුකක් හිතේ තිබුණත් චූටි මේ නටන නාඩගමේ අගමුල දැනගන්නත් මට ලොකු ඕනකමක් තිබුණා.

'' දැස්... මෙහෙ වරෙන්කො... ''

කලබලෙන් වගේ කාමරේට දුවගෙන ආව ශිවන්තයා මාව ඇඳෙන් බිමට ඇදලා ගත්තා.

'' චූටි යන්න ලෑස්ති වෙනවා. මං දැන් යද්දි ඒකි කාටද මන්දා කෝල් කරලා කියනවා ඇහුණා මං දවල්ට ඇවිත් ඔයාව හම්බවෙන්නම් කියලා. ''

'' ඉතිං...? ''

'' මම දැන් කුස්සිය පැත්තට ගිහින් චූටිව ටිකකට එළියට ගෙන්න ගන්නවා. උඹ ඒ අතර ඒකිගෙ කාමරේට ගිහින් ඒ කෝල්





කරපු එකාගෙ නම්බර් එක උඹේ ෆෝන් එකට දා ගනිං... ''

'' ඒකි ෆෝන් එකත් අතේ අරන් උඹ ඉන්න පැත්තට ආවොත්...? ''

මං ඇහුවෙ එහෙම උනොත් නම්බර් එක ගන්න විදියක් නැති නිසා.

'' එහෙම වෙන්නෙ නෑ. අනික උඹ ආවා කියලා කෙල්ල දන්නෙත් නැනෙ. ඒ නිසා සැකයක් හිතෙන එකක් නෑ. ''

එහෙම කියපු ශිවන්තයා ආපහු සැරයක් කාමරෙන් එළියට පැනලා දිව්වා. මමත් උගේ කර්ට්න් එක අස්සෙ හැංගිලා හිටියෙ සංඥාව ආව ගමන් චූටිගෙ කාමරේට දුවන්න බලාගෙන.

'' චූටී.... චූටී.... මෙහෙ එනවකො ටිකකට... ''

ශිවා කුස්සියේ තිබුණු මොකක්දෝ මන්දා පෙරලන ගමන්ම කෑ ගහනවා ඇහුණා. මං කාමරෙන් එළියට පනින්න හැදුවා විතරයි....

'' මොකද පුතා නංගිට කෑ ගහන්නෙ... එයා අඳිනවා... ''

කියාගෙන කුස්සිය පැත්තට දිව්වෙ රුවන්ති නැන්දා. ෂිට්... නැන්දා ගෙයි ඉන්නවා කියන එක අපි දෙන්නටම අමතක උනානෙ. දැන් ඉතිං මොකේද දත් වළදන්නේ කිව්වලු.

'' කවුද අම්මා මෙක මේ අඩමානෙට තිබ්බෙ... බලන්න මගේ අතත් පිච්චුණා. ඌහ්... ''

ශිවන්තයා කුස්සියෙ ඉඳගෙන මර ලතෝනි දෙනවා. ඌ බොරුවට බය කරන්න ගිහින් ඇත්තටම මොකක්හරි අකරතැබ්බයක් උනාද කියලා හිතෙද්දි මං කාමරෙන් එළියට ඇවිත් මැද පැසේජ් එකට ළං උනා. ඒත් එක්කමයි මං දැක්කෙ චූටිත් කාමරේ ඉඳලා

කුස්සියට දුවනවා.

ගිවන්තව බලන්න යැව්ල්ල පැත්තක තියෙද්දි මං අඩියට දෙකට චූටිගෙ කාමරේට පැනලා පොඩි සර්ච් එකක් දැම්මා. හරි... මට ඕන කරන බඩුව කෙල්ලගෙ කණ්ණාඩි මේසෙ උඩ දිලිසි දිලිසි තියෙනවා. ගිවන්තයා නන්ස්ටොප් අඬෝනාව දෙන සද්දෙ අතරම මං තප්පරේට දෙකට අන්තිමට ගත්තු කෝල් එකේ නම්බර් එක මගේ ෆෝන් එකට දාගත්තා. කෙල්ල ඒක සේව් කරලා තිබුණෙ ෆ්‍රෙන්ඩ් වන් කියලා.

වැඩේ ඉවර කරලා ෆෝන් එක තිබුණු තැනින්ම තියලා මං දොර ගාවට එද්දි එළියෙ ඉඳලා කාමරේ ඇතුළට ආව කෙනෙක් කර්ටින් එකේ එතීගෙනම මගේ ඇඟේ වැදුනා.

අඩේ... මේ චූටිනෙ. මාර නෝන්ඩිය තමයි මටත් උනේ.

එයාගෙ කාමරේ ඉඳලා හොර පූසා වගේ එළියට යන්න හදපු මාව දැක්ක ගමන් කෙල්ල සෑහෙන්න අප්සෙට් ගියා කියලා මට තේරුණා. ඒත් තාමත් ටයිට් ෂෝට් එකයි ස්කිනි එකයි විතරක් පිටින් හිටපු කෙල්ලව දැකලා මං ඊටත් වඩා අප්සෙට් උනා. මගේම නංගි උනත් කෙල්ල ඒ ඇඳුමට මාර හුරුබුහුටියි.

'' දැ...ස්... අ යියා.... ඔයා... ''

කෙල්ල ඇහුවෙ වචන පටලව පටලව.

'' මං ඔයා ඉන්නවද කියලා බලන්න කාමරේට ආවෙ. කොහෙද මේ බාගෙට ඇඳගෙන දිව්වෙ...? ''

හිත ඇතුළෙන් ගිඩි ගිඩි ගාලා සද්දයක් ආවට මං ඒක පුළුවන් උපරිම විදියට හංගගෙන කූල් ඩවුන් විදියට ඇහුවා. එතකොටයි කෙල්ලට මතක් උනේ එයා ඉන්නෙ බාගෙට ඇඳගෙන





කියලා.

'' අනේ... ''

චූටිගෙ සුදු අතක් ඒ පපුව හරහා යද්දි මං බිම බලාගෙනම කාමරෙන් එළියට දිව්වෙ ගිවන්තයට හිතෙන් බැන බැන. ඌත් කරන්නෙ මාර වහුකුණු වැඩ තමයි. ෂිට්... චූටි මොනවා හිතුවද මන්දා.

'' වැඩේ හරිද...? ''

චූටි හිටපු විදිය මැවිලා පෙනෙද්දි ගිවන්තයා කාමරේට ආවෙ හිනාවක් දාගෙනමයි.

'' වැඩේ... වැඩේ තමයි. උඹේ සද්දෙට ආවෙ චූටි නෙමෙයි රුවන්ති නැන්දනෙ... ''

මං කිව්වෙ ඌට ඇඳ උඩ තිබුණු කොට්ටෙකින් දමලා ගමන ගමන්.

'' ඒකනෙ බං... මට හිතුනෙත් නෑ අම්මා එතනට කඩන් පාත් වෙයි කියලා. එයාටත් ඕනෙ නැති දෙයක් නෑ. ''

'' එහෙම කියන්න එපා බං... ඒත් අම්මා කෙනෙක්නෙ. උඹේ සද්දෙට ඒ මනුස්සයා හිතන්න ඇති උඹට කරදරයක් කියලා.''

'' හරි... හරි... වැඩේ කරගන්න පුළුවන් උනාද කියපං...''

'' වැඩේනං කරගත්තා. ඒත් මාව චූටිගෙ අතටම මාට්ටු උනා. ඒකි ඒ වෙලාවෙම කාමරේට දුවන් ආවනෙ. ''

'' චිකේ... ඇත්තද... ''

ගිවන්තයා ඇහුවෙ නළලට අතින් ගහගන්න ගමන්.

'' ඒ විතරක්යැ... චූටි හිටියෙ බාගෙට ඇඳගෙන. මට වස නෝන්ඩිය... ''

" ආහ්... ඒකද මේ උඹට ඩෝං ගිහින් තියෙන්නෙ...? ඒවා ගණන් ගන්න එපා මල්ලි. අපේ එකී කොහොමත් ගෙදරට ඉන්නෙ බාගෙට ඇඳගෙන තමයි. කවදාවත් දණිස්සෙන් පහළට ඇඳුමක් අඳින්නෙ නෑ. "

ඒකයි දැන් දැකපු විදියයි දෙකක්නෙ. දැන් කෙල්ල හිටියෙ පන්ති යන්න අඳින යට ඇඳුම් ටික පිටින්නෙ. මට ආයෙත් චූටිගෙ මූණ බලන්නත් ලැජ්ජයි වගේ.

" ඕක ඔච්චර හිතන්න එපා බං. ඒකි මුකුත්ම අඳින්නෙ නැති කාලෙ ඉඳලා උඹ දැකලා තියෙනවනෙ. දැන් මෙහෙ දියත් අර නම්බර් එක. "

මගේ පිටට තට්ටුවක් දාපු ගිවන්තයා මං අතේ තිබුණු ෆෝන් එකෙන් නම්බර් එක අරන් උගේ ෆෝන් එකට දා ගත්තා.

" මේක මොකක් කියලද සේව් කරලා තිබුණෙ...? "

ඌ ඒක ඇහුවෙ රහසින් වගේ.

" ෆ්‍රෙන්ඩ් වන් කියලා... "

" ආන් ඒකෙනං පොඩි අවුලක් තියෙනවා මචෝ... ඕකෙ හොරයක් නැත්තං එහෙම සේව් කරගන්න ඕනෙ නැහැනෙ. කෙලින්ම නම දාගන්න තිබ්බනෙ. කමක් නෑ දැන් යමුකො... "

අපි දෙන්නා කොහොමහරි චූටිට කලින් ගෙදරින් පැන ගත්තා. බයික් එකේ කෙලින්ම හන්දියට ගිය අපි අතුරු පාරකට හරවගෙන හැංගිලා හිටියෙ කෙල්ල පාරට එනකල්.

අපි ගිහින් විනාඩි විස්සකට විතර පස්සෙ තමයි චූටි පාරට ආවෙ. කෙල්ල බිම බලාගෙනම ඇවිත් ටවුන් එක පැත්තට යන බස් එකකට නැග්ගා. එයා ක්ලාස් යනවානං යන්න ඕනෙ





ටවුන් එක පැත්තට නෙමෙයි අනික් පැත්තට. එතකොට මේ ළමයා මේ ගෙදරටත් බොරු කියලා කාව හම්බවෙන්නද යන්නෙ...?

අපේ හන්දියෙ ඉඳලා ටවුන් එකට ඒ හැටි දුරක් නැති නිසා අපිත් බස් එක පෙනෙන නොපෙනෙන මානෙන් ටවුමටම ආවා.

" බයික් එක කොහෙන් හරි දාලා යං. නැත්තං අපි දෙන්නා අතේ මාට්ටු. "

මගේ කතාවට ගිවන්තත් කැමති උනේ චූටි අපේ බයික් එකේ ඡායාව දැක්කත් අඳුරගන්නවා කියලා ඌත් දැනගෙන හිටපු නිසා. අනික ටවුන් එකේ භාගයක්ම අය මාවයි ගිවන්තවයි අඳුරන නිසා අපිට උදව් ගන්න කට්ටිය ඕන තරම් හිටියා.

" දේව් අයියගෙ පාකින් එකට දාමු... "

ඒක කිව්වෙ ගිවන්ත. දේව් අයියා කියන්නෙ ටවුන් එකේ ගිෆ්ට් අයිටම්ස් ෂොප් එකක් කරපු අවුරුදු තිස් පහක විතර මනුස්සයෙක්. එයා ඒ කාලෙ ඉඳලම අපේ ගෙවල් වල අය එක්ක හිතවත්. ඉතිං අපි දෙන්නා බයිසිකලේ එහෙන් දාලා චූටිගෙ පස්සෙන් වෙට්ටු දදා ෆලෝ කළේ එයා හම්බවෙන්න යන ෆ්‍රෙන්ඩ් වන් කවුද කියලා දැනගන්න.

අපේ අනුමානය නිවැරදි කරමින් එකපාරටම චූටිගෙ ඉස්සරහට ආවෙ විනෝද්. ඒ කියන්නෙ චූටි අද පන්ති තියෙනවා කියලා රුවන්ති නැන්දටත් බොරු කරලා ආවෙ මූව හම්බවෙන්න. මෙච්චර දේවල් සිද්ධ වෙද්දිත් අපි යාළුවො විතරයි කියලා දෙන්නම කියන එකනෙ වැඩේ කියන්නෙ.

" උන් දෙන්නා ඩයස් අයියගෙ ෆෝන් ෂොප් එක පැත්තටයි යන්නෙ... "

දෙන්නා යන දිහා බලාගෙන හිටියට අපි ඇතුළට යන්න තරම් කලබල උනේ නෑ.

'' මටනං හිතෙනවා බං අපේ එකීගෙයි අරූගෙයි දෙන්නගෙම හොම්බට දෙකක් අනින්න. අපි මේකිව මෙච්චර ආදරෙන් හදලත් මේකි අපේ කනෙන් රිංගන්නනෙ හදන්නෙ. බලපං අද අම්මට කියලා තියෙන බොරුව... ''

ගිවන්තයා කෑ ගැහුවෙ ඌ කවදාවත් ක්ලාස් කට් කරලා නැති ගාණට. ඌයි මායි ඉස්කෝලෙ කට් කරපුවා ක්ලාස් කට් කරපුවා අපිනෙ දන්නෙ. අපි ගෙදරට ක්ලාස් යනවා කියලා කියපු තරමටම ක්ලාස් ගියානං අපි අද ඉන්නෙ මෙතන නෙමෙයි. එහෙමනං අපි මහාචාර්යවරු.

කොහොමහරි විනාඩි දහයක විතර ගනුදෙනුවකින් පස්සෙ ජෝඩුව එළියට ආවා. ඊට පස්සෙ දෙන්නා ෆුඩ්සිටි එකට ගියා.

'' මේකි මේ මොනවද බං කරන්නෙ...? ලව් කරන එවුන් මොකටද ෆුඩ්සිටි යන්නෙ...? ගෙදරට උයන්න ගන්නයෑ. ''

මං ගිවන්තගෙන් ඇහුවෙ මුං දෙන්නා නටන්න හදන නාඩගම තේරෙන්නෙ නැති නිසා.

'' ඒක තමයි මාත් මේ බලන්නෙ...? කොහොම උනත් උන් දෙන්නගෙ සෙල්ලම ඉක්මනට ඉවරයක් කරන්න ඕනෙ. අපි හැමදාම මේ විදියට හැංගි හැංගි ඔත්තු බලන එකේ තේරුම මොකක්ද...? දවසක මුන් දෙන්නා මේ විදියට ටෝච් එකක් අරගෙන පැනලා යනකලුත් අපි හැංගිලා බලාගෙන ඉඳියි. මේක පිරිමිකමටත් ලැජ්ජාවක් දැස්... ''

හැමදාම ගිවන්තට කලබල වෙන්න එපා කියලා කූල්





ඩවුන් කරන්න හැදුවට මේක ඉක්මනට ඉවරයක් කරලා දාන එක කොයි එකටත් හොඳයි කියලා මටත් මේ වෙද්දි තේරිලයි තිබුණේ. මොකද චූටි එන්න එන්නම අවුට් යනවා වැඩියි. කෙල්ල මේ විදියට ගිහින් අපිටත් නොදැනිම අනතුරක් කරගත්තොත් අපේ මහන්සිය අපතේ යනවා.

'' ඇත්ත මචං... අපි අර නම්බර් එකට රෑට කෝල් කරලා මූ එක්ක ඩිරෙක්ට් කතා කරමු. දැන් ඉතිං ඌට මේක නෑ කියන්න බෑනෙ. ඊට කලින් බලමුකො මුන් දෙන්නා මේ සීනි පිටි තේ කොළ අරගෙන කොහෙද යන්න හදන්නෙ කියලා. ''

ඩබල ෆුඩ් සිටි එකෙන් එළියට ආවට පස්සෙ උනේ නොහිතපු දෙයක්. විනෝද් චූටිව ත්‍රීවිලර් එකකට නග්ගලා ත්‍රීවිල් ඩ්‍රයිවර්ට මොනවදෝ මන්දා කිව්වා. පේන විදියටනං කොල්ලා චූටිව තනියම කොහෙදෝ මන්දා යවන්න හදන්නෙ.

'' මොකද කරන්නෙ...? අපිට බයික් එක ගේන්න යන්න තරම් වෙලාවක් නෑ මචං... ''

'' නැගපං ඔය ඉස්සරහා තියෙන ත්‍රීවිල් එකට... ''

චූටි නැග්ග ත්‍රීවිලර් එක ස්ටාට් කරද්දිම මං ගිවන්තයාවත් ඇදගෙන ළඟම තියෙන ත්‍රීවිලර් එකට නැගලා අරක ෆලෝ කරන්න කිව්වා.

'' ඒ මිස් යන්නෙ වීදියවත්තට වෙන්න ඇති මහත්තයා. මමත් දවස් දෙකක්ම එයාව එක්කගෙන ගියා. ''

අපි ෆලෝ කරන්න කිව්වා විතරයි ත්‍රීවිල්කාරයා කිව්වෙ අමුතු ජාතියෙ කතාවක්. ඒ කියන්නෙ චූටි මේක නිතරම නටන නාඩගමක්ද...?

" මීට කලිනුත් එයා වීදියවත්තට ගියේ තනියමද...? " ඒක ඇහුවෙ ගිවන්ත. ඒ වෙද්දි ත්‍රීවිල් එක චූටි ගිය කොළ පාට ත්‍රීවිල් එක පස්සෙ පන්නන ගමන් තිබුණෙ.

" ඔව්... ඔය විදියටම බඩු අරගෙන තමයි මගෙත් එක්ක ගියෙත්. ඇයි මහත්තයා තමන්ගෙම නංගිව ඔය විදියට ෆලෝ කරන්නෙ...? "

" මොකක්...? "

ඒ මනුස්සයගෙ කතාවට මාවයි ගිවන්තවයි අන්දුන් කුන්දුන් උනා. මේ යකා කොහොමද අපිව අඳුරන්නෙ....? අනික චූටි අපේ නංගි කියන්න තරම්...?

" ඇයි මහත්තයා... මහත්තයලා තුරුලිය ලෑන්ඩ් සේල් ගෙදර නේද...? ඔය ඉස්සරහා යන්නෙ මහත්තයලගෙ නංගිනෙ...?"

" අයියා කොහොමද අපිව දන්නෙ...? "

මට ඒ වෙද්දි චූටි යන ත්‍රීවිල් එක දිහා බලන්න තරම්වත් කල්පනාවක් උනේ නෑ. ඒත් ගිවන්තගෙ ඇස් දෙකනම් තිබුණෙ ඒ පැත්තෙමයි.

" මං සහන්ගෙ යාළුවෙක්. මම දවස් දෙක තුනක් විතර සහන් එක්ක එහෙ ඇවිල්ලත් තියෙනවා. අන්තිමට ආවෙ අර තානායම් වත්තෙ නයා අරගෙන. "

මිනිහා කවුද කියලා ලාවට වගේ මතක් උනත් ඒ ගැන නිවී සැනසිල්ලෙ කතා කරන්න තරම් වෙලාවත් නොතිබුණේ අපි වීදියවත්ත කිට්ටුවට ඇවිත් තිබුණු නිසා. ත්‍රීවිල් පොර කිව්වා වගේම චූටි ගිය ත්‍රීවිල් එක වීදියවත්තට ඇතුල් උනා.

" මොකද කරන්නෙ මහත්තයා... ඇතුළට දාන්නද...? "





" තව ටිකකින් දාන්න... "

මට කලින්ම ගිවන්ත උත්තර දුන්නා. අපි විනාඩි කීපයක් එතන රැදිලා ඉන්න අතරෙ ත්‍රීවිල් අයියගෙ නම දැනගන්න අමතක කළේ නෑ. මිනිහගෙ නම තිස්ස. සහන්ගෙන් දැනගෙනද මන්දා මිනිහා අපේ පවුලෙ සෑහෙන විස්තරයක් දැනන් ඉන්න බවක් පෙනුනා.

" අයියා කොයි එකටත් අපිට ෆෝන් නම්බර් එක දීලා තියන්නකො. අපි හදිස්සියක් උනොත් කතා කරන්නම්. "

මං තිස්සගෙ නම්බර් එක ඉල්ලගන්නකොටමයි චූටි ගිය ත්‍රීවිල් එක වීදියවත්තෙන් එළියට දැම්මෙ.

" ආ... ඩගියා... හයර් එකක් වගේ... "

තිස්ස ඔළුව දාලා අර ත්‍රීවිල්කාරයගෙන් ඇහුවා.

" ඔව් බං... අර හරක් මඩුව ගාවට ගියා... "

මනුස්සයා යන්න ගියේ එහෙම කියාගෙන. ඒක ඇහුවමනං මට ඇතුළට යන්න ඕනකමක් තිබුණෙ නෑ. ඌ ඒ හරක්මඩුව කියලා කිව්වෙ දැහැමිලගෙ ගෙදරට කියන එක මට සීයට දෙසීයක් ෂුවර්. මොකද දැහැමිලගෙ වත්තෙ හරක් බැඳලා ඉන්නවා මං එදා ඇස් දෙකෙන්ම දැක්කනෙ. අනික දැහැමි කියන්නෙ චූටිගෙ යාළුවෙක් කියලා ගිවන්තත් කිව්වනෙ.

" දැන් යන්ද මහත්තයො... ? "

" ඔය කියන හරක් මඩුව පහු කරගෙන ගිහින් ආයෙත් හරවගෙන එමු... "

ගිවන්ත කිව්වෙ මගේ මූණ දිහා ඇස් කොණෙන් බලන ගමන්. ඌ දන්නවා මං ඉන්නෙ අප්සෙට් එකේ කියලා.

අපි දැහැමිලගෙ ගේ පහු කරද්දි තිස්ස ත්‍රීවිල් එක ස්ලෝ කළේ අපිට හොඳට බලාගන්න කියන්න වගේ. ඒත් අමුතුවෙන් බලන්න තරම් දෙයක් තිබුණෙ නෑ. චූටි දැහැමිත් එක්ක කතා කර කර මිදුලෙ ඉන්නවා අපි හොඳටම දැක්කා.

'' හරවගෙන ආපහු යමු. ''

මං කිව්වෙ බිම බලාගෙන. දැහැමිලගෙ ගෙදර ත්‍රීවිල්කාරයො හරක් මඩුව කියලා හඳුන්වන එක මගේ හිතට පුදුම වේදනාවක් වෙලා තිබුණෙ. ඒක ගිවන්තටත් දැනිලා වගේ මිනිහා මුකුත්ම කතා නොකර මගේ පිටට තට්ටුවක් දැම්මා. ආපහු ටවුන් එකට එනකල් මං කතා කළේ නෑ.

'' යන්න කලින් ඩයස් අයියගෙ ෆෝන් ෂොප් එකටත් ගිහින් යමු. අරුන් දෙන්නාගෙන් කාටද ෆෝන් එක ගත්තෙ කියලා දැනගන්න. ''

ගිවන්ත ඒක කිව්වෙ ත්‍රීවිල් එකෙන් බැස්සට පස්සෙ.

අපි දෙන්නා ෆෝන් ෂොප් එකට ගියා විතරයි ඩයස් අයියා බොහොම සුහදශීලී හිනාවක් දාලා අපිව පිළිගත්තා.

'' ආ... බේබි මහත්තුරු දෙන්නට කාලෙකින් අපිව මතක් වෙලා තියෙන්නෙ... ''

මිනිහා ඒකනං ඇහුවෙ පල් එකට වගේ. මොකද ඉස්කෝලෙ යන කාලෙ අපි සතියට දවසක් දෙකක්වත් මෙතනට ඇවිත් පොත අත්සන් කරලා තමයි යන්නෙ.

'' අපි ආවෙ ඩයස් අයියා අපේ නගා ගත්තු ෆෝන් එක මොකක්ද කියලා දැනගන්න... ''

ආයෙ වටෙන් ගොඩෙන් යන්නෙ නැතුව ගිවන්තයා





කෙලින්ම කාරණාවට බැස්සා.

'' එයාලා අලුත් ෆෝන් එකක් ගත්තෙ නෑ මල්ලි. අර කොල්ලා ගිය සතියෙ හදන්න දීලා තිබුණු ෆෝන් එක අරන් යන්න ආවෙ. ''

මෙච්චර වෙලා වෙන ලෝකෙක හිටපු මාව පියවි සිහියට ආවෙ ඩයස් අයියගෙ ඒ කතාවත් එක්ක. ඒ කියන්නෙ විනෝද් හදන්න දීපු ෆෝන් එක ගෙනියන්න තමයි දෙන්නා ඇවිත් තියෙන්නෙ. එහෙමනං චූටි උදේ කෝල් එක ගත්තෙ විනෝද්ට නෙමෙයිද...? මේක මාර අවනඩුවක්නෙ අප්පා.

'' ඒ ෆෝන් එකේ ජාතිය මොකක්ද...? ''

'' නොකියා සී වූ ටච් ෆෝන් එකක්... ''

අපි ප්‍රශ්නෙ අහන පරක්කුවට ඩයස් අයියා උත්තර දීලා ඉවරයි. මිනිහා වෙන කෙනෙක්ටනං මේ වගේ තොරතුරු දෙන්නෙ නෑ. අපේ තියෙන ෆිට් එකටයි චූටි අපේ නංගි කියලා දන්න නිසයි තමයි ගේම මේ තරම් ලේසි උනේ.

'' ඔය ෆෝන් එක දුන්න මැන් ගැන ඩයස් අයියට මොකද හිතෙන්නෙ...? ''

ගිවන්ත ඇහුවෙ ෂොප් එකේ අනික් එවුන්ට ඇහෙන්නෙ නැති තරමෙ පහත් හඬින්. ඒකට ඩයස් අයියා දෙන උත්තරේ මොකක්ද කියලා දැනගන්න මමත් ඒ මූණ දිහා බලාගෙනම හිටියා.

'' ඒ හැන්ඩියානං රියල් මීටරයක් මල්ලි. කතාවෙන් ඒක තේරෙනවා. ''

ඩයස් අයියා අපේ මස්සිනා වෙන්න ඉන්න කොල්ලා ගැන නියම සහතිකයක් දුන්නා.

" පොර අපේ එක්කෙනාට නියමෙට මැච් වෙනවා නේද...? "

ශිවන්ත ඒක ඇහුවෙ වැඩිය සීරියස් දෙයක් අහන විදියට නෙමෙයි... නිකං විහිළුවට වගේ.

" පෙනුමෙන් නම් මැච් වෙනවා තමයි. හැබැයි මට හිතෙන විදියට උන් දෙන්නා අතර එහෙම සීන් එකක් නෑ වගේ..."

ඔන්න ඒ පාර ඩයස් අයියත් අපේ මොලේ කොලොප්පන් කරන්න හදන්නෙ. ඇයි දෙයියනේ චූටියි විනෝද්දුයි මදිවට දැන් වචනයක් දෙකක් කතා කරපු මිනිහත් කියනවා උන් දෙන්නා අතර එහෙම දෙයක් නැලු. එහෙනං ගෙදරට බොරු කිය කිය ඇවිත් හොර රහසේ මුණ ගැහෙන්න උන් අතර කොහොම දෙයක්ද තියෙන්නෙ...?

" උන් ඩයස් අයියා ඉස්සරහා ඒ විදියට හැසිරෙන්න ඇති... "

" නෑ මල්ලි... උඹලා අපි බොක්ක උනාට උඹලගෙ නංගි මාව දන්නෙ නෑ. කොටින්ම මල්ලිලා අපි හිතවත් කියන්නවත් මං එයාව දන්නවා කියන්නවත් නංගි දන්නෙ නෑ. මං ඒ බව අඟවන්න ගියෙත් නෑ ඉතිං. ආව වැඩේ කරලා දීලා යැව්වා. "

ඩයස් අයියා ෆුල් ඉන්ෂුවරන්ස් ටයිප් එකෙන් තමයි ඒක කිව්වෙ.

" ඕක බාර දෙන්න ආවෙත් දෙන්නමද...? "

මං ඇහුවෙ නිකමට වගේ.

" නෑ නෑ... කොල්ලා දැන් සතියකට විතර කලින් තනියම ඇවිත් තමයි දීලා ගියේ... නංගි ආව ෆස්ට් ටයිම් එක මේ. "





" හ්ම්... ඒකත් එහෙමද...? හරි ඩයස් අයියෙ... ඔය ඩබල ආයෙ ටවුන් එක පැත්තෙ කැරකෙනවා දැක්කොත් අපිට කියන්නකො... "

" ඇයි... කෙල්ල කොටුවක්වත් පැනලද...? "

" නාමනං නෑ. ඒකිගෙ විභාගෙ අතළඟ නිසා තමයි අපි මේ කොටු පනින්න නොදී පරිස්සම් කරන්න හදන්නෙ... එහෙනං... අපි ගිහින් එන්නම් ඩයස් අයියා... "

ඩයස් අයියට අතකුත් වනලා අපි ෂොප් එකෙන් එළියට එද්දිම මිනිහා ශිවාට හොරෙන් මට ඇහැක් ගැහුවා. ඒකෙ තේරුම මට මොනවාහරි දෙයක් කියන්න තියනවා කියන එක මට තේරුම්ගන්න අපහසු උනේ නෑ.

ශිවා බයික් එක ගන්න පාකින් එක පැත්තට යද්දි මං ආයෙත් ෂොප් එකට අඩිය තිබ්බෙ ඒ රහස දැනගන්න.

" දෑස් මල්ලි... වෙලාවක තනියම ඇවිත් මාව මුණ ගැහෙන්න... "

ඒ ඇස් ඇතුළෙ මොකක්දෝ මන්දා ලොකු කතන්දරයක් ලියවිලා තිබුණත් මං ඒක ඒ වෙලාවෙ දැනගන්න උත්සහ කළේ නෑ. තනියම එන්න කිව්වෙ ශිවන්ත ඉද්දි කියන්න බැරි දෙයක් නිසානෙ. දකුණු අතේ මහපටඟිල්ල උස්සලා හිට් එකක් දානගමන් ශිවන්ත ගිය පැත්තට ගියා.

" මේක දැන් යන්නෙ අපි හිතපු නැති වෙනස් පැත්තකට මචං. චූටිගෙයි විනෝද්ගෙයි සීන් එක ඇතුළෙ උඹේ දැහැමිත් ඉන්නවා. ආයෙ ඒකෙ දෙකක් නෑ. ඒත් මේ ෆෝන් හුටපටේ මට ලොකු අවුලක්. "

ගිවන්ත ඒක කිව්වෙ අපි දෙන්නා අපේ ගෙදරට ඇවිත් මගේ කාමරේටත් රිංගගත්තට පස්සෙ. ඒ වෙලාවෙ අපේ ආච්චියි සුදුයි දෙන්නා මෙලෝ සිහියක් නැතුව කාටූන් බලනවා.

" අපි මුලින්ම අර නම්බර් එකට කෝල් කරලා බලමු."

මං චූටිගෙ ෆෝන් එකෙන් සේව් කරගත්තු නම්බර් එකට රින්ග් කරලා ගිවන්තට ඇහෙන්න ස්පීකර් එකත් ඔන් කරගත්තා.

" හලෝ..."

විනෝද්ගෙ හඬ ඇහෙනකල් බලන් හිටියට කතාකළේ තරමක් වයසක ගෑණු කෙනෙක්.

" ආන්ටි විනෝද් ඉන්නවද...? "

මගෙත් ෆෝන් එක උදුරගත්තු ගිවන්ත ඇහුවෙ ඒ විනෝද්ගෙ අම්මා වෙන්න ඇති කියලා හිතාගෙන.

" විනෝද්...? ඒ කව්ද පුතේ...? "

ගිවා මගේ මූණ බැලුවෙ මේ මොනවද වෙන්නෙ කියලා අහන්න වගේ.

" හලෝ.... "

අර ගෑණු කෙනාගෙ කටහඬ ආයෙත් ඇහෙන්න ගත්තා.

" මේ විනෝද්ගෙ ෆෝන් එක නෙමෙයිද...? "

" නෑ පුතේ... මේ අපේ ගෙදර පාවිච්චි කරන ෆෝන් එකක්... "

" එතකොට ආන්ටි දැහැමි කියලා කෙනෙක්ව දන්නවද...?"

" පුතාලට වැරදිලාද කොහෙද...? මං ඔය නම් තියෙන





කිසි කෙනෙක්ව දන්නෙ නෑ. "

" එහෙමද... අනේ සොරි ආන්ටි... "

එහෙම කියලා ගිවා ටක් ගාලා කෝල් එක කට් කළා. මමත් උගේ මූණ දිහා බලන් හිටියෙ ඒක එහෙම උනේ කොහොමද කියලා හිතාගන්න බැරුව...

" කවුද එතකොට මේ ෆ්‍රෙන්ඩ් වන් කියන එකා. චූටි ඩබල් ගේමක්වත් ගහනවද...? "

ගිවන්ත ඇහුවෙ කේන්තියෙන් වගේ.

" අදත් අපි පරාදයි බං. චූටි දිනුම්.... බලපං...ඒකි ගිය තැන දැනගත්තට විනෝද්ගෙයි ඒකිගෙයි සම්බන්ධයක් තියෙනවා කියලා ඔප්පු කරගන්න පුළුවන් උනේ නෑ. අනික යාළුවගෙ ගෙදර උනත් කෙල්ල ගියේ තනියමනෙ. ඒ දෙකටම වඩා කෙල්ල හරි සූක්ෂම විදියට ෆෝන් යූස් කරනවා. නම්බර් එක හොයලා කෝල් කරලවත් අපිට කෙනා හොයාගන්න බැරිවෙන විදියට. "

මං කිව්වෙ ඒ වෙලාවෙ මට දැනුණු අවංක හැඟීම.

" ඒකි දිනුම් වෙන්නෙ කොහොමද...? ඒකි ගෙදරට බොරුවක් කියලා රස්තියාදුවෙ ගියා කියලා අපේ අතටම අහුඋනා. අනික අපිට සැක හිතෙන පුද්ගලයවත් හම්බ උනා. ඒත් මට හිතාගන්න බැරි මේකි මොකටද බඩු මල්ලකුත් උස්සගෙන දැහැමිලගෙ ගෙදර ගියේ කියන එක. "

ගිවන්ත කිව්වෙ ඇත්ත. අපි ඉස්සරහා තියෙන නූල් බෝලෙ එන්න එන්නම පැටලෙනවා.

" අර කතා කරපු ආන්ටි අපිට බොරුවක් කිව්වා වෙන්න බැරිද මචං...? චූටි මූණ ගැහෙන්න ගියේ දෙන්නයිනෙ. විනෝද්වයි...

දැහැමිවයි.... ඉතිං එයා හම්බවෙන්න එනවා කියලා කෝල් කරන්න ඇත්තෙ ඒ දෙන්නාගෙන් කෙනෙක්ටනෙ. ඉතිං ඒ ආන්ටි කොහොමද කියන්නෙ ඒ නම් දෙකම එයා දන්නෙ නෑ කියලා. එක්කො එයා විනෝද්ගෙ අම්මා. එහෙමත් නැත්තං දැහැමිගෙ අම්මා. ''

'' උඹටත් ඇහුණනෙ මචං ඒ කටහඬ. මට හිතෙන්නෙ ඒ මනුස්සයා අපිට බොරුවක් කළේ නෑ කියලා. එහෙමනං...? ''

ගිවන්තයා එකපාරටම අතේ ඇඟිලි තුනකින් සද්දයක් දාන ගමන් ෂිට් කියලා කිව්වා.

'' මොකද...? ''

'' චූටි අපේ අම්මට ක්ලාස් යනවා කිව්වෙ ඉක්මනට එන අදහසක් නැති නිසානෙ. තාම වෙලාව එකටවත් නෑ. ඒ කියන්නෙ උන් තව ප්ලෑනක් ගහගෙන ඉන්න ඇති. ඒකි දැහැමිලගෙ ගෙදර ගියේ කෙල්ලවත් එක්කගෙන ඔය ෆ්‍රෙන්ඩ් වන්ව මීට් වෙන්න යන්නනම්...? අපරාදෙ... අපි ගේම මඟදි අතෑරලා දාලා ආවනෙ. ''

'' ඒ මොනවා උනත් චූටිගෙ ලව් එකක් තියෙනවා කියලා අපිට තාම ඔප්පු උනේ නැති නිසා මේවා නැන්දලට කියන්න යන්න එපා. අන්තිමේ රුවන්ති නැන්දයි ලොකු මාමයි දෙන්නා කෑ ගහන්න තියා ගත්තොත් කෙල්ල විභාගෙත් අනාගනියි.''

මං කොච්චර නෑ කිව්වත් අදත් කළේ ගිවන්තව ෂේප් කරන එක. මොන හේතුවක් නිසාද මන්දා... හුරතල් විදියට සැහැල්ලුවෙන් ඉන්න චූටිට බැනුම් අහන්න සිද්ධ වෙනවා කියන එක මතක් වෙද්දි මගේ හිතට මාරම දුකක් එනවා. අපේ අක්කට අම්මා බනින වෙලාවල් වලදිවත් මට එහෙම හැඟීමක් දැනෙන්නෙ නෑ.

* * * * * * *



# 09

පහුවෙනිදා උදේම මං ගියේ ෆෝන් ෂොප් එකේ ඩයස් අයියව හම්බවෙන්න. ඩයස් අයියා තනියම ඇවිත් එයාව මුණගැහෙන්න කියපු නිසා මං ඒ ගමන ගැන ගිවන්තට කියන්න ගියේ නෑ. මං ගෙදරට කිව්වෙත් ටවුන් එකට ගිහින් එන්නම් කියලා විතරයි. මොකද ඉතිං ඒක බොරුවක් නෙමෙයිනෙ.

'' මං මල්ලිව මුණ ගැහෙන්න දවස් ගාණක් තිස්සෙ හිතාගෙන හිටියෙ. මල්ලිලා දැන් ඉස්සර වගේ මේ පැත්තෙ එන්නෙත් නෑ... අපිටත් ඉතිං මේ කඩ වහලා දාලා එන්න විදියකුත් නෑ.... ''

මාව දැක්ක ගමන් කැෂියර් එක ළඟින් නැගිටලා ඉස්සරහට ආව ඩයස් අයියා කතාව පටන්ගත්තා.

'' මොකක්ද ඩයස් අයියෙ සීන් එක...? අනික තනියම මුණ ගැහිලා කියන්න තරම්...? ''

'' එන්නකො මේ පැත්තට... ''

මනුස්සයා මාව කඩේ පිටිපස්සෙ දොරෙන් එළියට

එක්කගෙන ගියේ වැඩට ඉන්න කොල්ලෙක්ට ඇතුළ බලාගන්න කියලා. කඩවල් වල ඉස්සරහා කොයි තරම් ලස්සනට තිබුණත් ඒවයෙ පශ්චාත්භාගය කොයි තරම් අප්පිරියයිද කියලා මට හිතුනෙ එළියට ආවට පස්සෙ. ඩයස් අයියගෙ ෆෝන් ෂොප් එකේ පිටිපස්සෙ අපද්‍රව්‍ය ඒ හැටි නොතිබුණාට එක පෙළට තිබුණු අහමඩ්ගෙ මස් කඩෙයි ඊට එහා කෑම කඩෙයි තනිකරම නරලොව අපාය. ඩයස් අයියානං ඒ කිසිදෙයක් ගාණක් නෑ වගේ කුණු කාණුව දිහා බලගෙනම කතාව පටන් ගත්තා.

'' මල්ලිට මං තනියම එන්න කිව්වෙ ගිවන්ත මල්ලි ඉස්සරහා මේ දේවල් කියන්න බැරි නිසා... ''

'' ඒ කිව්වෙ...? ''

'' ඒ කිව්වෙ ගිවන්ත මල්ලි චූටි නංගිගෙ අයියා නිසා...''

ඒ කතාව මට නිකං අන්ඩර දෙමළයක් වගේ උනා. මෙයා කියන්න හදන්නෙ චූටි ගැන මොකක්හරි වැරදි දෙයක්වත්ද...?

'' කියන දෙයක් තේරෙන්න කියන්න ඩයස් අයියෙ... ඔයා දන්නවනෙ මට ඔය වටේ යැවිලි දිරවන්නෙ නෑ කියලා. ''

'' ඕං ඉතිං කතාව පටන් ගන්න කලින්ම මල්ලි තරහා අරගෙන. එහෙම කලබල වෙලා මේ දේවල් විසඳන්න බෑ. ඔය නිසා තමයි මං ගිවන්ත නැතුව එන්න කිව්වෙත්... ''

මිනිහා ආයෙත් ඔළුව වටේ අතදානවා විතරයි. හැබැයි මගේ මූණෙ තිබ්බ වෙනස දැකලද මන්දා පොර හෙමීට කතාව පටන් ගත්තා.

'' මල්ලි දන්නවා ඇතිනෙ ඇන්තනීකාරයගෙ පුතා ගැන.... අර හැම තිස්සෙම කයිවාරු ගගහා යන ත්‍රීවිල්කාරයා. ''





මෙයා මේ කියන්න හදන්නෙ බෝස්තිං ගැනනෙ. ඒත් එයා ගැන කතාවක් කොහොමද චූටිට සම්බන්ධ වෙන්නෙ...?

'' මං දන්නවා ඩයස් අයියෙ. මිනිහගෙ නම සහන්. ''

'' මට මුලින්ම කියන්නකො ඒ යකා මල්ලිලගෙ පවුලෙ අයත් එක්ක මොකක්හරි සම්බන්ධයක් තියෙනවද කියලා...? ''

'' එහෙමට ලොකු කනෙක්ෂන් එකක්නම් නෑ. හැබැයි ඇන්තනී අන්කල් අපේ තාත්තලගෙ වැඩ වලට හවුල් නිසා සහනුත් අපේ ගෙවල් පැත්තෙ යනවා එනවා. ''

මං ඇත්තම තත්ත්වෙ විස්තර කළා.

'' ඕකා දවස් කීපයක්ම ඔයාලගෙ නංගි පස්සෙ කැරකුණා මං බලාගෙන. මල්ලි දන්නවා ඇතිනෙ මෙතන කැෂියර් එකේ ඉඳගත්තම මේ ටවුන් එකේ සිද්ධ වෙන දේවල් වලින් බාගයක්ම් පේනවා කියලා. මං දැක්කා ඕකා නංගි ඉස්කෝලෙ ඇරිලා එන වෙලාවල් වලදී තව එහෙ මෙහෙ යන දවස් වලදී කීප සැරයක්ම එයාව ෆලෝ කළා. හැබැයි ඒ කරදරයක් කරන චේතනාවෙන් වෙන්න බෑ. මට හිතෙන්නෙ මිනිහා නංගිට ලයින් පාරක් දානවා වගේ... ''

'' මොකා... සහන්...? මේ අපේ චූටිට ලයින් දානවා. ''

මට දැනුණෙ කවුරුහරි මගේ කන හරහා තද පාරක් ගැහුවා වගේ කම්පනයක්.

'' මේක නංගිත් දැනුවත්ව සිද්ධ වෙන දෙයක්... මොකද දවසක් ඒ මිනිහා බස් හෝල්ට් එකේදි නංගි එක්ක කතා කරනවත් මං ඇස් දෙකින්ම දැක්කා. නංගි උඹට මොනවදෝ මන්දා කියලා ගස්සලා වගේ අහක බලාගත්තා. ''

ඒ කියන්නෙ ඇන්තනී අන්කල්ලා අපේ තාත්තලගෙන් ගන්න බැරි පලිය සහන් ලව්වා චූටිගෙන් පියවගන්න හදනවද... හැබැයි ඉතිං මමයි ගිවන්තයි ඉන්නකල්නම් ඒවා සුම්මා. සහන්ට ඒ තරම් උඩ පනින්න ඉඩ දෙන්න බෑ.

ඒත් අපිට අවුලකට තිබ්බෙ චූටිත් මේ දවස් වල ගෙදරට බොරු කියලා වෙට්ටු දාන එක තමයි. කෙල්ල පන්ති යනවා කියලා වෙන කොහෙහරි ගිය වෙලාවක සහන් ගේමට බැස්සොත්...? අපිත් හිතාගෙන ඉඳියි කෙල්ල පන්තියෙ කියලා.

'' මල්ලි... දෑස්... මොනවද කල්පනා කරන්නෙ...? ''

ඩයස් අයියා මගේ උරහිසෙන් අල්ලලා හොල්ලද්දියි මං පියවි සිහියට ආවෙ.

'' ඩයස් අයියෙ... චූටි කියන්නෙ අපේ පවුල් දෙකතුනටම ඉන්න ලස්සනම මැණික. ඒ මැණිකට තිල මැස්සන්ට වහන්න දෙන්න බෑ. අනික ගිවන්ත විතරක් නෙමෙයි... මමත් චූටිගෙ අයියා. ඒ මගෙත් නංගි. එහෙම තියෙද්දි මං මේක ලේසියෙන් අරින්නෙ නෑ. ඩයස් අයියා මේ හැමදෙයක් ගැනම කිව්වට තැන්ක්ස්... ''

'' ඕක තැන්ක්ස් කරන්න තරම් දෙයක් නෙමෙයි... මං කොහොමත් මල්ලිට මේ ගැන කියන්න හිටියෙ කෙල්ලට අනතුරක් වෙන්න කලින් බේරගන්න ඕන නිසා. තාම තේරුමක් තියෙන වයසක් නෙමෙයිනෙ... ඒකා කාවහරි දම්මලා කෙල්ලව කොහෙටහරි ඉස්සුවොත් එහෙම සේරම අනාථයිනෙ. ''

ඩයස් අයියා ඒක කියද්දි මට මතක් උනේ අර තිස්ස කියන ත්‍රීවිල්කාරයා ගැන. මිනිහත් ඊයෙ කිව්වනෙ ඌ සහන්ගෙ යාළුවෙක් කියලා. චූටි යනවා ඇත්තෙ වීදියවත්තට කියලා ඌ කිව්වෙ ඒකා ඒ ගැන හොඳ නෝට් එකේ ඉඳලා තියෙන නිසානෙ.





අනික ඌ අපේ පවුල් වල විස්තරත් දන්නවා. එහෙනම් තිස්ස කියන්නෙත් සහන්ගෙ ඔත්තුකාරයෙක් වෙන්න බැරි නෑ. එතකොට විනෝද් කියන්නෙ කාගෙ කවුද...? මිනිහගෙත් කොහෙ හරි කොණක් සහන්ලගෙ පවුලට සම්බන්ධද...?

'' ඩයස් අයියෙ... මට ඔයාගෙන් පොඩි උදව්වක් ඕනෙ.''

'' කියන්න මල්ලි ඕන දෙයක්... ''

'' චූටි මේ පැත්තෙ ගැවසෙන වෙලාවල් වලට පොඩ්ඩක් විමසිල්ලෙන් ඉන්න. කෙල්ල අයියව දන්නෙ නැති නිසා අවුලකුත් නැනෙ. හැබැයි සහන් හරි අර ඊයෙ ආව කොල්ලා හරි කෙල්ලගෙ වටේ කැරකෙනවා දැක්කොත් මට කෝල් එකක් දෙන්න. අයියා ගාව මගේ නම්බර් එක ඇතිනෙ. ''

'' අර කලින් තිබුණ මොබිටෙල් එකමද...? ''

'' ඔව්... ඒක පැය විසිහතරම ඔන්. ''

'' රායිට් මල්ලි... වැඩේ කෙරුනයි කියලා හිතාගන්නකො.''

ඩයස් අයියා එක්ක කතා කරලා කඩෙන් එළියට බහින්න හදද්දිම ගිවන්ත කෝල් කළා. ඌට මේ සිද්ධිය දැන්ම කියලා කලබල කරන්න ඕනෙ නෑ කියලා හිතුන නිසා මං කිව්වෙ නිකමට ටවුම පැත්තෙ ආවා කියලා විතරයි.

'' මචං මං නංගිගෙ ෆෝන් එක උස්සලා ඕනකරන නම්බර්ස් දෙක තුනක්ම ලියා ගත්තා. අර ෆ්‍රෙන්ඩ් වන් කියන්නෙ දැහැමිවත් විනෝද්වත් වෙන්න බෑ බං. මොකද ඒ දෙන්නගෙම නම්බර්ස් වෙන වෙනම සේව් කරලා තියෙනවා මට අහුවුනානෙ.''

'' එහෙනං මට විනෝද්ගෙ නම්බර් එක කියපංකො. ''

මං කිව්වෙ බයික් එකේ නැගලා හෙල්මට් එක අතට

ගන්න ගමන්. ඌ ඒක කියද්දිම මං ඒ නම්බර් එක සේව් කරගත්තා.

'' මං හවස් වරුවෙ ඇවිත් උඹව හම්බවෙන්නම්කො...''

'' දැස්... උඹ මටත් හොරෙන් මොකක්හරි ගේමකට සෙට් වෙන්නද හදන්නෙ...? ''

ඌ ඒ කතාව ඇහුවෙ අමුතු විදියකට. මම දැහැමිගෙ නම්බර් එක නැතුව විනෝද්ගෙ එක විතරක් ඉල්ලගත්තු නිසා ගිවන්තට සැක හිතුනද මන්දා.

'' උඹ නැතුව තනියම මොන ගේම්ද ලොකු අයියෙ... මං මේ සුදූට පින්තූර කොළ වගයක් හොයන්න ටවුමෙ බුක් ෂොප් වල ඇවිදින ගමන්. ''

මිනිහට බොරුවක් ගහලා ෂේප් එකක් දාගත්තු මං ඒ සැනින්ම විනෝද්ගෙ නම්බර් එකට කෝල් එකක් ගත්තා.

'' හෙලෝ කවුද මේ...? ''

මගේ නම්බර් එක දන්නෙ නැති නිසාද මන්දා පොර ඇහුවෙ ටිකක් සැකෙන් වගේ.

'' මං රශ්මිගෙ අයියා. ''

'' ගිවන්ත අයියෙ... කොහොමද මගේ නම්බර් එක...''

'' හෝව්... හෝව්... නම්බර් එක නෙමෙයි මල්ලි... උඹ දැන් කොහෙද ඉන්නෙ කියලා කියපං... ''

'' මං ඉන්නෙ ලයිබ්රි එකේ... ''

'' හරි... මං නව විනාඩි දහයක් යන්න කලින් ඔතනට එනවා. මට උඹව හම්බවෙන්න ඕනෙ. එළියට ඇවිත් හිටපං...''

මං ඒ පාර හැදුවෙ ලයිබ්රියට යන්න. ඒක තියෙන්නෙ





සමාදාන මාවතේ. මාවතක් කිව්වට ඒක අපේ ටවුන් එකයි අපේ ලෑන්ඩ් සේල් එක තියෙන අනික් ලොකු ටවුන් එකයි යා වෙන ලොකු පාරක්. රජයේ කාර්යාල, අධ්‍යාපන ආයතන, පුද්ගලික ආයතන එහෙම ගොඩක් ඒ පාරෙ තියෙනවා. කොහොමහරි ඩයස් අයියගෙ කඩේ ඉඳලා ලයිබ්රි එකට යන්න මට විනාඩි හතක් විතර තමයි ගියේ. එච්චර පරක්කු උනෙත් ට්‍රැෆික් එක නිසා.

ලයිබ්රි එකේ පාකින් එකේ බයිසිකලේ නැවැත්තුවා විතරයි විනෝද් ඉස්සරහට ආවෙ බයිසිකලේ අඳුරගෙන. මොකද එදා වීදියවත්ත ඉස්සරහදි මං මේ බයිසිකලේ ඉඳගෙනම ඌගෙ පාර හරස් කරපු එක මිනිහට මතක ඇතිනෙ.

'' ගිවන්ත අයියා... ''

මං හෙල්මට් එකට අත තියද්දිම මිනිහා ගිවාගෙ නම කිව්වා. ඒත් ඊටපස්සෙ උනේ මං හිතපු නැති දෙයක්. හෙල්මට් එක ගලවලා අතට ගත්තා විතරයි මිනිහා හරි සුහදශීලී විදියට හිනා උනා.

හරිනං හිනාවෙන එක නෙමෙයි වෙන්න ඕනෙ මං කවුද කියලා අහන එකනෙ. ඒත් ඌ එහෙම ඇහුවෙ නැති එක මට ප්‍රශ්නයක්.

'' දැස් අයියා මෙහෙ...? ''

අඩෝ... ඒ කියන්නෙ මේ යකා ගිවන්තගෙ විතරක් නෙමෙයි මගේ නමත් දන්නවනෙ. මං ටිකක් වෙලා ඒ මූණ දිහා බලන් හිටියෙ මූව කොහොමද හැන්ඩ්ල් කරන්නෙ කියලා හිතාගන්න බැරුව.

'' මාව දන්නවද...? ''

'' මට රශ්මි අයියගෙ ෆොටෝස් පෙන්නලා තියෙනවා.''

උෟ කිව්වෙ මාව ලයිබ්‍රරි එකේ මිදුලෙ තිබුණ බංකුවක් ළඟට එක්කගෙන යන ගමන්. අපේ චූටිත් මාර බඩ්ඩක් තමයි. අපේ මුළු පරම්පරාවම පෙම්වතාට හඳුන්වලා දීලා. මෙහෙම යද්දි මූ පන්සලක එහෙම අපේ ආච්චි ඉන්නවා දැක්කොත් 'ආ... තිලකාච්චි' කියාගෙන කතා කරයිද මන්දා.

'' අයියා මාව හම්බවෙන්න ආවෙ...? ''

විනෝද් ඇහුවෙ හරි ලෙන්ගතු විදියට. මූ චූටිව රවට්ටනවා හරි සහන්ගෙ ඕනකමකට චූටිව ආශ්‍රය කරනවා වගේ හරි දෙයක් ඇති කියලා හිතාගෙන ආවට විනෝද්ගෙ මූණෙ ඒ වගේ වංචාවක සේයාවක්වත් නෑ.

මම එක කකුලක් නමලා අරන් අනික් කකුලෙ දණහිස උඩ තියාගන්න ගමන් කතාව පටන්ගත්තා.

'' මල්ලි... උඹ මට ඇත්ත කියයි කියලා හිතාගෙනයි මං අද මේ ගමන ආවෙ. ''

'' මං අයියට එදත් කිව්වෙ බොරුවක් නෙමෙයි. ''

'' එදා...? ''

'' ඔව්... අර වීදියවත්තෙදි හම්බඋන වෙලාවෙ... මං මුලදි හිතන් හිටියෙ ඒ ගිවන්ත අයියා වෙන්න ඇති කියලා. ඒත් එදා ආවෙත් අයියා වෙන්න ඇති කියලා මට හිතෙනවා. ''

හ්ම්... එහෙනං විනෝද් කියන්නෙ ඩයස් අයියා කිව්වා වගේම හොඳ මීටරයක්.

'' හරි ඒ කතා වැඩක් නෑ. මට කියපං උඹ සහන් කියලා එකෙක්ව අඳුරනවද...? ''





මං දඩෝං ගාලා එක ප්‍රශ්නයක් ඇහුවා. පොර ඇස් පුංචි කරලා මං දිහා බැලුවෙ ඒ කවුද කියලා අහන්න වගේ.

'' මං දන්නෙ නෑ. ''

'' ඔය ඇත්තමද...? ''

'' ඔව් අයියෙ. ඇත්තටම මං දන්නෙ නෑ. ''

'' රයිට්... එතකොට උඹ අංජුව අඳුරනවද...? ''

මං අංජු කිව්වෙ දැහැමිව. මොකද එදා කෙල්ල කියපු විදියට එයාගෙ ගේමස් නම ඒකනෙ. ඒකට නෑ කියලා උත්තර දුන්නොත්නං මං මේකගෙ අඬුබඬු ටික මෙතනම කඩනවා කියලා හිතාගත්තා. ඇයි ඉතිං එදා චූටිව එහෙ යවන්න ත්‍රීවිල් එකට නැග්ගුවෙත් මූනෙ.

'' දන්නවා... ඒ අපේ ටියුෂන් ක්ලාස් එකේ ගෑණු ළමයෙක්. ඒ වගේම එයා රශ්මිගෙ යාළුවෙක්. ''

ඒකත් එහෙමයි. බලාගෙන ගියාම විනෝද් කියන්නෙ ෆුල් සිරා කැරැක්ටර් එකක්නෙ.

'' රශ්මි ඒ කියන අංජුගෙ දිහා යනවයි කියලා උඹ දන්නවද...? ''

මිනිහා ඒකටත් ඔව් කියන්න වගේ ඔළුව හෙලෙව්වා. මං ඊළඟ ප්‍රශ්නෙ අහන්න හදද්දිම විනෝද් අමුතු කතාවක් පටන් ගත්තා.

'' අංජු කියන්නෙ ගොඩක් දුප්පත් ගෑණු ළමයෙක් අයියෙ. එයාගෙ තාත්තා නැති වෙලා තියෙන්නෙ පොඩි කාලෙදිමලු. එයයි අම්මයි විතරයි ගෙදර ඉන්නෙ. අම්මත් ඉන්නෙ අසනීපෙන්. ඒ නිසා එයාට රස්සාවකට යන්න බෑ. එයාලා හරක් පට්ටියක් කරනවා.

'' මට රශ්මි අයියගෙ ෆොටෝස් පෙන්නලා තියෙනවා.''

ඌ කිව්වෙ මාව ලයිබ්‍රරි එකේ මිදුලෙ තිබුණ බංකුවක් ළඟට එක්කගෙන යන ගමන්. අපේ චූටිත් මාර බඩ්ඩක් තමයි. අපේ මුළු පරම්පරාවම පෙම්වතාට හඳුන්වලා දීලා. මෙහෙම යද්දි මූ පන්සලක එහෙම අපේ ආච්චි ඉන්නවා දැක්කොත් 'ආ... තිලකාච්චි' කියාගෙන කතා කරයිද මන්දා.

'' අයියා මාව හම්බවෙන්න ආවෙ...? ''

විනෝද් ඇහුවෙ හරි ලෙන්ගතු විදියට. මූ චූටිව රවට්ටනවා හරි සහන්ගෙ ඕනකමකට චූටිව ආශ්‍රය කරනවා වගේ හරි දෙයක් ඇති කියලා හිතාගෙන ආවට විනෝද්ගෙ මූණෙ ඒ වගේ වංචාවක සේයාවක්වත් නෑ.

මම එක කකුලක් නමලා අරන් අනික් කකුලෙ දණහිස උඩ තියාගන්න ගමන් කතාව පටන්ගත්තා.

'' මල්ලි... උඹ මට ඇත්ත කියයි කියලා හිතාගෙනයි මං අද මේ ගමන ආවෙ. ''

'' මං අයියට එදත් කිව්වෙ බොරුවක් නෙමෙයි. ''

'' එදා...? ''

'' ඔව්... අර වීදියවත්තෙදි හම්බඋන වෙලාවෙ... මං මුලදි හිතන් හිටියෙ ඒ ගිවන්ත අයියා වෙන්න ඇති කියලා. ඒත් එදා ආවෙත් අයියා වෙන්න ඇති කියලා මට හිතෙනවා. ''

හ්ම්... එහෙනං විනෝද් කියන්නෙ ඩයස් අයියා කිව්වා වගේම හොඳ මීටරයක්.

'' හරි ඒ කතා වැඩක් නෑ. මට කියපං උඹ සහන් කියලා එකෙක්ව අඳුරනවද...? ''





මං දඩෝං ගාලා එක ප්‍රශ්නයක් ඇහුවා. පොර ඇස් පුංචි කරලා මං දිහා බැලුවෙ ඒ කවුද කියලා අහන්න වගේ.

'' මං දන්නෙ නෑ. ''

'' ඔය ඇත්තමද...? ''

'' ඔව් අයියෙ. ඇත්තටම මං දන්නෙ නෑ. ''

'' රයිට්... එතකොට උඹ අංජුව අඳුරනවද...? ''

මං අංජු කිව්වෙ දැහැමිව. මොකද එදා කෙල්ල කියපු විදියට එයාගෙ ෆේමස් නම ඒකනෙ. ඒකට නෑ කියලා උත්තර දුන්නොත්නං මං මේකගෙ අඬුබඬු ටික මෙතනම කඩනවා කියලා හිතාගත්තා. ඇයි ඉතිං එදා චූටිව එහෙ යවන්න ත්‍රීවිල් එකට නැග්ගුවෙත් මූනෙ.

'' දන්නවා... ඒ අපේ ටියුෂන් ක්ලාස් එකේ ගෑණු ළමයෙක්. ඒ වගේම එයා රශ්මිගෙ යාළුවෙක්. ''

ඒකත් එහෙමයි. බලාගෙන ගියාම විනෝද් කියන්නෙ ෆුල් සිරා කැරැක්ටර් එකක්නෙ.

'' රශ්මි ඒ කියන අංජුගෙ දිහා යනවයි කියලා උඹ දන්නවද...? ''

මිනිහා ඒකටත් ඔව් කියන්න වගේ ඔළුව හෙලෙව්වා. මං ඊළඟ ප්‍රශ්නෙ අහන්න හදද්දිම විනෝද් අමුතු කතාවක් පටන් ගත්තා.

'' අංජු කියන්නෙ ගොඩක් දුප්පත් ගෑණු ළමයෙක් අයියෙ. එයාගෙ තාත්තා නැති වෙලා තියෙන්නෙ පොඩි කාලෙදිමලු. එයයි අම්මයි විතරයි ගෙදර ඉන්නෙ. අම්මත් ඉන්නෙ අසනීපෙන්. ඒ නිසා එයාට රස්සාවකට යන්න බෑ. එයාලා හරක් පට්ටියක් කරනවා.

ඒකෙ එළදෙනුන්ගෙන් කිරි දොවලා විකුණලා ඒ වගේම පොල් අතු වියලා තමයි එයාලා ජීවත් වෙන්නෙ. ඊට අමතරව අංජු අම්මා එක්ක එකතු වෙලා ලියුම් කවර අලවනවා. ඒ සල්ලි වලින් තමයි එයා ඉගෙන ගන්නෙ. ''

දෙවියනේ... මේ කොල්ලා මොනවද මේ කියන්නෙ...? මේ සේරම දේවල් ඇත්තද...? දැහැමි කියන්නෙ මේ තරම්ම දුක් විඳින කෙනෙක්ද...? ඒත්... විනෝද් ඇයි මේ දේවල් මට කිව්වෙ මිනිහා මායි කියන ප්‍රශ්නෙත් එක පාරටම මගේ ඔළුවට ආවා. දැහැමියි ගැන මොනවාහරි දන්නවද...?

'' අංජු යන්නෙත් රශ්මි යන ඉස්කෝලෙටම තමයි. ඒ දෙන්නා හොඳ යාළුවො. රශ්මි හරි දඟයි. අංජු හරි අහිංසකයි. ඒ උනත් ඒ දෙන්නා හොඳ යාළුවො. අයියා දන්නවද...? රශ්මි තමයි මං මේ ලෝකෙ දැකපු හොඳම ගෑණු ළමයා. ''

'' ඇයි එහෙම කියන්නෙ...? ''

විනෝද්ගෙ කතාව හරි අවධානෙන් අහගෙන හිටපු මං ඇහුවා.

'' හරියට කන්න බොන්න නැති අංජුලට කෑම බීම අරන් දෙන නිසා... ඒ වගේම අංජුට ඉගෙනගන්න පොත්පත් අරන් දෙන නිසා.... සමහර දවස්වලට අංජු පන්ති සල්ලි ගෙවන්න විදියක් නැතුව පන්ති නෑවිත් ඉද්දි රශ්මි එයාගෙ පොකට් මනී එකතු කරලා අංජුගෙ පන්ති ගාස්තු ගෙවනවා. අංජු පන්ති එද්දි උනත් ගොඩක්විට අඳින්නෙ රශ්මි ගෙනත් දෙන ඇඳුම්. ''

මේ කතාව මට අදහගන්නත් බෑ වගේ. අපි අපේ චූටි ගැන වැරදි චිත්‍රයක් මවාගෙන හිටියට එයා මේ තරම් පරිත්‍යාගශීලී දේවදූතියක් කියලා මං දැනන් හිටියෙ නෑ. අනික එදා චූටි හුඩ්සිටි





එකෙන් අර වගේ බඩු මල්ලක් උස්සගෙන වීදියවත්තට ගියේ ඇයි කියලා දැන් මට තේරෙනවා.

'' ඔයා මේ දේවල් ෂුවර් කරලම කියන්නෙ කොහොමද මල්ලි...? ''

මං සෑහෙන්න කූල් ඩවුන් එකේ කොල්ලගෙන් ඇහුවා.

'' රශ්මි වගේම අංජුත් මගේ හොඳම යාළුවොනෙ අයියෙ. ඒ නිසා ඒ දේවල් මං හොඳටම දන්නවා. ''

එතකොට මේ හැන්ඩියට ඉන්න ඉලන්දාරියගෙ හොඳම යාළුවො දෙන්නා කෙල්ලො දෙන්නෙක්ද...?

'' හරි එහෙනම්... මට මේ ප්‍රශ්නෙටත් උත්තරයක් දීපංකො. රශ්මිගෙ පස්සෙන් උඹ ඇරෙන්න වෙන කොල්ලෙක් එනවා කියලා උඹ දන්නවද...? ''

මං වෙනස් විදියකට උනත් ඒ ඇහුවෙත් සහන් ගැනම තමයි. ඒකට පොර සිරා හිනාවක් දැම්මා. ඒකටනං කෙල්ලෙක්ගෙ විතරක් නෙමෙයි කොල්ලෙක්ගෙ උනත් හිත ඇදිලා යනවා.

'' මං දන්නෙ නෑ. ''

'' මං අර සහන් කියලා එකෙක් ගැන මුලදීම ඇහුවා නේද...? අන්න ඒකා රශ්මිට පැණි හලනවා කියලා මට ආරංචියක් ආවා. අපි කෙල්ල ගැන නෝට් එකේ ඉන්නෙ. ඒත් අපි නැති වෙලාවක හරි රශ්මිට කරදරයක් වෙන්න ගියොත් උඹ කෙල්ලව පරිස්සම් කරගන්න ඕනෙ. තේරුණාද...? ''

'' ඒ කියන්නෙ සහන් අමාරුකාරයෙක්ද...? ''

විනෝද් ෆුල් සීරියස් පිට ඇහුවා.

'' අමාරුකාරයෙක් විතරක් නෙමෙයි... තනිකරම

රස්තියාදුකාර මදාවියෙක්. රශ්මි ඔයාව හම්බවෙන්නයි අංජුව හම්බවෙන්නයි ගෙදරට බොරු කියලා යන නිසා අපිට ඒ මදාවියගෙන් කෙල්ලව බේර ගන්න ටිකක් අමාරුයි. ''

මං දන්න දේවල් වලින් ටිකක් විතර විනෝද්ටත් කිව්වෙ ඌ ගැන විශ්වාසෙ තියන්න පුළුවන් කියලා තේරුණාට පස්සෙ. කොහොමටත් චූටිව පරිස්සම් කරන්න කියලා මූට අමුතුවෙන් කියන්න දෙයක් නෑ. ඔය වගේ රස්තියාදුකාරයෙක් තමන් ආදරේ කරන කෙල්ල පස්සෙන් එනවා කියලා දැනගත්තම කෙල්ලව පරිස්සම් කරගන්න කොල්ලා දැනගන්න එපැයි.

'' රශ්මි වගේ කෙනෙක්ට කරදරයක් වෙන්න මං ඉඩ තියන්නෙ නෑ අයියෙ. මේ දේවල් කිව්වට තැන්ක්ස්. ''

'' ඔකේ මස්සිනා. එහෙනං අපි වෙන වෙලාවක හම්බවෙමු. මේ සීන් රශ්මිට කියන්න ඕනෙ නෑ හරි...''

කතාව කෙටියෙන් ඉවර කරලා මං යන්න නැගිට්ටා විතරයි විනෝද් හිතපු නැති විදියට මගේ උරහිසට අත තියලා මාව නතර කළා.

'' අයියා මෙච්චර වෙලා මගෙන් ප්‍රශ්න ඇහුවා... මං ඒ හැම එකකටම උත්තර දුන්නා. මට අයියගෙන් එකම එක ප්‍රශ්නයක් විතරක් අහන්න පුළුවන්ද...? ''

ඌ ඔළුවත් පැත්තකට පාත් කරලා අර අමුතු හිනාව මූණෙ තියාගෙනම ඇහුවා.

'' අහන්නකො බලන්න... ''

'' අයියා රශ්මි ගැන මේ තරම් උනන්දු ඇයි...? එයා යන එන තැන් ගැන මේ තරමට හොයන්නෙ ඇයි...? ''





අඩේ... මූ මොනවද මේ අහන්නෙ...? මේකට මාවයි චූටිවයි සැකයිද...?

'' රශ්මි කියන්නෙ... එහෙමත් නැත්තං අපේ චූටි කියන්නෙ ශිවන්තගෙ වගේම මගෙත් නංගි. එයා ගැන හොයලා බලන්න මට කාගෙන්වත් අවසර ඕනෙ නෑ. ''

'' වෙන හේතුවක් නැද්ද...? ''

ඕකනෙ ඉතිං බැරි. මං සාමෙන් කතාබහ අවසන් කරලා සමුගන්න හදද්දි මූ ගේම ඉල්ලගෙන එනවනෙ. මෙහෙම ගියොත්තං මස්සිනා උඹෙයි මගෙයි ඇයි හොඳයියට බබා හම්බවෙනවා.

'' තියෙනවා... මං ඒක උඹට පස්සෙ කියන්නම්කො... ''

විනෝද්ට චූටිව වැඩිපුර පරිස්සම් කරන්න හිතෙන විදියෙ උත්තරයක් දීලා මං එතනින් පිට උනා.

මම ගෙදර එද්දි තරමක් පරක්කු වෙලා. ඒ මදිවට අපේ අක්කා දොරගාවටම වෙලා පාර දිහා බලන් ඉන්නවා කන්න වගේ.

'' අනේ අනේ... හෙට අනිද්දා වැඩට යන්න ඉන්නවා කියලා කිසිම වගකීමක් නෑ. කොහෙද තමුසෙ මේ තරම් වෙලා ගිහින් හිටියෙ...? ''

අපේ අක්කණ්ඩිය සුපුරුදු විදියට ගෝරණාඩුව දාලා මාව පිළිගනිද්දි මං හෙන සීරියස් මූඩ් එකක් අරගෙන බයික් එකෙන් බැස්සා.

'' මේ හලෝ... සහෝදරී.... අපි එහෙම රස්තියාදුවෙ යන පොරවල් නෙමෙයි හරි. අපි ගියේ ෆුල් ඔෆීෂියල් වැඩකට. ''

'' ඔෆීෂියල් වැඩකට...? ''

'' ඔව්... ඒත් ඒවා එහෙම නිකම්ම කියන්න බෑ. මං අහන

ප්‍රශ්නෙට හරි උත්තරේ දුන්නොත් විතරයි කතන්දරේ කියන්න පුළුවන් වෙන්නෙ. ''

ඔන්න අක්කගෙ ඇස් දෙක ලොකු උනා. ප්‍රශ්නෙ අහන්නත් කලින්ම මෙයා බයවෙලා වගේ.

'' ඔයා මහලොකු ඔඩිටර්නෙ. එහෙනං මේකට උත්තරේ කියන්නකො බලන්න. ඔන්න එක ජීප් එකක් කඳුකර පාරක යද්දි අංශක හැටක කෝණයක් එන විදියෙ ලොකු වංගුවක් තියෙනවලු වම් අත පැත්තට. මේ ජීප් එක අර වංගුව හරවද්දි ඒකෙ කොයි රෝදෙද අඩුවෙන්ම හැරෙන්නෙ කියන්න බලන්න.''

ඒ පාර අක්කා අත් දෙකම එහෙට මෙහෙට හරව හරව ඒ කියපු වංගුව ගන්න හැටි මවා ගන්න ට්‍රයි කරනවා. උත්සහවන්තයා ඇනගනී කියන්නෙ නිකමටයැ. එයාට ටිකක් හිතන්න කල්දීලා මං ගියා ගේ ඇතුළට.

කොහොමහරි මම වොෂ් එකක් දාගෙන එද්දි අක්කා කොලේකුයි පැන්සලකුයි අරගෙන මොනවදෝ කටු සටහන් වගයක් ගහනවා.

'' ආ... මං ඔයාගෙ ප්‍රශ්නෙට උත්තරේ හොයාගත්තා. හැබැයි ඒක හරිද මන්දා... ''

ඒ කියන්නෙ මෙයා ඒකට උත්තරේ හොයන්න චිත්‍රත් ඇඳලද...?

'' එහෙමනං ළමයා කියමුකො බලන්න.... ''

මං උගුර පාදලා හාන්සි පුටුවෙ දිගා උනේ අපේ අක්කා මොනවා කියයිද කියලා හිතාගන්න බැරුව.

'' වම් පැත්තෙ පිටිපස්සෙ රෝදෙ. ''





අක්කා එයාගෙ ඔඩිට් දැනුම අපේ සාමාන්‍ය දැනීමට යටවෙයි කියලා බයෙන් වගේ උත්තර දුන්නෙ. මට පව් කියලත් හිතුනා.

'' ඒ කියන්නෙ වංගුව පැත්තෙ පිටිපස්සෙ රෝදෙ. එහෙම නේද...? ''

'' ඔව්... හරි නේද...? ''

හුහ්... හිනා කටයි. හිතාගෙන ඇති මහ මොළකාරියක් කියලා. හිටපංකො...

'' උත්තරේ වැරදියි... ඒ නිසා අද දවසේ වැඩසටහන් විස්තරේ ඔබට කියන්න අවසර නෑ. ''

ආයෙ නෑ මං වෘත්තීය මට්ටමෙන්ම ප්‍රකාශයක් නිකුත් කළා. අක්කට ඒක විශ්වාස කරන්නත් බෑ වගේ. ඔව් ඉතිං... එයා පැය භාගයක් විතර කටු සටහන් ගහලා චිත්‍ර ඇඳලා හොයාගත්තු උත්තරේනෙ.

'' වැරදියි... එතකොට මොකක්ද හරි උත්තරේ... ''

එයා ඇහුවෙ ඇස් දෙක උපරිමේට ලොකු කරගෙන. දුකයි තමයි. ඒත් ඉතිං මං හරි උත්තරේ කියන්න හිත හදාගත්තා.

'' උත්තරේ ස්පෙයාර් වීල් එක. ඒක තමයි අඩුවෙන්ම හැරිච්ච රෝදෙ... ''

'' තමුසෙට මං... ''

මං උත්තරේ දුන්නා විතරයි ඇති වෙච්ච ලැජ්ජාව ඉවසගන්න බැරුවද මන්දා අපේ අක්කා වෙඩිල්ල වගේ මගේ පස්සෙන් එළවන්න පටන් ගත්තා. මං බේරුණේ අපේ ආච්චි අස්සෙ හැංගිලා.

* * * * * * *

# 10

දන්නෙම නැතුව වැඩට යන්න තියෙන දවස කට අගටම ළං උනා. අනිද්දා තමයි මාසෙ පළවෙනිදා. ඒ කියන්නෙ අපි එදාට සේවයට වාර්තා කරන්න ඕනෙ.

තාත්තලා කියපු විදියට ඒක ෆුල් ටයිම් ජොබ් එකක් නොවුනත් මටනං ඒක මහමෙරක් වගේ තමයි දැනුණෙ. ඇයි ඉතිං සතියෙ දවස් හතම ෆුල් රිලැක්ස් එකේ හිටපු අපි සතියකට දවසක් දෙකක්වත් රාජකාරියක් සඳහා පිටත් වෙනවා කියන්නෙ ඒකත් මොන තරම් විපර්යාසයක්ද.

'' ආ... දෙන්නත් එක්ක ටවුන් එක පැත්තෙ ගිහින් මේකෙන් ඔෆිස් අඳින්න පුළුවන් විදියෙ ඇඳුම් දෙක තුනක් අරගන්න. ''

මං උදේ පත ඇනුමක් අරින ගමන් කාමරෙන් එළියට එද්දි අපේ තාත්තා රුපියල් දෙදාහෙ කොළයක් මගේ අතේ තිබ්බා. ඇයි දෙයියනේ මෙයාට පිස්සු හැදිලාද... රුපියල් දෙදාහකින් කොහොමද දෙන්නෙක්ට ඇඳුම් ගන්නෙ. අඩු තරමෙ දෙන්නට අන්ඩර් වෙයාර්ස් ගන්නවත් දෙදාහ මදි.





මගේ ඉරියව් වෙනස් වෙච්ච එක තේරිලාද මන්දා තාත්තගෙ මූණ ලොකු හිනාවකින් වැහිලා ගියා.

'' ඕක දුන්නෙ බයික් එකට තෙල් ගහන්න... ආ... මේක ගන්න... ''

ඒ පාර තාත්තා මගේ අතේ තිබ්බෙ පන්දාහෙ කොළ තුනක්. ආන්න එහෙම එන්ටකො අප්පච්චි...

'' මං සමරෙටත් කිව්වා. යාළුවා උදේම මෙහෙට එයි. ලෑස්ති වෙන්න.... ''

තාත්තා කාලෙකට පස්සෙ හරි ලෙන්ගතු විදියට මගේ පිටට තට්ටුවකුත් දාලා වාහනේට නැගලා පිට වෙලා ගියා.

'' ඔය එහෙන් මෙහෙන් කැලි එල්ලෙන ඒවා නැතුව ටිකක් වැදගත් විදියෙ ඇඳුමක් දෙකක් ගන්න පුතා. නැත්තං තාත්තා කෑ ගහන්න තියාගනී. දන්නවනෙ එයාගෙ හැටි... ''

අම්මා ඒ අනතුරු ඇඟවීම කළේ අපි යන්න ලෑස්ති වෙද්දි. ගිවා අපේ අම්මට එයාගෙ මහපටගිල්ල උස්සලා හිට් එකක් දාන ගමන් බයිසිකලේ පිටිපස්සෙ එල්ලුනා. කොහොමහරි අපි ටවුන් එකට එනකල් අපි අතර විශේෂ කතාබහක් උනේ නෑ.

'' මචං පොඩ්ඩක් රාමසිංහ එකට ගිහින් යං... ''

'' ඇයි උඹ ගෙදරින් ආවෙ කන්නෙ නැතුවද...? ''

මං බයික් එක නවත්තන්න හදද්දි ගිවන්ත කෑ ගැහුවෙ පුදුම වෙලා. මොකද ඉතිං ඌ දන්නවනෙ මොනවා නැතත් අපි උදේට කෑම ගේන්න හන්දියට යන එක වරද්දන්නෙ නෑ කියලා.

'' කන්නම නෙමෙයි... මට උඹට කියන්න දෙයක් තියෙනවා.... ''

බයික් එකේ යන ගමන් හුළං සද්දයි වාහන සද්දයි එක්ක වැදගත් දෙයක් කතා කරන්න බැරි නිසා මං ගිවන්ත එක්ක කතාබහ ඇරඹුවෙ රාමසිංහ එකට ගිහින් ප්ලේන්ටි දෙකක් ඕඩර් කළාට පස්සෙ.

'' උඹ විනෝද්ගෙ නම්බර් එක ඉල්ලගෙන මොනවද කළේ කියපංකො... අඩු තරමෙ ඌට කෝල් එකක්වත් දුන්නද...?''

මං කතා කරන්න හදන්නෙ මොකක් ගැනද කියලා ගිවන්තට ඉව වැටිලා වගේ මට කලින් මිනිහම කතාව පටන් ගත්තා. ඌ චූටි ගැන කේන්තියෙන් ඉන්න එකේ මං දන්න දේවල් හංගගෙන හිටියොත් කෙල්ලට අවාසියක් වෙන්න පුළුවන්. ඒ නිසා මං විනෝද්ට කෝල් කරලා ඌව හම්බවෙන්න ගියපු විස්තරේ කියන්න තීරණේ කළා.

'' අඩේ උඹ මාර පොරක්නෙ බං... ඒ ඩිංගට ගිහින් ඌව හම්බඋනත් එක්කද...? ''

ඌ ඇහුවෙ සීන් එක කියලා ඉවර කළාට පස්සෙ.

'' නැතුව බැනෙ මචෝ. මේ කතා දෙකෙන් එකක් විසඳගන්න එපැයි. අපේ එකීගෙ හිතේ වගේම විනෝද්ගෙ හිතෙත් ආදරයක් ඇති... ඒත් උන් තාම ගේමට එන්ටර් වෙලා නෑ ගිවා. චූටි අර වගේ බොරුවක් කියලා ෆුඩ්සිටි ගිහින් තියෙන්නෙත් දැහැමිලගෙ ගෙදරට බඩු ගන්න...''

මං ඒක කිව්වෙ ෆුල් සීරියස් මූඩ් එකකින්.

'' ඒක තමයි එහෙනං චූටි අම්මගෙන් සල්ලි වගයක් ඉල්ලපු වෙලාවෙ අම්මා නංගිට කෑ ගැහුවෙ මේ ළමයට කොච්චර සල්ලි දුන්නත් මදි කියලා. අනික මේ ළඟදි දවසක පාටියකට





අඳින්න නංගි ඇඳුමක් නෑ කියලා ගෙදර පොඩි ගෝරියක් දැම්මා. ඒ වෙලාවෙ අම්මා ඇහුවා ඇයි දැන් ළඟකදිත් හොඳ ඇඳුමක් ගත්තා නේද කියලා. ඒ පාර මේකි කිව්වනෙ ඒක මට අඳින්න බෑ තදයි වගේ නිසා මං යාළුවෙකුට දුන්නා කියලා. මට මතකයි එදා අම්මා කෑ ගහපු එකේ තරහට නංගි පාටියට යන්නෙත් නැතුව කන්නෙත් නැතුව නිදාගත්තා. ''

ගිවන්ත කියපු කතාවෙන් මට චූටි ගැන අමුතුම ආදරයක් දැනුණා. කෙල්ල එහෙනං දැහැමි වෙනුවෙන් සෑහෙන ලොකු දේවල් කරලා තියෙනවා. ඒ මදිවට ඒවට ඇති වෙන්න ගෙදරින් බැනුම් අහලත් තියෙනවා.

'' මේකි පන්ති යන්න උනත් අම්මගෙන් දෙතුන් සීය ඉල්ලන වෙලාවල්වලට එච්චර සල්ලි මොනා කරන්නද කියලා මමත් බැනලා තියෙනවා දැස්. මං දැනන් හිටියෙ නැනෙ නංගි ඒ සල්ලි වලින් ඒ තරම් පින් අතේ වැඩක් කරනවා කියලා. මටත් දැන් තමයි පව් කියලා හිතෙන්නෙ... ''

ගිවන්තත් උගේ සෝකෙ බාල්දියකට දැම්මා.

'' අපිත් අනං මනං ගන්නයි රස්තියාදු ගහන්නයි සල්ලි කොයි තරම් නාස්ති කරනවද ගිවා... ඒ අතින් බලද්දි චූටි අපිට වඩා සෑහෙන ශ්‍රේෂ්ටයි. ඉගෙනගන්න කෙනෙක්ට පොත්පත් අරන් දෙනවා කියන්නෙ... හරියකට කන්න නැති කෙනෙක්ට කන්න අරන් දෙනවා කියන්නෙ... අඳින්න නැති කෙනෙක්ට ඇඳුම් දෙනවා කියන්නෙ කොච්චර පින් අතේ වැඩක්ද...? මං හිතන්නෙ නෑ අපේ තාත්තලා උනත් අවුරුදු ගාණක් බිස්නස් කළාට ඔය වගේ පැත්තක් ගැන හිතලා තිබුණා කියලා. එයාලා කරන්නෙත් ඉතිං සීයා නැතිඋන දවස සිහිවෙන්න ඔය කොහෙහරි මඩමකට ගිහින් දානයක් දෙන

එක විතරනෙ..."

" ඒකනං ඇත්ත තමයි... අපිට මොනවද දැහැමි වෙනුවෙන් කරන්න පුළුවන්...? "

ගිවා ඒ අහපු දේට මට ඌ ගැන මාර ලෙන්ගතුකමක් දැනුණා. මොකද ඌ ඇහුවෙ උඹට මොකක්ද කරන්න පුළුවන් කියලා නෙමෙයි... අපිට මොනවද කරන්න පුළුවන් කියලා. ඒ කියන්නෙ දැහැමි මං ට්‍රයි කරන කෙල්ල උනත් ඌත් කැමතියි දැහැමි වෙනුවෙන් දෙයක් කරන්න.

" අපි මෙච්චරකල් කලේ අපිට දෙන පොකට් මනී සේරම කන්න බොන්නයි රස්තියාදුවෙ යන්නයි වියදම් කරපු එකනෙ... ඒත් මට හිතෙනවා මේ මාසෙ ඉඳලම ඒ නාස්ති කරන සල්ලි එකතු කරලා මොකක්හරි ආයතනයකින් ශිෂ්‍යත්වයක් දෙන විදියට මාසෙ ගානෙ දැහැමිට යවන්න. "

" ඔය තියෙන්නෙ මස්සිනා අයිඩියාස්... දෙමුකො ගේම ආයෙ ලොවෙත් නැති වෙන්න. "

ගිවන්ත පහක් දාලා මගේ කතාවට එකඟත්වය පල කළා.

" මට හිතෙනවා බං නංගි ඇත්තටම ඔය විනෝද් කියන එකාට කැමතිනං ඒකිට සපෝට් කරන්න. මොකද ඔය කියන විදියට ඌ අපි දෙන්නගෙ ට්‍රැක් එකට ගන්න පුළුවන් එකෙක් කියලා තේරෙනවනෙ. අනික අපේ නංගිට උනත් ඌ එක්ක කැත නැතුව පාරෙ බැහැලා යන්න පුළුවන්නෙ. මොකද උඹ කියන්නෙ...?"

ඒ කතාවට මං ඔළුව වැනුවෙ විනෝද්ව මටත් උපරිමේටම හිතට අල්ලලා තිබුණු නිසා.

" දැන් එහෙනං උඹ මට දැහැමිගෙ ෆෝන් නම්බර් එකත්





දීපං... එතකොට අපිට ඒ කතන්දරෙත් මොකක්හරි සෙට්ල්මන්ට් එකකට එන්න පුළුවන්. "

තේ බීලා බිල ගෙව්වටත් පස්සෙ මං ගිවන්තට ඒකත් මතක් කළා.

" චූටි ඒක සේව් කරලා තිබුණෙ උඹ අර කිව්ව විදියට අංජු කියලා. ඉත්තී....ං "

" ඔව් ඉතිං...? "

" උඹ බය වෙන්න එපා දැස්... උඹ විනෝද්ට කතා කළා වගේම මං අංජුට කතා කළා. ඒ නම්බර් එක කෙල්ලගෙම තමයි. මං රශ්මිගෙ අයියා ගිවන්ත කියලා කිව්වා විතරයි ඒකි නොසැහෙන්න කුල්ඩවුන් වෙලා මගෙත් එක්ක විස්තර කිව්වා. හැබැයි උඹ ඔය කිව්ව විදියට අපේ නංගි ඒකිට උදව් කරන කතානං මාත් එක්ක කිව්වෙ නෑ. "

ගිවන්ත කිව්වෙ මං කීයටවත් බලාපොරොත්තු නොවුන විදියෙ දෙයක්. ඌ දැහැමි එක්ක කතා කරන්න ඇති කියලා මං නිකමටවත් හිතුවෙ නෑ.

" කෙල්ල මොනවද ඔය තරම් කුල් ඩවුන් වෙලා උඹත් එක්ක කියෙව්වෙ...? "

" අපේ නංගිගෙයි එයාගෙයි යාළුකම ගැනයි... ම් තව එයාලගෙ ගෙදර ඉන්නෙ අම්මයි එයයි විතරයි කියන එකයි. එයාගෙ අනාගත බලාපොරොත්තුව ඩොක්ටර් කෙනෙක් වෙන්න කියන එක ගැනයි... "

මූ මේ කියන්නෙ ඇත්තමද...? බලාගෙන යද්දි කෙල්ල මයි සෙල්ෆ් ගැන ස්පීච් එකක්නෙ කරලා තියෙන්නෙ.

'' විශේෂම දේ තමයි දැස්... කෙල්ලත් මට කිව්වා අපේ චූටිගෙයි විනෝද්ගෙයි අතර එෆෙයාර් එකක් නෑ කියන එක. මං ඇහුවා මමත් එෆ් බී එකේ රික්වෙස්ට් එකක් එවන්නං ගන්නවද කියලා... ඒකි හා කිව්වා. ''

මේ රස කතානං එකක්වත් මට විශ්වාස නෑ. මූ මාව බයිට් කරන්න හිතාගෙන කිව්වද දන්නෑ.

'' උඹ කෙල්ලගෙන් මං ගැන මුකුත් ඇහුවෙ නැද්ද ලොකු අයියෙ...? ''

'' උඹ ගැන අහන්නෙ අහවල් දේකටද මලයා... අනික ඉතිං අහන්න තරම් දෙයක් උඹලා අතර වෙලා නෑ කියලා උඹමනෙ මට කිව්වෙ... ''

ඒකත් ඇත්ත තමයි. මං ගැන ඇහුවයි කියලා ඉතිං මොනවා අහන්නද. කමක් නෑ... දැන් කෙල්ලගෙ නම්බර් එක තියෙන එකේ මංම කතා කරලා තීරණේකට එනවා.

'' දැන් යමං... නැත්තං අපිට ඇඳුම් ගන්න හෙටත් එන්න වෙයි. ''

මං කල්පනා කරනවා දැකපු ගිවන්ත මගේ පිටට තට්ටුවකුත් දාලා ඉක්මනට නැගිටගත්තා.

රාමසිංහ එකෙන් එළියට ආපු අපි දෙන්නා මුලින්ම ගියේ අපේ ලෑන්ඩ් සේල් එක තියෙන පාරෙ තිබුණු ලොකුම විලාසිතා මන්දිරයට. ඒකෙ පිරිමි අයට ඕනකරන ඇඳුම් සේරම එකම ෆ්ලෝ එකක තියෙන නිසා අපිට හතර අතේ රස්තියාදු වෙන්න ඕනෙ නෑ.

'' ආනේ දැස්... ඔයාලා මෙහෙ...? ''





අපි ටෙක්ස්ටයිල් එකේ පඩිය නගින්න හදද්දිම කවුදෝ මන්දා මරාලයක් මගේ නම කියලා කෑ ගහනවා ඇහුණා. ඒ කවුරු වෙන්න බැරිද කියලා මං බැලුවෙ පුදුම වෙලා. යකඩෝ... මේ අර මේස සර්ජනාව හෙවත් ඇන්තනියගෙ දෝණි පොඩ්ඩනෙ. මේ හෝන්තුවත් නැති තැනක් නෑ අම්මපා.

'' මේසනා... ඔයා මෙහෙ...? ''

'' ඔව් අනේ... ලේටස්ට් ෆැෂන් මොනවාහරි ඇවිත්ද බලන්න ආවා... ''

'' ලේටස්ට් ෆැෂන්...? ''

ගිවන්ත ඒක ඇහුවෙ නෝන්ඩියට වගේ මේසනාගෙ උඩ ඉඳලා පහළටම බලන ගමන්. ඒකි ඇඳන් හිටියෙ කොට්ට උරයක් වගේ පට්ට ටයිට් ගවුමක්. කොට මදිවට ඒක තවත් අඟල් තුන හතරක් පලලා... ඒ ගවුමෙ පාට ෂෝල් එකකුත් බෙල්ල වටේ ඔතාගෙන.

'' ඇයි... මේක ලස්සන නැද්ද...? ''

ගිවා බැලුවෙ මොකක් දිහාද කියලා අනුමාන කරපු මේසනා හරි උජාරුවෙන් වගේ ඇහුවා. පුහ්... හිතාගෙන ඇති හරි කැල්ල කියලා.

'' ලස්සනයි මේසනා ඔක තව අඟල් පහක්වත් කොට උනානම්... ''

ගිවන්ත කියපු විදියට ඒක තව අඟල් පහක් කොට උනානනම් කෙල්ල යටට ඇඳන් ඉන්න ඒවත් පේනවා. ඒක ෂුවර්...

'' ඇයි අනේ... මං විතරද කොටට අඳින්නෙ... ඔයාලගෙ චූටිත් ඔය ඕන තරම් කොටට ඇඳන් ඉන්නෙ... ''

අපි දෙන්නත් එක්ක පඩිපෙළ නැගලා යන ගමන් මේසනා අපේ චූටිවත් කතාවට ගාවගන්න හැදුවෙ. ඒකටනං ගිවන්තට වගේම මටත් යකා නැග්ගා. චූටි මේකි වගේ කළු තප්පදෝරුවක් නෙමෙයි. අනික චූටි කොයි තරම් කොටට ඇන්දත් මේ වගේ කැත නෑ. හරි හුරතල් ගතියක් තමයි එයාගෙ තියෙන්නෙ. මේක ඒ වගේද... තියෙන කළු මදිවට මූණ පුරා අනේකජාති පාට උලාගෙන කරත්ත රෝද දෙකක් විතර කරාබු දෙකකුත් දාලා රෑකට දැක්කනං ඇත්තමයි බය හිතෙනවා.

'' අපේ නංගි ගෙදරට කොට කෑලි අඳින බව ඇත්ත මේසනා. ඒත් ඔය වගේ විලිසංගෙ නැති හෙළුවැලි ඇඳුම් ඇඳලා පාරෙ බැහැලා ගියානං මං ඒකිගෙ කන පොඩි කරනවා. ''

ගිවන්ත උත්තර දුන්නෙ මේසනාගෙ කන පොඩිකරන තරම් ආවේගෙකින්. මමත් කෙල්ලව වැඩිය ගණන් ගන්නෙ නෑ වගේ මගඇරලා යන්න හැදුවට ඒකි චුයින්ගම් එක වගේ ඇඟේම ඇලෙන්න එනවා.

'' අනේ දෑස්... මං මේ ඔයත් එක්ක ටිකක් නිදහසේ කතා කරන්න හිතාගෙනමයි හිටියෙ. හොඳ වෙලාවට ඔයා හම්බඋනේ.''

මේසනා ඒක කිව්වෙ මගේ අතකත් එල්ලිලා. මේකි මේ තරම් ජනාකීර්ණ ස්ථානයක මගේ චරිතෙ ඝාතනේ කරන්නද කොහෙද හදන්නෙ.

'' මේසනා මේ... මට ඔයා එක්ක කතා කරන්න තරම් දෙයක් නෑ හරි. නිකංහරි මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් එහෙම අපි මේ විදියට ඉන්නවා දැක්කොත් මාව වරදවා තේරුම් ගන්න පුළුවන්. එහෙම වෙනවට මං පොඩ්ඩක්වත් කැමති නෑ. කරුණාකරලා මාව අතෑරලා ඔයා යන්න ආපු ගමන යන්න... ''





මගේ වචන කෙල්ලට සැර වැඩි වෙලාද මන්දා ඒකි එක පාරටම ගල් ගැහුණා. ඒ වගේමයි මගේ අතත් ඉබේටම අතෑරුණා.

'' ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්...? ''

'' ඔව්... මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්. ඇයි ඔයාට ඒකෙ මොකක්හරි ප්‍රශ්නයක් තියෙනවද...? ''

මගෙයි මේසනාගෙයි ඇටෑක් එක දිහා ගිවන්තයා පැත්තකට වෙලා නිහඬවම බලාගෙන හිටියා මිසක් අපිට ඩිස්ටර්බ් කරන්න ආවෙ නෑ. ඒ නිසා අපි දෙන්නත් කියන්න ඕන දේවල් හිතේ හැටියට ෂොප් එකේ දොර ඉස්සරහදිම කියා ගත්තා.

'' ප්‍රශ්නයක් තියෙනවද අහන්නෙ ඇයි දෑස්...? ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් මමනෙ... ''

'' මොකක්...? ''

මං ඇහුවෙ මේ හොල්මනට මොලේ අමාරුවක් හැදිලද කියලා හොඳට මූණ දිහා බලන ගමන්.

'' ඇයි දෑස් ඔය විදියට මගේ හිත රිද්දන්නෙ. මං ඔයාට මේ තරම් ආදරේ කරද්දිත් ඇයි මට ඔය විදියට සලකන්නෙ. ''

'' අපි අතරෙ ආදරයක් තිබුණෙ කවදද මේසනා. අපි කවදාවත් එහෙම දෙයක් ගැන කතාවෙලාවත් තියෙනවද...? ''

'' ඔයා කියන්න හදන්නෙ ඔයා මට ආදරේ කළේ නෑ කියලද දෑස්...? අපි මෙච්චරකල් ආශ්‍රය කළේ විහිළුවට කියලද...? ඒකද ඔයා කියන්න හදන්නෙ...? ''

කෙල්ල ආවේග වෙලා වගේ මගේ අත් දෙකින් අල්ලලා හොලවන්න ගත්තා විතරයි වටේ මිනිස්සුත් අපි දිහා බලන්න ගත්තෙ වීදි නාට්ටියක් බලනවා වගේ ජොලියකින්.

'' මේසනා මේ.... ඔයා වගේ කෙල්ලෙක්ට ආදරේ කරන්න තරම් දෑස්ගෙ ඔළුව නරක් වෙලා නෑ. අනික වංචාවල් කරලා මිනිස්සුන්ගෙ සල්ලි කඩාවඩා ගන්න පවුලකට එකතු වෙන්න තරම් අපේ පවුල පහත් තත්ත්වෙකට වැටිලත් නෑ. අන්න ඒක මතක තියාගන්න. ''

කතාබහ වෙනස් පැත්තකට ඇදීගෙන යද්දි ගිවන්තගෙ ඉවසීමේ රතු කට්ට පැන්නා.

'' තමුසෙට පිස්සු හැදිලද...? අපි කවදද මිනිස්සුන්ගෙ සල්ලි වංචා කළේ...? ''

මේසනා ඇහුවෙ ගිවන්තව කන්න තරම් තරහකින් කඩා පනින ගමන්.

'' දෝණියන්දෑ ඒක දන්නෙ නැත්තං ගෙදර ගිහින් තාත්තගෙන් විස්තරේ අහගන්න. මෙච්චරකල් මිනිස්සුන්ගෙන් හොරට කොමිස් ගහපුවා තාත්තා අපූරුවට කියලා දෙයි... වරෙන් දෑස් යන්න... ''

ඌ මාව ඇදගෙන ෂොප් එක ඇතුළට ගියාමත් මේසනා අපේ පස්සෙන් දුවගෙන ආවා. මේකිටත් ලැජ්ජාව කියලා දෙයක් ගැව්ලාවත් නැතෙ අම්මපා.

'' දෑස්... මොකක්ද මගේ තියෙන වැරැද්ද කියලා මට කියනවද...? මං ඒවා හදාගන්න බලන්නම්... ''

මේසනාත් ඇන්තනී අන්කල් වගේම තමයි. ගේම අතාරින්න කැමතිම නෑ.

'' අපි දෙන්නා ගැලපෙන දෙන්නෙක් නෙමෙයි මේසනා. අනික මං වෙන කෙනෙකුට ආදරේ කරනවා. ඒ නිසා නොලැබෙන





දේවල් ගැන හිතන්න එපා. අපි ගියා.. ''

මේසනා පහළ තට්ටුවෙ බලාගෙන ඉද්දිම අපි දෙන්නා පඩිපෙළ නගින්න පටන්ගත්තා.

'' උඹටත් කෙල්ලෙක් දැක්කම වචන අමතක වෙනවා. ඒකිව ඔය තරම් හුරතල් කරන්න ගියේ බම්බුවකටද...? අතේ එල්ලිච්ච ගමන්ම දීලා අරින්න තිබ්බනෙ කන හරහා පාරක් තරු විසිවෙන්න. ආවා මෙතන ආදරේ ගැන කියාගෙන.... ''

ගිවන්ත පඩිපෙළ නැග්ගෙ මට බැන බැන.

'' මේ දෙනෝදාහක් ඉස්සරහා කෙල්ලෙක්ගෙ කන පලන්න ගිහින් පොලීසියෙ බාප්පලගෙන් කන අතගාවගන්න කියලද උඹ කියන්නෙ. ඊටවඩා හොඳ නැද්ද කියන්න තියෙන දේ ඒකිට තේරෙන බාසාවකින් කියන එක... ''

මමත් උත්තර දුන්නෙ ගිවා වගේම මල පැනපු මූඩ් එකකින්.

'' ඇත්තටම බං ඇන්තනියගෙ මුළු පවුලම එකයිනෙ බලාගෙන යනකොට. කියන සිංහලක් තේරෙන්නෙ නෑ. උන්ගෙ මුළු සර්වාංගෙටම පිස්සු...''

මේසනා කියන කතා අහලා මේ තරම් තරහා ගන්න ගිවන්ත ඩයස් අයියා සහන් ගැන කියපු කතාව ඇහුවානං කොහොම ප්‍රතිචාර දක්වයිද කියලා මට හිතාගන්න බැරි උනා. එදා අක්කගෙන් ඇන්තනීගෙ සිද්ධිය අහපු වෙලාවෙ ඉඳලා අපේ පවුලෙ හැමෝටම මේසනාලගෙ කට්ටියව පෙන්නන්න බැරුව හිටියෙ.

'' අපි ඔන්න ඕක අමතක කරලා දාලා ආපු වැඩේ කරගමු මචං... ආවා මෙතන මගුලක් කතා කරන්න... ''

ජෙන්ට්ස් අයිටම්ස් තියෙන ෆ්ලෝ එකට ගියාට පස්සෙ ශිවන්තයා රිලැක්ස් එකේ මගේ කරට අතක් දාගත්තෙ මාත් එක්ක තරහා ගත්ත එක වැරදියි කියලා තේරුණ නිසා වෙන්න ඇති.

* * * * * * *

රස්සාවට යන දවසට කලින් දවසෙ ටිකක් වේලාසන නිදාගන්න කියලා අම්මා කිව්වට එහෙම නින්ද යනවයැ. ඒ නිසා මං කළේ කාමරේ දොරත් වහගෙන ෆේස් බුක් ලොග් වෙච්ච එක.

'' හෙට ඉඳලා මං ජොබ් එකට යනවා අංජු... ඔයා අනිවාර්යෙන්ම හෙට උදේ මට පේන්න එන්න ඕනෙ. ''

මං ලොග් උන ගමන්ම දැහැමිට මැසේජ් එකක් යැව්වා. කෙල්ල කියපු නිසා මං දැන් නිතරම වගේ එයාව ඇමතුවෙ අංජු නමින්.

'' ඔයා රස්සාවට යන එක ගැන මට ගොඩක් සතුටුයි. ඒත් අයියෙ... මං කොහොමද ඒ වෙලාවට එන්නෙ...? මට හෙට ක්ලාස්නෙ. ''

මගේ මැසේජ් එකට රිප්ලයි ආවෙ ඒ විදියට. එයා හිතුවද දන්නෑ මං හැමදාම උදේ ඉඳලා රෑ වෙනකල් වැඩ කියලා. ඔව්... සමහරවිට එහෙම වෙන්න ඇති. සතුටු වෙන්න ඇත්තෙ මට ආයෙත් එයාලගෙ ගෙවල් පැත්තෙ එන්න වෙලාවක් නැති වෙයි කියලා වෙන්න ඇති. ඒත් මං වැඩි විස්තර කියන්න ගියේ නෑ.

'' අපි හත වෙද්දි ගෙදරින් පිට වෙනවා. ඔයාගෙ හිතේ මං ගැන මොකක්හරි හැඟීමක් තියෙනවානං ඔයා ඒ වෙලාවට එන්න... ''

'' ඔයාලගෙ ගෙදරට...? ''





කෙල්ල බය උනාද මන්දා. ඒත්... ඔෆිස් එකට යන්න කලින් එයාව බලලා යන්න ඕනෙ කියන හැඟීම මගේ හිතෙන් අයින් උනේ නෑ.

'' ඔයා කැමති තැනකට එන්න. මට ඕනෙ ඔයා එක්ක කතා කරන්න නෙමෙයි... ඔයාව බලන්න විතරයි. ''

මං සැර ටිකක් බාල කළා. ඊට ටික වෙලාවකට පස්සෙ ආවෙ කවියක්.

'' නුඹ අහසේ සඳු සේ තව බබලන්න
කොඳ කැකුළියක් වී හැකි වෙයි ළඟ ඉන්න
එනමුදු තව සිතක් බෑ මට රිදවන්න
අවසර දෙන්න ඔබගෙන් ඈතට යන්න ''

දෙවියනේ... අංජු කවදාවත් නැතුව මේ මොනවද කියන්නෙ...? අපි දෙන්නා ළං වෙන එකෙන් තව හිතක් රිදෙන්නෙ කොහොමද...? ඒ කිසිදෙයක් මට හිතාගන්න බැරුව ගියා.

'' ඔය නිල් නුවන් මා අභියස දල්වන්න
හදවත බිඳෙයි දුර නොගොසින් ළඟ ඉන්න
කොඳ කැකුළියේ මගෙ කඳුළැල් පිසලන්න
ඔබ මා අතර කිසිවෙකු නැත දැනගන්න ''

ඉස්කෝලෙ සාහිත්‍ය තරඟ වලදි හැමදාම පද්‍ය රචනා වලින් පළවෙනියා ගත්තු මට අංජුගෙ කවියට උත්තර දෙන එක එච්චර අමාරු උනේ නෑ.

ඒත් මගේ උත්තරෙන් පස්සෙ කෙල්ල එකපාරටම නිහඬ උනා. ඒකට හේතුවනං මොකක්ද කියලා මට තේරුණේ නෑ.

සමහරවිට මේසනා මගේ පස්සෙන් එන එක අංජු දැනගෙන වෙන්න ඇති.

තව බලාගෙන හිටියට කෙල්ල උත්තර එවන එකක් නෑ කියලා හිතුන නිසා මං හැඳුවෙ ලැප්ටොප් එක ඕෆ් කරලා දාලා නිදා ගන්න. ඒත් එහෙම හිතද්දිම දැහැමි අංජනා කියන නමෙන් තව නිසදැසක් මට ආවා.

'' ඔය නෙත් සිත දඟ කරනා කල
නිදිනැති මා නෙත් හඬන තරම්...
පවනැල්ලක දැවටී මා වෙත එන
ඔබේ සුවඳ මා පෙළන තරම්...
පාඩම් පොත් වල මැවී බොඳවෙනා
ඔබෙ රුව මා රස විඳින තරම්...
ආදර හැඟුමන් වාවනු නොහැකිව
දන්නෙද ඔබ මා දැවෙන තරම්... ''

ඒක කියවද්දි මං වෙනම ලෝකෙකට පාවෙලා ගියා වගේ හැඟීමක් තමයි මගේ හිතට දැනුණේ. මොකද අංජු කෙලින්ම නොකිව්වත් එයා මට කොයි තරම් ආදරේ කරනවද කියලා ඒ නිසදැස කියවද්දි මට තේරුම් ගන්න අමාරු උනේ නෑ.

හැබැයි මට පොඩි ප්‍රශ්නෙකට තිබුණෙ මගේ මූණ දිහා එක පාරක්වත් හරියට බලලා නොතිබුණු කෙල්ලට මගේ රූපෙ මැවෙන්නෙ කොහොමද කියන එක. අනික මාව දැක්කම ළඟටවත් එන්නෙ නැතුව එළවගත්තු කෙනාට මගේ සුවඳ දැනෙන්නෙ කොහොමද කියන. සමහරවිට ආදරේ කියන්නෙ ඒක වෙන්න ඇති කියලා මං හිත හදා ගත්තා. කොහොමඋනත් නිදා ගන්න





කලින් මගේ ආදරෙත් අංජුට ප්‍රකාශ කරන්න මං අමතක කළේ නෑ.

'' ඇත ඉඳන් ඔබ නෙතුපිය සැලුවට
නොහැකිය සිත සනහා ගන්න...
අරුණලු නැගෙනා සීත අළුයමේ
පැතුමක් ගෙන මා වෙත එන්න...
කප්පරකට සිත පෙම් කරනා වග
අවැසිය ඔබ හට පවසන්න...
තුරුළට ගෙන ඔබෙ කොපුල් තලා මට
සිපගන්නට අවසර දෙන්න... ''

* * * * * * *

# 11

ඕං අද තමයි අපි හා හා පුරා කියලා මුලින්ම රස්සාවකට යන දවස. අපේ අම්මා අද කිරිබතුත් හදලා. ගිවන්තත් යන්න ලෑස්ති වෙලා ගෙදර කට්ටියම එක්ක අපේ ගෙදර ආවා. රුවන්ති නැන්දා වාහනෙන් බැස්සෙ තඩි කේක් ගෙඩියක් දෑතින්ම උස්සගෙන. අපිට ඔෆිස් එක පැත්තෙ ඉඳලා හිටලා ඇවිත් යන්න කිව්ව එකට මෙයාලා මෙහෙම සලකනවානං අපි පර්මනන්ට් ජොබ් එක බාරගත්තු දවසට මොනවා නොකරයිද...

" විගහට කෑම මේසෙ ලෑස්ති කරන්න ලොකු... මල්ලිලා දෙන්නට යන්න කලින් කිරිබත් කෑල්ලක් කාලා යන්න... "

අම්මා කෙසෙල් ඇවරියක් උස්සගෙන කෑම කාමරේට දුවන ගමන් අක්කට කෑ ගහනවා මට ඇහුණා.

" මාර සැලකිලි නේද මචං...? "

ගිවන්ත ඇවිත් මගේ කරට අතක් දාගත්තෙ ඇහැක් ගහන ගමන්.

" පුතා... අදට ඔය දෙන්නා මාත් එක්ක කාර් එකේ යං.





ඊට පස්සෙ ඉතිං ඔයාලගෙ දඬු මොණරෙන්ම හිතෙන වෙලාවක ඇවිත් යන්න බැරියැ. "

අති මනරම් කෑම මේසෙට ඉඳගන්න ගමන් තමයි තාත්තා ඒ කතාව කිව්වෙ. යන එකනං අපිට ලොකු අවුලක් නෑ. මොකද වාහන තුනක ගියත් අපේ තාත්තයි සමරෙ මාමයි චූටි මාමයි තුන් දෙනාම යන්නෙත් එකම ඔෆිස් එකටනෙ. ඒ නිසා අපිට අද දවසට ඔය කොයි එකේ ගියත් එකයි. තාත්තා කිව්වත් වගේ අපි ආයෙත් ඔෆිස් එකට යනවානං යන්නෙ මගේ බයික් එකේ තමයි.

" එහෙනං ලොකු පුතාම කෑම මේසෙ විවෘත කරන්නකො... "

අපේ අම්මා එහෙම කියද්දි ගිවාගෙ මූණ ඇඹුල් උනා.

" මට එහෙම තනියම විවෘත කරන්න පුළුවන්ද මචං...? බෑනෙ.... "

මගේ මූණ දිහා බලාගෙන එහෙම කියපු ගිවන්තයා තඩි කිරිබත් කෑල්ලක් කඩාගෙන මගේ කටට ළං කළා. ඒක කන්න කට අරින්න කලින් මං කළේ රුවන්ති නැන්දා ගෙනාපු කේක් එකෙන් කෑල්ලක් කපාගෙන ගිවන්තගෙ කටට ළං කරපු එක.

" කාපං ලොකු අයියෙ සුභ මංගලම් කියලා... "

මං කේක් කෑල්ල ගිවාට කවද්දි ඌ කිරිබත් කෑල්ල මට කැව්වා. අපේ අම්මලා අක්කලා සේරම එකපාරටම අත්පුඩියක් ගැහුවෙ අපේ සමගියට වෙන්න ඇති.

" දැන් ඉතිං කට්ටයම ඉක්මනට කාලා පිටත් වෙමු... "

ඕන්න එහෙම කියලා සමරෙ මාමා මේසෙ තිබුණු හැම ජාතියකින්ම පිඟාන පුරවගත්තා. වෙනදට කෑම ජාති තෝර තෝර



Chamodi Madhuprabha

රණ්ඩු කරන අපේ අනික් සාමාජිකයොත් කිසි අවුලක් නැතුව කේක් කිරිබත් කන්න පටන් ගත්තෙ හරි සතුටින්. ඒත් මගේ එහා පැත්තෙ පුටුවෙ ඉඳගෙන හිටපු අපේ චූටි විතරක් හිස් පිඟාන දිහා බලාගෙන කල්පනා කරනවා මං දැක්කා.

'' කන්නෙ නැද්ද...? ''

මං ඇහුවෙ ඒ මූණ මගේ පැත්තට හරවගන්න ගමන්. දෙයියනේ... චූටිගෙ ඇස්වල කඳුළු. හැමෝම සතුටින් ඉන්න අද වගේ දවසකත් මේ පුංචි කෙල්ල දුක් වෙන්නෙ ඇයි කියලා මට හිතාගන්න බැරි උනා.

'' බබා... ඇයි මේ...? ''

චූටි මුකුත් නෑ කියන්න වගේ ඔළුව හොලවලා ආයෙත් බිම බලාගත්තා.

'' ආ... ''

මගේ පිඟානට දාගත්තු කිරිබත් කෑල්ලක් කඩලා කට්ට සම්බෝලෙත් එක්ක තවරලා මං චූටිගෙ කටට ළං කරද්දි ඒ ඇස් දෙකේ පිරිලා තිබුණු කඳුළු හීනියට කම්මුල් දෙක දිගේ ගලාගෙන ගියා. හොඳ වෙලාවට ඒක දැක්කෙ මගේ අනික් පැත්තෙ ඉඳගෙන හිටපු ශිවන්ත විතරයි.

කෙල්ල මේ දවස් වල ඉන්න මානසික තත්ත්වෙ ගැන මටත් වඩා හොඳින් දැනගෙන හිටපු ශිවා ඒක නොදැක්කා වගේ අහක බලාගත්තා. ඒත් එක්කම තමයි චූටි ඉක්මනට අතේ තිබුණු ලේන්සුවෙන් ඒ කඳුළු පිහිදගත්තෙ.

'' දැස් බේබී... ''

කට්ටිය සේරම කාලා බීලා කෑම මේසෙට වෙලා සතුටු





සාමීචියෙ යෙදෙද්දි සාලෙ පැත්තෙන් සරා අයියගෙ කටහඬ ඇහුණා. මං විතරක් නෙමෙයි කාලා ඉවර කරපු අපේ දෙතුන් දෙනෙක්ම නැගිටලා ඒ පැත්තට ගියේ සරා මොකද මේ උදේ පාන්දර කියලා දැනගන්න.

'' බේබිලා සුභ කටයුත්තකට යන්න යන මේ වෙලාවෙ මං වගේ කාලකණ්ණියෙක් ඉස්සරහට මුලිච්චි වෙන්න ආව එක හරිද මන්දා... ඒත්... ''

සරා මොකක්දෝ මන්දා දෙයක් කියන්න තටමද්දි අපේ තාත්තා අත දික් කරලා ඒක නතර කළා.

'' කවුද කියන්නෙ සරත් කාලකණ්ණියෙක් කියලා. සරත්ට පිස්සුද...? අනික අපේ පුතාට ගොඩක් හිතවත් කෙනෙක් මේ වගේ වෙලාවක ඉස්සරහට මුණ ගැහෙන එක කොයි තරම් සුභ දෙයක්ද... ''

අපේ තාත්තගෙ ඒ කතාවට අඳුරු වෙලා තිබුණු සරාගෙ මූණ හඳ පෑව්වා වගේ එළිය වැටුණා.

'' මං අවෙ බේබිලා දෙන්නා යන්න කලින් මේං මේ තෑග්ග බේබිලට දීලා යන්න... ''

අහිංසක විදියට හිනා උන සරා එයාගෙ කොට කලිසමේ දාගෙන තිබුණු මොනවදෝ මන්දා පුංචියට ඔතපු කුරු දෙකක් අතට ගත්තා. මගේ පිටිපස්සෙන් හිටපු ශිවන්ත ඒ දිහා බලාගෙන හිටියෙ හරි ආදරණීය විදියට. ශිවන්තට විතරක් නෙමෙයි... තමන්ටවත් දෙයක් ගන්න තරම් වත්කමක් නැති සරා අපිට පුංචිහරි තෑග්ගක් ගෙනාවා කියලා දැනගත්තම මටත් සරා ගැන දැනුණෙ අමුතුම හැඟීමක්.

'' ආ බේබි.... ''

එයා ඒ තෑගි දෙක අපි දෙන්නා අතට වෙන වෙනම දුන්නෙ කොන්දත් තරමක් පාත් කරලා ආචාර කරන ගමන්.

'' අපිට තෑගි ගෙනාවෙ ඇයි සරා අයියෙ...? ඔයාගෙ ඔය ආදරේ හැමදාම අපිට දෙනවානං ඒ ඇති... ''

මං උරහිස් දෙකෙන්ම අල්ලලා සරාව බදාගනිද්දි මිනිහා බුරුස් ගාලා නහය උඩට අදිනවා මට ඇහුණා. එදා මං ෆෝන් කාඩ් එක නැතිවෙලා හොයන දවසෙ ඒක ගන්න ඇත්තෙ සරා වෙන්න ඇති කියලා මිනිහට චෝදනා කරපු අපේ අක්කා උතත් අද සරා දිහා බලන් හිටියෙ තමන්ගෙම කෙනෙක් දිහා බලන තරම් ලෙන්ගතුකමෙන්.

'' දුක්වෙන්න එපා පුතා. ඔයාට අපේ පුතා එක්ක කතා කරන්න හිතෙන ඕනම වෙලාවක රෑ වෙලා හරි කමක් නෑ අපේ ගෙදර එන්න. මේ ගෙදර දොරවල් ඔයාට පැය විසිහතරෙම ඇරිලා.''

තාත්තා ඒ විදියට සරාගෙ හිත සනසලා ගෙදරින් එළියට බහින්න ලෑස්ති උනා.

'' අයියෙ... ටිකක් ඉන්න... ''

අපි නමෝ විත්තියෙන් දකුණු කකුල පෙරට තියලා එළියට බහින්න හදද්දිම චූටි ඒක නතර කරලා ගෙට දිව්වා. කෙල්ල ආපහු ආවෙ තරමක තෑගි පාර්සල් දෙකක් අරන්. ඒ කියන්නෙ සරා ගොයියා වගේම අපේ චූටි නංගිත් අපිට තෑගි අරගෙන. තෑගි දෙක අතට අරගෙන මමයි ගිවන්තයි දෙන්නම දෙපැත්තෙන් ගිහින් චූටිව තුරුල් කරගෙන ඒකිගෙ කම්මුල් දෙක ඉම්බා.

'' එහෙනං චූටි පුතේ... මේක මගේ ගාණෙ. මට ඔය





තෑගි තෝරන්න දන්න එකක්යැ. උඹලා දෙන්නා ඔකෙන් ඕන කරන දෙයක් අරගනින්... ''

අපේ ආච්චිත් අපි දෙන්නා අතට ලියුම් කවර දෙකක් දුන්නා. බලාගෙන යනකොට අපි ගෙදරින් පිට වෙලා පැය කිහිපයක් හරි ඉන්නවට අපේ ගෙදර අය පුදුම කැමැත්තක්නෙ තියන්නෙ. නිකම් නෙමෙයි තෑගිත් දීලයි අපිව එළවන්නෙ.

කොයි එකටත් මං පඩිය බහින්නෙ නැතුව තව ටිකක් වෙලා බලාගෙන හිටියෙ තව කවුරුහරි අපිට තෑගි දෙන්න ඉදිරිපත් වෙනවානං ඒ අයට අවස්ථාව දෙන්න.

'' වෙන නෑ වගේ නේද...? ''

මං වගේම බලාපොරොත්තුවේ දෑස් දල්වාගෙන හිටිය ගිවන්ත හුළං ගිය බැලූමක් වගේ කිව්වා. නෑ කිව්වට නැත්තෙම නෑ. අපිට තව චූටි තෑගි දෙකක් තියනවා වගේ. මොකද අපි ඒ පාර අපි ඉස්සරහට හෙමීට අඩි තිය තිය ඇවිදගෙන ආවෙ සුදූ.

'' පැටියො... ''

මං එයා ඉස්සරහා පාත් උනා.

'' දෑස් අයියා... ආ චොකෝ එකක්... බයි කාලා කන්න.''

අනේ... පුංචි එකී අපි දෙන්නට ලොකු චොකලට් එකක් දීලා තව උම්මා කියලා ලොකු කිස් එකකුත් දුන්නා. අපි වෙනුවෙන් ගෙදර ෆ්‍රිජ් එකේ තිබුණු චොකලට් එකක් හරි දෙන්න ඒ පුංචි හිතට මතක් උන එක කොයි තරම් දෙයක්ද...?

'' බායි පැටියෝ... දඟ කරන්නෙ නැතුව පරිස්සමට ඉන්න...''

ඒ විදියට හැමෝටම සමුදීලා තාත්තගෙ වාහනේට නගිද්දි

මගේ ඇස් හතර අතේ දුවන්න පටන් ගත්තා. ඒ ඊයෙ රෑ කුළුදුලේම මට ආදරේ ප්‍රකාශ කරපු පින්වන්ත මූණු පොඩ්ඩ දැකගන්න.

" කාවද හොයන්නෙ...? "

මගේ වෙනස ගිවන්තටත් තේරිලා.

" අංජුව... "

මං උත්තර දුන්නෙ ඌගෙ කනට කරලා. ඒක ඇහුණා විතරයි මිනිහා මගේ උඩ ඉඳලා පල්ලටම බැලුවෙ මට පිස්සුද කියලා අහනවා වගේ බැල්මකින්. ඒත් අංජු එක තත්පරේකට හරි මගේ ඇස් ඉස්සරහට එයි කියලා මගේ හිත කෑ ගහන්න ගත්තා.

" නලින් මාමෙ... මාවත් හන්දියෙන් බස්සගෙන යනවද...?"

තාත්තා වාහනේ ස්ටාට් කරද්දි බෑග් එකකුත් කරේ දාගෙන දුවන් ආපු චූටි ඇහුවෙ හරි අහිංසක විදියට.

" ඉතිං ළමයො ඔයා තාත්තගෙ වාහනේ යන්නකො... "

ඒ කිව්වෙ රුවන්ති නැන්දා.

" අනේ මට අයියලා එක්ක යන්න ඕනෙ... "

" කමක් නෑ නංගි... මං දූව බස්සගෙන යන්නම්... "

චූටි බැගෑපත් උන නිසාද මන්දා තාත්තා කෙල්ලවත් කාර් එකට ගන්නගත්තා. ගිවා ඉස්සරහා සීට් එකේ වාඩි වෙලා හිටිය නිසා චූටි නැග්ගෙ මගේ ළඟට.

ටික වෙලාවකට කලින් කන්නෙ නැතුව අඬ අඬ හිටපු කෙල්ල දැන් මට පෙනුනෙ වැහැලා වැහැලා පායපු අහසක් වගේ. ඇත්තටම කෙල්ලො කියන්නෙ තේරුම් ගන්න කොයි තරම් අමාරු සත්ත්ව කොට්ඨාසයක්ද කියලා මං තේරුම් ගත්තෙ චූටිගෙන්.





මං එයා දිහාම බලන් ඉන්නවා දැනිලද මන්දා කෙල්ල මගේ අතකින් අල්ලගත්තා. ඒ වෙලාවෙ මට දැනුණෙ අර දවසක් මං නිදාගෙන ඉන්න වෙලාවෙ කෙල්ල ඇවිත් මගේ නළලට අත තියපු වෙලාවෙ දැනුණ හැඟීමමයි. සීතලම සීතල සිනිඳු අතක්...

" මාමෙ... මාව ඔය පාර ගාවින් දාන්න. මගේ යාළුවා මෙතනට එන්නෙ... "

හන්දියට දාන්න කියලා වාහනේට නැගගත්තු චූටි පාර ගාවින්ම බැහැගත්තා විතරයි බස් හෝල්ට් එක පැත්තෙ ඉඳලා මතුඋනේ මං දකින්න බලාපොරොත්තුවෙන් හිටපු රූපෙ.... අංජු.

එයා කාර් එක දිහා උනන්දුවෙන් බලාගෙන චූටි දිහාට ඇවිදන් ආවට එයාට මාව පේන්නෙ නෑ කියලා මං දන්නවා. මොකද අපේ තාත්තගෙ වාහනේ පිටිපස්සෙ වීදුරු කළු කරලා නිසා අපිට එළිය පෙනුනට එළියෙ ඉන්න අයට පිටිපස්සෙ සීට් එකේ ඉන්න අයව පේන්නෙ නෑ. තාත්තට පොඩි ෂේප්මන්ට් එකක් දාගෙන වාහනෙන් බහිනවා කියලා මං හිතද්දිම ' පරිස්සමට යන්න දූ. අපි යන්නම් ..." කියලා තාත්තා වාහනේ ඉස්සරහට ඇද්දුවා.

දුක තමයි. මගේ වචනෙ අහක දාන්නෙ නැතුව උදේම මාව හොයාගෙන ආපු කෙල්ලට අඩුම තරමෙ ගුඩ් මෝනින් කියලවත් කියන්න බැරි උනා. ගිවන්තත් පිටිපස්ස හැරිලා මං දිහා බැලුවට තාත්තා ඉන්න නිසා මොනවත්ම කිව්වෙ නෑ.

කොහොමහරි අපි ඔෆිස් එක ළඟින් බහිනකොට අපිව පිළිගන්න කට්ටිය කේක් එකකුත් ගෙනත්.

" පොඩි මහත්තුරු දෙන්නා කේක් කෑල්ලක් කාලම වැඩ පටන්ගන්න යමු... "

තරමක් වයසක මනුස්සයෙක් අපිට කෑමට ආරාධනා කළාට තව කොහෙ කියලා කන්නද අප්පා. අපි ගෙදරින් ආවෙ නිදිමත හැදෙන තරමට කිරිබත් දෙසාබාලනෙ. ඒත් ඉතිං ආපු දවසෙම කරපු ආරාධනේ ප්‍රතික්ෂේප කළොත් මේ මිනිස්සු හිතයි අපි දෙන්නා තාත්තලා වගේ නෙමෙයි ලොකු ඔළුකාරයො කියලා. ඒ නිසා අපි කාලා බීලම වැඩට බැස්සා.

වැඩට බැස්සා කිව්වට අපි මුලින්ම කරපු වැඩේ තමයි සරා අයියා අපි දෙන්නට දීපු තෑග්ග විවෘත කරන්න ගත්තු එක. ඒක අපි දෙන්නගෙ සාක්කු වලම තිබුණු නිසා වැඩේ එච්චර අමාරු උනේ නෑ.

'' මේක පෙනුමෙන්නං පෑනක් වගේ ලොකු අයියෙ...''

බොහොම හීනියට සැහැල්ලුවට තිබුණු තෑග්ග මං ගැලෙව්වෙම මොකක්ද කියලා අනුමාන කරලා. මගේ අනුමානෙ සීයට සීයක්ම නිවැරදි කරමින් ඒකෙ තිබුණෙ නිල් පාට කාබන් පෑනක්. රුපියල් දහයක්ට නැත්තං පහළොවකට ගන්න පුළුවන් ඒ පෑන දැක්කම මට සරා ගැන මාර අනුකම්පාවක් දැනෙන්න ගත්තා. ගිවන්තට දීලා තිබුණෙත් ඒකක්ම තමයි.

'' සරා පව් බං... ''

මිනිහා ඒක කිව්වෙ ඒ පෑන දිහා ගොඩක් වෙලා බලාගෙන හිටියට පස්සෙ.

'' තෑග්ගක වටිනාකම තියෙන්නෙ රුපියල්වල නෙමෙයි කියන එක ඌ අපිට ඔප්පු කළා මචං... අපි දෙන්නා මේ පෑන් දෙක ඉවර වෙනකල්ම පාවිච්චි කරමු... ''

මං ඒක සාක්කුවෙ දාගත්තෙ ජොබ් එක කරලා කවදාහරි





අතටගන්න පළවෙනිම පඩියෙන් සරාට තෑග්ගක් අරගන්න ඕනෙ කියන එක මගේ හිතට මතක්කරලා දෙන ගමන්. අපිට චූටි දීපු තෑගි දෙක බලන්න විදියක් නොතිබුණේ ඒක තාත්තගෙ වාහනේ ඇතුළෙ තිබුණු නිසා.

'' ළමයි දෙන්නා... යමුද මාත් එක්ක වටයක්... ''

අපි සරා ගැන කතා කර කර ඉන්න වෙලාවෙ තාත්තා හිනාවක් දාගෙනම අපේ ළඟට ආවා.

එයා මුලින්ම කළේ අපිට ස්ටාෆ් එකේ අයව හඳුන්වලා දීපු එක. ඒ උනත් අපි ඉඳලා හිටලා ඔෆිස් එකට ඇවිත් තියෙන නිසා විශේෂ හඳුන්වාදීමක් අවශ්‍ය උනේ නෑ. ස්ටාෆ් එකේ ගොඩ දෙනෙක් අපිව දැනගෙන හිටියා.

කොහොමටත් ඔෆිස් එකේ වැඩි ස්ටාෆ් එකක් හිටියෙ නෑ. ඒකෙ ෆ්‍රන්ට් ඔෆිස් එකේ තුන්දෙනෙකුයි ඊට අමතරව ගිණුම් අංශයේ තුන් දෙනෙකුයි හිටියා. අයි ටී සෙක්ෂන් එකේ විතරයි පස් දෙනෙක් හිටියෙ. එයාලා කළේ ඉන්ටර්නෙට් එක හරහා ඉඩම් හොයන එක... තව අපි විකුණන්න හිතන් ඉන්න ඉඩම් ප්‍රමෝට් කරන එක වගේ දේවල්. අයි ටී එක හැන්ඩ්ල් කළේ චූටි මාමා.

තාත්තා කිව්ව විදියට සමරෙ මාමානං ගොඩක් විට හිටියෙ ෆීල්ඩ් එකේ. අපේ කම්පැනියට ගන්න හිතන් ඉන්න ඉඩම් බලන්න යන එක... ඒවා කට්ටි කරන එක... ලොකු ඉඩම් වෙන්දේසි වතු වගේ ඒවා වල තාවකාලික කුටි ගහලා අපේ ඔෆිස් එකේ නියෝජිතයෙක් ඒවයෙ රඳවන එක වගේ දේවල් තමයි එයාගෙ රාජකාරි උනේ.

අපේ තාත්තා කළේ මේ සේරම හැන්ඩ්ල් කරන එක. ඊට අමතරව ඉඩම් වලට කරන්ට් එක ගන්න එක... ජල සැපයුම දෙන

එක වගේ වැඩ වලට මැදිහත් උනෙත් තාත්තා. මොනවා උනත් සමරෙ මාමයි චූටි මාමයි දෙන්නා හැමදේම තීරණේ කරන්නෙ තාත්තගෙත් අනුමැතිය ඇතිව කියන එක අපිට පළවෙනි දවසෙම තේරුණා.

'' දැනට ඔයාලා මේ හැම සෙක්ෂන් එකකම වැඩ සිද්ධ වෙන හැටි ටික ටික ස්ටඩි කරන්න. මෙතන ලොකු ඩියුටියක් කෙරෙන්නෙ අයි ටී සෙක්ෂන් එක හරහා. දවසෙ පැය විසි හතරෙන් දාහතරකට වඩා කම්පියුටර් එකේ ඉන්න ඔයාලට ඒ දේවල් අමුතුවෙන් උගන්වන්න ඕන වෙන එකක් නැතුව ඇති කියලා මට හිතෙනවා... අනික චූටි මාමා ඒ විස්තර සේරම ඔයාලට කියලා දෙයි. ''

ඔෆිස් එකේ සෙක්ෂන් බෙදලා තියෙන හැටි කියලා දුන්නු අපේ තාත්තා ඊළඟට අපිව ලන්ච් රූම් එක... ටොයිලට්ස්... ස්ටෝර්ස්... එහෙම තියෙන පැත්තට එක්කගෙන ගියා.

'' ඔයාලා මීට කලින් මේ ඔෆිස් එකට ඇවිත් තියෙන නිසා ටොයිලට්ස් ලන්ච් රූම් එහෙම විශේෂයෙන් පෙන්වන්න ඕනෙ නැහැනෙ. විශේෂම දේ තමයි මේ ස්ටෝර්ස් එක. ''

එහෙම කියලා එයා අපිට ස්ටෝරුවෙ දොර ඇරලා පෙන්නුවා.

'' ඔෆිස් එකේ දේවල් කොයි තරම් හොඳට පාලනය උනත් හැමදාම අවුල් වෙන්නෙ මේ ස්ටෝර්ස් එක තමයි. මොකද මේක හැන්ඩ්ල් කරන්න කියලා අපි වෙනම පුද්ගලයෙක්ව යොදවලා නෑ... ''

ඒකෙ තිබුණෙ ඉඩම් කට්ටි කරද්දි ඕන කරන ගල් ඉනි, ගල් කටු, සවල්, අලවංගු වගේ ආයුධයි... වතුර බට... විල්බැරෝ...





ඉටි කොල රෝල්, ටේප්... යකඩ කණු වගේ දේවලුයි තවත් මොනවදෝ මන්දා එකපාරටම වෙන්කරලා අඳුරගන්න බැරි තවත් බඩු භාණ්ඩ රාශියකුයි.

'' හෙට අනිද්දා දිහාට ඇවිත් දෙන්නා එක්ක එකතු වෙලා හෙමීට මේවයෙ ස්ටොක් එකක් අරගෙන කම්පියුටරයිස් කරලා දාන්න. මොකද හැමදාම අලුත් සයිට් එකක වැඩට අරන් යන්න බලපුවම මේකෙ තියෙන ආයුධ අඩුයි. ''

කම්පැණියෙ ලොක්කා වෙච්ච අපේ තාත්තා ඒ විදියට අපි දෙන්නට පළවෙනිම කොන්ත්‍රාත්තුව පැවරුවා. ඒකනං ඒ හැටි අමාරු දෙයක් නෙමෙයි කියලයි මටනං හිතුනෙ.

'' ඔයාලා අලුත් ටෙක්නොලොජි එකත් එක්ක හැදෙන අයනෙ. මේකෙ වැඩ සිද්ධ වෙන විදියෙ මොකක්හරි වෙනසක් වෙන්න ඕනෙ කියලා හිතෙනවානං ඒ ගැන මට හරි මාමලා දෙන්නට හරි කියන්න. මොකද අපි හැම වෙලාවෙම අලුත් තාක්ෂණයත් එක්ක අලුත් අදහස් එක්ක ඉදිරියට යන්න ඕනෙ. එතකොට තමයි මේ දේවල්වල පැවැත්මක් තියෙන්නෙ.''

අපේ තාත්තලා මේ දේවල් මේ තරම් ගොඩනගාගන්න ඒ කාලෙ කොයි තරම් කට්ටක් කන්න ඇත්ද කියලා මට හිතුණා. අනික තාත්තලා මාමලා ගැන මෙච්චර කල් නොදැනුණ ආකාරයේ අමුතුම ගෞරවයක් වගේ දෙයක් මගේ හිත ඇතුළටම දැනෙන්න පටන් ගත්තා.

'' ගිවන්ත පුතා... මොකද හිතෙන්නෙ...? මෙතන වැඩ කරන්න අමාරුයි කියලා හිතෙනවද...? ''

තාත්තා ප්‍රශ්නෙ ඇහුවෙ ගිවන්තගෙන්.

" අමාරුයි කියලා මේ දේවල් අතෑරලා දාන්න බැනෙ මාමෙ. මේ අපේ දේවල්නෙ. අමාරුවෙන් උනත් මමයි දෑසුයි අපිට පුළුවන් උපරිමයෙන් වැඩ කරලා මේක තව දියුණු කරනවා... "

ශිවන්ත ඒ උත්තරේ දෙනකොට චූටි මාමත් අපි ළඟට ඇවිත් හිටියෙ.

" අපිට දැන් බය වෙන්න දෙයක් නෑ ලොකු අයියෙ. තව ටික කාලෙකින් අපි නැතුව උනත් කොල්ලො දෙන්නා ගේම ගහගෙන යයි... "

ශිවාගෙ කතාව ඇහුණ චූටි මාමා තාත්තට ඒක කිව්වෙ ලොකු විශ්වාසෙකින්.

" වටේපිටේ පොඩි රවුමක් දාලා දෙන්නා මං ඉන්න පැත්තටත් එන්නකො. එතන ඔයාලට කරන්න ගොඩක් දේවල් තියෙනවා. මං කිව්වෙ ආසාවෙන් කරන්න... "

චූටි මාමා ඒ නං අපිට පාස් කළේ හින්ට් එකක්. එයා ආසාවෙන් කියන වචනෙ බර කරලා කිව්වෙ අපි කම්පියුටර් එක්ක වැඩ කරන අතර ෆේස් බුක් යයි කියලත් හිතලා වෙන්න ඇති.

" මං හිතුවෙ මල්ලි දෙන්නව හෙට අනිද්දා දිහාට සමරෙ එක්ක අර අලුත් ලෑන්ඩ් එක බලන්න යවන්න කියලා... "

තාත්තා තවත් අලුත් අදහසක් ඉදිරිපත් කරද්දි චූටි මාමත් ඒක එක පයින්ම අනුමත කළා.

" අපි මාසෙ පළවෙනිදා නිසා අද ඉඳලා වැඩට එන්න කිව්වට ඔයාලා අනිවාර්‍යයෙන්ම දවස ගානෙ මෙතනට ඇවිත් පොත අත්සන් කරන්න ඕනෙ නෑ. ඔයාලට අත්‍යවශ්‍ය ගමන්බිමන් මොනවාහරි තියෙනවනං ඒ දේවල් කරගන්න. ඒත් ඒක පුරුද්දක්





විදියට තියාගන්න එපා.

තේරෙනවනෙ මං කියන දේ... මෙතනදි වෙන්න ඕනෙ පිට තැනක වැඩ කරනවා වගේ පැය අටේ රාජකාරිය නෙමෙයි. පැයක් දෙකක් හරි කමක් නෑ තමන්ගෙ කියන හැඟීමෙන් වැඩ කරන එක... "

තාත්තා අපිට පොඩි චාන්ස් එකක් දෙන්නත් අමතක කළේ නෑ. ඒත් ඉතිං එහෙම කිව්ව පළියට නැවිත් ඉන්න පුළුවන්ද...? තාත්තා මාමලා දෙන්නටත් කියලා තියෙන්නෙ ඕන වෙලාවක එයාලගෙ පෞද්ගලික දේවල් වලට අවශ්‍ය නිවාඩු අරගන්න කියලා. එහෙම කිව්වයි කියලා එයාලා කවදාවත් අනවශ්‍ය විදියට වැඩට නැවිත් ඉඳලා නෑ. චූටි මාමානං සමහර දවස් වලට වැඩ ඇරිලා ගෙදර එන්නෙ තාත්තා ආවටත් පැය දෙක තුනකට පස්සෙ.

කොහොමහරි අපිට පළවෙනිම දවසෙ චේලාසන පනින්න පුළුවන්කමක් තිබුණෙ නෑ. මොකද ඉතිං අපි ආවෙ තාත්තා එක්ක කාර් එකේනෙ. ඒ නිසා අපිට යන්න උනෙත් එයා එක්කම තමයි. තාත්තා වැඩ ඉවර කරනකල් කියලා හවස් වෙනකල් ඔෆිස් එකේ හිටපු එකෙන් අපිට පොඩි වාසියකුත් උනා. ඒ තමයි අපි ඔෆිස් එකෙන් පිට වෙද්දි ස්ටාෆ් එකේ සෑහෙන පිරිසක් අපි එක්ක ෆිට් උන එක.

අනික් කාරණේ තමයි දවසම කට්ටියත් එක්ක ගැවසුන නිසා මට දැහැමියි මමයි අතර ඇතිවුණ නිල නොලත් ප්‍රේමය ගැන ශිවන්තට කියන්න තරම් වෙලාවක් ආවෙ නෑ. උදේ චූටිව මුණ ගැහෙන මුවාවෙන් හරි කෙල්ල පාරට ආව එක ගැනත් ශිවාට සැකයක් තිබුණට ඌට ඒක අහන්න උනෙත් නෑ. වෙනත් විදියකට කියනවානං රස්සාවට ගිය පළවෙනි දවසෙම අපි

කාර්‍යබහුල වෙලා.

* * * * * * *

" දෑස්... කොහොමද ජොබ් එක හොඳයිද...? "

අපේ අක්කට මගෙන් ඒක අහන්න මතක් උනේ අපි ඔෆිස් එකට යන්න පටන් අරන් දවස් කීපෙකට පස්සෙ. අනේ මෙහෙමත් සහෝදරියො...

" ජොබ් එකනං මරු හලෝ. ඒක ඒ තරම් ගති කියලා අපි දැනන් හිටියානං මීට කලිනුයි ඒ පැත්තෙ යන්නෙ... "

කියන්නෙ ඇත්තක්ද බොරුවක්ද කියලා අහන් ඉන්න එකාට හිතාගන්න බැරි වෙන විදියට මම හෙන සීරියස් මූඩ් එකකින් කතාව පටන් ගත්තා.

" ඇත්තද...? "

" නැතුව... අපි ගිය දවසෙ මුලින්ම වැඩ කලේ අයි ටී එකේ. ඒකෙ ඉන්චාර්ජ් අපේ චූටි මාමනෙ. එයා අපිට මුලින්ම දුන්නෙ සීඩී එකක් දාලා බලන්න කියලා. දන්නවද ඒකෙ මොනවද තිබුණෙ කියලා...?"

" ඉඩම් වල මොනවා හරි ප්ලෑන් වෙන්න ඇති. "

" නෑ... පිටරටක මිනිස්සු කට්ටියක් කැලෑවක් එළි කරලා ඉඩම් කට්ටි කරන ප්‍රොජෙක්ට් එකකට ලෑස්ති උන සීන් එකක්. ඒකෙ ඒ මිනිස්සු කැලෑව ඇතුළෙ තිබුණු එයාලගෙ ඔෆිස් එකේ ඉද්දි මාර සීන් එකක් උනානෙ. "

" මොකක්ද...? "

" කට්ටිය උදේම ඉඩම මනින්න එළියට ගියා. ඒත් එයාලට පොඩි අමතකවීමක් වෙලා. මොකක්ද දන්නවද... කට්ටිය උදේට





කෑම හදන්න ප්ලග් එකට ගහපු හොට් ප්ලේට් එක ඕෆ් කරන්න අමතක වෙලයි ගිහින් තියෙන්නෙ. කොහොමහරි ඒ වෙලාවෙ කැලේ හිටපු සතෙක් කවුළුවකින් ඔෆිස් එක ඇතුළට රිංගුවා. ඌ ඒකෙ තිබුණු බඩුමුට්ටු ලියකියවිලි එහෙම සේරම ඇදලා එහෙ මෙහෙ දාලා අන්තිමේදි ගියේ කිචන් එකට. ගිහින් ඌ දන්නෙ නැතුව අර හොට් ප්ලේට් එකේ ඉඳගත්තනෙ... "

" ඉතිං...? "

" ඉතිං කියන්නෙ හලෝ ඌගෙ පුක පිච්චුනා. "

මං හිනාව බොහොම අමාරුවෙන් හංගගෙන කියද්දි අක්කා කිසිදෙයක් තේරුම්ගන්න බෑ වගේ මගේ මූණ දිහා බලන් හිටියා.

" දන්නවද ඒ සතා මොකාද කියලා...? "

මං ඇහුවෙ අක්කගෙ ඇස් දෙක දිහා කෙලින්ම බලාගෙන. එයා නෑ කියලා ඔළුව දෙපැත්තට වනලා උත්තර දුන්නා.

" පොඩ්ඩක් ගෙස් කරලා උත්තර දෙනවකො..."

" මං කොහොමද දන්නෙ ඉතිං... "

එයා උත්තර දුන්නෙ තරහෙන් වගේ. තරහා යන්නෙ නැතුව තියේවිද... රස්සාව කොහොමද කියලා අහපුවම මං මේ කැලෑවක් ගැන කතන්දරයක් පටන් ගත්තා මදිවට තව එයාගෙන් ප්‍රශ්නත් අහන්න තියාගත්තනෙ.

" ඕකෙ අමුතුවෙන් දැනගන්න දෙයක් තියෙනවද... ඒ සතා තමයි...... බැබුන්.... "

" බැබුන්...? "

" ඔව් බැබුන්... ඇයි සූ එකේදි දැකලා නැද්ද ඌගෙ

පස්ස රතු වෙලා ඉදිමිලා තියෙනවා. ''

'' තමුසෙගෙන් දෙයක් අහන කට හොඳයි බිම උලා ගන්නවා. ''

අක්කා ගස්සලා පද්දලා නළවලා ඒ මදිවට මට රවලා එතනින් යන්න ගියා. පව් අප්පා... ආවා මෙතන ජොබ් එක හොඳයිද අහන්න...

* * * * * * *



aralivihara@gmail.com

# 12

මමයි ශිවන්තයි එක දිගට දවස් තුනක් විතර තාත්තලා එක්ක ඔෆිස් එක පැත්තෙ ගිහින් වැඩ ටික ටික ඉගෙන ගත්තා. ඒත් අපිට තිබුණු අනේකවිධ රාජකාරිත් එක්ක ඒ වැඩේ දිගටම කරන්නත් අමාරුයි වගේ. ඇයි දන්නවද...?

දවසක් උදේම ශිවන්තටත් කෝල් එකක් දීලා තාත්තලගෙ සයිට් එකක් පැත්තෙ ගිහින් එන්න කියලා හදද්දිම ෆෝන් ෂොප් එකේ ඩයස් අයියා කෝල් කළා සහන් හන්දියෙ ඉඳලා චූටිව ෆලෝ කරනවා කියලා. එහෙම කියද්දි ඉතිං මොන ජොබ්ද... මමත් තත්පරේට දෙකට අතට අහුඋන ඇඳුමක් දාගෙන හන්දියට ගියා නෙමෙයි ඉගිලුණා.

යද්දි මෙන්න ජෝඩුව ඉන්නවා බස් හෝල්ට් එකේ. චූටි හිටියෙ බස් හෝල්ට් එක ඇතුළෙ. බෝස්තිං හෝල්ට් එක පිටිපස්සෙ ඉඳන් කෙල්ලට ඇහැ දාගෙන ඉන්නවා. මිනිහගෙ 'අජේම නයි... අපිවම කයි...' ත්‍රීවීලර් එකත් ඒ කිට්ටුවම නවත්තලා තියෙනවා. මමත් බයික් එක පැත්තකින් දාලා සහන් මොකාටද එන්න හදන්නෙ කියලා බලාගෙන හිටියා.

බලන් හිටියා කිව්වට ලොකුවට බලන් ඉන්න තරම් කාලයක් ගතඋනේ නෑ. ඌ හෙමීට පිටිපස්සෙන් චූටිට ළංවෙලා කෙල්ලගෙ කනට කරලා මොනවද කිව්වා. චූටි ඒක ඇහුණෙ නෑ වගේ අඩියක් දෙකක් ඉස්සරහට උනා.

මං එයාලට කිට්ටු වෙන ගමන් නිකමට වගේ ඈත තියෙන ෆෝන් ෂොප් එක දිහත් බැලුවෙ ඩයස් අයියා සිද්ධිය බලන් ඉන්නවද කියලා දැනගන්න. ඔව්... සමීප රූප රාමු නොපෙනනුනාට ෆෝන් ෂොප් එකට මෙතන කෙලින්ම පේනවා. ඩයස් අයියා ඈත ඉඳගෙනම තව ටිකක් ඉන්න කියලා අතින්ම මට සංඥාව දුන්නා. ඒත් කොහෙ ඉන්නද චූටිට ළංඋන සහන් මටවත් හිතාගන්න බැරි මොහොතක කෙල්ලගෙ උරහිසට අත තිබ්බනෙ. බස් හෝල්ට් එකේ හිටපු දෙතුන් දෙනෙක්වත් තල්ලු කරගෙන එතනට ළං උන මං කෙලින්ම අල්ලගත්තෙ සහන්ගෙ කොලර් එක.

" දැස්... උඹ... මෙතන ? "

මාව දැක්කා විතරයි සහන්ගෙ ඇස් දෙක ලොකු උනා. ඌ කීයටවත් හිතන්න නැතුව ඇති මං මේ වෙලාවෙ මෙතනට කඩන් පාත් වෙයි කියලා. අනික සහන්ට වඩා චූටි පුදුම වෙලා. පුදුම වෙලා කිව්වට කෙල්ල වැඩිපුරම බයවෙලා හිටියෙ.

" ඔව් ඇයි...? මං මෙතන ඉන්න එක උඹට ප්‍රශ්නයක්ද...?"

මං ඇහුවෙ ඌගෙ කොලර් එකෙන්ම ඇදලා ඌව ළඟට ගන්න ගමන්. මිනිහා ගස්සලා වගේ මගේ අත්දෙක තල්ලු කරන්න හැදුවෙ. ඒත් මං ඒකට ඉඩ දුන්නෙ නෑ. ඒ අතර තමයි චූටි ඇවිත් මගේ අතක එල්ලුනේ.

" අනේ අයියා... "





කෙල්ල හිටියෙ ඔන්න අඬන මෙන්න අඬන සයිස් එකක.

" චූටි... පැත්තකට වෙලා ඉන්නවා. මට මූත් එක්ක බේරගන්න දෙයක් තියෙනවා. "

" උඹයි මමයි මොනවා බේරගන්නද දැස්...? මේක මගෙයි චූටි නංගිගෙයි කතාවක්. උඹ ඒකට මැදිහත් නොවී පැත්තට වෙලා හිටපං... "

මෙන්න බලාපල්ලකො මේ ගඳයගෙ කතාව. ඌ චූටි එක්ක කතා කරනකල් මට පැත්තකට වෙලා ඉන්නලු.

" උඹට චූටිත් එක්ක කතාවක් නෑ සහන්. කරුණාකරලා මීට පස්සෙ මෙයාගෙ පස්සෙන් එන එක නතර කරපං... "

ඒක කිව්වා විතරයි සහන් ට්‍රයි කලේ මාව තල්ලු කරලා දාන්න. ඌ දඟලන අතරෙ මං මිනිහගෙ කොලර් එක විතරක් නෙමෙයි උගේ බෙල්ලත් ටිකක් විතර තද කළා.

" දැස්... මං මෙච්චර හරි ඉවසුවෙ උඹ මගේ මස්සිනා වෙන්න ඉන්න එකා නේද කියලා හිතලා. හොඳ හිතින් මාව අතෑරපං... එහෙම නොවුනොත් උඹට සෑහෙන පසුතැවෙන්න වෙයි. "

මගේ යක්සයා අසූ හාරදාහට නග්ගන කතාවක් කියලා සහන් හැදුවෙ පොර වෙන්න. ඌගෙ තාත්තා වගේම ඌත් හිතාගෙන ඇති මං අර බර කරත්තෙට කර ගහයි කියලා. හිතට ආපු තරහට මං ඌගෙ බෙල්ලට තියාගෙන හිටපු දකුණු අත මිට මොලවලා අරගෙන මිනිහගෙ මූණ මැදටම දීලා ඇරියා පැණි බේරෙන පාරක්. ඒත් ඊටපස්සෙ උනේ මං කීයටවත් බලාපොරොත්තු නොවුන දෙයක්. මගේ පාර කාගෙන සහන් බිමට පතබෑවෙද්දි

කවුදෝ මන්දා එකෙක් මගේ ඇස් දෙක නිලංකාර වෙලා යන තරමට මගේ ඔළුවට පාරක් ගැහුවා.

'' අනේ.... එපා.... අනේ දැස් අයියේ... ''

මාව බිම ඉන්දවෙද්දිම මට ඇහුනෙ චූටි මර ලතෝනි දෙන සද්දෙ. ඒත් චූටි දිහා බලන්න කලින් මං පිටිපස්ස හැරිලා බැලුවෙ මට ගහපු හයිරංකාරයා කවුද කියලා. ඒ වෙන කවුරුවත් නෙමෙයි... අපිව දවසක් ත්‍රීවිලර් එකේ දාගෙන ගිය සහන්ගෙ යාළුවා තිස්ස. ඒ අතරෙ සහනුත් මූණෙන් ලේ පෙරාගෙන නැගිටිනවා මට පෙනුණා.

'' උඹ හිතුවෙ උඹ හරි කෙරුමා කියලා නේද දැස්....? දැන් බලපං උඹටයි උඹලගෙ ඔය රූප සුන්දරීටයි වෙන දේ... ''

යාළුවා සපෝර්ට් එකට ආවා විතරයි නහයෙන් කටෙන් ලේ පෙර පෙර හිටපු සහන්ගෙ කටට ආයෙත් පණ ඇවිත්. මං අඩපණ උනොත් මුං දෙන්නා එකතු වෙලා චූටිට කරදරයක් කරයි කියලා හිතලා මම තප්පරේට දෙකට ආපහු නැගිටගත්තා. ඒ විතරක් නෙමෙයි ඒ නැගිට්ට සැනින්ම මගේ පිටිපස්සෙ හිටපු තිස්සට දුන්නා පයින් පාරක් මිනිහට 'ඌහ් ' ගාගෙන බිම වැටෙන්න.

තමන්ගෙ උදව්වට ආපු යාළුවට වෙච්ච ආනිසංශෙ දැකලා සහන් පිටිපස්සෙන් ඇවිත් මගේ ඇඟට පැන්නෙ හරියට ගෝරිල්ලෙක් වගේ. සහන්ට සද්දන්ත ඇඟක් තිබුණු නිසා ඌ පැනපු පැනිල්ලට මට බැලන්ස් නැතුව ගිහින් අපි දෙන්නම බිම පෙරළුණා. එතනින් එහා ගුටි කෙළිය ගියේ බිම පෙරළි පෙරළි. බිම පෙරලෙන අතරෙත් මං කළේ සහන්ගෙ මූණටම නෙලපු එක තමයි. කොහොමහරි මගේ එක පාරකට ඌගෙ නාස් පොල්ල කැඩිලද මන්දා මිනිහා මොහොතකට ගේම නතර කළා. බිම





පෙරළිලා හිටපු මට නැගිටගන්න ඒ වෙලාව ඉහටත් උඩින්. මම නැගිටිද්දි මේං තිස්සයා ආපහු මගේ ඉස්සරහා දිලිසි දිලිසි ඉන්නවා. සහන් කියන හේර කඳයා මෙල්ල කරපු මට මූත් මහලොකු කජ්ජක්ද...? මං ලෑස්ති උනේ තිස්සව දෙවෙනි පාරටත් සහන් ළඟින් දොයි කරවන්න.

ඒත් එක්කමයි මං දැක්කෙ නැගිටලා හිටපු තිස්ස ආයෙත් මගේ කකුල් දෙක ඉස්සරහා ඇදගෙන වැටෙනවා. ඒ පාර ඌට මොකද උනේ.

'' අයියේ... ඔයාට කරදරයක් නෑ නේද...? ''

අඩේ... ඒ විනෝද්නෙ. ඒ කියන්නෙ තිස්සට දෙවෙනි පාර ඇදගෙන වැටෙන්න ගහලා තියෙන්නෙ ඌද...? මං විනෝදට ෆිට් එකක් දාලා ආයෙත් ගේමට බැස්සා. මට ඕන උනේ හන්දියෙ ඉන්න කැඩුම් බිඳුම් වෙද මහත්තයට කස්ටමර් කෙනෙක් අල්ලලා දෙන්න.

සහනුත් ලේසියෙන් ගේම අතාරින එකෙක් නෙමෙයි වගේ. ඌ ආපහු ලේ පෙරාගෙනම නැගිටලා. හරියට හින්දි ෆිල්ම් එකක වගේ. මමත් අඩියක් දෙකක් මිනිහට කිට්ටු කළා. මිනිහගෙ ඇස් ගින්දර පිටවෙන තරමට වියරු වැටිලා තිබුණෙ. මං අත උස්සන්න හද්දිම මගේ ඔළුවට උඩින් ආපු කළු අතක් මටත් කලින් ඉස්සර වෙලා සහන්ගෙ මූණෙ වැදුනා. ඒ පාරනං ආයෙ කතා දෙකක් නෑ මගේ ෂොට් එකටත් වඩා පවර්ෆුල්.

'' දීපං මල්ලි මුන්ට ආයෙ මේ වගේ කුපාඩි වැඩ නොකරන්න... ''

ෂෙහ්.... මේ අපේ ඩයස් අයියනෙ. එයා ෂොප් එකත් දාලා අපේ සපෝර්ට් එකට දුවගෙන ඇවිත්. කොහොමහරි මමයි

විනෝද්දුයි ඩයස් අයියයි තුන්දෙනාම එකතු වෙලා සහන්ටයි ඌගෙ යාළුවටයි ඇති තරම් සැලකුවා. වැඩිපුරම මගේ ජම් එක උනේ සහන්. මිනිහා කොයි තරම් හයේ හතරෙ පොරක් උනත් වැඩක් නෑ. විනාඩි දෙකෙන් අඩපණ වෙලා ඉවරයි. ඒ නිසා මගේ වැඩේ වැඩිය අමාරු උනේ නෑ. මං ඌට ගැහුවෙ ආයෙ චූටි පස්සෙන් එන්න නෙමෙයි චූටි ඉන්න පැත්ත හැරිලා නිදියන්නෙවත් හිතෙන්නෙ නැති වෙන්න.

'' අනේ ඔය ඇති අයියෙ... ඕක නවත්තන්නකො... ''

චූටි ආයෙත් සැරයක් මගේ අතින් අදිද්දි තමයි මං පියවි සිහියට ආවෙ.

'' ඔව් මල්ලි... මූං දෙන්නා ආයෙ ලැජ්ජ තියෙනවානං මේ වගේ වැඩ කරන එකක් නෑ. ''

අපි අත් දෙක එකට හප්පලා දූවිලි පිහදාගන්න ටයිප් එකෙන් අත් ගසලා දාපු ඩයස් අයියත් ගේම ෆිනිෂ් කළා.

'' ඔයි... කෙල්ලො පස්සෙන් ගියාට කමක් නෑ... ඒත් මීට පස්සෙවත් තොපිලගෙ වයසට ගැලපෙන කෙල්ලො පස්සෙ පලයං... තොපිලගෙ ඔය ඇඟේපතේ අමාරුකම් ඇරගන්න මේ ඉස්කෝලෙ යන පොඩි එවුන් අල්ලගන්නෙ නැතුව. ''

එතනින් පිටවෙන්න කලින් ඔළුවවත් උස්සගන්න බැරුව හිටපු සහන්ට වෝනිත් එකක් දෙන්නත් ඩයස් අයියා අමතක කළේ නෑ.

හැමදේම විනාඩි ගාණක් ඇතුළත ඉවර කරපු අපි බස් ස්ටෑන්ඩ් එකෙන් පිටවෙන්න හදද්දි තමයි මං දැක්කෙ වටවෙලා ඉන්න සෙනඟ කන්දරාව. කතන්දරේ තව ඇදෙන්න කලින් මං





චූටිවත් ඇදගෙන ඒ සෙනඟ අතරින් ඩයස් අයියගෙ කඩේ ළඟට ගියා. විනෝද් වගේම ඩයස් අයියත් අපි දෙන්නා පස්සෙන් ආවෙ හරියට පන්සල් ගිහින් එන සද්ගුණවත් උපාසකයො වගේ.

'' චූට්ටෙ... අර හෝල්ට් එක ළඟ තියෙන දැස් මහත්තයගෙ බයික් එක ගෙනත් මේ ඉස්සරහෙන් දාපං... ''

කඩේට පය තිබ්බ සැණින් ඩයස් අයියා කළේ කඩේ හිටපු කොල්ලට නියෝගයක් දීපු එක. ඒක හොඳ දෙයක් කියලා මටත් හිතුණෙ සහන්ලගෙ තව යාළුවො එහෙම හිටියොත් බයික් එක උස්සයි කියලා හිතුන නිසා.

'' මොකද කියන්නෙ... මල්ලිලා මෙතන ඉඳලම වෝකට බහිනවද නැත්තං වෙන කොහෙටහරි යනවද...? ''

අපේ චූටිගෙයි විනෝද්ගෙයි මූණු වල ප්‍රශ්න පත්තරයක් තියෙනවා දැකලද මන්දා ඩයස් අයියා ඒක ඇහුවෙ හිනාවෙන ගමන්.

මටයි විනෝද්ටයි නම් මේ ෂොප් එක පිටිපස්සට උනත් ගිහින් කතා කරන්න පුළුවන්. ඒත් අපේ චූටිට ඒ තැන සුදුසු නෑ. ඉතිං කෙල්ල ගැන හිතලා මං එහා පැත්තෙ තිබුණු රාමසිංහ එකට යන්න තීරණේ කළා.

'' උඹ ඔය ඇඳුම ඇඳගෙන තැනකට යන්නෙ කොහොමද මල්ලී... මං අහන්නෙ අඩු තරමෙ ගෙදරටවත්...? ''

අපි තුන්දෙනා කඩෙන් එළියට එන්න හද්දි ඩයස් අයියා කියපු කතාවට තමයි මට මගේ ඇඳුම දිහා බැලුනෙ. කිව්වත් වගේ ඒක දූවිලි වලින් වැනසිලා. ඒ මදිවට අර කාලකණ්ණියගෙ ලේ ඇගේ හැමතැනම.

'' අවුලක් නෑ... අයියා මගේ ටී ෂර්ට් එක දාගන්න. මේක ඔය තරම් අප්සෙට් නෑ... ''

මාව බේරගන්න ඉදිරිපත් උනේ විනෝද්.

'' එතකොට මල්ලිට අවුලක් වෙයිනෙ... ''

'' නෑ අයියෙ... මේ වෙලාවට අපේ ගෙදර කවුරුවත් නෑ. මට ගිහින් ෂේප් එකක් දාගන්න පුළුවන්. ''

ඊට පස්සෙ අපි දෙන්නා ෆෝන් ෂොප් එකේම පිටිපස්සට ගිහින් ටී ෂර්ට් දෙක මාරු කරගෙන එළියට බැස්සා.

'' අනේ ඔයාට තුවාලයි දැස් අයියෙ... මේ බලන්න... ලේත් එනවා... ''

රාමසිංහ එකේ ඇතුළෙම තිබුණු මේසෙක ඉඳගත්තට පස්සෙ චූටි මගේ අතක් බදාගත්තෙ විනෝද් ඉස්සරහදිමයි.

'' මට විතරක් නෙමෙයි... පේන්නෙ නැද්ද විනෝද්ටත් තුවාලයි කියලා...? මේ සේරම උනේ ඔයාගෙ හිතුවක්කාරකම් නිසා චූටි... ''

මගේ කතාවට චූටි බයවෙලා වගේ මගේ අත අතෑරියා.

'' මං නිසා...? ඒ කොහොමද...? ''

'' ඔව්... ඔයා නිසා තමයි. අර රස්තියාදුකාරයා ඔයාගෙ පස්සෙන් එනවා කියලා ඇයි අපිට කලින් නොකිව්වෙ...? ඌගෙන් කරදරයි කියලා ඔයා නිකමටවත් කලින් කියලා තිබුණානං අද මෙහෙම දෙයක් සිද්ධ වෙන්නෙ නෑ. ''

ඒකට චූටි දෙන උත්තරේ මොකක්ද කියලා දැනගන්න වගේ විනෝද් චූටිගෙ මූණ දිහාම බලාගෙන හිටියා.

'' අනේ ඉතිං... කියන්න තරම් දෙයක් උනේ නෑ අයියෙ...''





'' කියන්න තරම් දෙයක් උනේ නෑ. එතකොට අරූ දවස් ගාණක් තමුසෙගෙ පස්සෙන් ආවෙ නැද්ද...? තමුසෙ ඊට කලින් ඔය බස් හෝල්ට් එකේම ඉඳගෙන ඌට බැන්නෙ නැද්ද...? ''

'' ඔ... ඔයා... කොහොමද ඔය තරම් දේවල් දැනගත්තෙ දැස් අයියෙ...? ''

චූටි ඒක ඇහුවෙ අඬන්න ඔන්න මෙන්න සයිස් එකකින්.

'' ඔය තරම් දේවල් නෙමෙයි... මං ඔයිට වඩා දේවලුත් දන්නවා. තමුසෙගෙ ඔය පණ්ඩිතකම් නිසා වෙන්න ගිය දේවල් තමුසෙවත් දන්නෙ නෑ. ''

මගේ සද්දෙ ටිකෙන් ටික ඕවර් යද්දි විනෝද් හෙමීට මගේ අත අල්ලගත්තා. හිතට ආපු තරහට අපි ගාව තව පිට මනුස්සයෙකුත් ඉන්නවා නේද කියන එක මට ඇත්තටම අමතක වෙලයි තිබුණෙ.

'' අනේ මට ඔහොම කතා කරන්න එපා අයියෙ... මට දුකයි... ''

චූටි කිව්වෙ එයාගෙ මල් වැටුණු පුංචි ලේන්සුව ඇස් දෙකට තියලා තද කරගන්න ගමන්.

'' දන්නවද අර සහන් කියන බල්ලා තමුන්ගෙ පස්සෙන් ඔත්තුකාරයො දාලා තිබුණා කියලා. දන්නවද උන් ඔයා යන එන තැන් ගැන නෝට් කළා කියලා. ''

'' මොනවා...? ''

බිම බලාගෙන හිටපු කෙල්ලගෙ ඇස් දෙක එක පාරට ලොකු උනේ මං කියපු කතාව විශ්වාස කරන්න බෑ කියන්න වගේ.

" ඔව්... ඔයා නිතරම වගේ ටවුන් එකේ කැරකෙනවා කියලා... වීදියවත්ත පැත්තෙ රවුම් ගහනවා කියලා ත්‍රීවිල් පාක් එකේ සමහරු දැනගෙන හිටියා. උන් දන්නවා කියන්නෙ ඒ දේවල් සහනුත් දන්නවා කියන එක. පන්ති යනවා කියලා ගෙදරට බොරු කියලා ඔහොම ගියපු දවසක අරුන් ටික ගේමට බැස්සානං චූටි දන්නවද ඔයාගෙ අයියයි මමයි නවතින්නෙ කොහෙන්ද කියලා....? එල්ලුම් ගහෙන්... "

චූටි නහය උඩට අදින ගමන්ම එයාගෙ දකුණු අත මගේ අත උඩින් තියාගත්තා.

" අයියා ඔය සිද්ධිය මට කියපු දා ඉඳලා මමත් හොඳ සෙවිල්ලෙන් තමයි හිටියෙ. අද උනත් මං මේ වෙලාවට ටවුන් එකට ආවෙ රශ්මි එනවා කියලා දන්න නිසා... "

විනෝද් ඒ කිව්වට මූ ඇත්තටම ආවෙ චූටිව ආරක්‍ෂා කරන අරමුණෙන්ද එහෙමත් නැත්තං මේ සුදු මූණු පොඩ්ඩ දැකගන්න අරමුණෙන්ද කියලා කවුද දන්නෙ.

" ඒ කියන්නෙ මේ කතාව ඔයත් දැනගෙන හිටියද විනෝද්...? "

" ඔව්... මටත් කිව්වෙ දෑස් අයියා තමයි... "

" එතකොට ඔයාලා මීට කලින් මුණ ගැහිලා කතා කරලා තියෙනවද...? "

ඔන්න දැන් අපේ සාකච්ඡාව වෙන පැත්තකට හැරීගෙන යන්නයි හදන්නෙ.

" ඒක මෙතනට අදාල නෑ චූටි. මට මුලින්ම කියනවා ඇයි අපිට මේ ගැන නොකිව්වෙ කියලා...? "





" මේ ගැන කිව්වෙ...? "

ඔකනෙ අප්පා මේ කෙල්ලත් එක්ක බැරි ඉතිං. මෙච්චර ලස්සනට පැහැදිලිව සිද්ධිය විස්තර කරලා ප්‍රශ්නයක් අහපුවම බබා වෙන්න හදනවා.

" මං අහන්නෙ අර බෝස්තිං ගැන... "

" ඔයාලා ඒ ගැන දැනගත්තොත් ප්‍රශ්න ඇති වෙයි කියලා බය හිතුණා. අනික දෑස් අයියෙ ඔයා කිව්වා වගේ ත්‍රීවිල්කාරයො මාව ෆලෝ කළා කියලා මං දැනන් හිටියෙ නෑ. "

කෙල්ල කතා කරන අතරෙ එයාගෙ අත ටිකෙන් ටික මගේ තුවාල වෙලා තියෙන වැලමිට හරියට ඇදීගෙන ආවා.

" සහන් ඔයාව හම්බවෙන වෙලාවල් වල මොනවද කිව්වෙ...? "

" එයා කියනවා මේ... එක්කො ඕනෙ නෑ අයියෙ. ඒවා මහ පිස්සු කතා... "

" චූටි මේ.... මගේ යකා අවුස්සන්නෙ නැතුව දැන්වත් වෙච්ච දේ කියනවද...? "

මගේ කතාවට ගැස්සුණු කෙල්ල එක පාරටම මගේ අත තද කළා.

" ඌයි... "

මං අත ඇදලා ගත්තෙ වැලමිට හරියෙන් ලොකු කැක්කුමක් ආව නිසා.

" ඕකටනං බෙහෙත් ටිකක් දාගන්න වෙයි අයියෙ. මං හිතන්නෙ ඔයාගෙ ඔළුවත් ඩැමේජ් ඇති. මං එතනට එද්දිම දැක්කනෙ අරූ දීපු පාර. "

අපිට නිදහසේ කතා කරන්න ඉඩ දීපු විනෝද් ඒ වෙලාවෙනං කට වහගෙන හිටියෙ නෑ.

'' බෙහෙත් දාගමු මල්ලි. ඒත් මෙයාගෙ කතාව අහලා ඉවර වෙලා... ''

මං චූටිව පෙන්නලා කිව්වෙ කෙල්ල ඒකට උත්තර දෙන එක අමතක කරලා දායි කියලා හිතුන නිසා. ටික වෙලාවක් මගේ ඇස් දෙක දිහා හරි කෙලින් බලාගෙන හිටපු චූටි අමාරුවෙන් කතාව පටන් ගත්තා.

'' සහන් අයියා මේ විදියට මගේ පස්සෙන් එන්න අරන් දැන් මාසයක් දෙකක් විතර වෙනවා. මුලදිනං ඈතින් පේන්න ඉඳලා ගියා විතරයි. පස්සෙ තමයි මං ළඟට ඇවිත් කතා කරන්න ගත්තෙ. එයා කියනවා අපේ පවුල් දෙක ඒ කාලෙ ඉඳලා දන්න නිසා අපේ දෙමව්පියො කැමතිලු අපි නෑදෑයො වෙනවට. තව... තව.... එයා කිව්වා... ''

'' ඔව් තව...? ''

'' තව කිව්වා දෑස් අයියෙ... ඔයත් මේසනා අක්කට කැමැත්ත දීලලු තියෙන්නෙ. ඒ කසාදෙත් වැඩිකල් නොගිහින් කෙරෙයිලු... ඊට පස්සෙ ඉතිං සහන් අයියගෙ කසාදෙ තමයිලු... ''

චූටි ඒ ටික කිව්වෙ වැරදිලාවත් මගේ දිහා බලන්නෙ නැතුව. ඒකෙන් තේරෙන්නෙ කෙල්ල සහන්ගෙ කතාව විශ්වාස කරලා කියන එක තමයි. මං විනෝද් දිහා බලලා ඇහැකුත් ගහලා චූටිව පෙන්නුවා.

'' කියන්නකො රශ්මි... ඊට පස්සෙ...? ''

'' ඊට පස්සෙ මං ඇහුවා සහන් අයියට අපේ පවුලට





සම්බන්ධ වෙන්න ඕනෙනං මං මොකටද අපේ අක්කා ඉන්නෙ කියලා. ඒ පාර එයා කියනවා අක්කා මං වගේ නෙමෙයිලු... අක්කා සැර නිසා එයාට ගැලපෙන්නෙ නැලු. එයාට හරියන්නෙ මං වගේ චූටි කෙල්ලෙක්ලු.... ''

හ්ම්.... ඒකත් එහෙමද? ඒ කියන්නෙ සහන් අපේ අක්කණ්ඩි ගැනත් යමක් කමක් දන්නවා. ඌ චූට්ට දාපු පාට් අපේ අක්කට එහෙම දාලා තිබුණනං අපි විස්තරේ දැනගන්නෙ සහන්ව හොස්පිට්ල් ඇඩ්මිට් කළාට පස්සෙ.

'' ඔයා ඉතිං මොනවද ඒ මනුස්සයට කිව්වෙ...? ''

විනෝද් ආපහු ප්‍රශ්නයක් ඇහුවා.

'' මං කිව්වා මං එයාට කැමති නෑ කියලා. ඊට පස්සෙ තමයි කල්පනා කරලා බලලා උත්තරයක් දෙන්න කිය කිය මගේ පස්සෙන් ආවෙ. ''

'' හරි එහෙනං... සහන් ආයෙත් ක්‍රියාත්මක උනොත් කරන්න ඕනෙ මොනවද කියලා අපි දෙවනුව හිතමුකො... හැබැයි චූටි ආයෙනං අපිට මුකුත් හංගන්න හදන්න එපා. මට කියන්න බැරි දෙයක් තියෙනවානං මේ විනෝද්ට හරි කියන්න. තේරුණානෙ. ආ... තව දෙයක්. අද වෙච්ච දේ ගැන මුකුත්ම ගෙදර ගිහින් කාටවත් කියන්න එපා. එහෙම උනොත් අන්තිමේ තාත්තලත් මේවට පැටලෙයි... ''

'' අඩු තරමෙ අපේ අයියටවත්...? ''

කෙල්ල ඒහෙම අහන්න ඇත්තෙ මගෙයි ගිවාගෙයි අතර රහස් නෑ කියලා දන්න නිසා වෙන්න ඇති.

'' අයියා දැනගන්න දවසක දැනගත්තාවෙ. දැන්ම මේක

එයාට කියන්න එපා. මොකද එහෙම උනොත් ඌ මීට වඩා ලොකු දේකට පැටලෙන්න පුළුවන්. මොකද ඉතිං මටත් වඩා ඔයා ගැන අයිතිවාසිකම් තියෙන්නෙ එයාටනෙ. නේද...? ''

මං ඒ ප්‍රශ්නෙ ඇහුවෙ චූටිගෙ ඇස් දෙක දිහා බලාගෙන. ඒකට දෙන්න ඕන උත්තරේ මොකක්ද කියලා දන්නෑ වගේ කෙල්ල ලස්සන හිනාවක් දාලා මගේ දිහා බැලුවා. එයා හරිනං ඒ හිනාව දාන්න ඕන මට නෙමෙයි විනෝද්ට.

'' අපි වැඩි වෙලා මෙතන ඉන්න එක හොඳ නෑ නේද අයියෙ... ඔයාලා දැන් ගෙදර යන්න. අපි වෙන දවසක හම්බවෙලා වැඩි විස්තර කතා කරමු. ''

විනෝද් ඒ කියපු කතාවනං සහතික ඇත්ත. අපි ගෙදර යන්න පරක්කු උනොත් අම්මලා අපිව හොයන්න ගනියි. එහෙම උනොත් වෙන්නෙ මේ වෙච්ච දේවල් නිකම්ම එයාලගෙ කනටත් යන එක.

'' අපි බෙහෙත් දාගෙනම යමු දැස් අයියෙ...''

රාමසිංහ එකෙන් එළියට ආවා විතරයි චූටි නහයෙන් අඬන්න ගත්තෙ හරියට එයාව තුවාල වෙලා වගේ. මේවට බෙහෙත් දාගෙන ගියොත් කතන්දර ගොඩයි.

'' බෙහෙත් ඕන නෑ හලෝ. ගෙදර ගිහින් පොඩි ප්ලාස්ටරයක් දාගත්තම හරි. ''

මං එහෙම කිව්වට වැලමිටේ තිබුණෙ පොඩි ප්ලාස්ටරයක් දාන තරමෙ තුවාලයක් නෙමෙයි. එතන අඟල් තුනක් විතර දිගට ගැඹුරට හීරිලා. අත් දෙකේ ඇඟිලි වලත් පොඩි පොඩි තුවාල. හොඳ වෙලාවට ඩෙනිම ඇඳන් හිටපු නිසා කකුල් දෙකටනං





ඩැමේජස් අඩුයි.

'' මේ තුවාලෙ ගොඩක් ලොකුයි අයියෙ. බෙහෙත් නොදැම්මොත් මේක පැසවයි... ''

'' මේක එච්චර ගණන් ගන්න එපා බබා. ආයෙ මේ අයියට තුවාල සිද්ධ නොවෙන විදියට වැඩ කරන්නකො. ඒ ඇති...''

කෙල්ලගෙ කම්මුලට තට්ටුවකුත් දාලා එයාව බයික් එකට නග්ගගත්තට මං ලොකු මාමලගෙ ගෙදරටම ගියේ නෑ. ඇයි ඉතිං මං මෙහෙම දූවිලි පෙරාගෙන ඉන්නවා රුවන්ති නැන්දා එහෙම දැක්කොත් ප්‍රශ්න කෝටියයිනෙ. ඒ නිසා පළවෙනි පටුමග ළඟින් චූටිව බස්සලා මං ගෙදර ගියා.

ගෙදර ගියා කිව්වට මං ගියේ වෙනදා යන විදියට නෙමෙයි. අපේ ගේ කිට්ටුවෙන් බයික් එකෙන් බැහැලා ඒක සද්දෙ ඇහෙන්නෙ නැති විදියට වත්තට තල්ලු කරගෙන ගියා. හොඳ වෙලාවට බලු බල්ලෙක් පේන්න නෑ. ඊටපස්සෙ ඉතිං මගේ විකල්ප මාර්ගය ඔස්සේ කෙලින්ම මං හිටියෙ කාමරේ ඇතුළෙ.

විනෝද්ගෙ ටී ෂර්ට් එකත් ගලවලා ඇඳ යටට දාලා තප්පරේට දෙකට ටවල් එකට මාරු උන මං වෙඩිල්ල වගේ උඩ තට්ටුවෙ බාත් රූම් එකට දිව්වා.

හරි... දැන් ඉතිං මං ෂේප්. මේ ඔළුවෙ ඉඳලා නැවිලා තියෙන දූවිලි ටික හෝද ගත්තම කවුද දන්නෙ මං වලියක් දාගෙන ගෙදර ආපු පොරක් කියලා.

* * * * * * *

# 13

වෙච්ච සිද්ධිය කාටවත් කියන්නෙ නැතුව ලෝඩ් වගේ ඉන්න හැදුවට හවස් වෙද්දිනං මගේ ඔළුව පැලෙන්න වගේ කැක්කුමක් ආවා. අර තිස්ස කියන හෙන්චයියා මගේ ඔළුවට මොකකින් ගැහුවද මන්දා... එතන තුවාලත් වෙලා. ඒ මදිවට හොඳටම ගෙඩි ගැහිලා.

අත් දෙකෙත් වැලමිටෙන් පහළ හීරිලා නිසා මං අත් දිග ටී ෂර්ට් එකක් ඇඳගෙන ඇඳට වැටුණා. මට ඇගේ අමාරුවට දන්නෙම නැතුව නින්ද ගිහින්.

'' දැස් අයියේ... ''

මං ඇහැරුණේ චූටිගෙ සද්දෙට. කෙල්ල මේ වෙලාවෙ මෙහෙ ආවෙ කොහොමද කියලා මට හිතා ගන්න බැරි උනා.

'' චූටි ඔයා... ''

මං ඇහුවෙ අමාරුවෙන් ඔළුව උස්සන ගමන්.

'' අනේ රත්තරං අයියෙ... මං කිව්වනෙ බෙහෙත් ටිකක් දාගෙන එමු කියලා. කෝ ඔයා කිව්වට ඇහුවෙ නෑනෙ.''





චූටිගෙ හිතේ මං කෙඳිරි ගාන්නෙ වැලමිටේ තුවාලෙ නිසා කියලා. ඒකත් ඇවිල්ලයි තමයි. ඒත් ඉස්කෝලෙ යන කාලෙ ඉඳලා ඉල්ලගෙනත් වලි දාගත්තු අපිට ඒක එච්චර ලොකු තුවලායක් නෙමෙයි.

'' තුවාලෙනං ගාණක් නෑ බබා. ඔළුව ටිකක් රිදෙනවා...''

'' අනේ.... අර පෝරිසාද මිනිහා ඔයාගෙ ඔළුවට ගැහුවෙ පොලු කෑල්ලකින් නේද...? මට ඒක අමතක උනානෙ... කෝ එන්න බලන්න... ''

චූටි මගේ ඇඳේ කොණකින් ඉඳගත්තා විතරයි මං මගේ ඔළුව එයාගෙ ඔඩොක්කුවෙන් තියා ගත්තා.

'' අම්මෝ... අයියෙ.... ඔයාගෙ ඔළුව තුවාල වෙලානෙ. මේ... හොඳටම ගෙඩිත් ගැහිලා. ''

තුවාලෙ කොයි තරම් රිදි රිදී තිබුණත් චූටි එයාගෙ සිනිඳු ඇඟිලි තුඩු වලින් ඔළුව අතගාද්දිනං දැණුනෙ පුදුම තරම් සනීපයක්.

'' ඔයා ආවෙ තනියමද චූටි...? අපේ අම්මලා පහළ පේන්න හිටියෙ නැද්ද...? ''

මං ඇහුවෙ අපේ කතාවට කාගෙන්වත් බාධාවක් ආවෙ නැති නිසා.

'' මං මෙහෙ එන්න විදියක් නැතුව හිටියෙ. අයියට කිව්වනං එන්න තිබ්බා. ඒත් එහෙම උනානං අද සිද්ධිය එයාටත් කියන්න වෙනවනෙ. හොඳ වෙලාවට කල්පනා කර කර ඉද්දි මංගලා නැන්දයි ආච්චියි සුදූයි අපේ දිහා ආවා. ''

'' මොනවා... එතකොට දැන් ඔයා එද්දි මේ ගෙදර හිටියෙ මං විතරද...? ''

මං එහෙම ඇහුවෙ ඒ කියපු තුන්දෙනාට අමතරව ගෙදර අනිත් සාමාජිකයො උන තාත්තයි අක්කයි චූටි මාමයි තුන් දෙනාම වැඩට ගිහින් හිටපු නිසා. එයාලා ගෙදර එන්නෙ හය හමාර හත විතර වෙලානෙ. එතකොට නිදාගෙන හිටපු මාව තනියම ගෙදර දාලා දොරවල් වහලා මෙයාලා යන්න ගිහින්.

'' මට සමාවෙන්න දැස් අයියෙ... ''

මගේ ප්‍රශ්නෙට උත්තර දෙනවා වෙනුවට මගෙන් සමාව ඉල්ලපු චූටි හිතපු නැති වෙලාවක මගේ ඔළුව ඉම්බා.

'' බබා... ඇයි මේ...? ''

මං හිතුවෙ චූටි සමාව ඉල්ලුවෙ මට මේ වෙච්ච දේට එයා වගකියන්න ඕන වගේ හැඟීමක් හිතට දැනුණු නිසා වෙන්නැති කියලා.

'' මට මේ සිද්ධිය තිලකාච්චිට කියන්න උනා අයියෙ...''

අප්පට සිරි... ඔය තියෙන්නෙ ගම කාලා. දැන් ඉතිං මං ගෙදර ඉඳලා හමාරයි.

'' කලබල වෙන්න එපා. ආච්චි කාටවත් කියන්නෙ නෑ. මං එහෙම කිව්වෙ මට ආච්චි එක්ක ඇවිත් ඔයාව බලලා යන්න පුළුවන් නිසයි... ''

'' ඒත් ඔයා අපේ පොරොන්දුව කඩ කළානෙ නංගි බබෝ... ''

'' එකට තමයි මං මුලින්ම සමාවෙන්න කියලා කිව්වෙ.''

'' ඔයාලා මොනවා කියලද මෙහෙ ආවෙ...? දැන් කෝ ආච්චි...? ''

'' මංගලා නැන්දා කිව්වා මේ ටිකේම ඔයත් වැඩට ගිය





නිසාද මන්දා අද නිදා ගත්තා කියලා. අපේ අයියත් දවල් වරුවම ගෙදරට වෙලා නිදි නිසා අපේ අම්මලට ඒක විශේෂයක් උනේ නෑ. ''

'' ඉතිං...? ''

'' ගෙදරත් හරි පාළුයි කියලා දැන් පැය භාගෙකට විතර කලින් තමයි නැන්දලා එහෙ ආවෙ. ඉතිං මං ආච්චිට දවල් වෙච්ච සිද්ධිය කියලා මට ඔයාව බලන්න එන්න ඕනෙ කිව්වා.... දන්නවනෙ ඉතිං අපේ ආච්චිගෙ වැඩ. මං ඒක කිව්වා විතරයි ආච්චි කිව්වනෙ කොල්ලත් නිදි එකේ ගෙදර පාළුවට අරින්න බෑ එයාට ගෙදර යන්න ඕනෙ කියලා. ''

'' නෑ... ''

'' ඒකනෙ... නැන්දටත් හරි පුදුමයි. මොකද ආච්චිමලු දවල් ඉඳලා කිය කිය හිටියෙ සමරෙලගෙ දිහා දවස් ගාණකින් යන්න බැරි උනා කියලා. ''

'' ඔයත් ඉතිං හොරා වගේ ආච්චිගෙ තනියට ආවා නේද...?''

චූටි කියපු කතාව අහගෙන ඉඳලා මං එහෙම ඇහුවෙ හිනා වෙවී. ඒත් කෙල්ල ඒක විහිළුවකට ගත්තෙ නැති පාටයි. එයා හෙන සීරියස් ලුක් එකකින් මගේ දිහා බලාගෙන හිටියා.

'' මං ආවෙ ආච්චිගෙ තනියට නෙමෙයි අයියෙ... ඔයාගෙ තනියට... ''

චූටි ඒක කියද්දි මෙච්චර වෙලා මගේ ඔළුවෙ එහාට මෙහාට දුවපු පුංචි ඇඟිලි තුඩු එක තැනක නතර උනා.

'' චූටි නංගි.... ''

" මං නිසා ඔයාට මේ වෙච්ච දේට මං මේ පැය කීපෙ ඇතුළත විඳවපු තරම ඔයා දන්නවද අයියෙ...? "

මං චූටිගෙ ඔඩොක්කුවෙ ඉඳලම ඇස් දෙක ඉස්සුවෙ කෙල්ලගෙ කටහඬ සැහෙන්න වෙනස් වෙලා කියලා දැනුණු නිසා. එතකොටම සීතල කඳුළක් මගේ කම්මුලකට වැටුණා.

" බබා.... ඔයා අඬනවද...? "

" අඬන්නෙ නැතුව මං වෙන මොනවා කරන්නද...? "

" ඔයා දන්නවද ඔයා අඬද්දි මගේ ඔළුව රිදෙනවට වඩා හිත රිදෙනවා කියලා...? "

මං ඇහුවෙ මගේ ඔළුව උඩ නතර වෙලා තිබුණු පුංචි අතක් අල්ලගන්න ගමන්.

" ඔය ඇත්තමද...? "

මං ඔළුවෙන්ම ඒකට උත්තර දුන්නා.

" එතකොට අංජු...? "

චූටි අහපු ඒ ප්‍රශ්නෙ නිසා මට දැනුණෙ මෙච්චර වෙලා අපි අතර ඇතිඋන සංවේදී කතාබහ මැද්දට අකුණක් පිපිරුවා වගේ හැඟීමක්. ඇත්තටම ඒ මොහොතෙ අංජු මගේ මතක පථයෙ කොණකවත් හිටියෙ නෑ.

" අයියෙ...? "

" ඔයා ඇයි චූටි ඒ වගේ ප්‍රශ්නයක් ඇහුවෙ...? "

" අයියා අංජුට ආදරේ නිසා.. "

" ඔයා කොහොමද දන්නෙ...? "

මගේ ප්‍රශ්නෙට චූටිගෙන් පිටඋනේ දිගම දිග හුස්මක්





විතරයි. සමහරවිට අංජු අපේ කතාව චූටිට කියලා ඇති. මොකද ඉතිං දෙන්නා හොඳ යාළුවොනෙ.

" ඔයා අංජුට කැමති නැද්ද නංගි...? "

" කැමතියි... ගොඩක් කැමතියි... "

මට හිත හදාගන්න ඒ උත්තරේ හොඳටම සෑහුණා.

" අංජු කැමති වෙන එකක් නෑ මං අයියව මේ විදියට ආශ්‍රය කරනවට..."

" අංජු එහෙම කෙනෙක් නෙමෙයි... එයා ලස්සන අදහස් තියෙන ගොඩක් හොඳ තේරුම් ගැනීමක් තියෙන කෙල්ලෙක්..."

ෆේස් බුක් එකෙන් ඇරෙන්න කවදාවත් නිදහසේ මුණ ගැහිලා කතා නොකරපු අංජු ගැන මං රෙකමන්ඩේශන් එකක් දුන්නා.

" අහන්නෙ නැද්ද මං කොහොමද ඔයයි අංජුයි ගැන දන්නෙ කියලා...? "

" අහන්න ඕන නෑ. මං දන්නවා ඔය දෙන්නා හොඳ යාළුවො කියලා. අංජු ඔයාට විස්තර කියලා ඇති... "

චූටි ගොඩක් වෙලාවකට පස්සෙ ලස්සනට හිනා උනා. ඒ හිනාව දකිද්දිනං මට හිතුනෙ චූටිව තුරුල් කරගෙන ඉඹින්න.

" චූටි පුතේ... චූටි පුතේ... "

ලස්සන පුංචි කෙල්ලෙක් එක්ක කාමරේක තනියම ඉද්දි ලස්සන සිතුවිල්ලක් පහළ උනා විතරයි අපේ ආච්චි හෙනහුරා වගේ එතනට කඩන් පාත් උනා. අච්චිගෙ කටහඬ ඇහුණා විතරයි කෙල්ල මගේ ඔළුව ප්‍රවේශමට කොට්ටෙ උඩින් තියලා නැගිටලත් ඉවරයි.

" කෝ වරෙං ඔය ඇඟපත ඩිංගක් තවන්න. නැත්තං හෙට වෙද්දි උණ ගන්න බලයි... "

ආච්චි කාමරේට ආවෙ උණු වතුර බේසමකුයි පොඩි ටවල් එකකුයි අරගෙන.

මොන තරම් පිස්සු වැඩ කළත් අපේ ආච්චි ගැන මාරම ආදරයක් දැනෙන්නෙ එයා කරන මේ වැඩ නිසා තමයි. අපේ අම්මා මේ දේ දැනගත්තනං මුලින්ම කරන්නෙ මට බනින එක. දෙවනුවට අපේ තාත්තට කියන එක. අන්තිමට තමයි එයාට මතක් වෙන්නෙ මූට තුවාලයක්වත් වෙලාද බලන්න ඕනෙ කියලා. ඒ අතින් බලද්දි අපේ ආච්චි කොයි තරම් හොඳද.

" දෙන්න ආච්චියෙ මං තවන්නං. ආච්චි පුළුවන්නං අර වෙනිවැල්ගැට එකෙන් ටිකක් තම්බලා ගේන්න... "

චූටි වතුර බේසම ආච්චිගෙ අතින් ගන්න ගමන් උපදෙස් දුන්නෙ හරියට සාත්තු සේවිකාවක් වගේ.

" ඒක මං ලිපේ තියලයි ආවෙ. හිටිංකො... මං ටිකක් නිවෙන්න ඇරලා කොප්පෙකට දාලා අරන් එන්න. "

" කොල්ලෙක් එක්ක වලියක් දාගත්තු පළියට මේ තරම් දේවල් කරන්න ඕනෙ නෑ බබා. රණ්ඩු කළයි කියලා මෙහෙම තවනවානං ඉස්සර ඉස්කෝලෙ යන දවස් වල ඔයාගෙ අයියවයි මාවයි හැමදාම තවන්න ඕනෙ. "

වෙනිවැල්ගැට තම්බලා බොන්න තරමෙ අලකලංචියක් උනේ නැති නිසා මං කිව්වට කෙල්ල ඒකට ඇහුම්කන් දුන්නෙ නෑ.

" ඒ කාලෙ ඔයාලා හැමදාම වලි දාගන්න නිසා ඒවා





එච්චර ගාණක් නැති උනාට දැන් එහෙම නෙමෙයිනෙ. අනික අර ගෝරිල්ලෙක් වගේ හිටපු පෝරිසාදයා එක්ක ඔයා පෙරළි පෙරළි ගහගත්තු හැටි මං ඇස් දෙකෙන්ම දැක්කනෙ. ඒ නිසා හොඳ ළමයා වගේ දැන් ඔය ටී ෂර්ට් එක ගලවන්න.... "

චූටි එහෙම කිව්වෙ ආච්චි කාමරෙන් පිට උනාට පස්සෙ. වතුර එකත් කාමරේටම ගෙනත් තියෙන නිසා මං ටී ෂර්ට් එක ගලවලා ඇඳේ මූනින් අතට හාන්සි උනා.

" දෙවියනේ... මේ බලන්නකො අයියෙ... ඔයාගෙ පිටත් හීරිලා. මේ... මේං මෙතන නිල් වෙලා වගේ... "

චූටි කරන්න ගත්තු වැඩේ පැත්තක තියලා පශ්චාත් මරණ පරීක්ෂණේ තියන්න පටන් අරන්.

" හලෝ මේ... ඔයාට හිතෙන තරම් මට ඕවා රිදෙන්නෙ නෑ. අම්මලා එන්න කලින් ඔය වැඩේ ඉවරයක් කරනවද...? "

මං ඒක කිව්වෙ ටිකක් සැරෙන් වගේ. ඊට පස්සෙනං කෙල්ල කිසි හා හූවක් නැතුව හෙමීට මගේ බෙල්ල පිට අත් දෙක සේරම තැව්වා. එයා ඒක කළේ බුදු පිළිමයක් සෝදනවා වගේ පුදුම භක්තියකින්.

" ඔය ඇති චූටි. දැන් අපේ අක්කා එහෙම මේ පැත්තට කඩන් පාත් උනොත් අපේ රහස් සේරම හෙට පත්තරේ හෙඩ් ලයින් වලටම දායි... "

" අයියෙ... "

බේසම පැත්තකින් තියලා මගේ ටී ෂර්ට් එක අතට දෙන ගමන් කෙල්ල මගේ ඇස් දෙකට එබුණා.

" හ්ම්... "

"එදා මං දීපු තෑග්ග බැලුවද...?"

මෙයා මේ අහන්නෙ අපි වැඩට යන දවසෙ දීපු අර ලස්සන වෙක් ෂර්ට් එක ගැන වෙන්න ඇති.

"ඔව් චූටී... ඒක හරි ලස්සනයි. ගිවයි මමයි දෙන්නා ඒකට ආච්චි දීපු සල්ලි වලින් එකම විදියෙ කලිසම් දෙකක් ගත්තා."

"දවසක ඒක මට ඇඳලා පෙන්නන්න ඕනෙ හොඳද...?"

ස්ටූල් එක උඩ තියපු බේසම අතට අරගෙන චූටි මගේ කාමරෙන් පිටවෙලා ගියේ අහිංසක ඉල්ලීමකුත් කරගෙනමයි.

* * * * * * *

"අනේ... පුතේ... ඉක්මනට එන්නකො..."

උදේ පාන්දරම අපේ අම්මා කෑ ගහන සද්දෙට මං ඇහැරුණේ උඩ ගිහින්. වෙනදා වගේ කරණමක් ගහලා ඇඳෙන් පනින්න හැදුවට අදනං ඒ සෙල්ලම කරන්න ලේසි උනේ නෑ. ගුටිබැට හුවමාරුව නිසා තාම අතපය රිදෙනවා. අර චූටි කිව්වත් වගේ අපි දැන් අවුරුදු එක හමාරකින් දෙකකින් විතර වලියකට සෙට් උනේ නැති නිසාද මන්දා මේ තරමට අමාරු.

"අනේ පුතේ.... ඉක්මනට එන්නකො... ආච්චි ගෙදර නෑ..."

ඔන්න ඒ පාර තමයි අම්මා හරිම හේතුව කියලා කෑ ගහන්න ගත්තෙ. ආච්චි ගෙදර නැති එක වෙන්න පුළුවන්ද...? ඊයෙ රෑ කවුරුහරි එයාව පැහැරගත්තාවත්ද...?

ඒ වගේ අනේක ජාති විකාර අදහස් ඔළුවට එද්දි මං අමාරුව පැත්තක දාලා ඇඳෙන් බැහැගත්තා. නැතුව ඉතිං ආච්චි නෑ කියද්දි එයාගෙ ආදරණීය මුණුබුරා වෙච්ච මං කොහොමද





ඇස් කන් පියාගෙන ඇඳට වෙලා ඉන්නෙ.

"ඇයි අම්මෙ...? ආච්චි කොහෙ ගිහින්ද...?"

කුස්සිය පැත්තෙ මිදුලට වෙලා බෙරිහන් දෙන අපේ අම්මා ළඟට ගිහින් මං ඇහුවෙ නිදිමරගාතෙන්මයි.

"දැන් තාත්තලා වැඩට යන වෙලාවෙත් මං දැක්කා ආච්චි එයාගෙ කාමරේට වෙලා කැරකි කැරකි ඉන්නවා. ඒත් දැන් බලනකොට ආගිය අතක් නෑ."

ආ... ඒ කියන්නෙ තාත්තා වැඩට ගිහින්ද...? පුදුමයි අපේ ගෙදර කිසි කෙනෙක් මාව ඇහැරුවෙ නැති එක.

"බොරුවට කෑ ගහන්න එපා අම්මෙ. ආච්චි මේ උදේ පාන්දර කොහෙ කියලා යන්නද...? එයා ඔය බාත් රූම් එකක හරි කාමරේක හරි ඇති. තව ටිකක් හොයලා බලන්න."

අම්මගෙ හිත හදන්න එහෙම කිව්වට මටත් ඒ වෙද්දි පොඩි සැකයක් ඇති වෙලා තිබුණෙ. ආච්චි සමහරවිට චූටිව හම්බ වෙන්නවත් ගියාද දන්නෑ.

"මං ඔයාට කතා කළෙත් හැම තැනකම බලලා තමයි. මේ වත්ත ඇතුලෙ කිසිම තැනක ආච්චි නෑ..."

"අම්මා ලොකු මාමලගෙ දිහාට කතා කළාද...?"

"තාම නෑ. ඒත් ඉතිං ආච්චි කවදාවත් අපිට නොකිය එහෙම ගෙදරින් පිටවෙලා යන්නෙ නැහැනෙ පුතා..."

අම්මා උත්තර දුන්නෙ බයෙන් වගේ.

"අම්මා කොයි එකටත් එහෙනුත් අහලා බලන්නකො. නැති උනොත් මං පාර පැත්තටවත් ගිහින් බලලා එන්නම්..."

" අනේ ඔව් පුතා... පොඩ්ඩක් හොයලා බලන්න. ආච්චි දැන් කොහොමත් හරි හිතුවක්කාරයි. "

ආච්චිටත් බැන බැනම අම්මා ගිහින් ලොකු මාමලගෙ ගෙදරට ෆෝන් කළා. ඒත් අම්මගෙ කතාවෙන් තේරුණ විදියට ආච්චි එහෙ ගිහිල්ලත් නැහැ. එතකොට එයාට මොකද උනේ...? මං අසනීපයි කියලා දන්න නිසා ආච්චි කන්න මොනවාහරි ගේන්න කඩේ පැත්තෙවත් ගියාද දන්නෑ. දැන් ඉතිං කරන්න තියෙන හොඳම දේ පාරට ගිහින් හොයලා බලන එක තමයි.

අතට අහුඋන ටී ෂර්ට් එකකුත් දාගෙන මං කාමරෙන් එළියට එද්දි අපේ අම්මා ඇස් වල කඳුළුත් පුරවගෙන තාත්තට කෝල් කරනවා මං දැක්කා.

" අනේ බලන්නකො නලින්... ඔයාලා ගිය වෙලාවෙ ඉඳලා අම්මා ගෙදර නැහැනෙ. මං අයියලගෙ දිහාටත් කෝල් කරලා බැලුවා. එහෙ ගිහිල්ලත් නැහැ. "

අම්මා තාත්තට සිද්ධිය පහදනවා. ආච්චි ලොකු මාමලගෙ දිහා ගිහිල්ලත් නැත්තං ආච්චිව හොයන්නම වෙනවනෙ. අම්මා බලාගෙන ඉද්දිම මං යන්නංවත් නොකියා බයික් එකට නැගලා පිට වෙලා ආවා.

පාරට ආවට මොකද ආච්චිව කොහෙ හොයන්නද කියලා මට හිතාගන්න බැරිඋනා. ඇයි ඉතිං වෙනදට එයා මේ විදියට අපි කාටත් නොකියා පිටවෙලා යන්නෙ නැහැනෙ. ගිවන්තලගෙ ගෙවල් පැත්තට ගිහින් ඌව එක්කගෙන ගියත් වැඩක් වෙයිද දන්නැති නිසා මං හන්දියට ගිහින් කෙලින්ම ත්‍රීවිල් පාක් එක ඉස්සරහා බස් හෝල්ට් එකේ බයික් එක නතර කළා. ඇයි ඉතිං අපි ඊයෙ පෙරළි පෙරළි ගුටි බැට හුවමාරු කරගත්තු ප්ලේස් එක එහෙම එක පාරට





පහු කරගෙන යන එක හරි නැතෙ.

ආච්චිව හොයන්න කියලා ආවට ත්‍රීවිල් පාක් එක දැක්කම මගේ ඇස් හොයන්න ගත්තෙ තිස්සව. ඒත් ඉතිං මිනිහා අද කොහොම පාක් එකට එන්නද ඊයෙ කාපු කැවිල්ලට. ඌ මෙළහටත් කොහෙ හරි ඉස්පිරිතාලෙක නේවාසික වෙලා ඇති.

" දැස් මහත්තයා.... "

මං බස් හෝල්ට් එකට වෙලා වටපිට බල බල ඉද්දි මගේ ළඟට ආවෙ ත්‍රීවිල් පාක් එකේ ලොකු අයියා විදියට හඳුන්වපු තඩි සෝමෙ. අපි ඉස්කෝලෙ යන දවස්වල එක එක හයර් යන්න සෙට් කරගත්තෙ සෝමෙ අයියව තමයි. සමහරවිට මිනිහා දැන් මගේ ඉස්සරහට ආවෙ ඊයෙ උන්ගෙ පාක් එකේ සාමාජිකයො දෙන්නෙක්ට ගහපු එකේ වාඩුව ගන්නද දන්නෑ.

" අර නොසන්ඩාලයො දෙන්නා ඊයෙ දවල් මහත්තයලට මෙතනදි සද්දයක් දැම්මලු නේද...? කොහෙද.... මගෙත් වෙලාවටම ඊයෙ අපේ පොඩි එකාගෙ ඉස්කෝලෙට යන්න උනානෙ. නැත්තං ඉතිං මහත්තයට කලින් මමයි ඕකුන්ගෙ හතර හන්දි කඩන්නෙ. "

අඩෝ... ඒ කියන්නෙ සෝමෙ අයියා ඇවිත් තියෙන්නෙ මගේ සපෝට් එකටද...? ඒත් අප්පා තමන්ගෙ පාක් එකේ සහෝදර සාමාජිකයො දෙන්නෙක්ට තෙලපු එකට මිනිහා තරහා වෙන්න ඕනෙ මං එක්කනෙ.

" සෝමෙ අයියා... තිස්සලා ඔයාලගෙ බජාර් එකේ නේද...? ඉතිං ඇයි ඔයා එයාලගෙ හතර හන්දි කඩන්නෙ...? "

මං ඇහුවෙ ටිකක් මිනිහගෙ ළඟට කිට්ටු කරන ගමන්.

" බජාර් එකේ...? මොන බජාර්ද මහත්තයා. අර

කයිවාරු පුතා... ඌ පාක් එකට හොම්බ දාගත්තෙ ඇන්තනීගෙ කයිවාරු පුතා... ඌ පාක් එකට හොම්බ දාගත්තෙ අර මන්ත්‍රී කෙනෙක්ට ගොට්ට අල්ලලා. ඒ මදිවට මිනිහා ඔය තිස්ස කියන එකාව ඒයෙ පෙරෙයිදා මේකට ගෙනත් එබුවෙ බලෙන්. ඕකුන් දෙන්නගෙන් එකෙක්ටවත් මේ පාක් එකේ දුවන්න පර්මිට් නෑ. ''

එකත් එහෙමද...? ඒ කියන්නෙ සහන් ඔය තරම් කයිවාරු ගහන්නෙ දේශපාලන හයිය අරන් වෙන්න ඇති.

'' මේ ඒක නෙමෙයි සෝමෙ අයියෙ.. ඔයාට අපේ ආච්චිව මතකද...? ''

කතාව දුර දිග ගියොත් ආපු කාරණේ අමතක වෙයි කියලා මං ඉක්මනටම මාතෘකාවට බැස්සා. නැත්තං ඉතිං මං ගෙදර යද්දි අපේ අම්මට හාට් ඇටෑක් හැදිලා තියෙයි.

'' මොකෝ මහත්තයො මට අමතක... මහත්තයලගෙ ගෙදර බවලත් උදවිය නිතරම මගෙත් එක්ක හයර් යනවනෙ. කොටින්ම ලොකු නෝනා අද උදෙත් රණසිංහ මාවතට ගියේ මාත් එක්කනෙ. ''

'' මොනවා... අපේ ආච්චි අද උදේ රණසිංහ මාවතට ගියා. ඒ මොකටද...? ''

'' ඒවා අහන එක අපිට අදාල නෑනෙ මහත්තයො... ලොකු නෝනා යං කිව්වා. මං ගියා. එච්චරයි. ''

'' අපේ ආච්චි රණසිංහ මාවතේ කොතනටද ගියේ කියලා සෝමෙ අයියට මතකද...? ''

'' ඒ පාරෙ අර ලොකු ටියුෂන් පන්තියක් තියෙන්නෙ. ආන්න ඒ කිට්ටුවෙන් තමයි බැහැ ගත්තෙ. ඇයි මහත්තයො මොකක්





හරි අවුලක්ද...? ''

මගේ මූණෙ ඉරියව් වල වෙනස තේරිලාද මන්දා සෝමෙ එහෙම ඇහුවෙ.

'' නෑ සෝමෙ අයියෙ. ආච්චි හන්දියට යනවා කියලා ගෙදරින් ආවට යන තැනක් හරියට කියලා නෑ. ඉතිං අම්මා බය වෙලා. ඒකයි ඇහුවෙ. මං වෙන වෙලාවක එන්නම්කො අයියා එක්ක කතා කර කර ඉඳලා යන්න... ''

වැඩේ ගොඩින් බේරලා දාලා මං බයික් එකෙන් රණසිංහ මාවතට ආවෙ ආච්චිගෙ හොර ගමන මොකක්ද කියලා දැනගන්න.

ඒත් මට වැඩි දුරක් යන්න උනේ නෑ... අපේ ආච්චි කුඩේකුත් අරගෙන රණසිංහ මාවත දිගේ හෙමීට ඉස්සරහට ඇවිදගෙන එනවා.

'' ආච්චියේ... ඔයා මොනවද මෙහෙ කරන්නෙ...? ''

ආයෙ නෑ ආච්චිගෙ කකුල් දෙක අස්සෙන්ම බයික් එක නතර කරලා මං ඇහුවා. මාව දැක්කා විතරයි ආච්චි බය උනේ හරියට මහසෝනා දැකලා වගේ.

'' චූටි පුතේ.... උඹ ඔය ලෙඩ තියාගෙන මේ පාරවල් ගානෙ අහවල් දෙයක් කරනවද...? ''

යාන්තමට ගොත ගගහා වචනයක් දෙකක් ගලපගෙන එයා මට දෝස්මුරයක් දැම්මා හරියට වැරැද්ද කළේ මං කියන්න වගේ.

'' ලෙඩ...? කාටද ලෙඩ තියෙන්නෙ...? මට පේන්නෙ ආච්චිට ලෙඩක් හැදීගෙන එනවද කොහෙද...? ඇත්ත කියන්න ආච්චියේ... මං ගෙදර කාටවත්ම කියන්නෙ නෑ... ඔයා අද

හොරෙන්ම ගෙදරින් පිටවෙලා ආවෙ සීයා කෙනෙක් හම්බවෙන්න නේද...? ''

ගානට ස්පින් කරලා මං බෝලෙ ආච්චිගෙ පැත්තට දාලා බැලුවා එයා ඒකට ෆේස් කරන්නෙ කොහොමද කියලා. මූත්... එයාට ඒක ඇහුවම යකා නැග්ගනෙ.

'' චූටි පුතේ... උඹ මගේ මේ සරීර කූඩුව ඇතුළෙ හැංගිලා යන්න රාස්සයා එළියට ගන්න හදන්න එපා. මං මේ තලින් ගෙදරින් යනකල් ඉඳලා එළියට බැස්සෙ උඹට අත උස්සපු එකාගෙන් පළිය ගන්න... ''

'' මොකා කිව්වා...? ''

මට ඒ කතාව නිකං ග්‍රීක් වගේ. ආච්චි මේ බස්තම අරන් ඇවිත් තියෙන්නෙ එතකොට සහන්ටයි තිස්සටයි ගහන්නද...?

'' ඈ බොල... ඇන්තනියගෙ ගෙවල් තියෙන්නෙ මේ පාරෙ කියලා උඹට අමතකද...? මං ඒ පැත්තට ගියා ඌට පොඩි කෝචොක් එකක් දාලා එන්න... ''

ඇත්තනෙ. කිව්වත් වගේම ඇන්තනී අන්කල්ලගෙ ගෙවල් තියෙන්නෙත් රණසිංහ මාවතේ නේන්නං. ඒත් ආච්චි පට්ට තනියම ගිහින් ගහලා ආපු ගේම මොකක්ද කියලා මට හිතාගන්න බැරුව ගියා.

'' කියන දෙයක් තේරෙන්න කියන්න ආච්චියෙ. අපි ඉක්මනට ගෙදර යන්න ඕනෙ. අන්න ඔයා ගෙදර නෑ කියලා අපේ කට්ටිය ඉන්ටර්පෝල් එකටත් කෝල් කරලා... ''

'' මං නැති විත්තිය කවුද ඉන්ටර්පෝල් කියන හාදයට කිව්වෙ. ඌ දන්නවයැ මං ගිය තැනක්....? ''





අප්පට සිරි. ආච්චි හිතාගෙන ඉන්නෙ ඉන්ටර්පෝල් කියන්නෙ මනුස්සයෙක් කියලද. කමක් නෑ... එයා ඕන එකක් හිතා ගත්තාවෙ.

මුලින්ම ආච්චි හන්දියෙ ඉන්නවා කියලා මං ගෙදරට කතා කරලා පණිවිඩේ දුන්නා. නැත්තං ඉතිං අම්මා මොන ජල්ලියක් අල්ලලා තියෙයිද කියන්න බෑ.

දැන් ඉතිං දැනගන්න ඕනෙ ආච්චි සහන්ට දීපු ගේම ගැන.

'' උඹ ඔහොම ඇස් උලුප්පගෙන මං දිහා බලන් ඉන්න ඕනෙ නෑ චූටි පුතේ. යමංකො ඇන්තනීලගෙ ගෙවල් පැත්තට. මං කරපු හරිය උඹට ඇස් දෙකෙන්ම බලාගන්න පුළුවන්. ''

ආච්චි ඒ කතාව කිව්වෙ හරි උජාරුවෙන්. ඒක අහලා මටත් පුදුම කුතුහලයක් දැනුණෙ.

'' ඔය තරම් කියන එකේ යමුකො බලන්න. ''

බයික් එක ආපහු ස්ටාට් කරගෙන මං ආච්චිවත් වදෙන් පොරෙන් ඒකට නග්ගගත්තා. එයා වෙනදා වගේම මගේ හුස්ම හිර වෙන තරමට මාව බදලා අල්ලගත්තට පස්සෙ මං හෙමීට රාජසිංහ මාවතේ ඉස්සරහට ගියා.

'' ආං බලාපං වෙලා තියෙන හරිය... ''

ඇන්තනී අන්කල්ලගෙ ගෙවල් පේන නොපෙනෙන මානෙදි ආච්චිගෙ කතාවට මං බයික් එක නතර කළා.

ඇත්තටම එතන මොකක්ද සිද්ධවෙන්නෙ කියලානං මට හිතාගන්න පුළුවන් උනේ නෑ. විසිතිස් දෙනෙක් විතර ඒ වත්ත ඇතුළෙ පිරිලා. සමහර පිරිමින්ගෙ අතේ තඩි පොලු මුගුරු. තවත්

සමහරු වත්තෙ තියන මල් පෝච්චි පොඩි කරනවා.

ඒ අස්සෙ මෙසනාද මන්දා යටි ගිරියෙන් කෑ ගහනවත් ඇහෙනවා. කොටින්ම ඇන්තනී අන්කල්ලගෙ වත්ත යුධ පිටියක් වගේ වෙලා.

'' ඔයා මාරයිනෙ ආච්චියෙ. ඔයා මොනවද කලේ...? මොකක්ද එතන සිද්ධ වෙන්නෙ ? ''

'' මං ඒ හැටි දෙයක් කලේ නෑ පුතේ. පොඩි වචන දෙක තුනක් පිට කරපු එක විතරයි මං කලේ... ''

'' වචන දෙක තුනක්...? වචන දෙක තුනකට මේ තරම් හරියක් කරන්න පුළුවන්ද...? ''

මං ඇහුවෙ පුදුම වෙලා. වචන දෙක තුනකට මෙච්චර ලොකු පෙරලියක් කරන්න පුළුවන්නම් ඒක බලගතු මන්තරයක් වගේ දෙයක් වෙන්න ඕනෙ.

'' මං ඒ වත්ත ළඟින් යන ගෑණු කෙනෙක්ට කිව්වා මේං මේ වත්තට දිගම දිග කළු නාගයෙක් ඇතුල් වෙනවා දැක්කා කියලා. එච්චරයි.... ''

නෑහ්... ආච්චිත් හරි ෂෝක් බලු වැඩක්නෙ කරලා තියෙන්නෙ. ඌරගෙ මාළු ඌරගෙ පිටේ තියලම කපලා.

සහන්ලටත් වෙලා තියෙන්නෙ ඌ අර ත්‍රීවිල් එකේ ගහගෙන ඉන්නවා වගේ 'අපේම නයි අපිවම කයි' ජාතියෙ වැඩක්. මිනිහා මෙච්චර දවස් අනික් මිනිස්සුන්ට නයා පෙන්න පෙන්න ගියා. දැන් අපේ ආච්චි උන්ටම නයා පෙන්නලා.

'' දවසක් ඇන්තනීගෙ ගෑණි අපේ දිහා ආපු වෙලාවක කිව්වා මේ පැත්තෙ ලොකු කළු නාගයෙක් සැරිසරනවා කියලා.





ඒ නයා ගහලා මේ කිට්ටුවම පිරිමි කෙනෙක් මැරිලා කියලත් කිව්වා. ඒක මතක් කරලා තමයි මං ඇඹරුවෙ ගුලිය... ''

ආච්චිය සිද්ධියට පාදක වෙච්ච නිධාන කතාව මට කියලා දුන්නා. මං ඒක අහගෙන හිටියෙ ඇන්තනීලගෙ වත්තෙ සිද්ධවෙන ජරමරෙන් ඇස් අහකට ගන්නෙ නැතුව.

'' ආච්චියේ ඔයානං කරලා තියෙන්නෙ අදහන්න වටින වැඩක්. දැන් ඉතිං ඇන්තනීලට තව සතියක් දෙකක් යනකල් නින්ද යන එකකුත් නෑ.... ''

මං කිව්වෙ හිනා වෙවී.

'' ඇයි මෙහෙ ඉන්න අර පෝරිසාද කොලුවා දවසක් අපේ ගෙදරටම ඇවිත් අපිට නයා පෙන්නලා ගියා උඹට මතකද...? ඒකෙ වාඩුව ගන්නත් මං පොටක් පැදෙනකල් හිටියෙ. ''

ආච්චි එහෙනං මේ එක ගලෙන් කුරුල්ලො දෙතුන් දෙනෙක් බාවන වැඩක් කරලා තියෙන්නෙ. අම්මපා මේක පාර නෙමෙයිනං මං අර එදා වගේ ආපහු ආච්චිව ඉඹිනවා ආයෙ මදි නොකියන්න.

* * * * * * *

## 14

යාන්තං කාලෙකට පස්සෙ ඉරිදා දවසක් ආව නිසා මං උදේම ඇඳ පැළඳගෙන මගේ අතීසාර මිත්‍ර පරාණෙ බලන්න යන්න ලෑස්ති උනේ.

" මොනවද ලොකු ඔයාට වෙලා තියෙන්නෙ...? දැන් ළඟකදි ඉඳලා ඔයා ඉන්නෙ මේ ලෝකෙ සිහියෙන් නෙමෙයි. මං කී සැරයක් ඔයාට කතා කළාද...? "

පාන්දරම ගේ ඇතුළෙන් ඇහෙන ගෝරණාඩුව මොකක්ද කියලා දැනගන්න මං තව පොඩ්ඩක් මගේ කන් දෙක ටියුන් කරගත්තා. සද්දෙ එන්නෙ අපේ අක්කගෙ කාමරේ පැත්තෙන්. අම්මා එයාට ලොවෙත් නැති වෙන්න දෙහි කපනවා.

" ඔය ෆෝන් එක පැත්තක තියලා ගෙදර ඉන්න දවසෙවත් පොඩ්ඩක් කුස්සියෙ වැඩ පළකට උදව් වෙන්න බැරිද...? යසයි ගෑනු ළමයි හැදෙන විදිය. "

ආ... එහෙනං අපේ අක්කටත් අර චූටිගෙ ලෙඩේ හැදිලාද කොහෙද.... ජංගම දුරකථන මේනියාව. ගිවන්තයි රුවන්ති නැන්දයි





කියන විදියට චූටිත් ඕන වෙලාවක ෆෝන් එක කනේ ගහගෙනලුනෙ ඉන්නෙ. ඒකට ඔන්න මමනං හොඳ ආදර්ශවත් ළමයෙක්.

මං ෆෝන් එක සීයට පනහක් පාවිච්චි කරන්නෙ ෆේස් බුක් යන්න... සීයට විස්සක් පාවිච්චි කරන්නෙ ෆොටෝ ගහන්න... ඊට පස්සෙ සීයට දහයක් කම්මැලි වෙලාවට ගේම් ගහන්න... නැත්තං සින්දු අහන්න, තව දහයක් පාවිච්චි කරන්නෙ වෙලාව බලන්න... එස් එම් එස් වලට සීයට පහක් විතර තමයි පාවිච්චි කරන්නෙ... අඩුවෙන්ම පාවිච්චි කරන්නෙ කෝල් ගන්න. ඕං ඔහොමයි අපි.

කොහොම හරි අම්මා අක්කට බර බරේ දාන අතරෙ මං හෙමීට බයිසිකලේ තල්ලු කරගෙන ගේට්ටුව ළඟට ආවා. නැත්තං ඉතිං සද්දෙ ඇහුනොත් අම්මා අක්කට බෙදන හැන්දෙන්ම මටත් බෙදන්න ගන්නවනෙ නිවාඩු දවසකවත් ගෙදර ඉන්නෙ නෑ කියලා. යාන්තං ගෙදර අයගෙ ඇස් වලින් වහන් වෙලා පාරට ඇවිත් බයික් එක ස්ටාට් කරන්න හැදුවා විතරයි මේං සරා ගොයියා අතපය හතර වන වන අපේ ගෙවල් පැත්තට දුවගෙන එනවා.

" දැස් බේබි... අයියෝ... මේ කොහෙ යන්නද....? මං හිතුවා අදවත් ගෙදර ඉඳී කියලා. "

ඇයි යකඩෝ... මේ තරම් අමාරුවෙන් මුරකාවල් බිඳගෙන පාරට ආවම මූ එනවනෙ මගේ අප්පොච්චි වගේ ප්‍රශ්න අහන්න.

" සරා අයියෙ මේ... කියන දෙයක් ෂෝට් ඇන්ඩ් ස්වීට් කියනවද...? මං මේ හදිස්සි ගමනකට යන්නෙ... "

ඒ කතාවට සරා චාටර් විදියට හිනා උනා.

" හදිස්සි ගමනක් කිව්වෙ ගිවන්ත බේබිලගෙ ගෙදර වෙන්නැති නේද...?"

මිනිහා ඒක කිව්වෙ මං දන්නවා හොරේ කියන ටයිප් එකෙන්. ඔව් ඉතිං... එක අතකට ගත්තම මාව ආශ්‍රය කරන මිනිස්සු දන්නවනෙ මං ගැන.

" සරා අයියට ඉංග්‍රීසි ඉගෙන ගන්න ඕනෙනං හවස තුනට හතරට විතර එන්න. මං ඒ වෙලාවට ගෙදර ඉන්නවා... "

එහෙම කියලා මං බයික් එක ස්ටාට් කරගත්තා විතරයි සරා එල්ලුනානෙ බයික් එකේ හැන්ඩ්ල් එකේ.

" අනේ බේබි... ඇයි මට ඔහොම කරන්නෙ...? බේබි වැඩට යන්න ගත්තට පස්සෙ හරියට වෙනස් වෙලා. "

මේකා හරියට කෑ ගහන්නෙ මගේ ගෑණු ළමයා වගේනෙ. කාටහරි ඇහුණානං මොනවා නොහිතයිද... ලැජ්ජාවෙ බෑ.

" මොන වෙනසක්ද සරා අයියෙ... අද නිවාඩු දවස නිසා මුදලාලි අන්කලුත් ගෙදරනෙ. ඒකයි මං කිව්වෙ... "

මොනවා උනත් අපි වැඩට යන දවසෙ අපිට තෑග්ගක් ගෙනත් දෙන්න තරම් හිත හොඳ වෙච්ච මේ අහිංසකයට බනින්න මගේ දිව නැමුනෙ නෑ. ඒ නිසා මං වෙන විදියක ෂේප් එකක් දාන්න බැලුවෙ.

" අද මුදලාලියා පොල් ඕඩරයක් බලන්න කුරුණෑගල ගියා පාන්දරින්ම. මං විතරයි ගෙදර... "

මුදලාලිගෙ නෝනත් මීට අවුරුදු දෙක තුනකට කලින් නැති උනා... ළමයි දෙන්නත් දැන් ඉන්නෙ රට. ඒ නිසා සරා ගොයියා ඇරුනම ඒ ගෙදර වෙන සාමාජිකයො කවුරුත් නෑ.





" එහෙමනං යංද මගෙත් එක්ක ගිවන්ත බේබි බලලා එන්න...? "

" අම්මපා ඔය ඇත්තටමද කිව්වෙ බේබි....? යන්කො එක පාරට දහ පාරක්... "

මගේ වචනෙ පිට උන සැණින් සරා බයික් එකට නැග්ගා නෙමෙයි පැන්නා. ඇයි යකෝ.... බයිසිකලේක යන්න පොඩි එකෙක්ටවත් නැති ආසාවක්නෙ මේ මනුස්සයට තියෙන්නෙ.

කොහොමහරි සරාගෙ දඩු අඬුවට අහුවෙලා මං බොහොම අමාරුවෙන් පළවෙනි පටුමගට බයිසිකලේ පැදගෙන ආවා.

" අම්මේ සරා අයියව දකින්න තියෙන අමාරුවක්...? "

බයිසිකලේ ලොකු මාමලගෙ වත්තට දාපු ගමන්ම ගිවන්ත ඇවිත් සරාව බොහොම උණුසුම් විදියට පිළිගත්තා.

" අපිනං ඉතිං වෙනදා වගේම ගෙදරට වෙලා ඔහේ ඉන්නවා බේබි. බේබිලනෙ දැන් රස්සාවට යන්න පටන් ගත්තම ජේන්න නැත්තෙ. "

සරා හරි අහිංසක විදියට හිනාවෙලා බයිසිකලෙන් බැහැගත්තට පස්සෙ තමයි මට හරියට හුස්ම ගන්න පුළුවන් උනේ.

" අපිනං ඉතිං හරි විදියට රස්සාවට ගියාට ඔයාලගෙ දෑස් බේබි ගෙදර ඉන්න ඇතිනෙ. "

ගිවා ඒ නං ගැහුවෙ හිට් එකක්. ඕං බලාපල්ලකො අපේ සහෝදරයො එක දවසක් වැඩට නොගියට කියන කැත කතා.

" අපේ දෑස් බේබි මේ දවස් වල ගෙදරට වෙලා ලොකු නෝනව මුර කරනවනෙ. ඒ නිසා එන්න බැරි වෙන්න ඇති. "

ගිවන්තගෙ හින්ට් එකෙන් මට වඩා රිදුනෙ සරාට. ඒ නිසා සරා අපේ ආච්චි ගැන කතාවක් ඇදලා මාව බේර ගන්න ට්‍රයි එකක් දුන්නා. හැබැයි රුවන්ති නැන්දා ඇවිත් මොනවාහරි කාලා ඉමු සරා කිව්වා විතරයි සරා වාෂ්ප උනේ හරියට අවුරුදු දෙක තුනක් බඩගින්නෙ හිටපු තාලෙට. ඒක මුදලාලි අන්කල් එහෙම දැක්කානං අම්මපා බඩ කපාගෙන මැරෙනවා.

'' මොකක්ද ඔය ආච්චි ඇල්ලුවයි කියන නාඩගම...? ''

සරා ගියාට පස්සෙ ගිවන්ත ඒ කතාව ඇහුවෙ සීරියස් විදියට.

'' ආච්චි පෙරෙයිදා මං ගැන නරක හීනයක් දැකලා. ඒ පාර එයා ඊයෙ උදේ අපි කාටත් නොකියා මගේ වෙලාව බලන්න කියලා තනියම හන්දියට ගිහින්. ''

ඊයෙ උදේ ආච්චි ගෙදර ආවට පස්සෙ අම්මලට කියපු බොරුවම මං ගිවන්තටත් කිව්වා. ඒත් මිනිහා මං දිහා බලන් හිටපු අර අමුතු බැල්ම වෙනස් කළේ නෑ.

'' හරි... ඒ කතාව මට අපේ අම්මත් කිව්වා. එතකොට කියපංකො උඹ ඊයෙ වැඩට යන්න ආවෙ නැත්තෙ ඇයි කියලා. මං යන්න ලෑස්ති වෙලා උඹේ ෆෝන් එකට ගත්තා ඒක ඕෆ්. ඒ පාර මං අපේ තාත්තා එක්ක ගියා. ''

මූ මේ දවසක් තනියම වැඩට ගිහින් තියෙන නිසා තමයි එහෙනං මේ ඩෝං ගිහින් තියෙන්නෙ.

'' ඊයෙ කොහෙ වැඩට එන්නද...? මං නැගිට්ටෙත් පරක්කු වෙලා. ඒකත් ආච්චි නෑ කිය කිය අම්මා බෙරිහන් දීපු සද්දෙට. ආච්චිව හොයගෙන ආපහු ගෙදර එනකොට දවල් වෙලා බං...''





'' හ්ම්... ඒකත් එහෙමද...? එතකොට උඹ පෙරෙයිදා කොහෙද ගියේ කියපංකො... ''

ඌ ඒකනං අහපු තාලෙ මට වැඩිය ඇල්ලුවෙ නෑ. මට පේන විදියට මූට මොකක්හරි ගැන ඉව වැටිලා තියෙන පාටයි.

'' ඇයි උඹ කවදාවත් නැතුව ඔය විදියෙ හරස් ප්‍රශ්න අහන්නෙ...? ''

'' ඇයි උඹ කවදාවත් නැතුව මගෙන් එක එක දේවල් හංගන්නෙ...? ''

මගේ ප්‍රශ්නෙට මිනිහා ප්‍රශ්නෙකින්ම රිටන් එක දුන්නා.

'' කියපං දැස්... ඇයි උඹ මේ විදියට සමහර දේවල් මගෙන් හංගන්නෙ...? මගේ මොකක්හරි වැරැද්දක් නිසාද... නැත්තං අංජු නිසාද... එහෙමත් නැත්තං අපේ චූටි නිසාද...? ''

ඒ කතාවෙ හැටියට ගිවන්ත කතා කරන්නෙ හැමදේම දැනගෙන කියලා මට තේරුණා.

'' ගිවා... මොනවද මචං මේ කියන්නෙ...? ''

'' මං මොනවද කියන්නෙ කියලා උඹ හොඳටම දන්නවා දැස්. මමයි කිසි දෙයක් නොදන්නෙ. උඹ දන්නවද... උඹ නැතුව තනියම වැඩ කරන්න කම්මැලි නිසා මං දවල් වේලාසන ආවා. හන්දියෙන් එද්දි මස් කඩේ අහමඩ් මාව නවත්තලා අහනවා 'මොකක්ද බොසා අර ත්‍රීවිල්කාරයො දැස් මහත්තයට දාපු පාට් එක... මොකක්හරි තියෙනවානං අපිටත් කියන්න... අපි සපෝට් එකට එනවා' කියලා. උඹම හිතපං ඒ වගේ වෙලාවට මං දෙන්න ඕන උත්තරේ මොකක්ද කියලා. මට කටක් ඇරලා කියන්න පුළුවන්ද ඒ ගැන මං දන්නෙ නෑ කියලා. මොකද මේ මුළු ටවුමෙම එවුන්

දන්නවා අපේ ෆ්‍රෙන්ඩ්ෂිප් එක ගැන.

මං ගෙදර ආවෙත් හෙන අවුලෙන්. වොෂ් එකක් දාගෙන උඹලගෙ දිහා එනවා කියලා හිතද්දිම මට ඇහුණා අපේ චූටි කාමරේ ඉඳගෙන අඬ අඬා කාටදෝ කෝල් කරනවා. බලනකොට ඒ අපේ ආච්චිට... ''

'' ආච්චිට...? ''

'' ඔව්... එයා ආච්චිට කියනවා අනේ බලන්න ආච්චි මං නිසා අයියට වෙච්ච දේ.... එයාව මේ ටිකේ පරිස්සමින් බලාගන්න ඔළුව වැදුනු නිසා නාන්න එහෙම දෙන්නෙපා කියලා. ඒ කතාව ඇහුනට පස්සෙ මං උඹව බලන්න එන්න හිතපු අදහස වෙනස් කළා. මොකද ටවුන් එකේ එවුනුයි අපේ ගෙදර එවුනුයි ආච්චියි හැමෝම දන්න දේ මං විතරයි නොදන්නෙ... එහෙම තියෙද්දිත් මං මොකටද උඹේ කකුල් දෙක ළඟට ඇවිත් අනේ ඒක මටත් කියපංකො කියලා පින්සෙණ්ඩු වෙන්නෙ. ''

ගිවන්ත තව මොනවදෝ මන්දා කියන්න හදද්දිම මං මිනිහව නතර කළා.

'' ලොකු අයියෙ... මං කිසිදෙයක් හිතාමතා හැංගුවෙ නෑ. අනික උඹ හිතනවා වගේ අපේ ගෙවල් දෙකේ හැමෝම මේ ගැන දන්නෙත් නෑ. දන්නෙ චූටියි ආච්චියි විතරයි. ''

'' ඒ දෙන්නා දැනගෙන හිටියම ඇති දැස්. මට ඒ කිසි දෙයක් දැනගන්න ඕනෙ නෑ. ''

ගිවා නැගිට්ටෙ ගේ ඇතුළට යන්න. ඒත් මං මිනිහට යන්න නොදී අත් දෙකෙන්ම අල්ලලා නතර කර ගත්තා.

'' ගිවා... මේ අහපං මචං. මේ දේවල් මම නොකිය





හිටියෙ උඹ එක්ක තියෙන තරහකටවත් උඹෙන් කිසිදෙයක් හංගන්න ඕනාවටවත් නෙමෙයි. මේවා දැනගෙන උඹ නැති ප්‍රශ්න ඇතිකර ගනියි කියලා හිතුන නිසා. මොකද ඉතිං උඹට මට තරම්වත් ඉවසීමක් නෑ කියලා මං දන්නවනෙ. ''

'' හරි ඉතිං... මට ඉවසීම නෑ කියලා උඹ දන්නවානං ඔය දන්න දේවල් උඹේ හිතේම තියාගෙන හිටපං. මට කියන්න එපා...''

'' ඔකනෙ කියන්නෙ. දෙයක් කියන්න කලින්ම උඹට ඩෝං ගිහින් ඉවරනෙ. ඉතිං කොහෙද ප්‍රශ්නයක් කතා කරන්නෙ...?''

ගිවන්තව බලෙන්ම වගේ කාමරේට ඇදගෙන ගිහින් ඇඳේ ඉන්දවලා මං සහන්ගෙ සිද්ධිය ඒ වු ඉසෙඩ් මිනිහට පහදලා දුන්නා. එදා හන්දියෙදි වෙච්ච ගුටි බැට හුවමාරුව ගැන කියද්දිනං ඌ ඒක අහගෙන හිටියෙ දත්මිටි කකා.

'' ඇයි බං ඒක දැනගත්තු වෙලාවෙම මට කෝල් එකක් නොදුන්නෙ. ඔහොම දෙයක් දැනගත්තානං ඔෆිස් එකේ නෙමෙයි මොන දීපංකරේක හිටියත් මං නැවිත් ඉන්නෙ නෑනෙ. ''

'' කිය කිය ඉන්න තරම් වෙලාවක් තිබුණෙ නෑ බං... අනික ඒ වෙලාවෙ අහසින් පාත් උනා වගේ විනෝද් එතනට කඩන් පාත් උනා. ඒ විතරක් නෙමෙයි සිද්ධිය දැකලා ඩයස් අයියත් දුවන් ආවා. අපි තුන්දෙනා සහන්ටයි තිස්සටයි දුන්නා ආයෙ ලොවෙත් නැති වෙන්න... ''

'' උඹට තුවාලද....? ''

'' නෑ මචං... එච්චර ලොකු සීන් එකක් නෑ. අර ඔළුවට වැදුණු පාර ඇරෙන්න වැලමිට පොඩ්ඩක් හීරුණා. එච්චරයි... ''

'' මටනං අපේ ගොන් හරකි එක්කත් මාර තරහක් එන්නෙ.

ඇයි යකෝ මෙච්චර හරියක් වෙලා තියෙද්දි මේකිට බැරි උනාද අපිට කටක් ඇරලා ඒ ගැන කියලා තියන්න. එහෙම උනානං නියපොත්තෙන් කඩන්න පුළුවන් දේ පොරවෙන් කපන්න තරම් දුරදිග යන්නෙ නැහැනෙ. ''

මං හිතුව විදියටම ගිවන්ත ඊළඟට චූටිට බනින්න පටන් ගත්තා.

'' පව් මචං... ඒකිට බනින්න එපා. කෙල්ල අපිට කියලා නැත්තෙත් අපි කලබල වෙලා රණ්ඩු වෙයි කියන බයට.''

'' බම්බුව තමයි. අර තිස්සයත් අපේ එකී යන එන තැන් ගැන නෝට් එකේ හිටියා කියලා උඹ දන්නවනෙ. මේකි කොහෙහරි යන්න ඌගෙ ත්‍රීවිල් එකට නැග්ග වෙලාවට ඌ සහන්ටත් ඔත්තුව දීලා මේකිව ඉස්සුවානං එහෙම... ''

ගිවාට හිතුනෙත් මට හිතුන දේම තමයි. මං එදා ඔය ගැන චූටිටත් කිව්වනෙ.

'' දැන් ඉතිං ඒ දේවල් වෙලා ඉවරයි. දැන් තියෙන්නෙ කෙල්ලව වෙනදට වඩා පරිස්සමින් බලාගන්න එක. මොකද සහන් මෙච්චර කල් ක්‍රියාත්මක නොවුනට මේ සිද්ධියෙන් පස්සෙ රිටත් එක දෙන්න බලාගෙන ඇති. ''

'' ඔව් ඉතිං... ඈන්තනියගෙ පගා ගැහිල්ල නිසා අපේ ගෙවල් වලිනුත් හිත හොඳ නෑ කියලා දන්නවා... අනික උඹ අර මල හෝන්තුව මේඝනාට කැමතිත් නෑ කියලා උන්ට තේරිලා ඇති. අපේ පවුලට ගෑවෙන්න ඉතුරු වෙලා තියෙන එකම විදිය චූටි කියලා උන්ට හිතෙන්න ඇති සමහරවිට... ''

ඒ කතාවනං සහතික ඇත්ත. සමහරවිට සහන් චූටිගෙ පස්සෙන් එන්නෙ ඈන්තනීගෙ අනුදැනුම ඇතිව වෙන්නත් පුළුවන්.





කොහොමහරි අන්තිමේදි මං ආච්චි ඊයෙ උදේ ගිහින් සහන්ලගෙ ගෙදරට දීලා ඇවිත් තියෙන ශේම ගැනත් ගිවාට කිව්වා. මිනිහා ඒකනං අහගෙන හිටියෙ උඩ පැන පැන හිනා වෙවී.

'' මං කියන්නෙ බොරුද බං... ආච්චිනං උඹටම හරියන බඩ්ඩ තමයි. උඹට අමාරුවක් ඇති කියලා හිතලා උඹව ගෙදරට කොටු කරන්නත් බොරුවක් කියලා ගෙදරට හොරෙන් ගිහින් ප්‍රතිවාදියාගෙන් පළි අරගෙනත් ඇවිත්... ''

ගිවා ආච්චි ගැන හරි ආඩම්බරෙන් තමයි කතා කළේ. ඔය ඔක්කොමත් හරි ආච්චි ගෙදර අයට හොරෙන් සැරෙන් සැරේ මට වෙනිවැල්ගැට හදාගෙන ඇවිත් පොවන එක තමයි දිරවන්න අමාරුම කාරණේ.

'' මං මේ දේවල් උඹට කිව්වෙ උඹ වැරදි වැටහීමක ඉන්න නිසා මචං. හැබැයි පින් සිද්ධ වෙයි මේ ගැන කියලා චූටිගෙ හිත කලබල කරන්න එහෙම එපා. එහෙම උනොත් කෙල්ල හෙට අනිද්දා තියෙන විභාගෙ අනාගන්න බැරි නෑ. ''

ගිවන්තට සිද්ධිය සම්පූර්ණයෙන්ම කියලා ඉවර වෙලා මං හැමදාම ගහන බයිලාව ගහන්නත් අමතක කළේ නෑ.

'' උඹට අංජු ගැනවත් නැති කැක්කුමක්නෙ බං අපේ එකී ගැන තියෙන්නෙ... අනේ මන්දා වෙලාවකට මට උඹව තේරුම් ගන්න බෑ. ''

මටවත් මාව හරියකට තේරුම්ගන්න බැරි එකේ ගිවන්ත කොහෙ තේරුම් ගන්නද. ඇත්තටම අංජුයි මමයි සම්බන්ධයක් පටන්ගත්තද නැද්ද කියලාවත් මට තාම හරියට හිතාගන්න බෑ.

'' මටත් මේ කිසිදෙයක් තේරෙන්නෙ නෑ බං... අනේ මන්දා... අංජු එක එක වෙලාවල් වල එක එක විදියයි... ''

මං හිතේ තියෙන දේ තේරෙන බාසාවෙන් ගිවන්තට කිව්වා.

" ඔකනෙ මස්සිනා අපි ඔය ලව් කේස් වලට අත ගහන්නෙ නැත්තෙ... අහලා තියෙනවද අර කවිය... "

" කවිය...? ඒ මොකක්ද...? "

" ආලය කලාවකි ප්‍රේමය මුලාවකී...
සිහිමද අයට එය මීපැණි ගුලාවකී...
කොපමණ පඬිවරුන් කීවත් අනාවැකී...
ආලය මිනී වල හාරන උදැල්ලකී... "

එහෙම කියලා ගිවන්ත සාදු සාදු කියලා තුන් පාරක් ඔළුව නමන්නත් අමතක කළේ නෑ.

" කවුද බං ඒක කියලා තියෙන්නෙ...? "

" ඒ පැහිච්චකං උඹට වැඩක් නැහැනෙ. මං වගේ හැමදාම නිදාගන්න කලින් ඕක තුන් සැරයක් කියලා නිදාගනිත්. එතකොට ඔය සියළු රෝග නිවාරණයි. "

හෙන සීරියස් පිට ආරම්භ උන අපේ කතාව හරිම සරල සැහැල්ලු විදියට අවසන් උනේ එහෙමයි.

අපි ඒ විදියට කතා කර කර ඉද්දි සරා අයියානං රුවන්ති නැන්දගෙන් අනේකජාති කෑම කාලා බඩ පුරවගෙන ගේ පිටිපස්සට වෙලා පොල් ලෙලි ගහනවා.

" සරා අයියෙ... දැන්ම ගෙදර යන්න අදහසක් නැද්ද...?"

මං ගේ පිටිපස්ස පැත්තට ගිහින් අහද්දි සරා පොල් ගෙඩියක් අතේ තියාගෙනම ලැජ්ජාවෙන් හිනා උනා.





" රුවන්ති නෝනා බල කරනවනෙ බේබි ඉඳලා දවල්ටත් කාලා යන්න කියලා... "

ආ... එහෙනං ඒකයි මේ මනුස්සයා ඇඹරෙන්න හේතුව.

" මට සරා කිව්වා දැස් පුතා මේ දවස්වල එයාට ඉංග්‍රීසි උගන්නනවා කියලා... "

ඒක කිව්වෙ රුවන්ති නැන්දා.

" ඒත් අපිට ඉංගිරිස් පාවිච්චි කරන්න චැන්ස් එකක් එන්නෙ නැනෙ නෝනා. ඒ නිසා මට දැන් ඒකත් එපා වෙලා තියෙන්නෙ..."

සරා රුවන්ති නැන්දට අහිංසක විදියට කියද්දි නැන්දා ඇස් කොණකින් මගේ දිහා බලලා හිනා උනා. අර දවසක් කරලා තිබ්බා වගේ රෑට ලන්ච් පැකට් එකක් ඉල්ලන්න වගේ චාන්ස් එකක් එයි කියලා කියන්නත් හදලා මං ඒක නොකිය හිටියෙ සරාට ලැජ්ජ හිතෙයි කියලා.

" චාන්ස් කියන ඒවා කල් තියා එන්නෙ නෑ සරා අයියෙ. අර සියම් කුමාරයගෙ කතාව වගේ සරා අයියටත් අහම්බෙන් කණා චාන්ස් එකක් වැදෙන්න බැරි නෑ. "

" මොකක්ද බේබි සියම් කුමාරයගෙ කතාව...? මං ඒක දන්නෙ නැහැනෙ... "

සරා පොල් ගෙඩිය ලෙලි ගහන ගමන්ම ඇහුවා. මේකටත් දෙයක් කිව්වම ඒකෙ අල ගිය මුල ගිය වැල ගිය හැම තැනම දැනගන්න ඕනෙනෙ. ඒත් ඉතිං එහෙමයි කියලා මං සියම් කුමාරයගෙ කතාව නොකියා හිටියෙ නෑ.

" එක ගමක දුප්පත් අහිංසක කොල්ලෙක් හිටියලු හරියට

සරා අයියා වගේ. ඒ කොල්ලා ළඟ ගෙදරක හිටපු නන්දා කියලා ලස්සන ගෑණු ළමයෙක් එක්ක යාළු වෙලා හිටියලු... ''

'' ඒ නං මං වගේ වෙන්න බෑ... මොකද ඉතිං මට ගෑණු ළමයෙක් නැතෙ... ''

සරා මොකාද එකා වගේ කතාව පටන් ගත්තා විතරයි මැදින් පැන්නනෙ. එතකොටම ගිවන්තත් ඇවිත් කුස්සියෙ දොර පඩියෙන් ඉඳගත්තා.

'' කට වහගෙන අහන් ඉන්නකො සරා අයියෙ දැස් කියලා ඉවර වෙනකල්... ''

'' හරි හරි... ඕං මං කට වහගත්තා. බේබි කියන්නකො.''

'' ඉතිං මේ සම්බන්ධෙට අර ගෑණු ළමයගෙ තාත්තා පොඩ්ඩක්වත් කැමති උනේ නැලු කොල්ලා දුප්පත් නිසා. ''

'' ඒ කියන්නෙ තක්කෙටම ගෑණු ළමයා පෝසත් ඇති නේද බේබි..? ''

සරා කට වහගත්තා කිව්වට මිනිහට තත්පර කීපයක් යද්දි ඒක අමතක වෙලත් ඉවරයි.

'' ඔව්... කෙල්ලගෙ පැත්තෙ හොඳට සල්ලි තියෙනවා. ඒ උනාට කෙල්ලනං කොල්ලට පණ ඇරලා. ඉතිං තාත්තා අකමැති නිසා මේ ජෝඩුව එකතු වෙලා පොඩි ප්ලෑනක් ගැහුවලු. ''

'' ඒ මොකක්ද...? ''

'' කෙල්ල කොල්ලට කිව්වලු සියම් රටේ කුමාරයෙක් විදියට කපුවෙක් හරහා තාත්තට යෝජනාවක් එවන්න කියලා...''

'' ඉතිං... ''





'' ඉතිං ඔන්න දවසක් දෙකක් යද්දි කෙල්ලගෙ ගෙදරට කපුවෙක් ඇවිත් තාත්තට කිව්වලු සියම් දේශයේ පෝසත් කුමාරයෙක් කුමාරිකාවක් හොයන්න ලංකාවට ආපු වෙලාවෙ ඔයාගෙ දුවව දැකලා එයාව සරණපාවා ගන්න කැමති වෙලා කියලා. මේක අහලා මේ මෝඩ තාත්තා හරියට සතුටු වෙලා කිව්වලු පහුවෙනිදටම ඒ කුමාරයව එක්ක එන්න කියලා... ''

'' එතකොට බේබි කවුද ඒ කියන කපුවා...? ''

ඒකනං තරමක වැදගත් ප්‍රශ්නයක් නිසා මං සරාට බැන්නෙ නෑ.

'' කපුවා ඒ කෙල්ල සල්ලි දීලා ගෙන්නපු හොර කපුවෙක්. ඉතිං පහුවෙනිදා මේ කොල්ලා පුළුවන් උපරිම විදියට වෙස් වලාගෙන අමුතු විදියෙ සේද ඇඳුම් ඇඳගෙන කපුවා එක්ක කෙල්ලගෙ ගෙදරට ගියාලු... අඩි උස සපත්තු දාලා තේජවන්ත විදියට ඇවිදගෙන එන සියම් කුමාරයව දැකපු කෙල්ලගෙ තාත්තා බිම දණ ගහලා කුමාරයට ආචාර කළාලු. ඒ පාර කුමාරයා සියම් බාසාවෙන් කිව්වලු ' බං ගෝස් සිගී නැටිං ' කියලා... ''

'' ඒ කියන්නෙ ඒ හාදයා සියම් බාසාවත් ඉගෙන ගෙනද...?''

සරා ඇහුවෙ ඇස් දෙකත් පොල් ගෙඩි තරම්ම ලොකු කරගෙන. ඒ ප්‍රශ්නෙට රුවන්ති නැන්දා වගේම ගිවන්තත් හිනා උනා.

'' නැතුව. කුමාරයා සියම් බාසාවෙන් කියපු දේ තේරුණේ නැති නිසා තාත්තා කපුවාගෙන් ඇහුවලු මොකක්ද ඒ කිව්වෙ කියලා. ඉතිං කපුවත් හරි ආඩම්බරෙන් කිව්වලු ඒ කියන්නෙ නැගිටින්න කියන එක කියලා. අර තාත්තා දඩිබිඩි ගාලා නැගිටලා

කුමාරයව ගෙට අරගෙන ගිහින් උපරිම සත්කාර ඇතුව භෝජන සංග්‍රහයකුත් දුන්නලු. කැමැත්තෙන් දෙන දේනෙ කියලා ඒ සංග්‍රහයත් භුක්ති විඳලා අන්තිමේ කුමාරයා ඇහුවලු ' නා කොන්දා ' කියලා."

" ඒ කියන්නෙ...? "

" ඒ කියන්නෙ 'නන්දා කොහෙද' කියලා. ඉතිං තාත්තා දුවව ගෙනල්ලා අර කුමාරයට බාර දුන්නලු. කුමාරයා 'බෝයි ආවං... බටා ටායි ' කියලා ඒ වෙලාවෙම කෙල්ලවත් අරන් යන්න ගියාලු... "

" ඒ අන්තිමටම කිව්වෙ මොකක්ද බේබි...? "

"ආයිබෝවං කියලනෙ සරා අයියෙ. තේරෙන්නෙ නැද්ද?"

රුවන්ති නැන්දා බඩ අල්ලගෙන හිනාවෙද්දි සරානං හිටියෙ ලොකු කල්පනාවක.

" ඇත්තටම බේබි මුලින් කිව්වා වගේ වෙන බාසාවක් ඉගෙනගෙන ඉන්න එකෙත් වාසි තියෙනවා නේද...? "

එහෙනං මෙච්චර වෙලා කතාව අහගෙන ඉඳලත් ඒ කුමාරයා කතාකළේ සියම් බාසාව නෙමෙයි කියන එක මේ මෝඩයට තේරිලා නැති එකනෙ වැඩේ.

" සරා අයියා ඉංග්‍රීසි ඉගෙනගන්නෙ ඔයාට සිංහල හොඳට පුළුවන්ද...? "

අවුරුදු විසිගාණක හිටපු සරාගෙන් ඒ ලැජ්ජනැති ප්‍රශ්නෙ ඇහුවෙ ශිවන්ත.

" නැතුව... මං මේ අගේට සිංහල කතා කරන්නෙ... "

" මං ඇහුවෙ එහෙම නෙමෙයි... ව්‍යාකරණ එහෙම පුළුවන්ද කියලා. "





ශිවන්තත් ගේම අතාරින්නෙ නෑ. ඌ සරාව මඩවන්නමයි හදන්නෙ.

" ඒ මොනාද අප්පේ ඒ...? "

" ඇයි සරා අයියෙ.... සිංහල බාසාවෙ මම කියන එකෙන් වාක්‍යයක් පටන් ගන්නවානං ඒක ඉවර කරන්න ඕනෙ 'මි' යන්නෙන්. අපි නම් 'මු' යන්නෙන්. "

ඒක කිව්වා විතරයි සරා පොල් ලෙලි ගැහිල්ල පැත්තක තියලා කල්පනා කරන්න පටන් ගත්තා.

" මම නං 'මි' යන්නෙන්. නේද...? හරි මට පුළුවන්... "

" පුළුවන්නම් කියන්න බලන්න මම කියන එකෙන් පටන් ගන්න වාක්‍යයක්.... "

" මම ඇති කරන මාළු සේරම ගුරාමි... හරි නේද බේබි...?"

සරා ඇස් දෙකත් නටවලා ඒ වාක්‍යය කිව්වම රුවන්ති නැන්දට හිනා වෙලා ඇස් දෙකට කඳුළුත් එනවා මං දැක්කා.

* * * * * * *

# 15

දවසක් ඔෆිස් එකට ගියපු මමයි ගිවන්තයි දෙන්නා අපේ ලැන්ඩ් සේල් එකේ විස්තරයි දැනට අපේ විකුණන්න තියෙන සමහර ඉඩම් වල විස්තරයි ෆොටෝස් වගයකුයි දාලා අත් පත්‍රිකාවක් ඩිසයින් කළා. ඊට පස්සෙ ඒක චූටි මාමට පෙන්නලා එයාගෙනුත් අනුමැතිය අරගෙන අපි හන්දියෙ ප්‍රෙස් එකට ගියා පත්‍රිකාව ප්‍රින්ට් කරගන්න.

'' දැන්මම දෙන්නනං විදියක් නෑ මහත්තයා. හවස තුන විතර වෙද්දි ප්‍රින්ට් එක දාලා තියන්නම්... ''

ප්‍රෙස් එකේ මනුස්සයා කැත නැතුව අපේ වැඩේ හවසට කල් දැම්මා. දැන් ඉතිං මොනවා කරන්නද...? අපි චූටි මාමට කියලා ආවෙ ආයෙ එද්දි ප්‍රින්ට් කරපු කොළ ටික අරන් එන්නම් කියලනෙ.

'' අපි යන්ද අර පස්යාලෙ ඉඩම පැත්තෙ ගිහින් එන්න...''

ඒ යෝජනාව ගෙනාවෙ ගිවන්ත.

'' මරු අයිඩියා එක... හොයාගෙන යං බලන්න... ''





මං හොයාගෙන යං කිව්වෙ ඒ ඉඩමට අපි මීට කලින් ගිහින් නොතිබුණු නිසා.

සමරෙ මාමා කියලා තිබුණු විදියට නුවර පාරෙ පස්යාල හරිය පහුකරලා ඇතුල් පාරක පිහිටලා තිබුණු ඒ ඉඩම අක්කර විසිහතක්ලු. ඉඩම ඉස්සරහින් තිබුණු පාරත් අළුතෙන් පුළුල් කරලා කාපට් දාපු පාරක්ලු. ඒ පාරට හැරෙන තැන තුරුලිය ලැන්ඩ් ලේස් කියන අපේ කම්පැනි බැනර් එකත් ලොකුවට ගහලා තියෙනවා කිව්ව නිසා හොයාගන්න අමාරු වෙන එකක් නෑ.

'' මම තාත්තගෙන් යන විදිය අහගත්තා. වරදින්න විදියක් නෑ. යමුකො... ''

ගිවන්තගෙ කතාවෙන් මගේ හිතට පොඩි ගටක් ආව නිසා අපි දෙන්නා ප්‍රෙස් එකේ ඉඳලා කෙලින්ම ගමන් ඇරඹුවෙ පස්යාලට.

'' මමනං කියන්නෙ මචං මේ හැරෙන පාරෙ ඉඳලා විතරක් අපේ බැනර් දාන එකේ අවුලක් තියෙනවා කියලයි. මේන් රෝඩ් එකේ ඉඳලම අපේ අර ස්ටෝස් එකේ ගොඩ ගහලා තියෙන ලැන්ඩ් සේල් කොඩි ටික දාලා දැම්මනං මරු. ඒකෙන් ඉඩම ගැනත් ප්‍රචාරයක් යනවා. අපේ කම්පැනියටත් පබ්ලිසිටියක් එනවා.''

මං ඒ කතාව ගිවන්තට කිව්වෙ මිනිහගෙ අදහස මොකක්ද කියලා දැනගන්න.

'' මමත් තාත්තගෙන් ඇහුවා ඒ තරම් බැනර් තොගයක් ගොඩ ගහගෙන ඉන්නෙ ඇයි දාන්නෙ නැතුව කියලා. එයාලා කියන්නෙ තරමක ලොකු ඉඩමක් හම්බ උනාම ඒවට දාන්නලු තියාගෙන ඉන්නෙ. එහෙම නැතුව පාර පුරා බැනර් ගහපුවම මිනිස්සු ඉඩම් ගැනිල්ල කෙසේ වෙතත් ඒ බැනර් අරන් ගිහින්

මිරිස් වේලන්නයි මෙස රෙදි වලටයි පාපිසි මහන්නයි වගේ දේවල් වලට පාවිච්චි කරනවලු. ''

සමරෙ මාමා කියලා තියෙන කතාවෙත් ඇත්තක් තියෙනවා බලන් යද්දි. අපේ රටේ මිනිස්සුන්ට නිකං හම්බවෙනවානං දෙමළ පත්තරේ උනත් කමක් නැහැනෙ. ඒත් එහෙමයි කියලා ඒ දේවල් පාවිච්චි නොකර නිකම්ම තියෙද්දි මීයො ඒවා ගෙවල් හදන්න අරන් යනවනෙ. අනික මේ පස්යාලෙ ඉඩමත් කොයි තරම් ලොකුද. පර්චස් දහයෙ විස්සෙ ඉඩම් කට්ටිම කීයක්ද.

'' ඒත් ගිවා ඉඩමට පබ්ලිසිටි ලැබෙන තරමට මිනිස්සු අඩු තරමෙ ඉඩම බලලා යන්න හරි එනවනෙ. මමනං අහලා තියෙන විදියට භූමියකට මිනිස්සු පය ගහන එක වැඩි වෙන තරමට ඒ ඉඩම වාසනාවන්ත වෙනවා කියලයි. සෙනග ගැවසෙන එකෙන් තමයි එතන වටිනාකමත් වැඩි වෙන්නෙ. ''

'' ඔය තියෙන්නෙ මල්ලි මරු ක්‍රියේටිව් අයිඩියාස්... අපි තාත්තලා එක්කත් කතා කරලා ඕක එක ඉඩමකට විතරක්වත් අතහදා බලමු. අනික මට හිතෙන්නෙ අපි දෙන්නා අර ගිය සතියෙ අපේ කම්පැනියෙ නමට ෆේස් බුක් එකේ හදපු ෆෑන් පේජ් එකත් තරමක් දුරට වැඩ කරයි කියලා... ''

ඔව්නෙ. අපි ගිය සතියෙ අපේ කම්පැනිය යටතේ තියෙන ඉඩම් වල විස්තර දාලා ඒවයෙ ෆොටෝස් දාලා එළකිරි වගේ පේජ් එකක් ඩිසයින් කළානෙ. මීට කලින් අපේ කම්පැනිය යටතේ ඉඩම් අරන් ගෙවල් හදපු සමහරුත් මේ වෙද්දි ඒකෙ ෆෑන්ස්ලා වෙලා තියෙනවා. අනික මිනිස්සු ඔය මොන බොරු බයිලා ගැහුවත් ෆේස් බුක් ලොග් වෙන්නෙ අවුරුදු දහ අටේ විස්සෙ කෙල්ලො





කොල්ලො විතරක් නෙමෙයි. ලොකු ලොකු ජොබ් කරන ලංකාවෙ නද පොරවල් වලින් භාගෙට භාගයක් මේ වෙද්දි මුහුණු පොතේ සාමාජිකයො.

'' මේ පාරෙ නේද...? ''

පොඩි කයියකුත් දාගෙන පස්යාල පහු කරද්දි අපේ කම්පැනි බැනර් එක දාපු ඒ කියන පාර අපිට හම්බ උනා. ඒකෙ වැඩි දුරක් යන්න උනේ නෑ වම් පැත්තෙ දිගට දිගේ පළලට පළලෙ තුරුලිය ලෑන්ඩ් සේල් ඉඩම දිලිසෙනවා.

'' අපිත් මේ වගේ සාඩම්බර ව්‍යාපාරයක කොටස්කාරයො කියලා ගෙදරට වෙලා ඉන්න කාලෙ දැනුණෙ නෑ නේද බං... බලපංකො මේකෙ පෙනුම කොහොමද කියලා... අම්මපා පොකට් මනී හරි එකතු කරලා මටත් මේකෙන් කෑල්ලක් ගන්න හිතෙනවා.''

පාර අයිනෙන් බයික් එක නතර කරලා බැස්සා විතරයි ගිවන්ත ඒක කිව්වෙ හෙල්මට් එක ගලවන්නෙවත් නැතුව. අනේ මූ ගන්න ඉඩම්...

'' මචෝ... අර අතන මිනිස්සු කට්ටියක් එක්ක කතා කරන මෑන් දිහා ටිකක් බලපං. මට නිකං දැකලා පුරුදුයි වගේ...''

ඉඩමෙ සිරි නරඹපු ගිවන්තගෙ දර්ශන පථයට ඒ අහුවෙලා තිබුණෙ වෙන කවුරුවත් නෙමෙයි ඇත්තනී අන්කල්ව. අනේ ඉතිං අපේ තාත්තලා මේ තරම් එළවද්දිත් මූ තවත් එනවනෙ ලැජ්ජ නැතුව මේවා අස්සෙ රිංගන්න.

'' යමුකො ඇතුළට... ගිහිල්ලම කතා කරමු... ''

අපි දෙන්නා කිසි අවුලක් නැතුව හෙල්මට් දෙකයි ජැකට් දෙකයි පිටින්ම ඉඩමට ඇතුළුවෙන මේන් ගේට් එක ළඟට ගියා.

සිකියුරිට්ලා දෙන්නට අමතරව අපේ ඔෆිස් එක එතන මුර කුටියෙ සිකියුරිටිලා දෙන්නා ගාවට දුවගෙන නියෝජනය කරන්න හිටපු මනුස්සයා අපි දෙන්නා ගාවට දුවගෙන ආවෙ හිනා කටක් පුරවගෙන.

අපේ තාත්තලා මොනවා නැතත් මිනිහට ගනුදෙනුකරුවන් පිළිගැනීම ගැනනම් හොඳ ට්‍රේනින් එකක් දීලා තියෙනවා.

" මහත්තයලා ආවෙ ඉඩමක් බලන්න වෙන්නැති නේද...?"

චිකේ... හොඳයි කියලා හිතුවා විතරයි මේ යකා ඇවිත් ගොන් ප්‍රශ්නයක් ඇහුවනෙ. ලෑන්ඩ් සේල් එකකට එන්නෙ ඉඩමක් බලන්න නේන්නං.... නැතුව කොට කලිසමක් ගන්නයැ.

කොහොම උනත් මනුස්සයා මාවයි ගිවන්තවයි දන්නෙනම් නැති පාටයි. අනික ඉතිං දන්නවා උනත් මේ ඉන්න විදියට අපිව හරියට අඳුරගන්නත් බෑනෙ.

" අන්කල් අපිට මේකෙ පාර අයිනෙ ඉඩම් කෑල්ලක් වෙන් කරගන්න පුළුවන්ද...? "

ඉඩමෙ ඉස්සරහා කොටසෙ ටික වෙලාවක් එහා මෙහා ඇවිදලා ඒකෙ මායිම් දිහත් හොඳ උනන්දුවෙන් බලලා ඉඩමෙ මැද හරියට වෙන්න හිටපු ඇන්තනී දිහත් බලලා ගිවන්ත ප්‍රශ්නයක් ඇහුවා.

" පාර අයිනෙ ඉඩම්නං මේ වෙද්දි සේරම විකිණිලා ඉවරයිනෙ මහත්තයා. දන්නවනෙ ඉතිං... බිස්නස් කරන අය ආවොත් මුලින්ම ඉල්ලන්නෙ පාරට මායිම් වෙන කෑලි ටික තමයි. මහත්තයලට ඕනෙනම් මේ මැද හරියෙන්... "

" නෑ නෑ අන්කල්... මේක මේ අපේ තාත්තගෙ ෂොප් එකකට. අපිට ඕනෙ පාර අයිනෙන්ම තමයි... "





හිතේ ඇති වෙලා තිබුණු පුදුමෙ යටපත් කරගෙන මමත් ටිකක් තදින්ම ඒ කතාව කියලා හිටියා මූ මොනාද කියන්නෙ බලන්න. ඇයි දෙයියනේ මේ අපේ අලුත්ම ප්‍රොජෙක්ට් එකනෙ. මේකෙ ඉඩම් කොහෙද ඉවර වෙන්නෙ. අපි අද උදෙත් මේකෙ රිසවේෂන් ප්ලෑන් එක බලද්දි තාම ඇඩ්වාන්ස් හම්බවෙලා තිබුණෙ ඉඩම් කට්ටි හතරකටද පහකටද විතරයි.

" පාර අයිනෙ බ්ලොක් වල ගාණනම් ටිකක් වැඩියි... "

එහෙම කියලා මනුස්සයා එක එක ඉඩමට අත දික් කරලා ඒවයෙ පර්චස් එකක මිල ගණන් වෙන වෙනම කියාගෙන ගියා.

" නෑ... අපිට ගාන වැදගත් වෙන්නෙ නෑ. අපිට ඕනෙ මෙන්න මේ හරියෙන්ම හොඳ හතරස් ඉඩම් කෑල්ලක්... "

ගිවන්ත ගේට්ටුව පැත්තට අත දික් කරලා පෙන්නද්දි මමත් ඒක අනුමත කරන්න වගේ ඔළුව වැනුවා.

" එහෙනං අපේ අර මහත්තයගෙන් තමයි අහලා බලන්න වෙන්නෙ... "

අප්පට සිරි... මේ මොනවද වෙන්නෙ. මූ අර මහත්තයා කියලා පෙන්නුවෙ ඇන්තනීකාරයාවනෙ. මූට කොහෙන්ද අපේ ඉඩම් ගැන තීරණ ගන්න අයිතියක්.

" ඒ මහත්තයද මේකෙ අයිතිකාරයා...? "

ඇගේ මයිල් එකින් එක කෙලින් වේගෙන එද්දි මං බොහොම අමාරුවෙන් ඒක ඉවසගෙන ප්‍රශ්න කළා. නැතුව ඉතිං එක පාරට කලබල උනොත් මේ දැනගන්න තියෙන දෙයක්වත් දැනගන්න වෙන්නෙ නෑනෙ.

" නෑ. ඒ මහත්තයා තමයි මෙතන වැඩ බලන්නෙ. එයා

එක්ක කතා කළොත් ඔෆිස් එකත් එක්ක කතා කරලා මහත්තයලගෙ වැඩේ කරලා දෙයි... හැබැයි ඉතිං... ''

එහෙම කියලා මිනිහා අමුතුම ජාතියෙ පල් හිනාවක් දැම්මා. ඒකෙන් අදහස් කළේ 'හැබැයි ඉතිං ඒ මහත්තට කීයක් හරි දෙන්න වෙයි' කියන එක මට තේරුම් ගන්න අමාරු උනේ නෑ.

'' හරි... අපි ඒ ගැන කතා කරන්න එහෙනං තාත්තවත් එක්කගෙනම එන්නම්... ඒ මහත්තයා හැමදාම මෙතන ඉන්නවද...?''

මූ නිකං හරි එක පාරටම ඇන්තනීව මෙතනට එක්කගෙන ආවොත් මොන හෙල්මට් දාගෙන හිටියත් මිනිහා අපිව අඳුරගන්නවා. ඒකෙ ආයෙ කතා දෙකක් නෑ.

'' ඉරිදයි අඟහරුවාදයි බ්‍රහස්පතින්දයි දවස් තුනේනම් අනිවාර්යෙන්ම එනවා. ඒ නැතත් අවශ්‍යතාවයක් තිබුණොත් වෙන දවසක උනත් එනවා. ''

මේකනං මාස්ටර් ප්ලෑනක්. මොකද මිනිහා කියපු ඒ දවස් තුන තමයි සමරෙ මාමා සයිට් විසිට් වලට යන්නෙ නැති දවස් තුන. ඒ දවස් වල වැඩ කෙරෙන්නෙ ඔෆිස් එකේ නියෝජිතයො විදියට බඳවගෙන ඉන්න මේ වගේ අය හරහා.

තාත්තා උනත් එයාට හිතුන වෙලාවල් වල ඇවිත් යනවා මිසක් මෙතන රැඳෙන්නෙ නෑ කියලා මේ මිනිහා දන්නවනෙ. ඒ කියන්නෙ මේ යකත් ඇන්තනීගෙ අතකොළුවක්. මං කොයි එකටත් කියලා දැන් වෙලාව බැලුවා. අපෝ... තාම දොළහටත් නෑ. හෙට බදාදා දවසක් නිසා තාත්තව මෙතනට ගෙනාවට ඇන්තනියව අල්ලගන්න වෙන්නෙ නෑනෙ.

'' මොකද කියන්නෙ මචං...මටනං මේ ප්ලේස් එක හිතට ඇල්ලුවා. අර මහත්තයා අද දවසම ඉන්නවා කියපු එකේ අපි





දැන්ම ගිහින් තාත්තව එක්කගෙන එමුද...? තව පරක්කු උනොත් අපිට ඉඩමක් ගන්නම බැරි වෙයි... ''.

මං හිතේ තියෙන දේ අර මිනිහා ඉස්සරහම ගිවන්තට කියලා දැම්මෙ සැකයක් නොහිතෙන විදියට. කොහොම උනත් ඒ වෙද්දි ඇන්තනී පේන්න හිටියෙ නෑ. ඌ අර මිනිස්සු කට්ටියත් එක්ක ඉඩම ඇතුළටම ගිහින්.

'' ඒකනං ඇත්ත මහත්තයා. මේක මසුරන් වටින ඉඩමක්. ඉස්සරහට මේවා තමයි සීඝ්‍රයෙන් දියුණුවෙන පැති. ''

'' එහෙනං අන්කල් අපි තව පැය දෙක තුනකින් විතර තාත්තා එක්ක එන්නම්. තරහා නැතුව අපිට අන්කල්ගෙ නම කියන්න පුළුවන්ද...? ''

'' මං ජයනාථ. අර මහත්තයගෙ නම ඇන්තනී. ''

අපි එක නමක් ඇහුවා විතරයි මනුස්සයා කිසි ලෝභකමක් නැතුව නම් දෙකම කිව්වා.

'එහෙමනං හිටපංකො අන්කල් අපි උඹට සම්බුව ලෑස්ති කරගෙන එනකල්... '

ඒක හිතෙන් විතරක් කියලා අන්කල්ට හරි ලස්සන ටිකිරි හිනාවක් දාපු අපි දෙන්නා ඉක්මනටම එතනින් පැනගත්තා.

'' දැස්... දැන් මොකද කරන්නෙ...? මේක පොඩ්ඩක්වත් පරක්කු කරන්න හොඳ සිටුවේෂන් එකක් නෙමෙයි. අපේ තාත්තව බැරිනං උඹලගෙ තාත්තව හරි අපි මෙතනට ගේන්නන්න ඕනෙ.''

'' ඔව්... ඔව්... එයාලගෙ සේවකයන්ගෙ විශ්වාසවන්තකම එයාලටම පෙන්නන එක තමයි හොඳම දේ. එක අතකට මේවා අපේ තාත්තලටත් හොඳ පාඩම් මචං... අර ඇන්තනීලා වගේ

අහක යන නයි රෙද්ද අස්සෙ දාගෙන දැන් කනෝ කනෝ කියන්න වෙලා තියෙන්නෙ. දැන් ඉතිං මොනවා කරන්නද...? අපි කෙලින්ම ඔෆිස් එකට යමු. ගිහින් තාත්තට සීන් එක නොකියා එක්ක එමු..."

" ඒකනං ලේසි වෙන එකක් නෑ පුතෝ... "

ගිවා මඩේ හිටවපු ඉන්න වගේ දෙපැත්තට වැනුනට මංනං වැඩේ අතෑරියෙ නෑ. බයික් එක පුළුවන් උපරිම ස්පීඩ් කරපු මං කෙලින්ම ආවෙ අපේ ටවුන් එකට.

" මේ කොහෙද යන්නෙ...? "

ඩයස් අයියගෙ ෆෝන් ෂොප් එක ළඟ බයිසිකලේ නතර කළාම ගිවන්ත ඇහුවෙ ඇස් දෙකත් ලොකු කරගෙන.

" මං ටක් ගාලා ඩයස් අයියට පණිවිඩයක් කියලා එනකල් උඹ අපේ තාත්තට කෝල් කරලා අහපං දැන් ඔෆිස් එකේ ඉන්නවද කියලා... "

මගේ සදාදර ලොකු අයියට නියෝගයක් දීලා මං ඩයස් අයියා හම්බවෙන්න ගිහින් පොඩි ප්ලෑනක් ගහගත්තා. ඒක මං ගිවන්තට කිව්වෙ ඔෆිස් එකට ආවට පස්සෙ.

" මිනිහා වැඩේ ගාණට කරයිද...? "

" මිනිහා ඒක ගාණට කරයි. අපි අපේ වැඩේ ගාණට කරමුකො. වරෙන්... "

අපි තාත්තලට හදිස්සි ගමනක් යන්න එන්න කිව්වට එයාලා ඒකට වැඩිය ප්‍රතිචාරයක් දැක්කුවෙ නෑ. ඒත් එහෙමයි කියලා නොගිහින් පුළුවන්ද... අපි මේ යන්නෙ අපේ ඉඩමක නීතිවිරෝධී කටයුත්තක් අල්ලලා දෙන්න කිව්වට පස්සෙ තමයි දෙන්නා කඩිමුඩියෙ ලෑස්ති උනේ.





" හැබැයි තාත්තෙ ඔයාලා දෙන්නට යන්න වෙන්නෙ අපි ගෙන්නන වාහනේ. මොකද අපේ කම්පැනි වාහනේක ගියොත් වැඩේ ඇනෙනවා. "

තාත්තා ඒකට කතා නොකරම ඔළුව වැනුවෙ එයාට වැඩේ බරපතලකම තේරිලා තිබුණු නිසාද කොහෙද.

කොහොමහරි ඩයස් අයියා නියම වෙලාවට එයාගෙ අයියව මිනිහගෙ වෑන් එකේ අපේ ඔෆිස් එකට එවලා තිබුණා. වාහනේ අලුත්ම මොඩ්ල් එකේ ටොයෝටා හයිඒස් එකක්. ඒකෙ වීදුරු කළු කරලා නිසා පිටිපස්සෙ ඉන්න අයව පැහැදිලිව පේන්නෙ නෑ.

අපි තාත්තලා දෙන්නව ඒකෙ පිටිපස්සෙම සීට් එකේ ඉන්දවලා මැද සීට් එකක් හරහා අපේ පරණ කටවුට් එකක් අනිත්පැත්ත හරවලා හේත්තු කළා. ඒක වාහනේ බිම ඉඳලා වහලෙ කිට්ටුවටම උස නිසා තාත්තලව දැන් කොහොමටවත් පේන්නෙ නෑ.

" අයියට ඩයස් අයියා සිද්ධිය විස්තර කරන්න ඇතිනෙ. ගිහින් අපේ තාත්තා විදියට ඇක්ට් කරන්නයි අයියට තියෙන්නෙ. හැබැයි මිනිස්සුන්ව කොටු වෙන විදියට අයියම ප්‍රශ්න අහන්න. අපිව වැඩිය කතාවට ගාවගන්න එපා. තේරුණානෙ.... "

කොණ්ඩෙත් ඉදිලා තරමක් තට්ටෙත් පෑදුනු ඩයස් අයියගෙ අයියව ඒ විදියට අපේ තාත්තා කරගෙන අපි දෙන්නා පාර ගාවට ගියා. ඒ වෙද්දි ඩයස් අයියගෙ ෂොප් එකේ වැඩ කරන අනිත් කොල්ලා අපිට ඌගේ මෝටර් සයිකලෙත් ගෙනත් පාර අයිනෙ නතර කරලා තිබුණෙ.

" රායිට් මල්ලි. ඔයා දැනට අපේ බයික් එක අරන් යන්න.

අපි මේක ෂොප් එකටම ගෙනත් දෙන්නම්... ''

ඒ මනුස්සයවත් පිටත් කරලා අපි අපේ වැටලීමේ මෙහෙයුම ක්‍රියාත්මක කළා. ඉඩම කිට්ටුවට යනකල්ම ගිවන්තයි මායි අතරෙ විශේෂ කතා බහක් සිද්ධ උනේ නැති තරම්.

'' බහින්න කලින් බලපං ඇන්තනී කෝ කියලා... ''

පස්සාලෙන් හරවලා ඉඩම කිට්ටුවටම යද්දි ගිවන්ත කිව්වත් වගේ මං වටපිට බැලුවා. අවුලක් නෑ. මිනිහා පේන මානෙක නෑ. දැන් ඉතිං බැහැලම බලනවා.

කොයි එකටත් ගිවන්තව බයික් එක ගාව නතර කරලා මං විතරක් ඉඩමෙ ගේට් එක පැත්තට ඇවිදගෙන ගියා. ඒ වෙද්දි තාත්තලා ආපු වෑන් එකත් අපේ බයික් එක කිට්ටුවෙන්ම නතර කරලා තිබුණෙ. මගේ හස්ත සංඥාවකට අනුව අපි කුලියට ගත්තු තාත්තත් වෑන් එකෙන් බැහැලා ඉඩම ඇතුළට ආවා.

'' අයියෙ... ආන් අර ඉන්නෙ මැන්. ඌ තමයි ජයනාථ කියන්නෙ. අනිකත් ඇතුළෙ ඇති සමහරවිට. බලමුකො... ඌ එක්ක කතා කරලා මං හෙමීට වෑන් එක පැත්තට කැපෙන්නං. අයියා ඌව ඒ පැත්තට එක්කගෙන එන්න බලන්න... ''

'' ආ... මේ මහත්තයා නේද දවාලෙත් ඇවිත් ගියේ..? මේ ඉන්නෙ තාත්තා වෙන්නැති...? ''

අපිව දැක්ක ජයනාථ ඌගෙ අර සුපුරුදු සුහදශීලී හිනාව දාලා කතාවට බැස්සා. ඒහෙනං එක පාරක් දැක්කට මිනිහට අපිව මතකයි.

'' ඔව් අන්කල්... ඉඩම හොඳයි කියලා දැනුණ නිසා අපි දැන්මම තාත්තව එක්කගෙන ආවා. කෝ අර ඇන්තනී කියපු





මහත්තයා නැද්ද...? ''

'' ඒ මහත්තයා අනිත් පැත්තෙ සිකියුරිටි එකේ ඇති. ඉන්නකො මං එක්කගෙන එන්නම්... ''

'' අපි අදම ඇඩ්වාන්ස් ගෙවන්න බලාගෙන ආවෙ අන්කල්. ඇන්තනී මහත්තයට ඒක කියන්න... ''

හැරිලා යන මනුස්සයව තව ටිකක් ෆෝම් කරලා මං හෙමීට ඇවිත් වෑන් එකෙන් ඉඳගත්තා. ඒ වෙද්දි ගිවන්තත් හිටියෙ වෑන් එකේ පිටිපස්සෙ වාඩි වෙලා.

එතන ඉඳලා අපිට තිබුණෙ ඩයස් අයියගෙ අයියා ගේම ගහන හැටි නරඹන එක විතරයි. ජයනාථ ඉඩම ඇතුළෙ ඉඳලා ඇන්තනීව එක්කගෙන ඇවිත් අර මනුස්සයට මූණ ගස්සන හැටි දෙතුන් දෙනා ටික වෙලාවක් කතා කරන හැටි අපි වාහනේ ඇතුළට වෙලා බලාගෙන හිටියා.

'' ඔය ජයනාථයා මිනිස්සුන්ව හැන්ඩ්ල් කරන හැටි දැකලා මං හිතුවෙ නලින් ඌ අපේ බිස්නස් නග්ගලා ගනියි කියලයි. දැන් බලන් යද්දි මේකා අර හොර තක්කඩියා එක්ක එකතු වෙලානෙ.''

දැන් තාත්තටයි සමරෙ මාමටයි වැඩේ මීටර් වෙලා ඉවරයි. අනික ඇන්තනීගෙ ගේම් ගැන අපිටත් වඩා හොඳට ඒ දෙන්නා දැනගෙන හිටියනෙ. එයාලට මෙච්චර කල් කරන්න බැරි උනේ ඇන්තනී පගා ගහද්දි ඌව අතටම අල්ලගන්න එකනෙ. දැන් අපි ඒ අවස්ථාව වැඩි මහන්සියකින් තොරව එයාලට ලබා දීලා තියෙනවා. ඉතුරු හරිය තාත්තලට බාරයි.

'' මේ මිනිහගෙ බයෝ ඩේටා එක ගෙනත් දුන්නෙ ඇන්තනීම තමයි සමරෙ. මට හොඳටම මතකයි ඇන්තනී කිව්වා

ජයනාථ මීට කලින් හොඳට කස්ටමර්ස්ලා හැන්ඩ්ල් කරලා තියෙනවා කියලා. ඒ කිව්ව පළියටම මං මිනිහව විශ්වාස කළේ නෑ... "

" නැතුව නැතුව නලින්... අපි දෙන්නම ඉන්ටර්විව් කරලා බලලනෙ මිනිහව ගන්න ඩිසයිඩ් කළේ... "

ඔන්න අපේ බොරු තාත්තා වැඩේ ඇදගෙන යන අතරෙ ඇත්ත තාත්තලා දෙන්නා අල ගිය මුලගිය ඉතිහාස කතා ටිකක් ඇදලා අරගෙන. මමයි ගිවන්තයි දෙන්නානං හොඳ බබාලා දෙන්නා වගේ වැඩිහිටියන්ගෙ කතා වලට හොට නොදා පාඩුවෙ හිටියා.

" අන්න කට්ටිය මේ පැත්තට එනවා. කතාව නවත්තගන්න... "

ඇන්තනීවත් එක්කගෙන ඩයස් අයියගෙ අයියා වෑන් එක දිහාට ඇවිදගෙන ආවා. ඊට පස්සෙ වෑන් එකේ දොර ටිකක් විතර ඇරලා ඒකට කකුලකුත් තියාගත්තා.

" එහෙම කරලා බෑ මහත්තයෝ... මං මේ තරම් දවස් හෙව්වෙ පාර අයිනෙ ඉඩම් කෑල්ලක්. පුතාලා කිව්ව නිසා මං මේ ඇඩ්වාන්ස් එකකුත් අරගෙන ආවෙ. මට ඕන විදියට වැඩේ සිද්ධ වෙන්නෙ නැත්තං අපි මේක අතෑරලා දාමු... "

අප්පට සිරි. ඔය තියෙන්නෙ අපේ අලුත් තාත්තගෙ ඇක්ටින් පාර ආයෙ නෑ ලොවෙත් නැති වෙන්න.

" මං කිව්වනෙ සර්... මේ වෙද්දි ෆ්‍රන්ට් ලයින් එකේ බ්ලොක් සේරම වෙන් කරගෙන ඉවරයි. ඒක වෙනස් කරගන්නනං ඉතිං කම්පැනි එකත් එක්ක කතා කරලම බලන්න වෙනවා... "

ඇන්තනිත් මුසාවාදා ගෙඩි පිටින් ඇද බානවා.





" එහෙනං මට ඔෆිස් එක තියෙන තැන කියන්න... මං ගිහින් එයාලා එක්ක කතා කරන්නම්... "

" නෑ... නෑ... අපි අපේ ගනුදෙනුකාරයො එහෙම රස්තියාදු කරන්නෙ නෑ. අනික ඉතිං සර් ගියත් අපේ ලොක්කා වෙන් කරපුවට අත තියන්න කැමති වෙයි කියලා මං හිතන්නෙ නෑ. "

ඇන්තනීකාරයා ට්‍රයි කරන්නෙ එයා කරලා දෙන්න යන වැඩේ කොයි තරම් අමාරුද කියලා ගනුදෙනුකරුට එත්තු ගන්වන්න.

" එහෙමනං මට මේක කෙරෙන විදියක් ගැන කියන්නකො... "

" සර්ට අමතර රුපියල් දහ පාලොස්දාහක් වියදම් කරන්න පුළුවන්නම් මං වැඩේ ෂුවර් එකටම කරලා දෙන්නම්... "

ඕං බළලා මල්ලෙන් එළියට පැන්නා. මං බයේ හිටියෙ ඒ කතාව ඇහුණා විතරයි තාත්තලා දෙන්නා කටවුට් එකත් පෙරලගෙන බිමට බහියි කියලයි. ඒත් ඒ දෙන්නා ඒ තරමට කලබල උනේ නෑ.

" හරි... මං ඒ ගාන මේ දැන්ම ගෙවන්නම්. හැබැයි කොන්දේසි දෙකක් මත.... එකක් මං පෙන්නන බ්ලොක් එකම මට ගන්න ඕනෙ. දෙවෙනි කාරණේ ඒ ගෙවන මුදලට මට රිසිට් එකක් දෙන්න ඕනෙ. "

හූහ්... අපි ඉඳලා ඉඳලා වැඩේට සෙට් කරගෙන තියෙන්නෙ මාර මීටරයක් තමයි. මේ යකා අපි කිව්වටත් වඩා හොඳට ගේම ගහනවනෙ.

" ඔය කාරණා දෙකම ප්‍රශ්නයක් වෙන්නෙ නෑ සර්. සර්ට ඕන කරන බ්ලොක් එක පෙන්නන්න. මං දැන්ම සර් ගෙවන ගාණට රිසිට් එකක් ලියලා දෙන්නම්. හැබැයි මටත් සර්ගෙන්

පොඩි යුතුකමක් වෙන්න ඕනෙ... ''

ඒ පාර ඇන්තනී මොකක්ද කියන්න හදන්නෙ කියලා මං ඇස් කන් සේරම ඇරලා අහගෙන හිටියා.

'' මම මේ උදව්ව සර්ට කරන්නෙ දියුණු වෙන මනුස්සයෙක්ට අත දෙන්න ඕනෙ නේද කියන එක සලකලා. ඇත්තම කිව්වොත් මේක මගේ රස්සාවත් නැති වෙන විදියෙ අවධානම් වැඩක්... ''

'' හරි හරි මිස්ට ඇන්තනී කාරණාව කෙටියෙන් කියමුකො බලන්න... ''

'' සර් මේ ගැන අපේ කම්පැනියට එහෙම දැනගන්න තියන්න එපා. එහෙම උනොත් මගේ රස්සාවත් නැතිවෙයි... සර්ට ඕන කරන ඉඩම් කෑල්ලත් නැති වෙයි... ''

අප්පට සිරි. මූ මාර පොරක්නෙ. මේ විදියට තමයි එහෙනං මිනිහා මෙච්චර කාලයක් මේක අහු නොවෙන්න කරගෙන යන්න ඇත්තෙ.

'' මගේ වැඩේ කෙරෙනවානං මං මොකටද මිස්ට ඇන්තනී ඒ චාන්ස් එක නැති කරගන්නෙ. බය වෙන්න එපා... මං මේ දැන් රුපියල් දහ දාහක් පේ කරනවා. අපි එතකොට කොහොමද ගනුදෙනුව සිද්ධ කරන්නෙ...? ''

'' සර් මට ඕනකරන බ්ලොක් එක පෙන්නන්න. මං අනිද්දා වෙද්දි ඒ ඉඩම සර්ගෙ අතට ලැබෙන ඩොකියුමන්ට්ස් සේරම ලෑස්ති කරලා තියන්නම්. මෙන්න මගේ කාඩ් එක... ''

ගනුදෙනුව බොහොම වැදගත් විදියට ගලාගෙන යන හැටි අපි කිසි සද්දයක් නැතුව බලාගෙන හිටියා.





'' එහෙනං මට රිසිට් එක ලියලා දෙන්න. මං දැන් කෑෂ් වලින් දහ දාහක් ගෙවනවා... ''

ඩයස් අයියගෙ අයියා සාක්කුවෙ තිබුණු සල්ලි මිටියක් අතට ගත්තා විතරයි ඇන්තනී සාක්කුවෙ දාගෙන හිටපු බිල් පොතක් අතට ගත්තා. පෙනුමෙන්නං ඒක අපේ කම්පැනියෙ එකක් නෙමෙයි.

'' සර්... නම කොහොමද දාන්නෙ...? ''

ඇන්තනී ඒක ඇහුවෙ බිලේ දිනේ දාලා දහදාහක් ගෙව්වා කියලා ලියලා ඉවර උනාට පස්සෙ.

'' නම දාන්න නලින් විදානපතිරණ කියලා... ''

'' මොකක්...? ''

ඒ නම අහලා ඇන්තනී කොර උනා. ඔව් ඉතිං... නලින් විදානපතිරණ කියන්නෙ අපේ තාත්තගෙ නම කියලා මිනිහා නොදැන ඉන්න විදියක් නැහැනෙ.

'' ඔව් ඇන්තනී... ඒ නමට බිල ලියලා දෙනවා... මොකද ඒක මට ඉස්සරහට සෑහෙන ප්‍රයෝජනවත් වෙයි... ''

ඒ කතාව කියාගෙන වාහනෙන් බැස්සෙ අපේ තාත්තා. ඒට පිටිපස්සෙන් සමරෙ මාමත් බැහැගත්තා විතරයි ඇන්තනීකාරයට යන එන මං නැති උනා. මෙච්චර වෙලා මේ වාහනේ ඇතුළෙ තුරුලිය ලෑන්ඩ් සේල් එකේ අයිතිකාරයො ඉන්නවා කියලා ඇන්තනී තියා උගේ මැරිච්ච තාත්තාවත් දැනගෙන ඉන්න නැතුව ඇති.

'' නලින්... ඔයා...ලා... ''

'' ඔව් යකෝ.... අපි තමයි... උඹ වගේ පාහරයෙක්ව පව් කියලා මුලදි හවුල්කරගත්තු අපිටයි ගහන්න ඕනෙ. උඹ කන්න දීපු

අත හපා කන සක්කිලියෙක්... ''

තාත්තා ඇන්තනීට දිගට හරහට දෙහි කපන අතරතුරේ මේ ගේම් එකේ මහ මොලකරුවො දෙන්නා වෙච්ච ගිවන්තයි මමයි දෙන්නත් හෙමින් සීරුවෙ කට්ටිය ළඟට ගියා. එතකොටම තමයි මම දැක්කෙ අපිට බිස්නස් එක කතා කරලා දීපු ජයනාථයා ඉඩම ඇතුළට පණ කඩාගෙන දුවනවා.

ඌ කොහෙද මායි ගිවන්තයි එක්ක රේස් දුවන්නෙ. මිනිහගෙ පස්සෙන් පිස්සු බල්ලො දෙන්නා වගේ දුවගෙන ගියපු අපි ඌව බෙල්ල මුලටම කොටු කරගත්තා.

'' අනේ පුංචි මහත්තයො මට කරදරයක් කරන්න එපා. මං අසරණ දරු පවුල්කාරයෙක්. ''

මගේ ෂොට් එකක් බඩට වැදුනා විතරයි ජයනාථයා සිංහ වෙස් ගලවපු බැටළුවා වගේ කෙඳරි ගාන්න පටන් ගත්තා.

'' උඹ මෙච්චර කල් ඇන්තනී එක්ක එකතු වෙලා දීපු ගේම් ටික අපිට කිව්වොත් අපි උඹට කරදරයක් කරන්නෙ නෑ... තේරුණාද...? එහෙම නොවුනොත් ජයනාථ උඹට විතරක් නෙමෙයි... උඹේ ඔය කියන දරු පවුලට වෙන දේ උඹට හිතාගන්නවත් බැරි වෙයි...''

ගිවන්ත මිනිහගෙ හුස්ම ටික හිරවෙන තරමට බෙල්ල මිරිකලා කියවගෙන යන අතරෙ ඌ එක දිගට කහින්න පටන් ගත්තා. මූ ඇත්තටම හුස්ම ගන්න බැරුව දඟලනවද... එහෙමත් නැත්තං අපෙන් ගැලවෙන්න බොරු රඟපෑමක් කරනවද කියලා හිතාගන්න බැරි වෙච්ච පාර මං කැරකිලා මිනිහගෙ බඩට පයින් ඇන්නා. ඒ ගහපු පාරෙ සැර කමට ගිවන්තගෙ අතත් මිනිහගෙ බෙල්ලෙන් අතෑරෙනවා මං දැක්කා.





'' අනේ මට සමාවෙන්න මහත්තයො... මං මේ කිසි දෙයක් කැමැත්තෙන් කරපු දේවල් නෙමෙයි. මේ සේරම දේවල් උනේ ඇන්තනී මහත්තයගෙ බල කිරීමට. එහෙම නැතුව මං කවදාවත් රස්සාව කරන තැනට වංචාවක් කරන්න හිතුවෙ නෑ...''

පොර බිම වැටීගෙනම සමාව භාජනේකට දාන්න ට්‍රයි එක දෙනවා. මෙච්චර ගුටි කාලත් මූ හැදෙන පාටක් නැනෙ අම්මපා. හිතේ තියෙන තරහට මං ආපහු සැරයක් අත උස්සද්දි ගිවන්ත මිනිහගෙ කටට වැලමිටෙන් හොඳ පාරක් දුන්නා. ඒකටනං ආයෙ කතා දෙකක් නෑ ජයනාථගෙ දත් සෙට් එකෙන් භාගයක්ම බඩේ වෙන්නැති.

'' ඔය ඇති පුතා... දැන් ඔය මිනිහවත් අපේ ඕ අයි සී මහත්තයට බාර දෙන්න... ''

එහෙම කියාගෙන අපේ ගාවට ආවෙ අපේ තාත්තා. එයා එක්ක පොලීසියෙ ඕ අයි සී මහත්තයත් හිටියා. ඒ වෙනකොටත් ඇන්තනීට පොලීසියෙන් මාංචු දාලා ඉවරයි.

'' අපි මිනිහා ගැන බලාගන්නං පුතා. මේ වගේ මිනිස්සුන්ගෙ වංචාවල් අතටම අල්ලලා දීපු ඔයාලා දෙන්නව බොහොම අගය කරන්න ඕනෙ. ''

ජයනාථව කුණු මාළු කෑල්ලක් වගේ උස්සලා ගන්න ගමන් ඕ අයි සී මහත්තයා මටයි ගිවන්තටයි ලකුණු ටිකක් දාන්නත් අමතක කළේ නෑ.

'' ඔව් මිස්ටර් දේදුණුපිටිය... මේ ඇන්තනීලගෙ වංචාවල් මීට කලින් දැනගෙන හිටියට මේ දරුවො දෙන්නා නිසා තමයි ඒක අද අතටම අල්ලගන්න පුළුවන් උනේ.... ''

සමරෙ මාමත් ඇවිත් මගේ කරට අතක් දාගත්තා.

'' මීට කලින් කරපු දේවල් ගැන දැනගන්න හැටි අපි දන්නවා මිස්ටර් සමරසිංහ... ඒවා අපි ගාණට මුන්ගෙ කටවල් වලින් එළියට ගන්නං... ''

ඕ අයි සී මහත්තයගෙ කතාවට ජයනාථගෙ මූණ තවත් ඇඹුල් වෙනවා මං බලාගෙන. කුම්බලා මාළු කෑවානං විඳවාපං බළලෝ කියන්නෙ ඕවට තමයි... දැන් ඉතිං පොලීසියට ගියාම ඕ අයි සී දේදුණුපිටියගෙන් ඇන්තනීටයි ජයනාථටයි අබ සරණයි තමයි...

'' ඔයා ළමයි දෙන්නාවත් අරගෙන දැන් ඔෆිස් එකට යන්න නලින්. මං මෙතන වැඩ බලන්න අර සිරිල්ට එන්න කියලා පණිවිඩයක් දුන්නා. මිනිහා ආවම වැඩ ටික බාර දීලම මං මෙහෙත් එන්නම්... ''

පොලිස් ජීප් එක හොරු දෙන්නව කුදලගෙන ගියාට පස්සෙ සමරෙ මාමා එතන වගකීම් බාර අරගෙන අපිව නිදහස් කළා.

* * * * * * *

Chamodi Madhuprabha



# 16

මේ දවස්වල අපේ අක්කට මොකක්දෝ මන්දා විහායක් ළං වෙලා... එයා පස්ස පැත්තෙන් දුං දාගෙන ගණන් හදනවා හදනවා ඉවරයක් නෑ. පව් අප්පා... බලන්න දුකයි... ඇඬෙනවා.

'' අයිසෙක් නිව්ටන් අපිත් දකින්නැති...
ගණන් හදන්නැති ඒ කාලේ....
කැම්පස් යන්නට පිං මදි වෙන්නැති...
ඒකයි තවමත් මහපාරේ... ''

අක්කගෙ කාමරේට හොරෙන්ම රිංගලා එයාට සින්දුවක් කියන ගමන්ම මං එයාගෙ කොණ්ඩ කරලක් ඇද්දා.

'' යනවකො වද නොදී... ''

අක්කා සුපුරුදු ගෝරණාඩුව දාලා මගේ පස්සෙන් එළවද්දිම අපේ ආච්චි චූටි පුතේ කිය කිය කෑ ගහනවා ඇහුණා. ඉතිං හැමදාම වගේ මං කළේ අක්කගෙන් බේරෙන්න හිතාගෙන ආච්චිගෙ පිටිපස්සෙ හැංගිච්ච එක.

'' යසයි ළමිස්සියො හැදෙන හැටි... අම්මපා

කොල්ලෙක්ටවත් නැති දාංගලයක්නෙ මෙකිට තියෙන්නෙ... ආත් අහරෙට වෙලා හිටපං... ''

අක්කට බර බරයක් දාලා මගේ ඔළුවත් අතගාපු ආච්චි මෙසෙ උඩ තිබුණු මොකක්දෝ මන්දා කවරයක් අතට ගත්තා.

'' මේ ලියුම් කඩදහිය මේ දැන් ආවෙ චූටි පුතේ... බලාපං ඒක උඹට නේද කියලා... ''

ඒක ඇහුණා විතරයි අපේ අක්කටත් වලිය අමතකයි. මටත් කලින් ලියුම උදුරලා අරගත්තෙ එයා.

'' ෂුවර් එකටම මේක තමුසෙගෙ කෙල්ලගෙන් වෙන්නැති... ඉන්නවකො... මං අද හැමදේම තාත්තට අල්ලලා දෙනවා... ''

අක්කා ලියුම කඩන ගමන් තනියම කියවනවා. එයාට උත්තර දෙන්න තරම්වත් මට සිහියක් නොවුණෙ ඒක කාගෙන්ද කියලා මටත් හිතාගන්න බැරි උන නිසා. මොකද මට ලියුම් එන්නෙ අවාරෙට පොල් වැටෙනවා වගේ තමයි. ඉඳලා හිටලා ආවත් ඒකත් මොකක්හරි බිලක්.

'' දැස්... මගේ උණුසුම් සුභ පැතුම් මල්ලියේ... ''

ඔන්න යකඩෝ අක්කා ලියුම අත් දෙකේ ගුලි කරගෙන මගේ මූණත් ඉම්බා. මොකක්ද බොලේ මේ අවනඩුව. දැන් මට ගහන්න එළවගෙන ආපු කෙනා මාව ඉඹින්න තරම් ඒ ලියුමෙ තිබුණු විශේෂත්වෙ මොකක්ද...

'' ඔයා මැනේජ්මන්ට් එක්සෑම් එක පාස් වෙලා දැස්... ක්‍රෙඩිට් පාස් දෙකකුත් තියෙනවා... ''

අක්කා කොයි තරම් වලි දැම්මත් ඒක කියද්දිනං එයාගෙ





ඇස් වලින් කඳුළුත් ආවා.

එළ කිරි තමයි. ඒකත් ජයසිරි මංගලම් කිව්වලු. යාන්තමට ගොඩ යන්න ඇති කියලා හිතපු කෝස් එකට ක්‍රෙඩිට් දෙකකුත් ඇවිත්. මං හිතන්නෙ බලපු එකාට වැරදිලා වෙන්නැති.

'' අනේ වාසනාවන්... මං දන්නවා මගේ චූටි පුතාට දෙයියො බුදුන් බලනවා කියලා... ''

ඒ පාර මාව බදාගත්තෙ අපේ ආච්චි. අම්මත් ලියුම බලපු සැණින් තාත්තට කතා කරලා නිව්ස් එක දෙනවා මං දැක්කා. එයාලා සේරගෙම සුභ පැතුම් පිළි අරගෙන මං ඊළඟට කළේ ශිවන්තට කෝල් කරපු එක. මට රිසල්ට් ආවා කියන්නෙ ඌටත් ඇවිත් තියෙන්න ඕනෙනෙ.

'' උඹනං පණ තියෙනකල් මැරෙන්නෙ නෑ බං. මං මේ උඹට කෝල් කරන්න හිතන් ෆෝන් එක අතට ගත්තා විතරයි. ''

පළවෙනි පාරම රින්ග්ස් යද්දි ආන්සර් කරපු ශිවන්තගෙ කට හඬේ තිබුණෙ අමුතුම තාලෙ සතුටක්.

'' මං පාස් ලොකු අයියෙ... උඹේ තත්ත්වෙ කොහොමද...?''

'' එළ තමයි මාත් ගොඩ... සබ්ජෙක්ට්ස් සේරම ටික එකෙන්ම පාස්... ''

එහෙනං ඒක තමයි අපේ ලොකු අයියගෙ වොයිස් එකේ මේ තරම් ජොලියක් තියෙන්නෙ.

'' මටනං ක්‍රෙඩිට් දෙකකුත් තියෙනවා... ''

'' ෆිට් තමයි මල්ලි. උඹ ඉතිං කොහොමත් මට වඩා බ්‍රයිට්නෙ. අපි දාමු මැක්සා පාටියක්... ''

මට ක්‍රෙඩිට් දෙකක් තියෙනවා කියලා අහලා වැඩිපුරම සතුටු උනේ ගිවන්ත.

" දාමු දාමු... මොකෝ අපි ආයෙ විභාග ලියන එකක්යැ."

" ආ... මට කියන්න අමතක උනා. ඊයෙ චූටිලටත් ඒ ලෙවල් වලට ඇඩ්මිෂන් ඇවිල්ලා... "

ගිවන්ත දුන්නෙ අලුත්ම නිව්ස් එකක්. ඒ කියන්නෙ දැහැමිටත් ඇඩ්මිෂන් ඇවිල්ලා ඇති. කෙල්ල මේ ටිකක් සද්දයක් නැතුව හිටියෙත් විභාගෙට බයේනෙ.

" අපි එහෙනං චූටිගෙ විභාගෙ ඉවර වෙලාම පාටිය ඇරේන්ජ් කරමු. තව මහ ලොකු කාලයක් නැනෙ ඒකට... "

ඒ වෙද්දි දැහැමිත් එක්ක කතාබහ කරලා නිදහසේ තීරණයක් ගන්න පුළුවන් වෙයි කියලා හිතලා මං වැඩේ ටිකක් කල් දැම්මා.

" අපෝ... එතකොට පෙරහැර ගිහින් අලි බෙටිත් වෙලිලා තියෙයි... දන්නවද... මාරි කියුරිත් කියලා තියෙනවලු අද කළ යුතු දේ අදම කරන්න කියලා.... "

" ඇත්තද...? මාරි කියුරි කවදද උඹට ඒ කතාව කිව්වෙ...?"

" මං ඉතිං උඹට කිව්වයි කියලා හිතාගනින් දැස්... "

ගිවන්ත ෆෝන් එක තිබ්බෙ ඒ හැටි හිත ඉහොඳකින් නෙමෙයි. ඕවානං මොනාද... මිනිහව යාළු කරගන්න හැටි මං නොදන්නවයැ.

* * * * * * *

මං කාලෙකට පස්සෙ නිවාඩු පාඩුවෙ ඇඳේ දිගාවෙලා





ලැප් ටොප් එකත් ඔඩොක්කුවට අරගෙන එෆ් බී එක පැත්තෙ ගියා. ඒ වෙද්දි දැහැමි ඔන් ලයින් එන එක සම්පූර්ණයෙන්ම නතර කරලා තිබුණ නිසා මට ෆේස් බුක් එක එපා වෙලයි තිබුණෙ.

ඒත් මං ලොග් උන හැටියෙම දැහැමි අංජනා කියන නමින් ආව මැසේජ් එකක් තිබුණා. කෙල්ල හැමදාම එවනවා වගේ ඒක නිසදැසක්.

" බැතිබර වූ හද මළුවේ
නිසසල ලෙස පා තබමින්
හෙමිහිට සක්මන් කරනා
නීල නුවන් යුග ඔබේද...
හැඩකාරව සිනහා සලා
නෙත් කැල්මෙන් සිත කළඹා
පාළු රැයක නෙතු අද්දර
දඟ කරන්නෙ ඔබ නොවේද... "

ඒ කියන්නෙ මං දැහැමිට නිදියන්න දෙන්නෙත් නැති තරමට කෙල්ලගෙ හිතට වැදිලා කියන එකද? ඒත් එහෙම හිතන්නත් අමාරුයි.

දැන් සති දෙකක විතර ඉඳලා දැහැමිගෙ ෆෝන් එකත් ඕෆ්. මං දවස් දෙකක්ම ගිවන්තටත් හොරෙන් කෙල්ලගෙ ගෙවල් පැත්තෙ ගියා. ඒත් දැහැමිගෙ ඡායාවක්වත් පේන්න නෑ. ඉතිං මං කොහොමද හිතන්නෙ එයා මං ගැන හිතනවා කියලා. අනේ මන්දා... කාට කියන නඩුද මේවා.

ආදරේ ප්‍රකාශ කරන එක පැත්තකින් තියලා මං පොඩ්ඩක්

ඒකෙ දාලා තිබුණු විස්තර කියවන්න පටන් ගත්තා. ඇඩ්මිෂන් ආවට පස්සෙ එෆ් බී එකෙත් ප්‍රධාන මාතෘකාව වෙලා තිබුණෙ විභාගෙ.

කවුදෝ මන්දා මේ පාර ඒ ලෙවල් ලියන ළමයින්ට සුභපතලා මරු කවියක් දාලා තිබුණා.

| | |
|---|---|
| කපන කපන කොටු හරියට | කැපේවා |
| ලියන ලියන බොරු හොඳටම | ලියවේවා |
| ගහන කණා ෂොට් හරියට | වැදේවා |
| රෑ හීනෙත් පේපර් එක | පෙනේවා |
| | |
| හිතන හිතන හැම වචනෙම | ගැලපේවා |
| ගහන ගහන ඉර හරියට | වැදේවා |
| බලන ගුරුට අනුකම්පා | හිතේවා |
| බුදු සරණින් ඒ තුනක්ම | ලැබේවා |

මං දෙපාරක් හිතුවෙ නෑ ඒ කවිය අපේ චූටිටයි දැහැමිටයි සෙන්ඩ් කළා. ඒත් මං දන්න තරමින් අපේ චූටිනං එහෙම කණාවට විභාගෙ ලියන එක්කෙනෙක් නෙමෙයි. කෙල්ල ආයෙ නෑ බොක්කෙන්ම පාඩම් කරලා ගේම දෙන ඩයල් එකක්. බලන ගුරුට අනුකම්පා නොහිතුණත් කෙල්ලට ඒ තුනක් ගන්න එක අමාරු වෙන එකක් නෑ.

" දැස් බේබි.... "

මගේ ඇඟ ගාවම ඉඳගෙන කවුදෝ මන්දා කෙඳිරිගාන සද්දයක් ඇහිලා මං ඔළුව උස්සලා බැලුවා. වෙන කවුද ඉතිං මේ අපේ සරා අයියා මිසක්. වෙනදට මහ සද්දෙට කෑ ගහගෙන එන





මනුස්සයා අද මොකද මේ වොලියුම් කන්ට්‍රෝල් කරලා...

" සරා අයියෙ... මොකක් හරි අවුලක්ද...? "

මිනිහගෙ මූණත් තහඩුව නිකං සුනාමියට අහුවෙලා වගේ සෝදා පාළු වෙලා ගිහින්.

" ඔං ඔක නිසා තමයි මං අන්තිම වතාවටත් බේබි එක්ක වචනයක් කතා කරලා යන්න ආවෙ."

මොනවද අප්පා මේ සරා අයියා කියවන්නෙ. ඔං ඔක කිව්වෙ කෝක ගැනද...? අනික අන්තිම වතාවක් ගැන කියන්නෙ සරා අයියා ගම රට අතෑරලා යන්නද...?

" තේරෙන්න කියන්නකො සරා අයියෙ... "

" මගේ මූණ දිහා බලලා මං ඉන්නෙ ප්‍රශ්නෙක කියලා කියන්න තරම් බේබිට මාව තේරුම් ගන්න පුළුවන් නිසා තමයි මං මේ දේවල් කියලා යන්න ආවෙ. "

" ඇයි... අදත් මුදලාලි අන්කල් එක්ක කොක්කක් දා ගත්තද...? "

සරා ඇඳ අයිනෙ තිබුණ පුංචි ස්ටූල් එකේ ඉඳගත්තට පස්සෙ මං ලැප් ටොප් එක ඕෆ් කරලා කතාවට බැස්සා.

" මං දැන් මුදලාලි එක්ක තරහා ගන්නෙ නෑ බේබි. මේක ඒ මනුස්සයගෙ වැරැද්දක් නෙමෙයි... මගේ කරුමෙ..."

" මං කලිනුත් කිව්වනෙ සරා අයියෙ... දැන් උනේ මොකක්ද කියලා මුලින්ම කියලා ඉන්නකො... "

" මට එයාව නැති වෙලා දැස් බේබි... "

" එයා...? කවුද එයා කියන්නෙ...? "

'' එයා කියන්නෙ අපේ ගමේ හිටපු හිච්චි නගා... එයයි මමයි පුංචි කාලෙ ඉඳලම තීන්දු කරලා හිටියෙ. අයියෝ වෙච්ච නස්පැත්තිය... ''

අඩෝ... සරා අයියා මේ කියන්නෙ කෙල්ලෙක් ගැනනෙ. මනුස්සයගෙ ජීවිත කතාව ඇතුළෙත් ආදර කතාවක් තිබුණා කියලා මං දැනගෙන හිටියෙ නෑනෙ.

'' ඉතිං කසාදයක් තීන්දු කරලා තිබුණානං සරා අයියා ඉඳලා හිටලාවත් ගමේ ගිහින් එන්න එපැයි. ඔයා මෙහෙට වෙලා හිටපුවම එහෙ වෙන දේවල් දැනගන්නෙ කොහොමද...? ''

'' ඒකනෙ බේබි මමත් කරපු ගොන්කම. හිච්චි නගාගෙ ඉගෙනීම ඉවර වෙනකල් කියලා තමයි මමත් මේ මුදලාලිට කඹුර කඹුර මෙහෙට වෙලා බැල මෙහෙවරකම් කර කර උන්නෙ. කොහෙද ඉතිං... මං අපේ අනාගතේට හරි හම්බ කරගන්න මෙහෙට වෙලා දහ දුක් විඳිද්දි හිච්චි අපේ ගමේ කසිප්පු පෙරන සුමනෙගෙ පුතා එක්ක පැනලා ගිහින්.... ''

ෂුහ්... සරා අයියටත් වෙලා තියෙන දෙයක්. අනේ පව් අප්පා මනුස්සයගෙ අකලංක පිවිතුරු ප්‍රේමය.

'' මං මුදලාලිට වැඳලා වැඳලා යාන්තං නිවාඩුවක් ඉල්ලගෙන ඊයෙ අපේ අයියව බලන්න කියලා ගමේ ගියා. ඒ යද්දි හිච්චි නගාගෙ අම්මා අන්තරා වෙලා... ඉතිං මගේ නැන්දම්මනෙ කියලා හිතලා මමත් බරටම සීනි තේ කොළ එහෙම අරගෙන මළගෙදර ගියා. අනේ හිච්චි නගා පොඩි එකෙකුත් හොක්කෙ ගහගෙන හොටු පෙර පෙර අඬනවා. මට දැක්කම වාවන්නෙ නැතුව ගියා... ''





සරා දැනුත් ඒක මතක් කළේ පපුවට අතක් තියාගෙන. මිනිහට පපුවෙ අමාරුවක්වත් හැදෙයිද මන්දා.

'' පොඩි එකා කාගෙද සරා අයියෙ...? ''

'' මම හිතන් හිටියෙ ඒ උණහපුළු පැටියා වෙන එකෙක්ගෙ වෙන්නැති කියලා. අනේ මාව දැක්කා විතරයි හිච්චි ඒ පොඩි එකාව ළඟ හිටපු සුමනෙගෙ පුතා අතට දුන්නා ' මේ දරුවා ටිකක් ගන්න ඒයි' කියලා. ඒ දුන්නා විතරයි පොඩි එකා කෑ ගහන්න ගත්තා අම්මේ කියලා... එතකොටයි මං දන්නෙ වෙලා තියෙන සන්තෑසිය. ''

සරා ගොයියා හොටුත් හූර හූර කතාව දිගටම කියාගෙන යනවා. මමත් ඒ අමුතු තාලෙ ලව් ස්ටෝරිය අහගෙන හිටියෙ ඒකෙන් සරාගෙ හිතවත් හැදෙයිනෙ කියලා.

'' බේබිට කියන්න හිච්චි නගා 'බලන්නකො සරා අයියෙ ගහක් ගලක් වගේ හිටපු අපේ අම්මට වෙච්ච දෙයක්' කියලා කියද්දි මම අර අරගෙන ගිය සීනි තේකොළ මල්ලත් අතේ අරගෙනම ආපහු කඩුල්ල පැනලා ඉවරයි... ''

ඒ කියන්නෙ සරා අයියා දුක වැඩිකමට අරගෙන ගිය බඩුමුට්ටු ටික නොදීම ඇවිල්ලා කියන එකද... අනේ අම්මපා මෙහෙමත් මනුස්සයෙක්.

'' සරා අයියා ඔය කියන විදියට ඔයා අවුරුද්දකින් දෙකකින්වත් ගමේ ගිහින් නැති පාටයිනෙ. එහෙම බෑ සරා අයියෙ ලව් කරන්න. කෙල්ලෙක්ව බඳින්න හිතාගෙන ඉන්නවානං ඉඳලා හිටලාවත් ඒ කෙල්ලට චොකලට් එකක් එහෙම අරගෙන ගිහින් බලලා එන්න ඕනෙ. වෙසක් එකට අලුත් අවුරුද්දට එහෙම කාඩ් එකක් යවන්න ඕනෙ. එහෙම නැතුව දැන් කාලෙ කෙල්ලන්ව

අල්ලලා තියාගන්න ලේසි නෑ. ''

සරාගෙ හිත හදන්න වගේ මං එහෙම කිව්වට සරා ඒක අනුමත කරන්නෙ නෑ කියන්න වගේ ඔළුව වැනුවා.

'' අපි අතරෙ තිබුණෙ එහෙම චොකලට් දෙන්න ඕන විදියෙ ආදරයක් නෙමෙයි බේබි. අපි පොඩි කාලෙ ගමේ සෙල්ලම් ගේ දාද්දි හැමදාම ඒකෙ තාත්තා උනේ මං... අම්මා හිච්චි නගා. අපි ලොකු වෙලා කසාද බැඳලා ළමයෙක් හම්බ උනාම ඒ ළමයට නීල් ආම්ස්ටෝන් කියලා නමකුත් දාන්න හිටියා... ''

'' මොකක්...? නීල් ආම්ස්ට්‍රෝන්? ''

'' ඔව් බේබි... අපේ ගමේ පාරවල් වල හොඳටම වල ගොඩැලිනෙ. ඉතිං ඒ පැත්තෙ ගෑණු උදවියට බබා හම්බවෙන්න අමාරු වෙලා ඉස්පිරිතාලෙ යද්දි වාහනේ වලේ වැටිලා උඩ විසිවෙන අතරෙ බබා හම්බ වෙනවා. බබා උඩු ගුවනෙදි හම්බ වෙන නිසා තමයි අපි ඒ නම දාන්න කතා උනේ. අයියෝ.... මගේ හීන.... ''

මං බඩ අල්ලගෙන හිනා වෙන අතරෙ සරා අයියා හෝ ගාලා අඬනවා.

'' දැන් ඉතිං මට ඉඳලා වැඩක් නෑ බේබි... මං මේ බේබි හොයාගෙන ආවෙ අන්තිම වතාවට මගේ හිතේ තියෙන දුක කියලා යන්න... ''

'' යන්න කිව්වෙ සරා අයියා කොහෙ යන්නද...? ''

'' දැන් ඉතිං මට උන්නත් එකයි මළත් එකයි බේබි. මුදලාලිගෙ නෝනා නැති එකේ මට හැමදාම වෙන්නෙ මේ මනුස්සයට බත් තම්බ තම්බ ඉන්න තමයි. මොකෝ ඉතිං අර රට





ඉන්න පුත්තු එනවයි කියලායැ. කවදාහරි හිච්චිව කසාඳ බැඳලා ගමේ පදිංචි වෙනවා කියලා හිතන් හිටියට ඒ හීන සේරම නැති උනා. ඒ නිසා මං තීරණයක් ගත්තා. ''

'' මොකක්ද තීරණේ...? ''

මං ඒකනං ඇහුවෙ විහිළුවට නෙමෙයි. සරා අයියා හිතේ ආවේගෙට මොකක්හරි අකරතැබ්බයක් කරගත්තොත් එහෙම මොන අපරාදයක්ද...?

'' මේං මේකයි තීරණේ... ''

සරා සාක්කුවෙන් එළියට ඇදලා අරන් පෙන්නුවෙ කෘමිනාශක බෝතලයක්. දෙයියනේ... මේ හාදයට මේ තරම්ම සසර කලකිරිලද...?

'' ඔයාට පිස්සුද සරා අයියෙ... ඕවා බිව්වට මැරෙන්නෙ නෑ. ඕක ගැහුවම ඔයාටත් වෙන්නෙ ඔයාලගෙ අයියට වගේ ටික දවසක් ඉස්පිරිතාලෙ ලැගලා නර්ස්ලගෙන් දොස්තරලගෙන් බැනුම් අහලා උගුර කට තුවාල කරගෙන ගෙදර එන්න. ''

ඔන්න ඒක අහලා සරාගෙ ඇස් බෝල දෙක ලොකු උනා. ඇත්තම කිව්වොත් සරා බය උනා.

'' ඔය ඇත්තමද බේබි...? මේවා එච්චර සැර නැද්ද...? ''

'' මොන පිස්සුද සරා අයියෙ. ඕව හදලා තියෙන්නෙ පුංචි කෘමීන් මැරෙන්න. ඒ පොඩි සතෙක් ඕක වැදිලා මළාට අපි වගේ සද්දන්ත සරීර වලට ඕක ඔරොත්තු දෙන්නෙ නෑ. අපි ඕක බිව්වම වෙන්නෙ මං අර කලින් කිව්වා වගේ උගුර කට තුවාල වෙලා කන්න බැරි වෙන එක විතරයි. ''

කතාව අතරතුරේ මං සරාගෙ අතේ තිබුණු බෝතලේ

මගේ අතට අරන් පොඩි සර්ච් පාරක් දැම්මා. මේක ආයෙ නෑ ඔර්ජිනල් බෙහෙතක්. සරා මේක ගැහුවොත් අපිට දවස් හතක් නයිට් එක අඳින්න වෙන එක නවත්තන්න සක්කරයටවත් බෑ.

'' එහෙමනං ඉතිං මේක බිච්චට වැඩක් වෙන එකක් නෑ නේද...? ''

ඒ කතාවෙ හැටියටනං සරා අදහස වෙනස් කරලා පාටයි.

'' සරා අයියට නොකා නොබී දුක් විඳින්න ඕනෙමනං මේක බිච්චට කමක් නෑ. කොයි එකටත් මේ දීලා තියෙන උපදෙස් ටික කියවලා බලලම බොන්න... ආ... ''

මං බෝතලේ ආපහු සරාට දික් කළා.

'' උපදෙස් කිව්වෙ බේබි... මොනවද ඕකෙ ගහලා තියෙන්නෙ...? ''

'' මේ ගහලා තියෙන්නෙ 'පළිබෝධනාශක අනතුරු සහිතයි... ඇගේ හලාගන්නැතුව බොන්න...' කියලා... ''

මං බෝතලේ දිහා බලලා කිව්වා විතරයි සරා ඉඳන් හිටපු බංකුවෙන් නැගිට්ටා.

'' එහෙමනං ඕක වැඩක් වෙන්නෙ නෑ... ඕකෙ බොන්න කියලා බය නැතුව ගහලා ඇත්තෙ බිච්චට මැරෙන්නෙ නැති නිසා වෙන්නැතිනෙ. කමක් නෑ බේබි... බේබි ඕක තියාගෙන මංගලා නෝනගෙ මල් පැළ වලට ගහන්න. මට මැරෙන්න ඕනෙ නෑ... ''

ඔය තියෙන්නෙ මගේ බ්‍රේන් වොෂ් පාර ආයෙ නෑ ලොවෙත් නැති වෙන්න. ඒක ඇහුවා විතරයි සරාට සියදිවි හානි කර ගන්න එකත් එපා වෙලා.

'' ඔයා අහලා නැද්ද සරා අයියෙ කතාවක් තියෙනවා





ගැණු ළමයි පාරේ යන බස් වැනිය... එකක් වැරදුනොත් අනිකේ යා හැකිය.... කියලා. ඒ නිසා ඔන්න ඔහෙ හිච්චිව හිතෙන් අමතක කරලා දාන්න. මං සරා අයියට හොයලා දෙන්නම් ගින්දර වගේ කෑල්ලක්... ''

මගේ කතාවට දුක්බර හිනාවක් දාගෙනම සරා යන්න ගියා.

දැන් ඉතිං මං මේ කෘමිනාශක බෝතලේ අරන් තියාගන්න ඕනෙ දැහැමි මාව බඳින්න බෑ කිව්වොත් එහෙම බොන්න. නැතුව ඉතිං මෙච්චර වටින බෙහෙතක් සරා කිව්වා වගේ අපේ අම්මගෙ මල් පැල වලට ගහන්න දෙන එක මොන අපරාධයක්ද.

* * * * * * *

# 17

අදනං දෙයියනේ කියලා මගේ ග්‍රහයා හොඳයි... මං උදේ ශිවන්තවත් දාගෙන වැඩට යනවා කියලා හිතාගෙන පළවෙනි පටුමග හරියට බයිසිකලේ යද්දි මගේ මූණට මුලිච්චි උනේ දැහැමිව... වෙනත් විදියකට කිව්වොත් අංජුව.

මං පාරෙ මේ පැත්තෙන් ඇවිත් පළවෙනි පටුමගට බයිසිකලේ හරවන්න හදද්දි කෙල්ල අනිත් පැත්තෙන් ඇවිත් පළවෙනි පටුමගට හැරෙන්න හැදුවෙ.

'' නංගි... ''

අංජුගෙ කකුල් දෙක ළඟම බ්‍රේක් ගහලා මං කතා කළා.

'' සුවහස් අයියා... ''

'' සුවහස් නෙමෙයි නංගි.... දැස්... ''

මං වරද නිවැරදි කරද්දි අංජු මූණත් පැත්තකට ඇල කරලා හරි ලස්සනට හිනා උනා. ඒ හිනාව හරියට මධුරි ඩික්සිත්ගෙ හිනාව වගේ. පළාතම එළියයි.

'' කොහෙද මේ යන්නෙ...? ''





ලොකු මල් වැටිච්ච ෆ්ලෙයාර්ඩ් සායකුයි අත් බෝරිච්චි කරපු පුංචි ටී ෂර්ට් එකකුයි ඇඳගෙන පොත් මිටියකුත් පපුවට තුරුල් කරගෙන තාලෙට අඩි තිය තිය කෙල්ල මේ යන්නෙ අපේ චූටිව හම්බවෙන්න කියන එක මට සීයට සීයක් ෂුවර්. ඒත් මං ඒක නොදන්නවා වගේ ඇහුවා.

'' අද අපිට පංති නෑ අයියෙ... ඇඩ්මිෂන් ආව නිසා දැන් ඉස්කෝලෙත් වැඩි වැඩක් කෙරෙන්නෙත් නෑ. ඉතිං මං රශ්මි එක්ක පාඩම් කරන්න ආවා... ''

'' රශ්මි දන්නවද ඔයා දැන් එනවා කියලා...? ''

මං කඩඉම් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා.

'' මගේ ෆෝන් එක වැඩ කරන්නෙ නැති නිසා කියන්න විදියක් තිබුණෙ නෑ. පංති නැති නිසා එයත් ගෙදර ඇති... ''

අංජු කිව්වෙ හරිම අහිංසක විදියට. ඒකෙන් මට තව හෝඩුවාවක් ලැබුණා. මං හිතාගෙන හිටියෙ අංජු ෆෝන් එක ඕෆ් කරගෙන ඉන්නවා කියලනෙ. ඒත් ඇත්තටම වෙලා තිබුණෙ වෙන දෙයක්.

'' එහෙනං ළමයට වැරදිලා. අද රශ්මි ගෙදර නෑ... ''

'' රශ්මි ගෙදර නෑ... අනේ... එයා කොහෙ ගිහින්ද...? අනික මේ උදේ පාන්දර...? ''

කෙල්ල මගේ කතාවට මාර ෂොක් උනා.

'' එයා අද අපේ අක්කයි ආච්චියි දෙන්නා එක්ක සුදූගෙ ඉස්කෝලෙ කොන්සට් එකකට ගියා... ''

ඇත්තටම මං ඒ කිව්වෙ දාර පචයක්. මේ වෙද්දි චූටි අගේට පස්ස උඩ දාගෙන දොයි ඇති. මොකද ඉතිං මට ඇහිලා

තියෙනවනෙ රුවන්ති නැන්දා නිතරම කෑ ගහනවා චූටි ගෙදර ඉන්න දවස් වලට නැගිට්ටින්න කම්මැලියි කියලා.

" එහෙනං මං මෙහෙම්ම ගෙදර යනවා. රශ්මි ගෙදර නැත්තං මං එහෙ යන එක තේරුමක් නෑනෙ... "

අංජු කිව්වෙ සංසාරෙත් එපා වෙච්ච ගානට. මේ පොඩ්ඩක් රස්තියාදු උනා කියලා ඒකට ඔය තරම් දුක් වෙන්න ඕනෙද...?

" එහෙනං නගින්න... මං ඔයාව ගේ ගාවින් දාගෙන යන්නම්... "

" එතකොට අයියා යන්න ආපු ගමන...? "

" ආ... මංද...? මං මේ පන්සල පැත්තෙ ගිහින් එන්න හිතාගෙන එළියට බැස්සා. "

කණාවට වගේ සුදු ෂර්ට් එකක් ඇඳගෙන ආපු නිසා මං බය නැතුව දෙවෙනි මුසාවාදෙත් අතෑරියා. හැබැයි කෙල්ලට ඒක ෂුවර් නෑ වගේ.

" මං හිතුවා වැඩට යන ගමන් කියලා... "

අංජු ඊතලේ තිතටම විද්දා. ඒත් මට ඕන උනේ කෙල්ල එක්ක මෙතනට වෙලා හුරතල් වෙන්න නෙමෙයි. පුළුවන් තරම් ඉක්මනට මෙතනින් යන්න. ඇයි අප්පා අපේ ගෙවල් දෙකේ කවුරුහරි මේ අවේලාවෙ එළියට බැස්සොත් මට මොකද වෙන්නෙ ඉතිං...

" නගින්නකො... මං ඔයාව බස්සගෙන යන්නම්... "

ගිවත්තට දාන්න ගෙනාපු අමතර හෙල්මට් එක අංජුගෙ අතට දෙන්න හැදුවට කෙල්ල එක පාරටම ඒක ගත්තෙ නෑ. ඕවට





තමයි ඉතිං කැටයම් කියන්නෙ. මේ තරම් අගේට ෂවර් එකක් හයි කරලා දෙන්න හදද්දි මේ දරුවා ළිඳෙන්මනෙ නාන්න හදන්නෙ.

" මේ... කරුණාකරලා මේක දාගන්නවද...? මේක දැම්මම ඔයාගෙ මූණ කාටවත් අඳුරන්න බෑ. "

මං ඒක කිව්වෙ ටිකක් සැරෙන් වගේ. ඒ පාරනං කෙල්ලගෙ අත හෙමීට දික් උනා.

" හරි... දැන් නැගලා මාව අල්ලගන්න... "

අංජුගෙ පොත් ටික අතට අරගෙන මං එයාව පරිස්සමට බයික් එකට නග්ගගත්තා. හැබැයි ඉතිං කෙල්ල නැග්ගෙ බෑ කියන්න බැරිකමට කියලා මං දන්නවා. ඊට පස්සෙ දෙයියනේ කියලා මං බයික් එක ස්ටාට් කරගත්තා.

" අයියෙ... මේ කොහෙද යන්නෙ...? "

අංජනා කතා කළේ මං ටවුන් එකෙන් එයාලගෙ ගෙවල් පාරට නැතුව අනික් පැත්තට හරවද්දි.

" මාත් එක්ක ටිකක් පන්සලට ගිහින් එමුද...? වැඩි වෙලා යන්නෙ නෑ. ඉක්මනට එනවා... "

" අනේ... "

" හරි හරි... ඔයාට මාව ෂුවර් නැත්තං කමක් නෑ... "

මං පාර අයිනට කරලා නැවැත්තුවා.

" අයියා ඇත්තටම පන්සල්ද යන්නෙ...? "

කෙල්ල ඇහුවෙ හෙල්මට් එකේ වයිසර් එක උස්සන ගමන්.

" ඔව්... මේ එහා පාරෙ සුමංගලාරාමෙට.... "

අපේ අක්කා නිතරම වර්ණනා කරන පන්සල ගැන මං කිව්වෙ එයාව රවට්ටන්න හිතාගෙන නෙමෙයි. ඇත්තටම පන්සලට ගිහින් අංජු එක්ක ටිකක් කතා කරන්න හිතාගෙන. මොකද අහම්බෙන් ලැබුණු මේ චාන්ස් එක නැති කරගන්න මගේ හිත කැමති උනේ නෑ.

" ඉක්මනට එනවානං කමක් නෑ. හැබැයි මට වැඩිය පරක්කු වෙන්න බෑ අයියෙ. මං ගෙදර ගිහින් පාඩම් කරන්න ඕනෙ. "

ඒක හරිම අහිංසක ඉල්ලීමක්. අංජුගෙ තත්ත්වෙ විනෝද්ගෙන් දැනගෙන තිබුණු නිසා කෙල්ලලට රවට්ටන්න කොහොමත් මගේ හිත කැමති උනේ නෑ.

කොහොමහරි අපි දෙන්නා පැය කාලකින් විතර හිටියෙ ඒ කියන පන්සලේ. හෙල්මට් ගලවලා බයිසිකලේම හැන්ඩ්ල් එකේ රඳවලා සෙරප්පු සපත්තුත් ගහක් යටින් දාලා අපි පන්සලට ඇතුල් උනා. අක්කා කියනවා වගේ මේ පන්සලනං පුදුම තරම් නිස්කලංකයි තමයි.

" අයියා පන්සල් යන්න ආවෙ මල් පහන් මුකුත්ම අරගෙන නෙමෙයිද...? "

මකර තොරණ යටින් පන්සලට පය තියද්දිම අංජු ඇහුවෙ අමුතු විදියට හිනාවෙලා. කොටින්ම කිව්වොත් ඒ හිනාවෙ තියෙන්නෙ තාමත් මාව ෂුවර් නැති ගතියක්.

" අර ඉස්සරහා තියෙන මල් කඩෙන් ඕන කරන දේවල් අරන් එන්න... ආ... "

අංජුට බලෙන්ම වගේ රුපියල් පන්සීයකුත් දීලා එයාව මල් කඩේ පැත්තට පිටත් කරලා මං ගිවාට මැසේජ් එකක් දැම්මා.





' සොරි මචං... මට එන්න වෙන්නෙ නෑ. මං වරුවකට විතර පොඩි ගමනක් යනවා. ගෙදරට ෂේප් එකක් දා ගනින්... '

ඒ ටික විතරක් ලියලා යවලා මං ෆෝන් එක ඕෆ් කළා. නැත්තං ඉතිං ගිවා අහලා එවන ප්‍රශ්න වලට උත්තර දෙන්න ගියොත් මට අංජු එක්ක කතා කරන්න වෙලාවක් නැතුව යනවා.

කෙල්ල මල් හඳුන්කූරු පොල්තෙල් පහන් තිර වගේ ඕන කරන සේරම දේවල් ගෙනත් ඉතුරු සල්ලි මගේ අතේ තිබ්බා.

" ඕක ඔයා තියාගන්න "

" අනේ ඒකනං කරන්න කියන්න එපා අයියෙ. මට සල්ලි එපා... "

" ඇයි...? "

" මං මේ ගමන ආවෙ අයියා කොයි වගේ කෙනෙක්ද කියලා රශ්මිගෙන් දැනගෙන තිබුණු නිසයි ඔයා පන්සලට එනවා කියපු නිසයි විතරයි. හැබැයි එහෙම කළා කියලා මට ඔයාගෙන් සල්ලි ගන්නනම් බෑ. "

ඒකත් එහෙමයිද. කමක් නෑ ඉතිං අංජු කියන්නෙත් කෙල්ලෙක්නෙ. එයාට කියලත් ආත්ම ගරුත්වයක් තියෙන්න එපැයි. ඒ නිසා මං වැඩිය තර්ක නොකර සල්ලි ටික අරගෙන සාක්කුවෙ දාගත්තා.

ඊට පස්සෙ මට සිද්ධ උනේ කෙල්ලගෙ උපදෙස් වලට යටත්ව මල් පහන් පූජ කරලා වඳින්න. ඒ විතරක්නං මදෑ. බෝධිය වටේ වට හතක් ගිහින් බෝධිය නාවන්න කියලත් අංජු මට කිව්වා.

" ඔයා බෝධි පූජා තියෙන හැටි හොඳට දන්නවා වගේ නේද...? "

'' ඔව් ඉතිං මං නිතරම අම්මා එක්ක පන්සල් යනවනෙ. එහෙම ගියාම අපි තුන් සූත්‍රය කියලා බෝධි පූජා කවි කියලා පැයක් විතර වැඳලා තමයි යන්නෙ. ''

'' එහෙනං මේ වට හත යනකල් මටත් ඇහෙන්න බෝධිය වඳින කවි ටිකක් කියන්න. ''

කෙල්ල ඒකට හා කියලා කිව්වෙ නෑ. හිනා උනා විතරයි. කොහොම උනත් ඒ වෙලාවෙ පන්සලේ හත් අට දෙනෙක්ට වඩා සෙනඟක් පේන්න හිටියෙ නැති නිසා අංජුට ළංවෙලා එයා කියන කවි ටිකත් අහගෙනම වට හත යන්න තරම් මං පින් කරලා තිබුණා.

'' මේ පන්සලේ පිටිපස්සෙ තියෙන ගල් තලාවට අර ඈත තියෙන කන්ද හරි ලස්සනට පේනවලු. අපි ටිකක් එතනට යමුද...? ''

අපේ අක්කගෙන් දැනගෙන තිබුණු දෙයක් දකින ආසාව ඇත්තටම ඒ වෙලාවෙ මගේ හිතේ තිබුණු නිසයි මං ඒ යෝජනාව කළේ. ඒත් අංජු මං දිහා බැලුවෙ හරි අමුතු විදියකට.

'' ඒ කියන්නෙ අයියා ඒක මීට කලින් දැකලා නැද්ද...? ''

'' නෑනෙ... ''

'' එහෙමනං කොහොමද ඒ ගැන දන්නෙ....? ''

'' අපේ අක්කා එයාගෙ යාළුවො එක්ක මේ පන්සලට ඇවිත් තියෙනවලු. එයා තමයි කිව්වෙ. ඉතිං මටත් ඒක බලන්න ආස හිතුනා.''

'' එහෙනං ගිහින් බලමු... ''

මල් පහන් සේරම පූජ කරලා ඉවර උන නිසාද මන්දා මෙච්චර වෙලා පැත්තකින් තියලා තිබුණු පොත් ටික ආපහු පපුවට





තුරුල් කරගෙන අංජනා පෙරමුණ ගත්තා.

'' අනේ... ඇත්තටම ලස්සනයි තමයි අයියෙ... වෙන කොහෙද ලෝකෙකට ගියා වගේ දැනෙනවා. ''

චෛත්‍යය ළඟ එක යායට වවලා තිබුණු නා ගස් පෝළිම ගාවින් ඇවිදගෙන ගියපු කෙල්ල එක පාරටම උඩ පැන්නෙ මේක පන්සල කියලා අමතක වෙලා වගේ. දැහැමි අංජනා කියන්නෙ කොයි තරම් හුරතල් කෙල්ලෙක්ද කියලා මං තේරුම් ගත්තෙ එයාගෙ ඒ හැසිරීමෙන්.

'' උඩ පනින්න එපා ළමයො... මේක පන්සලක්... ''

මං පුංචි ළමයෙක්ට උපදෙස් දෙනවා වගේ මතක් කරලා දුන්නා විතරයි කෙල්ල පොත් ටික පැත්තකින් තියලා බිම ඉඳගත්තා. ඒක නිකං මං දැන් කරගත්තු පුණ්‍ය කර්මය දැන්ම පල දුන්නා වගේ වැඩක්. මොකද ඉතිං මටත් ඕනකම තිබුණෙ කෙල්ලගෙ ළඟින් වාඩිවෙලා ටිකක් නිදහසේ කතා කරන්නෙ.

'' අයියට ඇයි හැමෝම දෑස් කියලා කතා කරන්නෙ...? ''

අංජු ඈත බලාගෙන මං බලාපොරොත්තු නොවුණු විදියෙ ප්‍රශ්නයක් අහද්දි මමත් ඒ ළඟින්ම ඉඳගත්තා.

'' අපේ ගෙවල් වල එවුන්ට පිස්සුනෙ නංගි... මේ තරම් ලස්සන නමක් උප්පැන්නෙ තියෙද්දි කොහෙවත් යන පෙට් නේම් එකක් දාගෙන.''

'' කොහෙවත් යන...? ඒක කොහොමද කොහෙවත් යන පෙට් නේම් එකක් වෙන්නෙ? මට රශ්මිනං කිව්වෙ ගෙවල් වල හැමෝම අයියට දෑස් කියලා කතා කරන්නෙ ඔයාට ලස්සන ඇස් දෙකක් තියෙන හින්දලු... ''

ඒ කියන්නෙ හේතුව දැනගෙනයි අංජු මේ ප්‍රශ්නෙ අහලා තියෙන්නෙ. කෙල්ලගෙ කපටිකම කොයි තරම්ද කියලා හිතෙද්දි මං ඒ මූණ දිහා බැලුවෙ ඇස් පුංචි කරලා. ඒ පාර කෙල්ල මගේ ඇස් දෙක දිහා බලාගෙන හිටියෙ අනිමිස ලෝචන පූජාව කරන්න වගේ.

" ඇයි...? "

" අයියගෙ ඇස් ඇත්තටම ලස්සනයි තමයි. මං දැකපු ලස්සනම ඇස් දෙක... "

එහෙනං ඒකයි මේ ළමයා මගේ ඇස් දිහා ඇසිපිය නොහෙලා බලා ඉඳලා තියෙන්නෙ.

" රශ්මිගෙ ඇස් දෙකත් ටිකක් ඔය වගේ... "

ඔන්න ඉතිං මේ අවේලාවල් වල කෙල්ල අපේ චූටි ගැන කතා කරන්න පටන් ගත්තා. චූටිගෙ ඇස් මගේ වගේද කියන්නනම් මං දන්නෙ නෑ. හැබැයි මං මේ ලෝකෙ දැකපු ලස්සනම ඇස් දෙක තියෙන්නෙ අපේ චූටිට. කොටින්ම ඒකිගෙ ඒ පුංචි නිල් ඇස් දෙකට මං පුදුම තරම් කැමතියි.

මම චූටි ගැන කල්පනා කරන අතරෙ අංජු ඈත පේන කන්ද දිහා බලාගෙන හිටියා. ඊට පස්සෙ සක්වල ගල සසල වෙන තරමෙ දිග හුස්මක් හෙලුවා.

" කාලෙකට පස්සෙ හිත නිවී සැනසුනා. "

එයා ඒ කතාව කිව්වෙ මොන හේතුවක් උඩද කියලා මට තේරුණේ නෑ.

" මටත් ඕන හිත නිවා සනසගන්න තමයි නංගි... ඇත්තම කිව්වොත් මගේ හිත හරි කලබලයි... "





" ඒ කිව්වෙ...? "

" මං ඒ කිව්වෙ මොකක්ද කියලා මට වඩා හොඳට ඔයා දන්නවා අංජනා... "

මං කියන දේවල් අහගෙන හිටියට අංජු නිකමටවත් මගේ මූණ දිහා බලන්න උනන්දු උනේ නෑ. එයාගෙ ඇස් තිබුණෙ ඈත තියෙන කඳු වැටියෙ හිරවෙලා.

" ඇයි කතා නොකරන්නෙ...? ඔයා එෆ් බී එකේදි මට ආදරේ හිතෙන නිසදැස් එව්වෙ බොරුවටද...? ඉස්සර වෙලාම වැඩට යන දවසෙ ඔයාව දකින්න ආසයි කිව්වම අපේ චූටිව බලන්න එන විදියට ඔයා පාර ළඟට ආවෙ බොරුවටද...? මෙච්චර දවස් මට ආදරෙයි කියලා නොකියා කිව්වෙ බොරුවටද...? ආ නංගි... මට කියන්න... "

ඒ වෙලාවෙ මගේ හඬ මටම පාලනය කරගන්න බැරි තරමට ආවේගශීලී වෙලා... එහෙමත් නැත්තං දුක්බර වෙලා තිබුණෙ.

" ආදරෙයි කිව්වා...? මේ මං...? "

මෙච්චර වෙලා ඈත බලන් හිටපු අංජුගෙ ඇස් ඔන්න ඒ පාරනං මගේ පැත්තට හැරුණා. ඒත් එයා අහපු දේ ගැන මට දැණුනෙ තරහක්.

" ඔයා ආදරෙයි කියලා කෙලින්ම කිව්වෙ නෑ තමයි... ඒත් මතකද... 'ආදර හැඟුමන් වාවනු නොහැකිව දන්නෙද ඔබ මා දැවෙන තරම්' කියලා නිසදැසක් එව්වා. ඔයාට අමතක උනාට මට ඒ නිසදැස් අකුරක් නෑර කට පාඩම් නංගි... ඔය නෙත් සිත අගඳගකරනා කළ දන්නෙද ඔබ මා දැවෙන තරම් කියලා මට නිසදැස් එව්වා ඇත්තටම ඔයාට මතක නැද්ද...? "

මං ඒක ඇහුවෙ අංජුගෙ උරහිස් දෙකෙන් අල්ලලා එයාව මගේ පැත්තට හරව ගන්න ගමන්.

'' අනේ... මං කොහොමද ඔයාට මේක තේරුම් කරලා දෙන්නෙ...? ''

අංජු අත් දෙකෙන්ම එයාගෙ කොණ්ඩෙ අල්ලලා අදින ගමන් කිව්වෙ හරිම වේදනාකාරී විදියට.

මේ කෙල්ල මොනවද මේ කියවන්නෙ කියලා මට තේරෙන්නෙ නෑ. අංජු කියන්නෙත් අර ගිවන්ත කිව්වා වගේ ජොලියට ෆේස් බුක් ඇවිත් කොල්ලො අමාරුවෙ දාන කෙල්ලෙක්ද...?

'' මොකක්ද මට තේරුම් කරලා දෙන්න තියෙන්නෙ...? කියන දෙයක් පැහැදිලිව කියන්න. මොකද මං ඔය අනිත් කොල්ලො වගේ විහිළුවට කෙල්ලෝ ආශ්‍රය කරන්නෙ නෑ නංගි... ''

'' මං ඒක දන්නවා අයියෙ. රශ්මි මට ඒ ගැන කියලා තියෙනවා.''

'' එහෙනං ඇයි මාව තවත් මේ විදියට වටේ ගෙනියන්නෙ... වෙලාවකට ආදරේ පෙන්නලා ඇයි තවත් වෙලාවකට ඒ දේවල් දන්නෙ නෑ වගේ හැසිරෙන්නෙ...? ''

'' ඒකට ලොකු හේතුවක් තියෙනවා. ඒත් මට ඒක දැන්මම අයියට කියන්න විදියක් නෑ. ''

'' ඔයාට ඕනෙ මාව පිස්සෙක් වෙනවා දකින්නද...? ''

'' මට සමාවෙන්න අයියෙ... ප්ලීස්... අපි මගේ විභාගෙන් පස්සෙ ඔය ගැන කතා කරමු. ''

දෙයියනේ... මේ කෙල්ල මට කියන්නෙ තවත් මාසයක්





විතර මට මේ බර හිතේ තද කරන් ඉන්න කියලද...?

'' මට තේරෙනවා ඔයා ඉන්න තත්ත්වෙ... ඒත් මං ගැනත් ඩිංගක් හිතන්න. මට හිත එකලාසයක් කරගෙන විභාගෙ ලියන්න ඕනෙ. ඊටපස්සෙ අපි මේ හැම දෙයක්ම විසඳගමු... ''

'' හරි... ඔයා ඔය නොකියන දේ අපි පස්සෙ කතා කරමු... ඒත් මට මේකට විතරක් උත්තරයක් දීලා යනවද...? ''

ඒක මොකක්ද කියලා අහන බැල්මෙන් අංජු මං දිහා බලන් හිටියා.

'' මං ගැන පුංචි ආදරයක්වත් ඔය හිතේ නැද්ද...? ''

මං ඒක ඇහුවෙ අංජුගෙ ඔඩොක්කුවෙ තිබුණු එයාගෙ අත තද කරලා අල්ලගන්න ගමන්. ඒත් මං අල්ලගත්තා විතරයි එයා කලබල වෙලා මගෙන් අත ඇදලා ගත්තා.

'' මට විභාගෙ ඉවර වෙනකල් ආදරයක් ගැන හිතන්න බෑ අයියෙ. මං ගොඩක් දුප්පත් පවුලක ළමයෙක්. අයියා ඒක දකින්න ඇතිනෙ. අපේ තාත්තත් නැතුව අම්මා මාව හැදුවෙ දහදුක් විඳලා. අපිට ගොඩ යන්න තියෙන එකම මාර්ගෙ මේ විභාගෙ විතරයි. මං ඒක හරියට නොකළොත් අපිට කවදාවත් මේ ඉන්න තැනින් අඩියක්වත් උඩට තියන්න බැරි වෙනවා. ඒ නිසා ප්ලීස්... අපි විභාගෙන් පස්සෙ ආයෙත් දවසක මුණ ගැහෙමු. ''

බිම තියලා තිබුණු පොත් මිටිය කලබලෙන් වගේ අතට ගත්තු අංජු ඉඳගෙන හිටපු තැනින් නැගිටලා අඩියක් දෙකක් ඉස්සරහට ගියා. කෙල්ලට තිබුණු කලබලේට එක පොතක් බිම වැටෙනවා එයා දැක්කෙ නෑ. මං නිකමට වගේ ඒක අහුලලා දිය ඇල්ලක දර්ශනයකින් කවර දාලා තිබුණු පොතේ ලස්සන බැලුවා.

ඒත් මාව ගැස්සිලා ගියේ ඒකෙ ගහලා තිබුණු නම දැක්කට පස්සෙ. හරිනං ඒකෙ නම තියෙන්න ඕනෙ දැහැමි අංජනා කියලනෙ. ඒත් ඒ වෙනුවට පොතේ තිබුණෙ සෙනුරි අංජනා පොතුපිටිය කියලා. එතකොට කෙල්ල එෆ් බී ඉන්නෙත් බොරු නමකින්. ඒ නිසා වෙන්නැති එදා මට දැහැමි කියන්නෙ නැතුව අංජු කියන්න කියලා කිව්වෙ.

" සෙනුරි... ආ... "

මහා කලකිරීමක් වගේ දෙයක් හිතට දැනෙද්දි මට ඒ පොත ආපහු එයාට දික්කළා. සෙනුරි කියන නම ඇහුණා විතරයි කෙල්ල හැරිලා බැලුවෙ ගැස්සිලා වගේ. කොටින්ම ඒ ඇස්වල තිබුණෙ මහා තැතිගැන්මක් වගේ දෙයක්.

" ඔයා පටන් ගන්න තැන ඉඳලම මාව රැවැට්ටුවා නේද...?"

මං ඇහුවෙ ඒ ඇස් දිහා කෙලින් බලාගෙන. ඒත් ඒකට එයා දීපු උත්තරේ තමයි මගෙන් මිදිලා පන්සලේ ඉස්සරහා පැත්තට දුවගෙන ගියපු එක. තවත් එයාගෙන් අහන්න දේවල් මට ඉතුරු වෙලා තිබුණෙ නෑ. එහෙමයි කියලා මං බලෙන්ම එක්කගෙන ආපු කෙනාව මග දාලා යන්න බැහැනෙ. අංජුව වීදිය වත්තට හැරෙන තැනින් බස්සලා මං ආයෙමත් ගෙදර ආවා.

ඒ එද්දි තව කරුමයක් ගෙදරට කඩන් පාත් වෙලා. ඒ තමයි මේඝනා. මාව දැක්ක ගමන් ඒකි මහසෝන් අවතාරෙ වගේ බයිසිකලේ ඉස්සරහට දුවගෙන ආවා.

" අනේ... මං ඔයා එනකල් කොයි තරම් වෙලා බලන් හිටියද දෑස්... ඇයි මාව මෙහෙම මග අරින්නෙ...? "





කෙල්ල ඒක ඇහුවෙ මගේ ඇගේ ඇතිල්ලෙන ගමන්. දැන් ටික වෙලාවකට කලින් අංජු ළඟ ඉඳලා ලබපු අමිහිරි අත්දැකීමත් එක්ක මට කෙල්ලො සංහතිය ගැනම කලකිරිලා හිටියෙ. ඒ නිසා මම මේඝනාව තල්ලු කරලා දැම්මා. එතකොටම තමයි අපේ අම්මයි ආච්චියි දෙන්නා මිදුලට බැස්සෙ.

" චූටි පුතේ... උඹ අද වැඩට නෙමෙයිද ගියේ...? මොකද මේ වෙලාවෙ ගෙදර ආවෙ...? "

ආච්චි ඇලඩින්ගෙ පුදුම පහන දිහා බලනවා වගේ මං දිහා බලද්දි මං කතා නොකරම ගෙට ආවා. ඇයි ඉතිං ගිවන්තයා මාව ෂේප් කරන්න මොන බොරුවක් ගැහු වද කියලා නොදැන අදහස් ප්‍රකාශ කරන එක ශරීර සෞඛ්‍යයට අහිතකරයිනෙ.

" මේ ළමයා ඔයාව හම්බවෙන්න කියලා උදේම මෙහෙ ආවා. අපි ඒත් කිව්වා ඔයා වැඩට ගිහින් නිසා හවස් වෙලා එන්න කියලා. කොහෙද කියන එක ඇහුවයැ ඉතිං... "

අම්මා පුපුරු ගගහා කියන ගමන් මගේ පස්සෙන් ආවා.

" මං දන්නවා ආන්ටිලා මාව යවා ගන්නයි බොරු කිව්වෙ කියලා. නැත්තං ඉතිං වැඩට ගිය කෙනා කොහොමද මේ වෙලාවට ගෙදර එන්නෙ... "

මේඝනාත් ගේම අතාරින පාටක් නෑ වගේ. තල්ලු කරලා දාලත් මේකි තව එනවනෙ ඇගේ ඇලෙන්න.

" අනේ දෑස්... මං ඔයාට කොයි තරම් කෝල් කළාද...? ඔයා ෆෝන් එකත් ඕෆ් කරගෙන. ඇයි ඔයා අපිට මෙහෙම කරන්නෙ...? "

" මේඝනා මේ... මගේ යකා අවුස්සගන්නෙ නැතුව

කරුණාකරලා මෙහෙන් පිටවෙලා යනවද...? මට ඔයා එක්ක කිසි කතාවක් නෑ. ''

'' ආන් ඇතිද කෙල්ලෙ උඹ අහගත්තා. මං කිව්වනෙ මගේ චූටි පුතා ආවට පස්සෙ උඹට ඔහොම තමයි සලකන්නෙ කියලා... දැන්වත් විලිසංගෙ ඇතිව ගෙදර පල... ''

මගේ බැනිල්ලට අපේ ආච්චි ෆෝම් වෙලා.

'' එහෙම යන්නෙ කොහොමද...? ඔයාට මං එක්ක කතාවක් නැතිවට මට ඔයා එක්ක කතාවක් තියෙනවා. ඔයා මොන හිතකින්ද අපේ තාත්තව රිමාන්ඩ් කරන්න ඔත්තුව දුන්නෙ...''

අඩේ... ඒ කියන්නෙ ඇන්තනියව රිමාන්ඩ් කරලද...? දැනුයි හිතට පොඩි සහනයක් දැණුනෙ.

'' මිනිස්සුන්ව නිකං රිමාන්ඩ් කරන්න පොලිසි වලට පිස්සු නෑ හලෝ. තමුසෙගෙ තාත්තා කරපු බලු වැඩේට තමයි ඕවයෙ ලගින්න උනේ. රිමාන්ඩ් නෙමෙයි... හෙට අනිද්දා වෙද්දි ලැස්ති වෙලා ඉන්නවා හිරේට බත් අදින්න... ''

'' අනේ දැස්.... ඔයා ඔහොමද මට කතා කරන්නෙ...? ''

මේසනා අඬන්න වගේ මූණත් බෙරි කරගෙන ඇහුවා. අනේ... මං අහුවෙයි ඔය රංගනේට. ඒකි ඇඬුවා නෙමෙයි සියදිවි හානි කරගත්තත් මගේනං බල්ලාවත් හැරිලා බලන්නෙ නෑ.

'' දැන්වත් ඔය ළමයා කියන දේ අහලා මෙතනින් යනවද...? ඔයාලගෙ තාත්තව බේරගන්න ඕනෙනං ගිහින් හොඳ ලෝයර් කෙනෙක් අල්ලගන්න. ඒකට මේ අපේ පුතාට කරදර කරන්න එපා. ''

අපේ අම්මා ගින්දර වගේ ටෝකක් දුන්නා විතරයි මේසනා





හරි අසරණ ලීලාවෙන් ආයෙත් මගේ දිහා බැලුවා.

'' මගේ තාත්තව බේරගන්න පුළුවන් ඔයාට තමයි දැස්... ලෝයර් කෙනෙක්ට නෙමෙයි. ''

'' ඒ කොහෙමද...? ''

'' ඔයාට පුළුවන්නෙ අර පස්යාලෙදි වෙච්ච කිසි දෙයක් ඔයා දැක්කෙ නෑ කියලා කියන්න... එතකොට... ''

'' මේසනා... තමුසෙ මාව මිනීමරුවෙක් නොකර මෙතනින් යනවද නැද්ද...? ''

මං හිතේ තිබුණු කේන්තිය කෑ ගහලා පිටකරලා දාලා පඩිපෙළ නැග්ගෙ කාමරේට වෙලා ටිකක් තනියම ඉන්න හිතාගෙන. මේසනා ආයෙත් මගේ කාමරේට කඩන්පාත් වෙයි කියලා හිතලා මං කොයි එකටත් කාමරේ දොරත් ලොක් කරගත්තා. ඒත් කෙල්ල මගේ කතාවට අඬාගෙන යන්න ගිහින්ද කොහෙද. කිසිම හැලහොල්මනක් නෑ.

* * * * * * *

# 18

වැඩට යන්නෙත් නැතුව ගෙදරින් එළියට බහින්නෙත් නැතුව කාමරේ අස්සටම රිංගගෙන මං කළේ අහස පොළව ගැටගහන්න කල්පනා කරපු එක. කොහොම හිතුවත් අංජු කියපු හතරබීරි කතා කිසි එකක් මට තේරුම් ගන්න බැරිඋනා. එයා මුල ඉඳලම මට කරලා තිබුණෙ කොයි තරම් ලොකු බොරුවක්ද...? වෙන නමකින් ප්‍රොෆයිල් එක හදපු එක කමක් නෑ කියන්නකො... ඒත් එයාට තිබුණා නිකමට හරි මට එයාගෙ ඇත්ත නම කියලා තියන්න. මං හොයාගන්නකල්ම එයා මට ඒකත් හැංගුවා.

ඔය අතරෙ තමයි තවත් දෙයක් මගේ මීටරේ මීටරේට ආවෙ. දවසක් අපි චූටිගෙ ෆෝන් එකෙන් හොයාගත්තු ෆ්‍රෙන්ඩ් වන් කියන නම්බර් එක කාගෙද කියලා දැන් කිසිම සැකයක් නෑ. ඒක අනිවාර්යෙන්ම අංජුලගෙ ගෙදර පාවිච්චි කරන ෆෝන් එක වෙන්න ඇති. මොකද ඒ කතා කරපු ගෑණු කෙනාගෙ හඬ හරිම අහිංසකයි. අනික එයා අපිට බොරුවක් කිව්වෙත් නෑ කියලා දැනුණනෙ. අපි එයාගෙන් ඇහුවෙ විනෝද් කියලා කෙනෙක්ව හරි දැහැමි කියලා කෙනෙක්ව හරි දන්නවද කියලනෙ. ඒ මනුස්සයා





ඒ නම් දෙකම දන්නෙ නෑ කිව්වා. සෙනුරි අංජනා වෙච්ච එයාගෙ දුව දැහැමි කියන නම පාවිච්චි කරනවා කියලා ඒ අම්මා ඇත්තටම දන්නෙ නැතුව ඇති. ඒක තමයි අපිට ඒ ගැන කිසිම හෝඩුවාවක් හොයාගන්න බැරි උනේ.

මට තිබුණ අනික් ප්‍රශ්නෙ තමයි මේ දේවල් ගිවන්තට කියනවද නැද්ද කියන එක. කිව්වොත්නං ආයෙ කතා දෙකක් නෑ ඌ අංජුගෙ ගේ ඉස්සරහට ගිහින් පළු යන්න බැනලා එයි. අනික ෆේස් බුක් එන සමහර කෙල්ලො මොන වගේද කියන එක ඌ මට මුලින්ම අනතුරු අඟවලා තිබුණනෙ. ඒත් මොන හේතුවක් නිසාද මන්දා මේ තරම් දෙයක් සිද්ධ වෙලා තියෙද්දිත් අංජු කියන්නෙ රැවටිලිකාරියක් කියන එක පිළිගන්න මගේ හිත කැමති උනේම නෑ.

'' දැස්... උඹ ඔහොම තක්බීර් වෙලා ඉන්නෙ නැතුව අදවත් මට එදා වෙච්ච සීන් එක කියනවද...? ''

මගේ ඇඳ උඩට අපතයා වගේ කඩන් පාත් වෙච්ච ගිවන්තයා මගේ මූණට එබිලා ඇහුවා. මූ නං අම්මපා පණ තියෙනකල් මැරෙන එකෙක් නෙමෙයි. මං දැන් මේකා ගැන හිතුවා විතරයිනෙ.

'' මං එදා ගෙවල් වලට පට්ට බේගලයක් ඇදබාලා උඹව ගොඩ දැම්මා. එහෙම වෙලත් උඹ මට සීන් එක හංගනවා.''

එදා වැඩට යන්න ගෙදරින් එළියට බැහැපු එකා වැඩට නොගිහින් කොහෙ අතුරුදහන් උනාද කියලා ගෙවල් වලින් හොයද්දි යාළුවෙක් ඇක්සිඩන්ට් වෙලා ආරංචියක් ඇවිත් මං කොළඹ හදිසි අනතුරු එකට ගියා කියලා පචයක් ගහලා ගිවන්තයා මාව බේරගෙන තිබුණා. ඒත් මං මේ වෙනකල් ඌට කිසිම දෙයක් කිව්වෙ නැහැ.

'' මට ටිකක් පාඩුවෙ ඉන්න දීපං ගිවා. ''

මං කිව්වෙ ගිවන්තට කියන්න තියා මේ දේවල් මටවත් හරියට තේරුම් ගන්න බැරිඋන නිසා.

'' ඒ කියන්නෙ උඹේ ලෝකෙ මට කියන්න බැරි දේවලුත් දැන් තියෙනවා කියන එක නේද...? හරි හරි මල්ලි.... ඔහොම යන්කො... ''

'' එහෙම දෙයක් නෙමෙයි බං... මං ෆුල් අප්සෙට් වෙලා ඉන්නෙ. පොඩ්ඩක් තේරුම් ගනින්කො... ''

'' උඹ කියන්නෙ උඹ ඔහොම කාමරෙන් එළියට එන්නෙ නැතුව උඩ බලාගෙන කල්පනා කරද්දි අපි අප්සෙට් වෙන්නෙ නෑ කියලද...? ''

ගිවා ඇහුවෙ කේන්තියෙන්. එක අතකට බලද්දි උගේ කේන්තියත් සාධාරණයි.

'' බලපං... උඹ දැන් දවස් දෙකකින් වැඩට ආවෙ නෑ. ඒකට හේතුව මොකක්ද කියලා ගෙවල් වල එවුන් අහන්නෙ උඹෙන් නෙමෙයි මගෙන්. මං කිව්වා අපේ යාළුවෙක් ඇක්සිඩන්ට් වෙලා කියලා. ඒ පාර නලින් මාමා අහනවා මං අප්සෙට් වෙන්නෙ නැතුව උඹ විතරක් අප්සෙට් වෙන්නෙ ඒ යාළුවා කෙල්ලෙක් නිසාද කියලා... මං ඒවට දෙන්න ඕන උත්තර මොනවද කියලා උඹම කියලා දීපංකො... ''

'' සොරි මචං... ''

'' හෝව් හෝව්... සොරි නෙමෙයි... මං තව කියලා ඉවර නෑ. මේ අහපං... උඹ දැහැමිට ඉගෙනගන්න ශිෂ්‍යත්වයක් හදලා දෙන්න ඕනෙ කියලා කිව්වා මතකද...? මං පෙරෙයිදා අපේ





තාත්තටයි නලින් මාමටයි කියලා දුප්පත් ළමයින්ට මාසෙ ගාණෙ ශිෂ්‍යාධාර දෙන වැඩසටහනක් හැදුවා. ඒකට උඹේ දැහැමි අංජනාගෙ නමත් මං ඇතුළත් කළා. අපි එහෙමයි උඹලා ගැන හිතන්නෙ. ඒත් උඹ අපිට සලකන්නෙ මෙ විදියට නේද...? ''

'' ඒ නම දැහැමි අංජනා නෙමෙයි... සෙනුරි අංජනා කියලා වෙනස් කරලා දාපං... ''

මං කිව්වෙ හීනෙන් වගේ.

'' මොකක්...? සෙනුරි... කවුද යකඩෝ ඒ...? ''

ගිවන්තගෙ ඇස් දෙක ටොම් බෝල දෙකක් වගේ ලොකු වෙද්දි මට ඌට තවත් හංගන්න දෙයක් තිබුණෙ නෑ. ඒ පාර මං එදා වෙච්ච සිද්ධිය අකුරක් නෑර මිනිහට විස්තර කළා.

'' මං උඹට මුල ඉඳලම ඕක කිව්වෙ නැද්ද...? අන්න ඔය නිසා තමයි මල්ලි මං කිව්වෙ ඕවා සීරියස් විදියට හිතට ගන්න එපා කියලා... ''

කතාව අන්තිම වෙනකල් සාවධානව අහගෙන හිටපු ගිවන්ත කතා කළේ අංජු ගැන තරහින්.

'' ඒත් බං මට හිතෙන්නෙ කෙල්ල අපිට නොකියන මොකක්දෝ මන්දා දෙයක් තියෙනවා කියලයි... ''

'' ඔව් ඔව්... ෂුවර් එකටම ඇති. විභාගෙ ඉවර උනාම ඒකි කියයි අනේ සොරි අයියෙ මට වෙන බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවා කියලා... බලපං බොරුද කියලා... ''

'' අංජු එහෙම නෑ බං... ''

'' අනේ පල ඩෝ යන්න... ඒකි මෙච්චර කල් කරලා තියෙන්නෙ උඹව අල්ලෙ නටවපු එක... වැඩිය ඕනෙ නෑ... බලපං

අපි අර ෆ්‍රෙන්ඩ් වන්ව හොයාගන්න කොයි තරම් දත කෑවද කියලා... ඒත් ඒකි අපිව ගානට අන්දලනෙ. ''

'' හරි බං... තව මාසයක් යද්දි උන්ගෙ විභාගෙ ඉවරනෙ. ඊටපස්සෙ අපි මේකෙ අග මුල හොයාගමු. ''

ගිවා අංජුට නැව් ගාණට බනින එක මට අහන් ඉන්න ලේසි උනේ නැති නිසා මං ඒක ගොඩින් බේරලා දැම්මා.

'' ඒ කියන්නෙ උඹ ඒ ලෙවල් ඉවර වෙනකල්ම වැඩට එන්නෙ නැද්ද...? ''

'' නෑ මචං... මං හෙට ඉඳලා එනවා... ''

මං කිව්වෙ ගිවාගෙ කරට අතක් දාගෙන ඌව ෂේප් කරන ගමන්.

'' ආන්න එහෙම වරෙන්. කොහොමටත් අර ඇන්තනීගෙ සීන් එක තදේට ඇදිලා යනවා. මේ වෙද්දි මිනිහගෙ පිල්මාට් වැඩ ගොඩක් පොලීසියෙන් හොයාගෙන. තාත්තා කියපු විදියට ඒකට සාක්කි දෙන්න අපිටත් යන්න වෙන තත්ත්වයක් තියෙන්නෙ. ''

'' සාක්කිනං දෙන්න බැරියෑ ලොකු අයියෙ ලොවෙත් නැති වෙන්න. කොහොමටත් ඔය ඇන්තනියව නං ටික කාලෙකට හරි ඇතුළට යවන්න ඕනෙ අර සහන්ගෙයි මේසනාගෙයි කටවල් වැහෙන්නවත්... ''

හිත ඇතුළෙ කොයි තරම් දුකක් හිරවෙලා තිබුණත් ඒ දේවල් මොහොතකට අමතක කරලා දාලා මං කුල් ඩවුන් උනා. ගිවන්තත් යන්තං මනුස්ස පාටට හිනා උනේ මං එහෙම කිව්වට පස්සෙ තමයි.

* * * * * * *





පහුවෙනිදට වැඩට එන්නම් කියලා ගිවන්තට කියලා තිබුණත් එදා රෑම මට බඩේ අමාරුවක් හැදුණා. ඒක නිකම්ම බඩේ අමාරුවක් නෙමෙයි... මං රෑ එළිවෙනකල් හිටියෙ ටොයිලට් එකේ පදිංචි වෙලා. කොටින්ම මං නිසා අපේ අම්මයි ආච්චියි දෙන්නත් නිදි නෑ. එයාලා දෙන්නත් මං එක්කම ඇහැරගෙන මට අනේකවිධ අත් බෙහෙත් දෙනවා. කෝපිද... දෙහිද... ඉඟුරුද... අසමෝදගන්ද... එක එක ජාතියෙ දේවල්. ඒවා බීලා බීලම පාන්දර වෙද්දි බඩ යන්න විතරක් නෙමෙයි මට වමනෙ යන්නත් වගේ.

'' දැන් මේක බලාගෙන ඉඳලා හරියන්නෙ නෑ මංගලා. පුතාව ලෑස්ති කරගන්න අර ඩේ ඇන්ඩ් නයිට් සර්විස් එකටවත් එක්ක යන්න. මේ විදියට ගියොත් මේ ළමයට උදේ වෙද්දි කෙළින් ඉන්න පණ නැති වෙයි... ''

පාන්දර තුන විතර වෙද්දි අපේ තාත්තත් කරලියට බැස්සා. එයා එහෙම කිව්වට උදේ වෙද්දි නෙමෙයි මට ඒ වෙද්දිම පණ නැතුවයි හිටියෙ. ඇයි අප්පා විසිතිස් පාරක් විතර කැත නැතුව බඩ ගියාට පස්සෙ තව මොනවද යන්න තියෙන්නෙ.

'' මෙයා පහුගිය ටිකේ හරියකට කෑවෙ බිව්වෙත් නැනෙ නලින්. අර යාළුවෙක් ඇක්සිඩන්ට් වෙලා ඉස්පිරිතාලෙ කියලා හෝන්දු මාන්දු වෙලානෙ හිටියෙ. ''

'' දැන් ඕවා ගැන කියවලා හරියන්නෙ නෑ මංගලෝ... කොල්ලට ඉක්මනට බෙහෙත් ටිකක් අරන් දෙනවා මිසක්... ''

ඔන්න ආච්චි සුපුරුදු පරිදි මගේ ගැලිවිලිකාරයා විදියට ඉදිරිපත් උනා. නැත්තං මෙයාලා මට මේ බඩයන අස්සෙ දිගින් දිගටම ඇක්සිඩන්ට් වෙච්ච යාළුවා ගැන අහන්න තියාගනී.

'' පුතා එහෙනං ඇඳුමක් දාගන්න. අපි බෙහෙත් ටිකක්

අරන් එමු... ''

'' දැන්ම ඕනෙ නෑ තාත්තා. දැන් කෝපි දෙකකුත් බිව්වනෙ. තව ටිකකින් අඩු වෙයි. එහෙම නොවුණොත් උදේට බලමු... ''

බෙහෙත් ගන්න යන්න තියා කෙලින් වෙන්නවත් බැරි තරමට බඩ රිදෙන නිසා මං වැඩේ පස්සට කල් දැම්මා. අනික බැරිවෙලාවත් දොස්තර ළඟට යන අතරෙ ටොයිලට් යන්න ඕන උනොත්.... එහෙම උනොත් පාර අයිනෙ අකුලකට තමයි රිංගන්න වෙන්නෙ.

'' එහෙමනං ටිකක් ඇඳෙන් හාන්සි වෙන්න. නින්ද ගියොත් එහෙම ඔය ගතිය ඇරිලා යාවි... ''

මගේ අමාරුව අම්මටත් තේරිලා තිබුණ නිසාද මන්දා එයාලා මාව ඇඳට දාලා ඒ දෙපැත්තෙ ඉඳගෙන මාව මුර කරන්න ගත්තා.

ඒත් ඉතිං එළිය වැටෙනකල්ම වෙනසක් උනේ නෑ. සුපුරුදු සන්තෑසියම තමයි.

'' තවත්නං බලන්ඉන්න බෑ පුතා. යං... අර නර්සින් හෝම් එකට ගිහින් ඔයාට සේලයින් එකක්වත් දෙන්න වෙයි. ''

උදේ වැඩට යන්න ලෑස්ති උන තාත්තා මාව බලෙන්ම වගේ වාහනේට දාගත්තා. ආච්චිත් ඇඳ පැළඳගෙන ඇවිත් ඒකට නගිද්දි මං ඒ දිහා බැලුවෙ පුදුමෙන් වගේ.

'' ආච්චි මේ කොහෙ යන්නද...? ''

'' අද සුදූගෙ ඉස්කොලෙ පේරන්ට්ස් මීටින්ලු. ඒකට කෙල්ලව තනියම යවන්න බෑනෙ. ඉතිං චූටි මාමා එක්ක අම්මටත්





යන්න කියලා මං කිව්වා. අක්කත් පන්ති යන නිසා ඔයයි ආච්චියි බෙහෙත් අරගෙන සමරෙ මාමලගෙ දිහාට දාන්නම්... ''

තාත්තා එහෙම කියලා අපිව නර්සින් හෝම් එකට එක්කගෙන ගියා. එතනිත් මට බෙහෙත් වලට අමතරව සේලයින් දෙකකුත් දුන්නු නිසා අපිට තරමක් වෙලා ඉන්න උනා.

'' තාත්තට ඔෆිස් යන්න පරක්කු වෙනවනෙ. මමයි ආච්චියි ත්‍රීවිලර් එකක් අරගෙන යන්නම්... තාත්තා යන්න.... ''

'' ඔයාට පිස්සුද ළමයො... ඔයා මේ කෙලින් ඉන්න පණ නැතුව නිකං හරි පාරෙ ඇදගෙන වැටුණොත් ආච්චිට පුළුවන්ද ඔයාව වාරු කරගන්න. මං ඔයාලව බස්සගෙනම යන්නම්. අනික මං සමරෙට පණිවිඩේ දීලා තියෙන්නෙ. ''

තාත්තා කිව්වත් වගේ බෙහෙත් අරන් ඉවර වෙලා එයා අපි දෙන්නව සමරෙ මාමලගෙ දිහාට ගිහින් බැස්සුවා.

'' මොකද දැස් පුතා උනේ...? මට අම්මා කෝල් කළා උදෙන්ම... ''

අපේ වාහනේ සද්දෙට දුවන් ආව රුවන්ති නැන්දා මාව අල්ලගෙන ගෙට එක්කන් යන්න හැදුවෙ.

'' මට යන්න පුළුවන් නැන්දෙ... ලොකු අවුලක් නෙමෙයි... අජීරණයක්ලු... ''

මං කිව්වෙ හිනාවෙන්න උත්සහ කරන ගමන්.

'' ඔව් ඔව්... ලොකු අවුලක් නෙමෙයි. පාන්දර වෙනකල් විසිතිස් පාරක් විතර ටොයිලට් ගියා... ''

මට පල් එකට වගේ ඒ කතාව කිව්වෙ අපේ තාත්තා.

'' මං කොල්ලව බලාගන්නම් අයියෙ. අයියා වැඩට යන්න.

දැන් පරක්කුත් ඇතිනෙ... ''

මගේ භාරකාරයා විදියට රුවන්ති නැන්දා ඉදිරිපත් උනා. දැන් ඉතිං අම්මලා එනකල්ම මට රුවන්ති නැන්දා කියන විදියට තමයි ඉන්න වෙන්නෙ.

'' කෝ... ගිවන්ත පුතා ගියාද...? ''

'' තාම නෑ... අන්න ලෑස්ති වෙලා කෑම කනවා. ''

'' එහෙනං එන්න කියන්න මං එක්කම යන්න... ''

මං වෙනුවටද මන්දා තාත්තා ගිවාව බලෙන්ම අරන් යන්න ලෑස්ති උනේ. ඒ කියද්දිම ඌ හිනාවක් දාගෙන ආවා.

'' ආ... මංගලා නැන්දා සීන් එක කිව්වා මචං... පොඩ්ඩක් පරිස්සම් වෙයන්. ඔහොම බඩ ගිහින් ගිහින් අන්තිමේදි බූරියත් යන්න පුළුවන්. නිකං හරි ඒ වගේ තත්ත්වයක් ආවොත් බූරියට ලණුවක් දාලා අපේ අර බාත්රූම් එකේ ජනේලෙ ගැටගහපං... ''

ඌ යන්න කලින් ඒක කිව්වෙ ජෝක් එකට වගේ.

''උඹ වැඩට ගිහින් වරෙන්කො මං බූරිය පෙන්නන්න.''

ගිවා හිනාවෙලාම මගේ පිටට තට්ටුවක් දාලා වාහනේට නැග්ගා.

'' මොනවාහරි ඩිංගක් කාලා බෙහෙත් ටික බීලා නිදියගන්න පුතේ. ඔයාගෙ ඇඟටත් අමාරු නැතෑ... ''

'' අනේ ඔව් ළමයො... කොල්ලා රෑ එළිවෙනකල්ම ඇහැරලා... ''

මං සෙටියට පෙරලෙද්දි රුවන්ති නැන්දා මට කන්න දෙයක් ගේන්න වෙන්නැති කුස්සියට ගියා. අපේ ආච්චිත් එයාගෙ





පස්සෙන්ම යනවා මං බලාගෙන.

'' අයියා... ''

ඇස් දෙක පියාගෙන සෙටියෙම පොඩි ඇලට් එකක් දාන්න හදද්දි මට කතා කලේ චූටි. එහෙනං අද මෙයත් ගෙදර.

'' මං හිතුවා ඔයා පංති ගිහින් කියලා... ''

'' ඔව්... අද පංති දවසක් තමයි. ඒත් උදේ මංගලා නැන්දා කතා කරලා ඔයාව මෙහෙ එවනවා කිව්වම මං පංති නොගිහින් නතර උනා... ''

චූටි කිව්වෙ මං ගාවින්ම ඉඳගන්න ගමන්.

'' අපරාදෙනෙ හලෝ... ලබන සතියෙ විභාගෙත් පටන් ගන්නවා නේද...? ''

'' විභාගෙ වගේද අයියෙ ඔයා... ''

කෙල්ල ඒක හිතලා කිව්වා නෙමෙයි ඒක ඉබේටම කියවුණා කියලයි මට හිතුනෙ.

'' මොකක්ද චූටි කිව්වෙ...? ''

'' නෑ අයියෙ... මේ... දැන් අපිට සිලබස් කවර් කරලා ඉවරයි. ඒ නිසා පංති නොගියා කියලා විශේෂයක් නෑ... ''

ඇත්තටම චූටි කලිනුත් කියන්න අදහස් කලේ ඔය වගේ දෙයක්ද. එහෙමත් නැත්තං එයා කතාව වෙනස් කළාද...? මට ඒ ගැන ලොකුවට හිතන්න අවස්ථාවක් නොලැබුණේ රුවන්ති නැන්දා ඉදිආප්ප පිඟානක් බෙදාගෙන ආපු නිසා.

'' අම්මෝ නැන්දෙ ඔච්චරනං කන්න බෑ. අනික වැඩිය කාලා ආපහු යන්න උනොත්. ''

මං කිව්වෙ අත් දෙකෙන් වැඳලා පෙන්නන ගමන්. ඒක දැකලා රුවන්ති නැන්දට හොඳටම හිනා.

" බය වෙන්න එපා. දැන් බෙහෙත් තියෙනවනෙ. ඒ නිසා කන්න පුළුවන් තරම කන්න... "

" මෙයා ඕක ඉතුරු කරයි. මෙහෙ දෙන්න අම්මෙ මං කවන්නම්... "

රුවන්ති නැන්දා ඉස්සරහා චන්ඩියා වගේ ඉඳිආප්ප පිඟාන ඉල්ලගත්තු චූටි ඒක අනන්න පටන් ගත්තා.

" බබා... පොඩි දෙයක් අහන්නද...? "

නැන්දගෙ ඉස්සරහම චූටිගෙ මූණට එබුන මං කතා කළේ සීරියස් මූඩ් එකකින්. කෙල්ල ඒකට නිකං ගැස්සිලා ගියා වගේ.

" මොකක්ද...? "

" ඔයා ටොයිලට් ගිහින් අත සේදුවද...? "

" තමුසෙට මං... "

චූටි ඉඳිආප්ප පිඟාන ස්ටූල් එක උඩට අතෑරලා මට ඇඟිල්ලක් දික් කරද්දිම නැන්දා ආපහු කුස්සියට ගියා. හරියට අපි දෙන්නට ඕන මගුලක් කරගන්න කියලා වගේ.

" හරි හරි අප්පා... ඕකට ඉතිං තරහා ගන්න ඕනෙයැ. මං නිකමට වගේ ඇහුවෙ. "

" දන්නවද...? මං දැන් ඇඟ සෝදලා ආවා විතරයි. "

කෙල්ල හිනාව තද කරගෙන ආපහු පිඟාන අතට ගත්තා. මං දන්නෙ නැද්ද මෙයා තරහා ගත්තෙ බොරුවට කියලා.

" කොහොමද විනෝද් එහෙම... සනීපෙන් ඉන්නවද...?





මට ළඟකදි හම්බඋනෙත් නෑ. "

චූටිව තරහා ගස්සවලා ඉවර වෙලා මං වෙනස්ම මාතෘකාවකින් කතාව පටන් ගත්තා.

" මට හම්බ උනෙත් නෑ. "

" වෙන්න බෑ. කොල්ලා ඔයාලගෙ ක්ලාස් එකේනෙ. "

" ඔව්... ඒත් ක්ලාස් එනවා. ඇරුනම එහෙම්මම යනවා. එච්චරයි. කතා කරන්න උනේ නෑ. "

චූටි ඒක කිව්වෙ ඕනාවට එපාවට වගේ.

" ඇයි තරහා වෙලාවත්ද...? "

" නෑ ඉතිං... විභාගෙ ළඟයිනෙ. ඒ නිසා දැන් කවුරුවත් කාලෙ නාස්ති කරන්නෙ නෑ. "

චූටි ඒ ගැහුවෙ හින්ට් එකක්ද කියලා මට තේරුණේ නෑ. මොකද ඉතිං මං දවසක් එයාගෙ යාළුවා උන අංජුගෙ කාලෙ නාස්ති කළානෙ.

" පොඩි කටවල් කවන්න නංගි... "

කෙල්ල තරහක් පිරිමහන්න වගේ තඩි කටවල් ගිල්ලවද්දි මං ඒක මතක් කරලා දුන්නෙ අද කෑම හිරවෙලා වෙනම අකරතැබ්බයක් වෙයි කියලා හිතලයි.

" සොරි... මං වෙන කල්පනාවක හිටියෙ. "

" ඔයාට ඔය තරම් කල්පනා කරන්න මොනවද තියෙන්නෙ...? "

" ඇයි... ඔයාලට විතරද කාමරේට වෙලා දවස් ගණන් කල්පනා කරන්න දේවල් තියෙන්නෙ...? "

ඔන්න ඉතිං තව හිත්ට් එකක් පාස් කළා. ඇයි දෙයියනේ කවන්න කියලා ළඟට අරගෙන මෙයා කරන්නෙ මාව සාතනය කරන එකනෙ.

'' විභාගෙ ඉවර වෙනකල් මගේ හිතේ තියෙන්නෙ පුදුම බරක් අයියෙ. ඒක ඔයාට පහදන්න මට තේරෙන්නෙ නෑ... ''

තව ඉඳි ආප්ප කටක් ළං කරන ගමන් කෙල්ල හරිම හැඟීම්බර විදියට එහෙම කිව්වා.

'' ඔයාට විභාගෙ ගැන බයක් දැනෙනවද බබා...? ''

'' නෑ... ජීවිතේ ගැන බයක් දැනෙනවා. ''

'' ඒ කිව්වෙ...? ''

'' අනේ මන්දා අයියෙ. මං කරපු වැරදි දැන් මගේ පස්සෙන් පන්නනවා වගේ මට දැනෙනවා. ඒ ගැන හිතද්දි මට මාවම පාලනය කරගන්න බෑ වගේ... ''

චූටි මේ හීනෙන් කියවනවද මන්දා. එයා මොනවද ඔය තරමට කරලා තියෙන වැරදි. ගෙදර පූසි පැටියට ගිවන්න පාරක් ගහනවා දැක්කත් ඇස් වලට කඳුළු පුරවගන්න මේ කෙල්ල විපාක දෙන තරමට වැරදි කරලා තියෙනවද...?

'' ඔයා මොනවා ගැනද මේ කතා කරන්නෙ චූටි...? ''

'' අනේ ඒ දේවල් ඔයාට කියලා මට හිත සනසගන්න තිබුණානං අයියෙ... ''

අහපු දේට නෙමෙයි කෙල්ල උත්තර දුන්නෙ.

'' ඉතිං මං අද වරුවක්ම මෙහෙ ඉන්නවනෙ. ඔයා හිතේ තියෙන හැම දෙයක්ම මට කියලා ඔය හිත සනසගන්න... ''





'' මගේ විභාගෙ ඉවර උන දවසට පහුවෙනිදා මං අනිවාර්යයෙන්ම අයියව හම්බවෙලා මේ හැමදේම කියනවා. ෂුවර්... ''

මෙයත් අංජු වගේම තමයි. හැමදේම විභාගෙට පස්සෙ. මෙහෙම ගියොත් මට වෙන්නෙ ඒ ලෙවල් විභාගෙන් පස්සෙ කෙල්ලන්ගෙ දුක ඇසීම වෙනුවෙන් විශේෂ නිවාඩු ටිකක් අනුමත කරවගන්න.

චූටි කියපු කතාව ගැන හිතද්දි මගේ ෆෝන් එකට මැසේජ් එකක් ආවා. වෙනදටනං එන මැසේජ් ඒ වෙලාවෙම නොබැලුවට අද කෑම ටිකත් කටටම වැටෙන එකේ වෙන මොන වැඩද. ඒ නිසා මං ඒ මැසේජ් එක බලන්න ගත්තා. ඒක ඇවිත් තිබුණෙ අංජුගෙ නම්බර් එකෙන්. එහෙනං අංජු ෆෝන් එක හදාගෙන වෙන්නැති.

'' කන්න බෑ කිව්වට ඔය අපූරුවට කෑවෙ. ඉන්න මං අත හෝදලා බෙහෙත් ටික අරගෙන එන්නම්... ''

චූටි එහෙම කියාගෙන නැගිට්ටා විතරයි මං ආයෙත් ෆෝන් එකට එබුණා. අංජු ඒ එවලා තිබුණෙ නිසදැසක්.

'' ගෙවී ගිය නිමක් නැති
අමාවක පසු කරන්
සිත් අහස එකළු කර
පැයුවා සඳ මෙමට...

නමුදු ඒ මෘදු කිරණ
උරුම නැත සිත් ගැඹට
සුමුදු සඳ බැස ගියා
කඳුළු වැල් නිම්තෙරට...

දඟ කරන ඔබේ ඔය
දිගු නීල නෙතු අගින්
යළිඳු සඳ පායන්න
වෙර දරයි මා හදට...

හඬන නෙතු සැනසුනා
අමාවක කළුවරින්
ඉතින් සඳ පායන්න
එපා මා නිලඹරට... ''

මොකක්ද අප්පා ඒකෙ තේරුම. මගේ ඇස් වලින් එයාගෙ ජීවිතේට හඳ පායන්න එපා කියලා නේද ඒ කියලා තියෙන්නෙ. ඒ කියන්නෙ අංජුට මාව එපා කියන එක නේද...?

ඒ නිසදැස බලලා ආයෙත් නිකං මගේ ඇඟට පණ නැති උනා වගේ.

'' අයියා... මේ බෙහෙත් ටික බීලා ඉන්න. ආ... ''

ආච්චිගෙන් බෙහෙත් ටික ඉල්ලගෙන චූටි ඒක මගේ අතට ගෙනත් දුන්නා.

'' ඔව්... බීලා ටිකක් නිදා ගන්න ඕනෙ... ''

මං ඒ චූටිට නොකියා කිව්වෙ මට ටිකක් තනියම ඉන්න ඕනෙ කියලා. ඒක තේරුණ නිසාද මන්දා කෙල්ල මට ගිවාගෙ කාමරේ ඇඳ අස් කරලා දීලා යන්න ගියා.

ඒ උනාට මං නිදා ගන්න කලින් ගිවාගෙ කම්පියුටර් එක ඔන් කරගෙන පොඩි වෙලාවකට එෆ් බී ලොග් උනේ අංජුට උත්තරයක් දීලම ඉන්න ඕන කියලා හිත කියපු නිසයි.





'' දවසකට ආදරෙයි කියන්නයි ආයෙත් එපා කියන්නයි ඔයාට මාව සෙල්ලම් බඩුවක්ද අංජනා. ඔයා එදා මං එක්ක පන්සල් යන්න ආවෙ මං ගැන කිසිම හැඟීමක් නැතුවද...? මං ළඟ වාඩි වෙලා වැන්දෙ... මාත් එක්ක එකට පියවර තියලා ගිහින් බෝධිය නැව්වෙ... මං ළඟටම වෙලා කඳු යායෙ ලස්සන බැලුවෙ මාව එපා නිසාද...?

දන්නවද ඔයාට ඒ දේවල් මොහොතකින් අමතක කරලා දාන්න පුළුවන් උනාට ඒ දවස මගේ ජීවිතේ ලස්සනම දවසක්...''

අංජනාට ඒක මතක් කරලා දීලා මං කම්පියුටර් එක ඕෆ් කරලා දැම්මා.

* * * * * * *

# 19

දවසක් දෙකක් ගෙදරට වෙලා ඉඳලා මං වැඩට යන්න කියලා හිතපු දවසෙම පාන්දර මට විනෝද් කෝල් කළා.

'' දැස් අයියෙ... මට ඔයාව හම්බවෙලා ටිකක් කතා කරන්න ඕනෙ... ''

කොල්ලා කිව්වෙ ටිකක් කලබලෙන් වගේ. මෙච්චර දවස් ගෙදර ඉඳලා අදත් වැඩට නොගිහින් ඉන්න එක හරි නෑ වගේ දැනුණු නිසා මං ඌව හම්බවෙන එක හවසට කල් දැම්මා.

'' හවස් වෙනකල් ඉන්න බෑ අයියෙ. පොඩි හදිස්සියක්. මට පුළුවන් තරම් ඉක්මනට අයියව මුණ ගැහෙන්න ඕනෙ. මට ඔයාට කියන්න දෙයක් තියෙනවා. ''

ඒකනං එසේ මෙසේ හුටස්පරයක් වෙන්න බෑ. හවස් වෙනකල්වත් ඉවසන්න බැරි තරම් හදිස්සියක් කිව්වෙ මොකක්ද කියලා මට හිතාගන්න පුළුවන් උනේ නෑ.

'' ඔයාට අපේ ගෙදරට එන්න බැරිද මල්ලි. මං දැන් ගෙදර ඉන්නවා. ''





'' තව කවුද මේ වෙලාවෙ ඉන්නෙ...? මොකද මං මේ කියන්න යන්නෙ පොඩි රහසක්. ''

මූට මොකක්ද අප්පා මේ උදේ පාන්දර මට කියන්න තියෙන රහස.

'' අවුලක් නෑ මල්ලි. තව පැයකින් විතර එන්නකො. ඒ වෙද්දි ගෙදර ඉන්නෙ අම්මයි ආච්චියි විතරයි. ''

'' ඕකේ. ''

මං කෝල් එක කට් කරලා විනෝද් එනකල් මඟ බලාගෙන හිටියෙ හරිම නොඉවසිල්ලෙන්. ඇයි ඉතිං කොල්ලා මොන කුණු කේස් එකක් අරන් එනවද කියලා කවුද දන්නෙ.

'' පුතා අද වැඩට එන්නෙ නෑ නේද...? ''

මං කොට කලිසම පිටින්ම මිදුලට වෙලා ඉන්නවා දැකලා තාත්තා ඇහුවෙ ඔෆිස් එකට යන්න වාහනේට නගිද්දියි.

'' මං හෙට විතර එන්නම් තාත්තා... ''

'' නෑ... නෑ... මං අද එන්න කිව්වා නෙමෙයි. ඔයා බෙහෙත් සේරම ඉවර වෙලාම එන්න. ඔයයි ගිවන්ත පුතයි අපිට තිබුණු ලොකුම බාධකේ දැන් අයින් කරලා ඉවරයිනෙ. ''

තාත්තා ඒ කිව්වෙ ඇන්තනී ගැන කියලා මට අමුතුවෙන් කියලා දෙන්න ඕන උනේ නෑ.

'' දැන් කොහොමද තාත්තා ඒ කේස් එක...? ''

'' මිනිහගෙ අපි නොදන්න යටිකුට්ටු වැඩ දැන් දැන් තමයි එළියට එන්නෙ. කොහොමත් මිනිහට වැඩේ ලේසියෙන් ගොඩ දාගන්න බැරි වෙයි. අනික මමත් කිසිම චාන්ස් එකක් දෙන්නෙ නෑ... ''

" ඒකනං හොඳයි තාත්තෙ. ඒ අතරම තව හොයලා බලන්න අර ජයනාථට අමතරව මිනිහගෙ තව ඉත්තො අපේ කම්පැනිය ඇතුළෙ ඉන්නවද කියලා... "

" ඒක තමයි මමයි සමරෙයි මේ දවස් වල කරගෙන යන්නෙ. පුතත් සනීප වෙලා එන්නකො අපේ උදව්වට... "

කාලෙකට පස්සෙ හරිම සැහැල්ලුවෙන් එහෙම කියපු අපේ තාත්තා මගේ පිටට තට්ටුවකුත් දාලා පිට වෙලා ගියා.

අක්කයි සුදුයි චූටි මාමයි තුන් දෙනත් පිටවෙලා පැය භාගයක් විතර යද්දි තමයි විනෝද් අපේ ගෙදරට ආවෙ. අම්මටත් වෙනසක් නොදැනෙන්න කොල්ලව මගේ යාළුවෙක් විදියට හඳුන්වලා දීලා අපි දෙන්නා එළියෙ බංකුවට ආවා නිදහසේ කතා කරන්න හිතාගෙන.

" විභාගෙට තව දවස් දෙක තුනයි නේද මල්ලි තියෙන්නෙ...? එහෙම තියාගෙන මේ වගේ ඇවිද ඇවිද ඉඳලා හරියනවද...? "

කතාවට මුල පුරන්න විදියක් නැති නිසා මං ඇහුවා.

" මේ විභාගෙට වඩා බරපතල ප්‍රශ්නයක් අයියෙ. විභාග ලියලා ඉවර වෙලා මේවා විසඳගන්න හිටියොත් මොනවයින් මොනවා වෙලා තියෙයිද මන්දා... "

අන්න නියම කොල්ලො. මේකානං අපේ චූටියි අංජුයි වගේ කියන්න තියෙන දේවල් විභාගෙන් පස්සෙ කියන්නම් කියලා කල් දාන්නෙ නෑ.

" දැන් මොකක්ද වෙලා තියෙන්නෙ...? අපේ චූටි උඹට චූටි එකවත් තිබ්බද...? "





" ඔව්... මං රශ්මි ගැන දෙයක් තමයි කියන්න ආවෙ. ඒත් ඒක අයියා හිතනවා වගේ දෙයක් නෙමෙයි. කොහොම්ම කවදාවත් එළි කරන්නෙ නෑ කියලා පොරොන්දු වෙච්ච රහසක් තමයි මං මේ අද අයියට කියන්න හදන්නෙ... "

දැන් දැන් කේස් එක තවත් පැටලෙන පාටක් තමයි තියෙන්නෙ. මේකා අපේ චූටි ගැන දන්න රහස මොකක් වෙන්න බැරිද...?

" උඹ මොනවා කියන්න යනවද කියලා මටනං හිතාගන්නවත් බෑ කොල්ලො... "

" මේක කොහෙන් පටන් ගන්නද කියලා මටත් හිතාගන්න බැරුව ඉන්නෙ... ඒත් මං මෙහෙම කියන්නම්කො මුලින්ම. රශ්මි කියන්නෙ අයියලා හිතන් හිටියා වගේ මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් නෙමෙයි. අනික රශ්මිගෙ හිතේ මං ගැනවත් මගේ හිතේ රශ්මි ගැනවත් එහෙම කිසිම විශේෂ හැඟීමක් නෑ. එහෙම දෙයක් කවදාවත් අපි අතර ඇති වෙන්නෙත් නෑ. "

ඒ කතාවට මාව නිකං ගල් ගැහුණා වගේ. ඇයි දෙයියනේ අපේ චූටි පහුගිය ටිකේ ආදරෙන් ඔල්මාදෙ හැදිලනෙ හිටියෙ. ඒක විනෝද් නිසා ඇතිඋන දෙයක් නෙමෙයිනං ඒ ආදරේ අයිතිකාරයා කවුද...?

" මං මෙහෙම කිව්වට අයියා මං ගැන වරදවා හිතන්න එපා. මං.... මං ආදරේ කරන්නෙ... අංජුට... "

" මොකක්...? "

මට නිකං හුස්මත් හිරඋනා වගේ දැනෙන්න ගත්තා.

" ඔව් අයියෙ. අංජුව දැක්ක දවසෙ ඉඳලම මං එයාට

ආදරේ කළා. එයා ගොඩක් දුප්පත් ළමයෙක් නිසා සමහරවිට ඒ ආදරේ තවත් වැඩිවෙන්න ඇති. ''

මේකා මේ කියන්නෙ මගේ පපුවට පිහියෙන් අනින කතාවක්නෙ. එතකොට මමත් අංජුට ආදරෙයි කියන එක මූ තාම දන්නෙ නැද්ද...?

'' රශ්මි එයාගෙ දුප්පත් යාළුවට හරියට උදව් කරනවා කියලා මං අයියට මීට කලින් දවසකත් කියන්න ඇතිනෙ. අංජු මගේ උදව් ගන්න කැමති නෑ. අනික එහෙම කරන එක එයාගෙ ආත්මගරුත්වයටත් හොඳ නැති නිසා මමත් අංජුට උදව් කළේ රශ්මි හරහා තමයි. ''

'' ඒ කියන්නෙ උඹ රශ්මිට ළංවෙලා හිටියෙ අංජු නිසාද...?''

'' කීයටවත් නෑ... රශ්මි කියන්නෙ අංජු මුණ ගැහෙන්න කලින් ඉඳලා මට හිටිය හොඳම යාළුවා. අංජුව මුණ ගැහුණා කියලා අපේ යාළුකමේ කිසිම වෙනසක් උනේ නෑ. ඒත් මට අංජුට ළං වෙන්න එයා ගොඩක් උදව් කළා. ''

'' එතකොට ඔයයි අංජුයි අතරෙ එෆෙයාර් එකක් තියෙනවද...? ''

මං ඒ ඇහුවෙ මට දැනගන්න ඕන වෙලා තිබුණු වටිනාම ප්‍රශ්නෙ. එහෙම දෙයක් තිබිලා තියෙනවානං අංජු මට කරලා තියෙන්නෙ කොයි තරම් ද්‍රෝහිකමක්ද.

'' නෑ අයියෙ... අංජු හැමදාම මට කිව්වෙ රශ්මි වගේම එයාගෙ යාළුවෙක් වෙලා ඉන්න කියලා විතරයි. එයා ඉගෙනගෙන හොඳ තැනකට එනකල් කවදාවත් ආදරයක් ගැන හිතන්නෙ නෑ කියලත් කිව්වා. ''





'' සොරි... මං ඔය කිසි දෙයක් කලින් දැනන් හිටියෙ නෑ. එහෙම දැනගෙන හිටියානං මං කවදාවත්... ''

විනෝද් මොහොතකට මගේ කතාවට බාධා කළා.

'' ඔව් අයියෙ... මං දන්නවා අයියගෙ හිතෙත් අංජු ගැන විශේෂ හැඟීමක් තියෙනවයි කියලා. අයියා කොහොමත් මං ගැන දැනන් හිටියෙ නෑ කියන්නත් මං දන්නවා. ඔයාලා හිතුවෙ මං ට්‍රයි කරන්නෙ රශ්මිට කියලනෙ... ''

'' දැන් මේ ප්‍රශ්නෙයි අපේ චූටිගෙ අර කියපු රහසයි අතර තියෙන සම්බන්ධෙ මොකක්ද...? ''

ඔළුවෙ ඉඳලා යටිපතුල් දෙකට යනකල්ම අමුතු සීතලක් ගලාගෙන යනවා දැනෙද්දි මං ඒ ප්‍රශ්නෙත් විනෝද්ගෙන් අහන්න අමතක කළේ නෑ.

'' අයියා මට මුලින්ම කියන්නකො ඔයා අංජුට ආදරේ කරන්න පෙළඹුණ හේතුව මොකක්ද කියලා...? ''

'' මට අංජුව හම්බඋනේ එෆ් බී එකේදි මල්ලි. ඒකෙදි අදහස් හුවමාරු කරගෙන තමයි අපි දෙන්නා ගොඩක් ළං උනේ. ඇත්තම කිව්වොත් මං ආදරේ කළේ අංජු ළඟ තියෙන ලස්සන අදහස් වලට. එයාට ලස්සනට නිසඳැස් ලියන්නත් පුළුවන්. අපි අතර එෆෙයාර් එකක් නොතිබුණාට අංජු මට එවපු නිසඳැස් නිසා මං එයාට ගොඩක් බැඳුණා.''

'' ඒ කියන්නෙ ඔයාලා අතර ආදරේ හුවමාරු උනේ ෆේස් බුක් එක හරහා. ''

මං ඒකට ඔළුව වැනුවෙ මගේ උත්තරේ නිසා විනෝද්ගෙ හිත රිදෙයි කියලා හිතලයි.

'' මං උඹේ ආදරේට අතරමැදියෙක් උනා කියලා හිතනවානං මට සමාවෙයන් විනෝද්... මේක පැටලුණු නූල් බෝලයක් වගේ වෙලා... ''

කොල්ලා ඔළුවත් බිමට හරවගෙන කල්පනා කරනවා දැකලා මං ඌගෙ උරහිසට තට්ටුවක් දැම්මා.

'' නෑ අයියෙ. අයියා මට අතරමැදියෙක් උනේ නෑ. අයියා ආදරේ කළේ දැහැමි අංජනාට මිසක් සෙනුරි අංජනාට නෙමෙයිනෙ... ''

'' ඒ කිව්වෙ...? ''

'' දැහැමියි සෙනුරියි කියන්නෙ එක්කෙනෙක් නෙමෙයි දෙන්නෙක්... ''

'' විනෝද්....? ''

'' ඔව් අයියෙ... අයියා දැහැමි එක්ක චැට් කරපු දේවල්වත් ඔයාලා අතර හුවමාරු උන නිසදැස් ගැනවත් කිසිම දෙයක් අංජු දන්නෙ නෑ. ''

එතකොට එදා මං පන්සලේදි අංජුගෙන් ඒ දේවල් ගැන අහද්දිත් එයා ගොළු වෙලා හිටියෙ ඒ නිසාද...? එහෙමනං මේ දේවල් මේ විදියට පැටලුවෙ කවුද...?

'' එතකොට දැහැමි කියන්නෙ කවුද මල්ලි...? ''

'' දැහැමි කියන්නෙ රශ්මි... ''

විනෝද් මගේ ඇස් දෙක දිහා බලාගෙන ඒක කියද්දි මට නිකං උන් හිටි තැන් අමතක උනා වගේ දැනුණෙ.

'' ඒක තමයි අපි නොකියන්න පොරොන්දු උන රහස. ඒත් දැන් වෙලා තියෙන දේවල් එක්ක අපි ඒක තව හංගන්න



ගියොත් රශ්මි මොන නාඩගමක් නටයිද දන්නෑ. ''

එතකොට මෙච්චර කල් දැහැමි කියන බොරු නමකට මූලා වෙලා මට ආදරේ කරලා තියෙන්නෙ අපේ චූටිද...? කෙල්ල පහුගිය ටිකේ ගෙදරට වෙලා නොකා නොබී ඇඬුවයි කියලා ගිවන්ත කිව්වනෙ. ඒකට හේතුවත් මමද...? මට මේ කිසිදෙයක් හිතාගන්න බෑ වගේ.

'' රශ්මි ඒ ප්‍රොෆයිල් එක හදලා තියෙන්නෙ එයාගෙ යාළුවා උන අංජනාගෙ නමේ කෑල්ලකුත් දාලා. ඔය දෙන්නා කාලයක් චැට් කරගෙන යද්දි ඔයා බල කළාලුනෙ එයාගෙ ෆොටෝ එකක් බලන්න ඕනෙමයි කියලා. ඒකට කෙල්ල හොඳටම අප්සෙට් උනා. අන්තිමේදි මටයි අංජුටයි මේ සිද්ධිය කියලා අංජනාගෙත් කැමැත්ත ඇතුව තමයි එයා අංජුගෙ ෆොටෝ එකක් ඔයාට එවලා තියෙන්නෙ. ඊට පස්සෙ ඔයා කොහොමහරි ඒ ෆොටෝ එකේ අයිතිකාරයා හොයාගෙන තිබුණා. ''

අහන්න බලාපොරොත්තු නොවුණ අමුතුම ජාතියෙ කතාවක් විනෝද් එක හුස්මට කියාගෙන යද්දි මං හුස්ම ගන්නෙත් නැතුව ඒක අහගෙන හිටියා.

'' ඒ ෆොටෝ එකේ රූපෙ තියෙන ගෑණු ළමයා ඉන්නෙ වීදියවත්තෙ කියලා මට හොයලා දුන්නෙත් රශ්මිගෙ අයියා තමයි.''

'' ඔව්... ඔයයි ගිවන්ත අයියයි අංජුගෙ ගෙවල් පැත්තෙ කැරකෙනවා කියලා දැනගෙන රශ්මි හොඳටම ඇඬුවා. එයා කරපු මෝඩ වැඩේ නිසා එයාට ඔයාව නැති වෙයි කියලා එයා හොඳටම බයඋනා. ''

'' මට තාමත් මේ කිසිදෙයක් හිතාගන්න බෑ මල්ලි...''

'' අයියා අප්සෙට් වෙන එක සාධාරණයි. මේ වගේ සීන්

" මං උඹේ ආදරේට අතරමැදියෙක් උනා කියලා හිතනවානං මට සමාවෙයන් විනෝද්... මේක පැටලුණු නූල් බෝලයක් වගේ වෙලා... "

කොල්ලා ඔළුවත් බිමට හරවගෙන කල්පනා කරනවා දැකලා මං ඌගෙ උරහිසට තට්ටුවක් දැම්මා.

" නෑ අයියෙ. අයියා මට අතරමැදියෙක් උනේ නෑ. අයියා ආදරේ කළේ දැහැමි අංජනාට මිසක් සෙනුරි අංජනාට නෙමෙයිනෙ... "

" ඒ කිව්වෙ...? "

" දැහැමියි සෙනුරියි කියන්නෙ එක්කෙනෙක් නෙමෙයි දෙන්නෙක්... "

" විනෝද්....? "

" ඔව් අයියෙ... අයියා දැහැමි එක්ක වැට් කරපු දේවල්වත් ඕයාලා අතර හුවමාරු උන තිසදැස් ගැනවත් කිසිම දෙයක් අංජු දන්නෙ නෑ. "

එතකොට එදා මං පන්සලේදී අංජුගෙන් ඒ දේවල් ගැන අහද්දීත් එයා ගොළු වෙලා හිටියෙ ඒ නිසාද...? එහෙමනං මේ දේවල් මේ විදියට පැටලුවෙ කවුද...?

" එතකොට දැහැමි කියන්නෙ කවුද මල්ලි...? "

" දැහැමි කියන්නෙ රශ්මි... "

විනෝද් මගේ ඇස් දෙක දිහා බලාගෙන ඒක කියද්දී මට නිකං උන් හිටි තැන් අමතක උනා වගේ දැනුණෙ.

" ඒක තමයි අපි නොකියන්න පොරොන්දු උන රහස. ඒත් දැන් වෙලා තියෙන දේවල් එක්ක අපි ඒක තව හංගන්න





ගියොත් රශ්මි මොන නාඩගමක් නටයිද දන්නෑ. "

එතකොට මෙච්චර කල් දැහැමි කියන බොරු නමකට මුලා වෙලා මට ආදරේ කරලා තියෙන්නෙ අපේ චූටිද...? කෙල්ල පහුගිය ටිකේ ගෙදරට වෙලා නොකා නොබී ඇඬුවයි කියලා ශිවන්ත කිව්වනෙ. ඒකට හේතුවත් මමද...? මට මේ කිසිදෙයක් හිතාගන්න බෑ වගේ.

" රශ්මි ඒ ප්‍රොෆයිල් එක හදලා තියෙන්නෙ එයාගෙ යාළුවා උන අංජනාගෙ නමේ කෑල්ලකුත් දාලා. ඔය දෙන්නා කාලයක් චැට් කරගෙන යද්දි ඔයා බල කළාලුනෙ එයාගෙ ෆොටෝ එකක් බලන්න ඕනෙමයි කියලා. ඒකට කෙල්ල හොඳටම අප්සෙට් උනා. අන්තිමේදි මටයි අංජුටයි මේ සිද්ධිය කියලා අංජනාගෙත් කැමැත්ත ඇතුව තමයි එයා අංජුගෙ ෆොටෝ එකක් ඔයාට එවලා තියෙන්නෙ. ඊට පස්සෙ ඔයා කොහොමහරි ඒ ෆොටෝ එකේ අයිතිකාරයා හොයාගෙන තිබුණා. "

අහන්න බලාපොරොත්තු නොවුණ අමුතුම ජාතියෙ කතාවක් විනෝද් එක හුස්මට කියාගෙන යද්දි මං හුස්ම ගන්නෙත් නැතුව ඒක අහගෙන හිටියා.

" ඒ ෆොටෝ එකේ රූපෙ තියෙන ගෑණු ළමයා ඉන්නෙ විදියවත්තෙ කියලා මට හොයලා දුන්නෙත් රශ්මිගෙ අයියා තමයි."

" ඔව්... ඔයයි ශිවන්ත අයියයි අංජුගෙ ගෙවල් පැත්තෙ කැරකෙනවා කියලා දැනගෙන රශ්මි හොඳටම ඇඬුවා. එයා කරපු මෝඩ වැඩේ නිසා එයාට ඔයාව නැති වෙයි කියලා එයා හොඳටම බයඋනා. "

" මට තාමත් මේ කිසිදෙයක් හිතාගන්න බෑ මල්ලි..."

" අයියා අප්සෙට් වෙන එක සාධාරණයි. මේ වගේ සීන්

එකක් මට උනානං මං මොන තීරණයක් ගනියිද කියලා මටත් හිතාගන්න බෑ. ''

'' මල්ලි කියන්නෙ එතකොට අංජු මේ කිසි දෙයක් ගැන දැනගෙන හිටියෙ නෑ කියලද...? ''

'' මං අංජුව සුද්ධ කරන්න හිතාගෙන මෙහෙම කියනවා නෙමෙයි අයියෙ. ඒත් ඇත්තටම අංජු මේ කිසිම දෙයක් ගැන දන්නෙ නෑ. එයා හිතුවෙ රශ්මි එයාගෙ ෆොටෝ එක දැම්මම අයියා ඒක පස්සෙ පන්නන එකක් නෑ කියලා. විභාගෙ ඉවර වෙලා රශ්මි ඒ හැමදේම අයියට කියන්නනෙ හිටියෙ. එතකොට අංජුට කිසි ප්‍රශනයක් වෙන එකක් නෑ කියලා එයා හිතුවා. ඒත් අන්තිමේදි උනේ කවුරුවත් හිතපු නැති දෙයක්නෙ. ''

විනෝද් ඒ කවුරුවත් හිතපු නැති දෙයක් කියලා කිව්වෙ මං අංජුව හොයාගෙන ගිහින් එයා එක්ක කතා කරපු එක වෙන්න ඇති. ඒක තමයි එදා චූටි කිව්වෙ මං කරපු පව් දැන් මගේ පස්සෙන්ම පන්නනවා කියලා.

'' අයියා මුලින්ම වැඩට යන දවසෙ අංජුව බලන්න ඕනෙ කියලා මැසේජ් කරලා තිබුණා නේද...? රශ්මි ඒ මැසේජ් එක බලලා එදා මුළු දවසම ඇඬුවා. මගෙනුත් ඇවිත් ඇහුවා මොකද කරන්නෙ කියලා. මංනං එදත් කිව්වෙ අයියට ඇත්ත කියන්න කියලා තමයි. ඒත් ඔයාට ආදරෙයි කියන එක එකපාර කියන්න රශ්මි ගොඩක් බය උනා. අනික අයියා කියලත් තිබුණලු ඉස්සෙල්ලා ඉගෙනීම ගැන හිතලා දෙවනුව ආදරේ ගැන හිතන්න කියලා. ඒ නිසා රශ්මි හිතන් හිටියෙ විභාගෙ ඉවරවෙලාම අයියට මේ ගැන කියන්න. ''

'' ඒත් මල්ලි මං ඒ වැඩට යන දවසෙ උදේ අංජු ටවුන්





එකට ඇවිත් හිටියනෙ. ප්‍රොෆයිල් එක හැන්ඩ්ල් කරන්නෙ අපේ චූටිනං අංජු එදා කොහොමද හරි වෙලාවටම එතනට ආවෙ. ''

'' අංජුව නොදැක යන්න උනොත් අයියගෙ හිත රිදෙයි කියලා අන්තිමේදි රශ්මි තීරණේ කළා ඒ වෙලාවට අංජුට එන්න කියන්න. ඒ උනාට අයියෙ අංජු එදා එතනට ආවෙ ඔය කිසිම දෙයක් දැනගෙන නෙමෙයි. අංජුගෙ දුප්පත්කමට රශ්මි නොසෑහෙන්න උදව් කරන නිසා අංජුගෙ හිතේ රශ්මි හිටියෙ ගොඩක් උසස් තැනක. ඒ නිසා රශ්මි කියන දෙයක් කරන්න අංජු කවදාවත් පැකිලුණේ නෑ. ''

'' මල්ලි කියන්නෙ එතකොට අපේ චූටි අංජුට උදව් කරන එකට හිලව් වෙන්න එයාව අයුතු විදියට පාවිච්චි කළා කියලද...? ''

මං ඇහුවෙ ටිකක් සැරෙන් වගේ.

'' අපෝ කීයටවත් නෑ අයියෙ. මං අයියා එක්ක මුලින්ම කතා කරපු දවසෙත් කිව්වෙ රශ්මි කියන්නෙ මං මේ ජීවිතේ දැකපු හොඳම ගෑණු ළමයා කියලා. එයා කවදාවත් එහෙම නරක චේතනාවකින් වැඩ කරපු කෙනෙක් නෙමෙයි. මේ හැම පටලැවිල්ලක්ම උනේ ඔයාගෙ වදෙන් බේරෙන්න බැරි නිසා රශ්මි දූරදිග නොබලා අංජුගෙ ෆොටෝ එකක් එවපු එකෙන් තමයි. ''

යකෝ මේක කැකිල්ලෙ රජ්ජුරුවන්ගෙ නඩු තීන්දුව වගේ කේස් එකක්නෙ. එතකොට මේ හැම පටලැවිල්ලකටම මුල ෆොටෝ එක ඉල්ලපු මමද...?

'' අයියා දන්නවද අංජුට ෆේස් බුක් යන්න තියා එයාලගෙ ගෙදරට කම්පියුටර් එකක්වත් නෑ කියලා. කොටින්ම අංජු ෆේස්බුක් කියන්නෙ මොන වගේ දෙයක්ද කියලාවත් දැනගෙන ඉඳලා නෑ.

ඊත් පස්සෙ රශ්මිම අංජුට එෆ් බී යන හැටි කියලා දුන්නා. එයා අංජුට වෙනම ප්‍රොෆයිල් එකකුත් හදලා දුන්නා. ඊත් මං දන්න තරමට අංජු කවදාවත් ඒක පාවිච්චි කළේ නෑ. ''

විනෝද් මේ දේවල් කියාගෙන යද්දි මං කළේ හිතෙන් අතීතෙට ගමන් කරපු එක. ඒ කාලෙ වෙච්ච එක එක සිද්ධි මං ආපහු මතක් කරගෙන මේ දේවල් එක්ක ගලපන්න උත්සහ කළා. ඊත් සමහර තැන් විනෝද්ගෙ මේ කතාවත් එක්ක ටැලි වෙන්නෙ නෑ. ඒවා පරස්පරයි.

'' ඔය කියන විදියට මට නිසදැස් එව්වෙ චූටිනං එයා මොකටද අතරමැදියෙක් ගැන කියෙව්වෙ. මට තේරෙන්නෙ නෑ...''

'' මං ඒ ගැනනං හරියටම දන්නෙ නෑ අයියෙ. ඊත් දවසක් රශ්මි කිව්වා අයියා මුණ ගැහෙන්න ඕනෙ කියලා කියපු වෙලාවක එයා අංජුගෙ පැත්තෙන් හිතලා නිසදැසක් දැම්මා කියලා. සමහරවිට ඒ ගැන වෙන්න ඇති අයියා ඔය කියනවා ඇත්තෙ. ''

ඔව්නෙ. ඒක උනෙත් අපි වැඩට යන දවසට කලින් දවසෙම තමයි. මං හම්බවෙන්න ඕනෙ කියලා කියපු වෙලාවෙනෙ කෙල්ල නිසදැසක් එවලා තිබුණෙ 'එනමුදු තව සිතක් බෑ මට රිදවන්න... අවසර දෙන්න ඔබගෙන් ඈතට යන්න කියලා...

ඒ විතරක්ද එදා අපි වැඩට යන දවසෙ උදේ කිරිබත් කන්න කියලා මේසෙට වාඩි උනාම චූටි ඇඩුවත් එක්කනෙ.

'' මේවා අහලා මටත් තිකං පිස්සු වගේ. දැන් කියන්නකො මල්ලිට අදම මාව හම්බවෙන්න තිබුණු අවශ්‍යතාවය මොකක්ද කියලා. ''

කොයි තරම් කල්පනා කළත් මේ දේවල් වල කෙළවරක් නැති නිසා මං කතාව මාරු කළා.



'' අයියා මේ ළඟදි දවසක අංජු එක්ක පන්සල් ගියාද...?''

විනෝද් ඒක ඇහුවෙ ටිකක් දුකෙන් වගේ. ඔව් ඉතිං... එක අතකින් බලද්දි අංජු කියන්නෙ විනෝද්ගෙ සිහින කුමාරිනෙ. ඒ නිසා ඒ වගේ දෙයක් මගෙන් එකපාර අහන්න කොල්ලට අප්සෙට් ඇති.

'' ඔව්... ගිය සතියෙ දවසක... එදත් අංජු කැමැත්තෙන් ආවා නෙමෙයි. මගේ බලකිරීමට තමයි ගියේ. ''

පසුවට ඇති වෙන්න තියෙන ප්‍රශ්න ගැන හිතලයි මං ඒ අන්තිම කොටස එකතු කළේ. කොහොමටත් ඒක බොරුවක් නෙමෙයිනෙ.

'' අංජු මෙච්චර දවස් වෙච්ච හැමදේම රශ්මිට කියලා තිබුණා. ඔයා ෆෝන් නම්බර් එක හොයන් කෝල් කරනවා කියලා අංජු ඒකත් ඕෆ් කරගෙන හිටියා. ඊත් මේ පන්සල් ගිය සිද්ධිය විතරක් එයා කියලා නෑ... ''

'' එහෙමනං අපේ චූටි කොහොමද ඒ ගැන දැනන් තියෙන්නෙ. මොකද මමයි අංජුයි ගිවත්තයි ඇරෙන්න වෙන කවුරුවත් ඒක දන්නෙ නෑ. අනික ගිවා කියන්නෙත් නෑ කියලා මට ෂුවර්... ''

'' කවුරුවත් කියලා නෙමෙයි. අයියා එෆ් බී එකේ යවපු මැසේජ් එකකින්ම තමයි එයා ඒක දැනගෙන තියෙන්නෙ... ''

හුටා... එදා අංජු ෆෝන් එකට එවපු මැසේජ් එක බලලා කේන්ති ගිහින් මං රිප්ලයි එකක් යැව්වා නේන්නං. ෆෝන් එකේ මැසේජ් කරනවට වඩා කම්පියුටරේ යවන එක ලේසි නිසානෙ මං එහෙම කළේ. ඒ කියන්නෙ ඒ මැසේජ් එක බලලා අපේ චූටි අප්සෙට් ගිහින්ද...?

'' දැන් කෝ චූටි...? ''

'' එයා මේ ටිකේම අංජු එක්ක පාඩම් කරන්න යනවා කියලා උදේම ගෙදරින් පිටවෙලා ඇවිත්. ඒත් එයා අංජුලගෙ දිහා ගිහින් නෑ අයියෙ. මේ දවස් තුනේම එයා ආවෙ අපේ ගෙදර... දැන් ඉන්නෙත් එහෙ. ''

'' මොනවා...? ''

හිතේ තියෙන තරහට කොල්ලෙක්ගෙ ගෙදර යන්න තරම් අපේ චූටිට ඇත්තටම පිස්සු හැදිලද...? විනෝද් හොඳ එකෙක් කියන එක ගැනනම් සැකයක් නෑ. ඌ කෙල්ලගෙ හොඳම යාළුවා බවත් ඇත්තයි කියමුකො. ඒත් කවුද දන්නෙ... හැමදේම වෙනස් වෙලා යන්න පොඩි වෙලාවක් ඇති. අනික චූටි කියන්නෙත් ඇහැට කනට පේන ලස්සන හුරතල් කෙල්ලෙක්නෙ. නිකංහරි විනෝද්ගෙ හිත වෙනස් උනොත්.

'' ඔච්චර කල්පනා කරන්න එපා අයියෙ. මටත් නංගි කෙනෙක් ඉන්නවා රශ්මි වගේම. එයාට මගෙන් කිසිම කරදරයක් වෙන්නෙ නෑ. ඒත් මේ විභාගෙ කට අග තියාගෙන රශ්මි අපේ ගෙදර ඇවිත් කරන්නෙ පාඩම් කරන එක නෙමෙයි... උදේ ඉඳලා හවස් වෙනකල්ම ඉකි ගගහා අඬන එක... ''

මගේ හිත කියෙව්වා වගේ විනෝද් නියම උත්තරයක් දුන්නා. ඒත් චූටි ඉකි ගගහා අඬනවා කියපු එකනං මට වාවන්න පුළුවන් උනේ නෑ.

'' අපි දැන් මේකට මොකද කරන්නෙ මල්ලි...? ''

'' ඒක තීරණේ කරන්න ඕනෙ මං නෙමෙයි අයියා. මේ ප්‍රශ්නෙ ඔයයි අංජුයි අතර සිද්ධියක් විතරක්නං කතා දෙකක් නෑ





මං අංජුව ඔයාට දීලා අයින් වෙනවා. ආයෙ ඒකෙ කිසිම සැකයක් නෑ. ඒත් මෙතන තියෙන්නෙ වෙනම දෙයක්නෙ. ඒ නිසා මොනවද කරන්න ඕනෙ කියලා අයියා තීරණය කරන්න. ඔයාට එකපාර තීරණයක් ගන්න අමාරුනං අඩුම තරමෙ විහිළුවටවත් රශ්මිගෙ හිත සනසන්න. එහෙම නොවුණොත් කෙල්ල විභාගෙ අනාගනියි අයියෙ. අපරාදෙ... අපි තුන් දෙනාගෙන් ගොඩක්ම බ්‍රයිට් එයා. ''

විනෝද් එයාගෙ හිතේ තිබුණු බර සේරම මගේ පපුවට දාලා ඉවර වෙලා මහා සද්දෙට හුස්මක් පිට කළා. මං මේකට මොනවා කරනවද කියලා මට තේරුණේ නෑ.

මං ආදරේ කළේ එෆ් බී එකේදි මට හම්බඋන... එකේදි මට නිසදැස් එවපු කෙනාට කියලා කියන්නෙ ඇත්තටම මං ආදරේ කරලා තියෙන්නෙ අපේ චූටිට. එයාගෙ ලස්සන අදහස් වලට. ඒත් මොහොතකට හරි මං අංජුටත් ළං උනානෙ. අනික අංජු විනෝද්ට කැමති නෑ කියන්නත් මං දන්නවා.

ඒ විතරක්ද... විනෝද්ට නොකිව්වට අංජු එදා මගේ ෆෝන් එකට එවලා තිබුණ නිසදැස...

'දඟ කරන ඔබේ ඔය
දිගු නීල නෙතු අගින්
යළිඳු සඟ පායන්න
වෙර දරයි මා හදට...'

අන්න ඒ පද පේළි ටික ආවෙ චූටිගෙන් නෙමෙයි අංජුගෙන් නිසා මට එතනත් පොඩි කොස්සක් ඉතුරු වෙලා තිබුණා. චූටි අංජුව මේකට බලෙන් පැටලුවට අංජු දැන් මට ඇත්තටම ආදරේ කරන්න පටන් අරන්නම්... එහෙම උනොත් මං දෙන්නගෙන් කාවද තෝරගන්නෙ...?

'' කමක් නෑ... අයියගෙ තීරණේ මට දැනගන්න අවශ්‍ය නෑ. ඒත් අයියෙ රශ්මිගෙ විභාගෙ ගැන හිතලාවත් මොනවාහරි කරන්න. ප්ලීස්... ''

මගේ මූණ දිහා ඇස් පිය නොහෙළා බලන් හිටියට මං කිසිම උත්තරයක් නොදුන්න නිසාද මන්දා විනෝද් යන්න නැගිට්ටා.

'' චූටි කීයටද ඔයාලගෙ ගෙදරින් එන්නෙ...? ''

'' එයාට ගෙදර ඉඳගෙන නිදහසේ අඬන්නවත් බෑ කියලා තමයි අපේ ගෙදර එන්නෙ. අපෙත් අම්මයි තාත්තයි දෙන්නම වැඩට යනවනෙ. ඉතිං දවල් දවසෙ ගෙදර ඉන්නෙ නංගියි වැඩට ඉන්න ගෑණු කෙනයි විතරයි. රශ්මි අම්මලා එන වෙලාව වෙනකල්... ඒ කියන්නෙ පහමාර විතර වෙනකල් අපේ ගෙදර ඉඳලා තමයි යන්නෙ... ''

'' එතකොට අංජු මේ දවස්වල මොනවද කරන්නෙ කියලා මල්ලි දන්නවද...? ''

'' අර සිද්ධිය කිව්වෙ නෑ කියලා රශ්මි එයා එක්ක තරහා වෙලානෙ. ඒ නිසා අංජුත් ඉන්නෙ ගොඩක් දුකෙන්. මං හිතන විදියට අංජු ඇත්තෙ ගෙදර. ''

'' හරි මල්ලි... මේ දේවල් මට කිව්වට තැන්ක්ස්... මං මොනවාහරි කරන්න බලන්නම්... ''

මං ඒ නොකියා කිව්වෙ විනෝද්ට එතනින් යන්න කියලයි. ඒක තේරිලාද මන්දා කොල්ලා තවත් මට කරදර නොකර පිටවෙලා ගියා.

* * * * * * *



# 20

හිත ඇතුළට කළු ගල් හොන්ඩරයක් විතර පැටෙව්වා වගේ මහා බරක් දැනෙද්දි මං අංජුව මුණ ගැහෙන්න යන්න තීරණය කළා. ගිවන්තට මේ දේවල් කියන්න ඕනකම තිබුණත් ඌ වැඩ ඇරිලා එන්නෙ හවස් වෙලා නිසා ඒ වෙනකල් ඉවසගෙන ඉන්න මට පුළුවන් උනේ නෑ.

'' චූටි පුතේ... උඹ මේ කොහෙ යන්නද තකහනියෙ...? ''

'' අද අපේ අර යාළුවගෙ ටිකට් කපනවලු ආච්චියෙ... ඉතිං මං යනවා ඌව ගෙදර එක්කගෙන එන්න... ''

පහුගිය ටිකේ දිගින් දිගටම අපේ ගේ ඇතුළෙ ගලාගෙන ගිය බොරුව මම ඒ විදියටම අලුත් කළා.

'' ඒකට ඉතිං අසනීපෙන් ඉන්න උඹම යන්න ඕනෙයැ... ඒ කොලුවගෙ ගෙදර උන්ට බැරුවයැ වාහනයක් කතා කරගෙන ඌව එක්ක යන්න... ''

ආච්චි ඒක කිව්වෙ තරහට නෙමෙයි මං ගැන තියෙන ආදරේට කියලා මං දන්නවා.



Chamodi Madhuka

" මං මෙහෙම කිව්වයි කියලා කාටවත් කියන්න එපා ආච්චියෙ... ඌ කොලුවෙක් නෙමෙයි... කෙල්ලෙක්... "

" හැබෑ.....ට? හා හා... එහෙමනං පරිස්සමට ගිහින් වරෙන්කො... "

ආච්චි දත් නැති කට අමුතු විදියට නටවලා හිනාවක් දාලා මට යන්න අවසර දුන්නා.

" හැබැයි චූටි පුතේ ඔය ගැටිස්සියො උඹේ හුටු හුටුවෙ නග්ගගන්නවා එහෙම නෙමෙයි. එහෙම උනොත් ලෝකයා කතන්දර කියයි... "

කොයි තරම් සිරියාවන්ත විදියට හිනා උනත් ආච්චි එළියට බහින්න හදපු අන්තිම මොහොතෙ රෝන්ග් ටෝක් එකක් දුන්නනෙ.

" අනේ මේ ආච්චියෙ... ඔය ලෝකයා කියන එකාට මං බය නෑ. ඌව මට හම්බවෙද්දෙන්කො කොහෙදිහරි... ආයෙ කතන්දර කියන්න බැරි වෙන්න මං ඌගෙ දත් සෙට් එක බඩට යවන්න... "

ඒ කියපු වේගෙන්ම මං බයිසිකලේ පාරට ගත්තා. හිතේ තිබුණු නොඉවසිල්ල කොයි තරම්ද කියනවානං මං විනාඩි පහළවක් යන්න කලින් හිටියෙ අංජුලගෙ ගෙදර.

ඒ වෙලාවෙ කෙල්ල මිදුලෙ තිබුණු පොල් කොටයක් උඩ ඉඳගෙන බර කල්පනාවක්. කොටින්ම මං බයිසිකලෙන් බැහැලා වත්ත ඇතුළට යනකල්ම එයා මාව දැක්කෙ නෑ.

" නංගි..."

ඒ පොල් කොටේම අනික් පැත්තෙන් ඉඳගන්න ගමන් මං කතා කළා. මගේ සද්දෙ ඇහුණා විතරයි අංජු ගැස්සිලා ගියේ





හරියට කරන්ට් එක වැදුණා වගේ.

" අයියෙ... ඔයා මෙහෙ...? "

එයා ඇහුවෙ ඇස් දෙකත් ලොකු කරගෙන.

" ඇයි මට මෙහෙ එන්න බැරිද...? "

" අනේ අයියෙ... මේ වෙලා තියෙන දේවල් හොඳටම ඇති... කරුණාකරලා අයියා මෙතනින් යන්න... "

අංජු එහෙම කිව්වෙ අත් දෙක එකතු කරලා මට වඳින ගමන්. ඇත්තටම එයාගෙ ඒ ඉරියව්වට මට ගොඩක් දුක හිතුණා.

" ඇයි මාව එළවගන්න හදන්නෙ...? "

" මං කිව්වනෙ අයියෙ... මං විභාගෙ ඉවර උන ගමන් මේ හැමදේම අයියට පහදලා දෙන්නම්... ඒ නිසා ප්ලීස්.... දැන් අයියා මෙතනින් යන්න... "

අංජු තාමත් හිතාගෙන ඉන්නෙ මං මේ ඇවිත් ඉන්නෙ කිසි දෙයක් නොදැන කියලා. පව්...

" නංගි... ඔයා මොකටද මේ බයවෙලා ඉන්නෙ...? මට ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕනෙ. මේක ඔයාගෙ විභාගෙ ඉවර වෙනකල් කල් දාන්න පුළුවන් දෙයක් නෙමෙයි. එහෙම උනොත් මට පිස්සු හැදෙයි... "

" මටත් පිස්සු නොහැදුන එක විතරයි අයියෙ. මටත් මේ දේවල් උහුලගෙන ඉන්න බෑ. අනික එයා දැන් මාත් එක්ක තරහත් වෙලා. ඒත් දෙයියනේ මං කියලා මොනවා කරන්නද...? මට ඒ පොරොන්දුව කඩ කරන්න බෑ. "

අංජු මේ නොකියා කියන්නෙ මොනවද කියලා මට දැන් තේරෙනවා. එයා පොරොන්දුව කඩ කරන්න බෑ කියන්නෙ

අපේ වූටිට මේ රහස රකින්න වෙච්ච පොරොන්දුවනෙ.

" සෙනුරි... එදා මං ඔයාව මෙතනින් ඇවිත් බස්සලා ගියේ මේ තරම් ඉක්මනට ඔයාව හම්බවෙන්න හිතාගෙන නෙමෙයි. ඒත් මට අද එන්න උනා. "

මං ඒ සෙනුරි කියලා කිව්වෙ අංජුට නම් වල වෙනස මතක් කරලා දෙන්න. ඒත් එයා ඒක බාරගත්තෙ හින්ට් එකක් හැටියට.

" ඔය දේවල් කිය කිය මගේ හිත රිදවන්න එපා අයියෙ. මං සෙනුරි මිසක් දැහැමි නෙමෙයි. කොටින්ම අයියා ආදරේ කරන දැහැමි මං නෙමෙයි... "

" නංගි... එතකොට ඔයා ආදරේ කරන කෙනා විනෝද්ද...?"

ඔන්න ඒක ඇහුවා විතරයි කෙල්ල ආපහු ගැස්සිලා ගියා.

" අයියා... කොහොමද... මේ දේවල් දන්නෙ...? "

" ඔයා විනෝද්ට කැමතියි කියන එකද...? "

මං ඇහුවෙ ඒ ඇස් දෙකට එබිලා.

" නෑ. විනෝද් මට කැමතියි කියන එක... "

" ඒක විතරක් නෙමෙයි මං තව ගොඩක් දේවල් දන්නවා නංගි. මට ඕනෙ ඒකෙ ඇත්ත නැත්ත දැනගන්න විතරයි. "

අංජු මං දිහා බයවෙලා බලන් හිටියෙ මොනවා කියන්නද කියලා හිතාගන්න බැරුව වගේ.

" සොරි... මට කිසි දෙයක් කියන්න විදියක් නෑ එයාගෙන් අහන්නෙ නැතුව... "



ෂා... මං හිතාගෙන හිටියට වඩා අංජු ග්‍රේට්නෙ. එයා මොන විදියකින් ඇහුවත් පොරොන්දු කඩ කරන කෙනෙක් නෙමෙයි. මේ වගේ විශ්වාසවන්ත යාළුවෙක් හම්බවෙන්න අපේ වූටි පෙර ආත්මෙක ගොඩක් පින් කරන්න ඇති.

" මං ඔයා ලව්වා පොරොන්දු කඩ කරවන්න හදනවා නෙමෙයි. මං ආවෙ මම සෙනුරි අංජනාට නැතුව දැහැමි අංජනාට ළං උනොත් ඒකෙන් ඔයාගෙ හිතට දුකක් දැනෙයිද අහන්න... "

මෙච්චර වෙලා රතු වෙලා තිබුණු ඒ ඇස් වලින් ඔන්න හෝ ගාලා කඳුළු කැට කඩන් වැටෙන්න ගටන් ගත්තා. ඇත්තටම කිව්වොත් මගේ කතාවට කෙල්ල හොඳටම ඇඬුවා.

" ඔයා එහෙනං ඒ හැම දෙයක්ම දන්නවද අයියෙ... අනේ... මට සමාවෙන්න. මං මේ කිසි දේකට වැරදිකාරයා නෙමෙයි. මං අයියගෙ හිත රැවැට්ටුවෙ නෑ. ඒ වගේම තමයි රශ්මිගෙත් කිසි වැරැද්දක් නෑ. එයා මේ දේවල් කළේ අයියට තිබුණු ආදරේ වැඩිකමට."

" එතකොට රශ්මි විතරද මට ආදරේ කළේ...? "

" රශ්මි කියන්නෙ අපේ පවුලට බුදු හාමුදුරුවො එවපු දේව දූතියක් අයියෙ. ඇත්තටම එයා මේ මිහිපිට ඉන්න දෙවඟනක්. ඒ තරම් හොඳ ගතිගුණ තියෙන ගෑණු ළමයෙක් මගේ මේ ජීවිතේට මුණ ගැහිලා නෑ. ඒ නිසා අයියා කවදාවත් රශ්මිට දුකක් දෙන්න එපා. එහෙම උනොත් මට පව් සිද්ධ වෙයි... "

අංජු උත්තර දුන්නෙ මං අහපු ප්‍රශ්නෙට නෙමෙයි. ඒත් කෙල්ල මට කිව්වෙ එයා ගැන නොහිත වූටි ගැන හිතන්න කියලනෙ. ඒක තමයි මටත් දැනගන්න ඕන වෙලා තිබුණෙ.

" ඒත් මේ ප්‍රශ්නෙට ඔයාව පැටලුවෙ එයා නේද...? "

මං ඇහුවෙ අංජු ඒකට දෙන උත්තරේ මොකක්ද කියලා දැනගන්න.

'' එයා හැමදාම මට උදව් කරනවා මිසක් කවදාවත් මගෙන් උදව්වක් ඉල්ලලා තිබුණෙ නෑ. අනික රශ්මි වගේ කෙනෙක්ට කරන්න තරමෙ උදව්වක් මං වගේ දුප්පත් කෙල්ලෙක් ළඟ තිබුණෙත් නෑ. අපි කන්න නැතුව හිටපු දවස් වල රශ්මි අපිට කන්න බොන්න ගෙනත් දීලා තියෙනවා. මං වැරහැලි ඇඳගෙන පන්ති යද්දි එයා මට අලුත්ම ඇඳුම් ගෙනත් දීලා තියෙනවා. ලියන්න හරියකට පොතක් පතක් නැතුව හිටපු මට එයා පොත්පත් ටික අරන් දීලා තියෙනවා.

ඒ විතරක් නෙමෙයි... දවසක් අපේ අම්මා අසනීප වෙලා එයාට බෙහෙත් ගෙනත් දෙන්න විදියක් නැතුව මං අඬ අඬ හිටපු වෙලාවෙ රශ්මි තමයි ත්‍රීවිලර් එකක් අරන් ඇවිත් අම්මව ඉක්මනට ඉස්පිරිතාලෙ එක්කගෙන ගියේ. දොස්තරලා කිව්වා එදා අම්මව ගේන්න තව ටිකක් පරක්කු උනානං අම්මගෙ ජීවිතෙත් නැති වෙන්න තිබුණා කියලා. එදා ඉස්පිරිතාලෙ නැති තරමක් ගණන් වැඩි බෙහෙත් වගයක් දොස්තර ලියලා දුන්නා පිටින් අරන් දෙන්න කියලා. ඒ පාර රශ්මි ටියුෂන් පන්තියට දෙන්න තියාගෙන හිටපු පන්ති ගාස්තුව දීලා ඒ බෙහෙත් ටික අරන් දුන්නා.

අනික හැම මාසෙම එයාගෙ පොකට් මනී එකතු කරලා එයා අපේ ගෙදරට සීනි පිටි තේකොළ ගෙනත් දෙනවා. මං ඒත් කිව්වා සල්ලි නාස්ති කරනවා කියලා ගෙදරින් බැනුම් අහන්න වෙයි කියලා. එයා කියන්නෙ එයාට ගෙදරින් හම්බවෙන සල්ලි එයාගෙ වියදම් වලට ඇති කියලයි... ''

අංජු එක හුස්මට අපේ චූටිගෙ හොඳ කියාගෙන ගියාට



චූටි යාළුවා වෙනුවෙන් ඒ දේවල් කරන්න ගෙදරින් කොයි තරම් බැනුම් ඇහුවද කියලා දන්නෙ අපි විතරයි. ඒත් දැන් ඒවා කියලා අංජුගෙ හිත රිද්දන්න මට ඕනකමක් තිබුණෙ නෑ.

'' මං ජීවත් වෙලා ඉන්නකල් කවදාවත් රශ්මිට නරකක් වෙන්න ඉඩ දෙන්නෙ නෑ අයියෙ. මොන දේ නැතත් එයා මට මගේ දුප්පත් අම්මව බේරලා දුන්න එක මේ හිතේ ගලේ කොටපු අකුරක් වගේ හැමදාම තියෙනවා. ඒ නිසා මං කීයටවත් ඒ හිතට දුකක් දැනෙන දෙයක් කරන්නෙ නෑ.

එයා මේ අවුරුදු ගාණටම මගෙන් ඉල්ලපු එකම උදව්ව මගේ ෆොටෝ එක ෆේස් බුක් දාන්න ඉල්ලපු එක විතරයි. එකත් එයාගෙම අයියට කියලා දැනගෙන හිටපු නිසයි මං විරුද්ධ නොවුණෙ. ඒ දේ මේ තරම් දුරදිග යයි කියලා මං කීයටවත් හිතුවෙ නෑ. ''

'' ඒත් වැරදීමකින් හරි අපි දෙන්නත් මුණ ගැහුණනෙ නංගි... ඒකට මොකද කරන්නෙ...? ''

'' ඒක අමතක කරලා දාන්න අයියෙ. අපි හම්බ උනේ දවස් කීයද...? ඔයා මාව හොයාගෙන මුලින්ම මෙහෙ ආව දවසෙත් මං අයියව එළවගත්තෙ තරහකට නෙමෙයි රශ්මි දැනගත්තොත් එයාට දුක හිතෙයි කියලා. දෙවෙනි දවස අයියා වැඩට ගිය මුල්ම දවසනෙ. එදත් වෙච්ච කිසි දෙයක් මං දැනන් හිටියෙ නෑ. රශ්මි එන්න කියපු වෙලාවට හන්දියට ගිය එක විතරයි මං කළේ. මගෙන් වැරැද්දක් කියලා දෙයක් උනානං ඒ අයියා එක්ක පන්සල් ගියපු එක විතරයි. ''

අංජු එහෙම කිව්වට ඒ දවස් වලට අමතරව මං තව දවස් කීයක් මේ පාරෙ ඇවිත් රස්තියාදු වෙලා තියෙනවද.

'' එදත් ඔයා ඒ ගමන ආවෙ මගේ බලකිරීමටනෙ. ඒ නිසා ඔයාගෙන් වැරැද්දක් වෙලා නෑ. ඒත් මේ කිසි දෙයක් නොදැන හිටපු මං එදා ඔයාගෙ හිත රිදෙන දේවල් කියන්න ඇති. ඒකට මට සමාවෙන්න නංගි... ''

'' අයියා මොකටද සමාව ගන්නෙ. අයියා ඒ කතා කිව්වෙ ඇයි කියලා මං හොඳටම දන්නවනෙ. ඒකයි මං කිව්වෙ අපේ විභාගෙන් පස්සෙ ඒවට උත්තර දෙන්නම් කියලා. ''

'' ඒ කියන්නෙ ඔයා හිතන් හිටයෙ ඔයාලගෙ විභාගෙන් පස්සෙ මාව මුණ ගැහෙන්නද...? ''

'' නෑ... විභාගෙ ඉවර උන හැටියෙ අයියට මේ හැම දෙයක්ම තේරුම් කරලා දෙනවා කියලා රශ්මි කිව්වා. එතකොට මට අමුතුවෙන් පහදන්න දෙයක් ඉතුරු වෙන්නෙ නැහැනෙ. ඒකයි මං එහෙම කිව්වෙ... ''

මං දිග හුස්මක් පිට කරන ගමන් අංජුලගෙ ගේ දිහා බැලුවා. ගේ ඇතුළෙ එයාගෙ අම්මා ඉන්න පාටක්නං පේන්න තිබුණෙ නෑ.

'' අම්මා කෝ....? ''

'' මේ ළඟ ගෙදරක හෙට උදේ කිරි දානයක් තියෙනවා. අම්මා එහෙට ගියා අත් උදව් දීලා එන්න. ''

අංජුලගෙ ජීවිතේ ගලාගෙන යන විදිය ගැන මගේ හිතේ තිබුණෙ දුකක්. ඔෆිස් එකේ පටන් ගන්න අලුත් ශිෂ්‍යාධාර අරමුදල යටතේ හරි අංජුට පොඩි සහනයක් දෙන්න පුළුවන් උන එක ගැන ඇත්තටම මගේ හිතේ තිබුණෙ ලොකු සතුටක්.

'' මට කියන්න තව මොනවාහරි දෙයක් ඉතුරු වෙලා



තියෙනවද නංගි...? ''

යන්න කලින් මේ හැමදේම නිරවුල් කරගෙන යන්න ඕන නිසයි මං ඒ ප්‍රශ්නෙ ඇහුවෙ.

'' මං අවුරුදු දාහතරේදි විතර නොතේරුම්කමට පිරිමි ළමයෙක් ගැන බලාපොරොත්තු තියන් හිටියා අයියෙ. ඒත් මං දුප්පත් කියලා දැනගත්ත දා ඉඳලා ඒ ළමයා මං එක්ක කතා කරන එක නතර කළා. එදා ඉඳලා මං ආදරයක් ගැන හිතන්න බයයි. අනික මං නිසා අම්මා දුක් වින්ඳා හොඳටම ඇති. මට ඕනෙ අම්මව ඒ දුකින් එතෙර කරවන්න. ඒ නිසා ඉගෙනගෙන තැනකට එනකල් මං කාටවත් ආදරේ කරන්නෙ නෑ කියලා තීරණේ කරලා ඉවරයි. ''

'' එතකොට විනෝද්ට මොකද වෙන්නෙ...? ''

ඒ ප්‍රශ්නෙ එක පාරටම මගේ කටින් පිට උනා.

'' විනෝද් කියන්නෙත් ගොඩක් හොඳ කෙනෙක් තමයි. ඒත් මට එයා ගැන කිසිම විශේෂ හැඟීමක් දැනෙන්නෙ නෑ. අනික විනෝද්ගෙ අම්මයි තාත්තයි දෙන්නම ආණ්ඩුවෙ රස්සා කරන අය. ඒ අය කවදාවත් මාව ලේලි විදියට බාරගන්නෙ නෑ. ''

'' ඔයා මුහුද හත් ගව්වක් තියා අමුඩ ගහන්න හදනවනෙ...''

'' ඒ අයියා හිතන හැටි. අයියත් මං වගේ දුප්පත් ගෙදරක දරුවෙක් වෙලා ඉපදුනානං ඔයිට වඩා වෙනස් විදියකට හිතයි.''

අංජුගෙ ඒ කතාවත් එක්ක මට තව අහන්න ප්‍රශ්න ඉතුරු වෙලා තිබුණෙ නෑ.

'' මං මේ දේවල් නොකියා හිටියෙ රශ්මිට වෙච්ච පොරොන්දුව නිසා. ඒත් අයියා දැන් හැමදේම දන්නවනෙ. ඒ

නිසා විභාගෙ ඉවර වෙනකල් මේක කල්දාන්න එපා... ඔයා අදම ගිහින් රශ්මිව මුණ ගැහිලා කතා කරන්න අයියෙ... එයා ගොඩක් හිතේ අමාරුවෙන් ඇත්තෙ... ''

'' මං අන්තිම සැරේට මේ අහන්නෙ...? ඔයා අවංකවම මටයි රශ්මිටයි ආශිර්වාද කරනවද...? ඒකට හරි උත්තරයක් හම්බඋනොත් මට පුළුවන් රශ්මි ගැන තීරණයක් ගන්න... ''

'' ඇත්තටම ඔව්... අයියව අයිති රශ්මිට විතරයි... ඔයා දැන් මෙහෙන් යන්න අයියෙ... ආයෙ වැරදිලාවත් මාව බලන්න එන්න එපා... ''

මගේ ඇස් මග ඇරලා එහෙම කියපු අංජු ගේ ඇතුළට දුවලා ගිහින් දොර වහගත්තා.

* * * * * * *

අංජුව හම්බවෙලා මං ගෙදර එනකොට වෙලාව හවස තුනට විතර ඇති. ඒ ඇවිත් මං කළේ එෆ් බී ලොග් වෙලා පහුගිය කාලෙ දැහැමි අංජනාගෙයි මගෙයි අතර හුවමාරු උන මැසේජ් එකින් එක ආපස්සට කියවලා බලපු එක.

ඒවයෙන් බාගෙට භාගයක්ම නිසදැස්. ඇත්තටම අපේ චූටිට ඒ තරම් ලස්සනට නිසදැස් ලියන්න පුළුවන් කියලා මං කීයටවත් දැනගෙන හිටියෙ නෑ.

'' ඔය නෙත් සිත අඟ කරනා කල
නිදිනැති මා නෙත් හඬන තරම්...
පවනැල්ලක දැවටී මා වෙත එන
ඔබේ සුවඳ මා පෙළන තරම්...
පාඩම් පොත් වල මැවී බොඳවෙනා





ඔබෙ රුව මා රස විඳින තරම්...
ආදර හැඟුමන් වාවනු නොහැකිව
දන්නෙද ඔබ මා දැවෙන තරම්... ''

කාලෙකට ඉස්සර ආපු ඒ මැසේජ් එක දැක්කම මට චූටි ගැන අලුත්ම හැඟීමක් දැනෙන්න ගත්තා. කොහොමත් චූටි කියන්නෙ පුංචි කාලෙ ඉඳලම මගේ හෙවනැල්ල වගේ ළඟින් හිටිය කෙල්ලනෙ. එයාගෙ හුරතල් මූණ... ඒ ලස්සන ඇස් දෙක... වෙන වෙනම මගේ ඇස් ඉස්සරහා මැවෙන්න පටන් ගත්තා.

සහන් එක්ක පාරෙ රණ්ඩු කරගෙන ආපු දවසෙ කෙල්ල ඇස් වල කඳුළු පුරවගෙන මට සාත්තු කරපු හැටි... දවසක් ගිවන්තගෙ ඔත්තුවකට මං කෙල්ලගෙ කාමරේට රිංගපු වෙලාවෙ කොට කලිසමයි ස්කිනි එකයි පිටින් එයා දුවන් ආපු හැටි... අපි මුලින්ම වැඩට ගිය දවසෙ මූණ රතු කරගෙන අඬපු හැටි මතක් වෙද්දි මට මේ දැන් දුවලා ගිහින් ඒ මූණ බලලා එන්න තරම් ආසාවක් දැනෙන්න ගත්තා.

අංජු වගේ කෙල්ලෙක්ව මගේ ජීවිතේට ළං කරගන්න ගියොත් අපේ ගෙවල් වල කවුරුහරි බාල්දියක් පෙරලන්න ඉඩ තිබුණා. ඒත් චූටිට කවුරුවත් විරුද්ධ වෙන්නෙ නෑ කියන එක මට ඉරහඳ වගේ ෂුවර්. වැඩිය ඕනෙ නෑ අපේ ආච්චිත් අපේ අක්කට වඩා චූටිට ආදරෙයිනෙ.

අනික ගිවන්තත් දවසක් කිව්වෙ උඹට අංජු ගැනවත් නැති කැක්කුමක්නෙ බං අපේ එකී ගැන තියෙන්නෙ කියලා. ඒ කියන්නෙ මෙච්චර දවස් යටගැහිලා තිබුණට අපේ හිත් අපි ගැන කොයි තරම් වද උනාද කියලා දැන් තමයි තේරෙන්නෙ.

මගේ අතිජාත මිත්‍රයා හෙවත් මගේ මස්සිනා වෙච්ච

ගිවන්තව තවත් සමීප කරගන්න පුළුවන්නම් ඒකත් කොයි තරම් දෙයක්ද කියලා හිතෙද්දි මං නාලා ඇඳුමක් ඇඳගත්තා. ඇඳුමක් කිව්වට ඒක නිකම්ම නිකම් ඇඳුමක් නෙමෙයි. අපි වැඩට යද්දි චූටි තෑගි දීපු චෙක් ෂර්ට් එකයි ආච්චි දීපු සල්ලි වලින් මහපු කලිසමයි.

මට මේ තරම් දවස් ඒක අඳින්න හිත දුන්නෙ නැත්තෙ සමහරවිට මේ විශේෂ දවස උදාවෙනකල් වෙන්න ඇති.

'' කොහෙ යන්නද දැස් මේ වෙලාවෙ...? ''

මගේ කාමරේට එබුන අම්මා ඇහුවෙ පුදුමෙන් වගේ. පුදුම වෙන්නෙ නැතුව තියෙයියැ ඉතිං... මෙච්චර දවස් වැඩටත් නොගිහින් ගෙදර හිටපු එකා එකපාරටම හැන්දෑවෙ නාලා හොඳ ඇඳුමක් ඇඳ ගනිද්දි.

'' මං අම්මට ලේලි කෙනෙක් අරන් එන්න යන්නෙ... ''

'' අනේ යන්න ළමයො විහිළු නොකර... ''

ඕකනෙ ඉතිං බැරි. අම්මට ඇත්ත කියලා ගෙදරින් පිටවෙන්න හැදුවත් එයාට මාව විශ්වාස නැනෙ.

'' විහිළුවක් නෙමෙයි අම්මා... මේක ඇත්තක්...''

'' අක්කත් කසාද බඳින එක ගැන කියද්දි හැමදාම ලිස්සලා යනවනෙ පුතා. එයාට තව අවුරුදු දෙක තුනකටවත් මගුල් කතා කරන්න එපාලු. මං කැමතියි අඩු ගානෙ ඔයාවත් පිළිවෙළක් වෙනවානං. ඒත් ඉතිං ගේනවනං අර අපේ චූටි දූව වගේ හොඳ හැදිච්ච කෙල්ලෙක්ව අරන් එන්න. ''

අම්මා ඒක කිව්වෙ ඇත්තටමද කියලා මට හිතාගන්න බැරි උනා. හැබැයි ඒ මූණෙ විහිළුවක සේයාවක්වත් නෑ.

'' චූටි වගේ කෙනෙක් මොකටද...? අම්මා කියනවානං



මං චූටිවම අරන් එන්නම්කො... ''

සෙන්ට් එක ඇගේ හලාගෙන අම්මගෙ මූණට කිස් එකකුත් දීලා මං දඩු මොණරෙට නැග්ගා.

'' ඔයා ඔය තරම් ලස්සනට ඇඳගෙන යන්නෙ අයියලගෙ දිහාද කියන එකනං මට සැකයි දැස්... ''

අම්මා ඒක කිව්වෙ මං බයික් එක පාරට ගන්න හදද්දි. ඔව් ඉතිං යන්නෙ මාමලගෙ දිහාටනං නෙමෙයි. මේ වෙලාවෙ චූටි ඉන්නෙ විනෝද්ලගෙ ගෙදරනෙ.

'' ගිහින් එන්නම් අම්මා... බුදු සරණයි... ''

'' බුදු සරණයි පුතා... පරිස්සමින්... ''

ඒ විදියට අම්මගෙ ආශිර්වාදෙත් අරගෙන ගෙදරින් එන්න ලැබුණ එක ගැන මගේ හිතේ තිබුණෙ කියාගන්න බැරි සතුටක්. ඒ සතුට හිතේ තුරුළු කරගෙනම මං විනෝද්ගෙන් අහගත්තු විදියට පන්සල පාරෙ තිබුණු එයාලගෙ ගෙදරට ගියා.

ඇත්තටම අංජු කිව්වා වගේ විනෝද්ලා හොඳ සල්ලිකාරයො කියලා ඒ ගේ දැක්කම කියන්න පුළුවන්. ඒක තරමක් ලොකු ඉඩමක හදපු තට්ටු තුනේ ලස්සන ගෙයක්.

පාර අයිනෙ බයික් එක නතර කරලා බෙල් එක ගහන්න හදද්දිම ගේට්ටුව ඇරුණා. ඇරුණා කිව්වට ඒක ඇරියෙ විනෝද්ම තමයි.

'' අයියා අදම මෙහෙ එයි කියලා මගේ හිත කිව්වා. ඒකයි මං මිදුලට වෙලා බලාගෙන හිටියෙ. එන්න ඇතුළට... ''

විනෝද් ගේට්ටු පළුවක් ඇරලා දුන්නම මං බයික් එක වත්ත ඇතුළට දාලා හෙල්මට් ජැකට් එහෙමත් ගලවලා දැම්මා.

'' මේවා දාගෙන අයියා මාවත් ෆලෝ කළා නේද...? ''

මගේ ෆුල් ෆේස් හෙල්මට් එක දැකලා විනෝද් කිව්වෙ හිනාවෙන ගමන්.

'' අයියා වගේ රශ්මිව පරිස්සම් කරන කෙනෙක් රශ්මිට ලැබෙන්න යන්නෙ එයාගෙ වාසනාවකට වෙන්න ඇති. ''

කොල්ලා එක එක දේවල් කියෙව්වට මගේනං හිත තිබුණෙ ගල් වෙලා වගේ.

'' දැන් කෝ රශ්මි...? ''

'' අපේ නංගි එක්ක ඇතුළෙ ඉන්නවා. එන්න යමු... ''

විනෝද් අර සාගරයක් වගේ තිබුණු ගේ ඇතුළට මාව එක්කගෙන ගියා.

චූටි හිටියෙ ඒකෙ පහළම තට්ටුවෙ කාමරේක. කාමරේ කර්ටන් එක අයින් කළාම මං දැක්කෙ ඇඳේ මුනින් තලා වෙලා ඉන්න චූටිවයි... ඒ ඇඳේම කොණක වාඩිවෙලා හිටපු අවුරුදු දාහතරක පහළොවක විතර ගෑණු ළමයෙක්වයි. මාව දැක්කා විතරයි ඒ ගෑණු ළමයා එතනින් නැගිටලා යන්න ගියා. එයාගෙ පස්සෙන්ම විනෝද් යන්න ගියේ කාමරේ දොරත් තරමක් අඩවල් කරගෙන.

ඩෙනිම් ත්‍රී ක්වාටර් එකකුයි ලා කොළ පාට ටී ෂර්ට් එකකුයි ඇඳලා බිත්තිය පැත්ත ඇරිගෙන හිටපු කෙල්ල ඇහැරලාද නිදිද කියලා මට හිතාගන්න බැරි උනා.

'' චූටි... ''

මං කතා කළේ ඇඳේ ඉඳගන්න ගමන්මයි. ඒ හඬ ඇහුණා විතරයි චූටි හැරිලා බැලුවෙ අදහාගන්න බැරි දෙයක් ඇස් ඉස්සරහා කඩන් පාත් උනා වගේ.



'' දැස් අයියා... ඔයා... ''

මාව දැකලා චූටි ඇඳෙන් තරමක් කෙලින් වෙද්දිත් ඒ ඇස් වලින් අලුතෙන් ගලාගෙන ගිය කඳුළු පාරවල් හත අටක් මං දැක්කා.

'' ඇයි අඬන්නෙ...? ''

ඒකට උත්තර දෙනවා වෙනුවට කෙල්ල කළේ තවත් හයියෙන් අඬන්න ගත්තු එක.

'' මේ ලස්සන ඇස් රතු වෙනකල් අඬන්න තරම් ඔයාට තියෙන ප්‍රශ්නෙ මොකක්ද බබා...? අනික මේ විභාගෙ අතළඟ තියාගෙන ඇයි ඔයා මේ විදියට හැසිරෙන්නෙ...? ''

'' මං හරි පව්කාරියෙක් අයියා... ''

එදා වගේම අදත් චූටි කිව්වෙ එකම දේ. එයා එහෙම කිව්වට චූටි කියන්නෙ කොයි තරම් පින් දහම් කරන කෙනෙක්ද කියලා අපි හැමෝම දන්නවනෙ.

'' ඔයා පව් කරලා නෑ බබා. දැන් ඔය කඳුළු පිහිදගන්න. මට ඔයාට කියන්න දෙයක් තියෙනවා... ''

මං එහෙම කියලා සාක්කුවෙ තිබුණු ලේන්සුව අරගෙන චූටිගෙ ඇස් දෙක පිහිදලා ඒ මූණ මගේ දිහාට හරවගත්තා.

'' ඔයාට තියෙන ප්‍රශ්නෙ මොකක්ද කියන්න මට... ''

'' මට විභාගෙ ලියන්න බෑ අයියා... ''

කෙල්ල කිව්වෙ මූණත් බෙරි කරගෙන.

'' ඒ ඇයි...? ''

'' මට මගේ ආදරේ නැති උනා... ''

'' ඇයි ඔයා එහෙම හිතන්නෙ...? අනික ඔයා කොහොමද දන්නෙ ඔයාට ඔයාගෙ ආදරේ නැති උනා කියලා...? ''

කෙල්ල කතා කරන්නෙ අංජු ගැන ඔළුවෙ තියාගෙන කියලා මට අමුතුවෙන් කියලා දෙන්න ඕන උනේ නෑ.

'' එයා... එයා වෙන කෙනෙකුට ළං වෙලා... ''

'' කවුද කිව්වෙ...? ''

'' එයාමයි කිව්වෙ. අනික මේ හැමදේම උනේ මගේ වරදින් අයියෙ... ඇත්ත එළි කරන්න තියෙන බය නිසා මං විනෝද් මගේ බෝයි ෆ්‍රෙන්ඩ් විදියට හැමෝටම හිතාගන්න ඉඩ ඇරියා. ඒකෙන් මට වැරදුනා. ''

'' ඔයා ගොඩක් දේවල් හිතේ තද කරන් තනියම දුක් විඳිනවනෙ බබා. ''

මං චූටිගෙ ඇස් දිහා කෙලින් බලාගෙන එහෙම කිව්වා විතරයි ඒ බැල්ම දරාගන්න බෑ වගේ කෙල්ල එකපාරටම මට තුරුල් උනා.

'' මං... මං එයාට ගොඩක් ආදරෙයි අයියෙ... එයා වෙන කෙනෙකුට අයිති වෙනවා මට බලන් ඉන්න බෑ... ''

එයා ඒ නොකියා කිව්වෙ මං ඔයාට ගොඩක් ආදරෙයි අයියෙ කියන එක තමයි. ඇත්තටම ඒ වෙලාවෙ මට චූටි ගැන දැනුණෙ කියාගන්න බැරි දුකක්. පව්... කෙල්ල මට මේ තරම් ආදරේ කරනවා කියලා මං දැනගෙන හිටියෙ නෑ.

'' ඔයාගෙ ආදරේ කවදාවත් වෙන කෙනෙකුට අයිති වෙන්නෙ නෑ බබා. මේ සුවහස් අයියා ආදරේ අංජුට නෙමෙයි දැහැමිට...''





'' අයියා... ඔයා... ඔයා මොනවද මේ කියන්නෙ...? ''

මෙච්චර වෙලා මගේ පපුවට හේත්තු කරගෙන හිටපු මූණ මගේ පැත්තට හරවලා චූටි බැලුවෙ අමුතුම බැල්මකින්. ඒකෙ දුක, පුදුමය, ආදරේ... මේ හැමදේම අඩුවක් නැතුව ගැබ් වෙලා තිබුණා.

'' ඇයි චූටි මේ තරම් ලොකු ආදරයක් හිතේ හංගගෙන දුක් වින්දෙ...? මේ අයියා ඔයාව ප්‍රතික්ෂේප කරයි කියලා හිතුවද...?''

'' අනේ අයියා... ඔයා කොහොමද මේ දේවල් දැනගත්තෙ...? කවුද ඔයාට මේවා කිව්වෙ...? අංජුද... එහෙමත් නැත්තං විනෝද්ද...? ''

'' මට කවුරුවත් කිව්වෙ නෑ. අංජු මාව ප්‍රතික්ෂේප කරද්දි ඔයා මට දවසින් දවස ළං වෙද්දි මං ඒක තේරුම් ගත්තා. ''

මං එහෙම කිව්වෙ විනෝද් ගැන චූටිගෙ හිතේ තරහක් ඇති කරවන්න ඕනෙ නැති නිසා.

'' ඒත් මං මෝඩයා වගේ ඔයාට අංජුව ළං කළානෙ...''

'' ඔව්... ඒකනං ඇත්තටම මෝඩ වැඩක් තමයි. අංජු හොඳ නිසා හොඳයි. වෙන කෙල්ලෙක්ට එහෙම මාව අහු උනානං ඔයාට මේ විදියට මාව ලැබෙන්නෙ නෑ... ''

ඒ චූටි නහය මිරිකන ගමන් මං කිව්වෙ ගොඩක් ආදරෙන්.

'' එහෙම උනානං මං ජීවත් වෙන්නෙ නෑ. ''

'' ඔය ඇත්තමද...? ''

'' මේ පපුව ඇතුළෙ එදත් අදත් හෙටත් ඉඩක් තියෙන්නෙ ඔයාට විතරයි අයියෙ. ඔයා හිතුවා වගේ විනෝද්වත් වෙන කෙනෙක්වත් මේක ඇතුළෙ නෑ... ''

කෙල්ල පපුවට අත තියලා තද කරන ගමන්ම ආපහු මගේ ඇඟට බරඋනා. ඒ පාරනං මං එයාව තුරුල් කරගත්තෙ හුස්ම ගන්නවත් බැරි තරම් තදේට.

'' අනේ මේක හීනයක් නෙමෙයි නේද අයියෙ...? ''

මට ඒ හඬ ඇහුණෙ එහා ලෝකෙන් වගේ.

'' නෑ... මේක ඇත්තක්. මේ බලන්න දැනෙනවද කියලා...''

චූටිව අත් දෙකෙන්ම උස්සලා මගේ ඔඩොක්කුවට ගන්න ගමන් මං ඒ නළලට කිස් එකක් දුන්නා.

'' මචා...ං... මට මේක ඇතුළට එන්න අවසරද...? ''

දෙයියනේ... මේ අපේ ගිවන්තයගෙ කටහඬනෙ. ඌ කොහොමද මේ වෙලාවෙ මෙතනට ආවෙ. එහෙම හිතද්දිම අවසර ඉල්ලපු මිනිහා කිසිම අවසරයකින් තොරව කාමරේට ඇතුල් උනා.

'' මේ කතන්දරේ කවදා හරි දවසක මේ විදියට අවසන් වෙයි කියලා මං දැනන් හිටියා මචං... ''

ගිවා කිව්වෙ මාවයි චූටිවයි දෙන්නවම තුරල් කරගන්න ගමන්. ඒත් ඌ කොහොමද එහෙම හිතන්නෙ... ඌ මුල ඉඳලම අංජුගෙ කතන්දරෙත් දැනගෙන හිටියනෙ.

'' උඹ මොන අංජනෙක් ගැන විස්තර හෙව්වත් ඊට වඩා අවධානෙ යොමු කළේ අපේ මේ මැට්ටිට... මේකිත් බොරුවට විනෝද්ට කෝල් කර කර අපිව රැවැට්ටුවට හිත තිබුණෙ උඹේ ළඟ. ඉතිං මේක මේ විදියට අවසන් නොවුණානං තමයි මං පුදුම වෙන්නෙ...''

'' ඒත් උඹ චූටි ආදරේ කරන්නෙ කාටද කියලා දැනන් හිටියෙ නෑනෙ ගිවා...''





'' ඔව්... ඒත් මං ඒක ගෙස් කළා. මට වැඩේ කන්ෆර්ම් උනේ පෙරෙයිදා... ''

'' ඒ කිව්වෙ...? ''

මං ගිවන්ත එක්ක කතා කරද්දි චූටි එයාගෙ අයියට මූණ දෙන්න ලැජ්ජාවෙන් වගේ තව තවත් එයාගෙ මූණ මගේ උරහිසේ හංගගත්තා.

'' මෙයා කාමරෙන් එළියට එන්නෙ නැතුව පැය ගණන් ඉන්නවා දැකලා මං අර එදා දුන්නා වගේ පොඩි සර්ච් එකක් දුන්නා. ඒ කිව්වෙ මෙයා බාත්රූම් එකට යනකල් ඉඳලා මෙයාගෙ කාමරේ පොඩි සෝදිසි මෙහෙයුමක් දැම්මා. එතකොට තමයි මට අර නිසදැස් ටික හම්බ උනේ... ''

'' අර නිසදැස් කිව්වෙ...? ''

'' අර උඹ දැහැමි එව්වයි කියලා මට පෙන්නපු නිසදැස්. අන්න ඒවා. මෙයා ඒ වගේ නිසදැස් තොගයක් ලියලා හාෆ් ෂීට් පැක් එකක් ඉවර වෙන්නම. ඒ හැම එකක් යටින්ම දැහැමි කියලත් ලියලා තිබුණා. ඒ අත් අකුරු මෙයාගෙ කියලා දන්න නිසා දැහැමි කියන්නෙ කවුද කියලා මං හිතා ගත්තා. ''

'' ඔයා හරි නරකයි අයියා... ''

චූටි ඒක කිව්වෙ යාන්තමට ඇස් උස්සලා බලලා.

'' එතකොට තමුසෙ මෙච්චර දවස් අපිව ගොනාට අන්දපු එක හොඳයි. මේං මේ පින්තූරෙ අහුඋනේ නැත්තං මං තාමත් ඒ ගොනාම තමයි... ''

ගිවන්ත සාක්කුවෙ තිබිලා අතට ගත්තු ෆොටෝ එක මං උදුරගත්තෙ ගත්තෙ කිසි දෙයක් තේරුම් ගන්න බැරුව. කිරි අප්පට බල්ලො පැනපි කිව්වලු. මේ මගේම ෆොටෝ එකක්නෙ. මේක

කෙල්ල පපුවට අත තියලා තද කරන ගමන්ම ආපහු මගේ ඇඟට බරඋනා. ඒ පාරනං මං එයාව තුරුල් කරගත්තෙ හුස්ම ගන්නවත් බැරි තරම් තදේට.

'' අනේ මේක හීනයක් නෙමෙයි නේද අයියෙ...? ''

මට ඒ හඬ ඇහුණෙ එහා ලෝකෙන් වගේ.

'' නෑ... මේක ඇත්තක්. මේ බලන්න දැනෙනවද කියලා...''

චූටිව අත් දෙකෙන්ම උස්සලා මගේ ඔඩොක්කුවට ගන්න ගමන් මං ඒ නළලට කිස් එකක් දුන්නා.

'' මචා...ං... මට මේක ඇතුළට එන්න අවසරද...? ''

දෙයියනේ... මේ අපේ ගිවන්තයගෙ කටහඬනෙ. ඌ කොහොමද මේ වෙලාවෙ මෙතනට ආවෙ. එහෙම හිතද්දිම අවසර ඉල්ලපු මිනිහා කිසිම අවසරයකින් තොරව කාමරේට ඇතුල් උනා.

'' මේ කතන්දරේ කවදා හරි දවසක මේ විදියට අවසන් වෙයි කියලා මං දැනන් හිටියා මචං... ''

ගිවා කිව්වෙ මාවයි චූටිවයි දෙන්නවම තුරල් කරගන්න ගමන්. ඒත් ඌ කොහොමද එහෙම හිතන්නෙ... ඌ මුල ඉඳලම අංජුගෙ කතන්දරෙත් දැනගෙන හිටියනෙ.

'' උඹ මොන අංජනෙක් ගැන විස්තර හෙව්වත් ඊට වඩා අවධානෙ යොමු කළේ අපේ මේ මැට්ටිට... මේකිත් බොරුවට විනෝද්ට කෝල් කර කර අපිව රැවැට්ටුවට හිත තිබුණෙ උඹේ ළඟ. ඉතිං මේක මේ විදියට අවසන් නොවුණානං තමයි මං පුදුම වෙන්නෙ...''

'' ඒත් උඹ චූටි ආදරේ කරන්නෙ කාටද කියලා දැනන් හිටියෙ නැනෙ ගිවා...''





'' ඔව්... ඒත් මං ඒක ගෙස් කළා. මට වැඩේ කන්ෆර්ම් උනේ පෙරෙයිදා... ''

'' ඒ කිව්වෙ...? ''

මං ගිවන්ත එක්ක කතා කරද්දි චූටි එයාගෙ අයියට මූණ දෙන්න ලැජ්ජාවෙන් වගේ තව තවත් එයාගෙ මූණ මගේ උරහිසේ හංගගත්තා.

'' මෙයා කාමරෙන් එළියට එන්නෙ නැතුව පැය ගණන් ඉන්නවා දැකලා මං අර එදා දුන්නා වගේ පොඩි සර්ච් එකක් දුන්නා. ඒ කිව්වෙ මෙයා බාත්රූම් එකට යනකල් ඉඳලා මෙයාගෙ කාමරේ පොඩි සෝදිසි මෙහෙයුමක් දැම්මා. එතකොට තමයි මට අර නිසදැස් ටික හම්බ උනේ... ''

'' අර නිසදැස් කිව්වෙ...? ''

'' අර උඹ දැහැමි එව්වයි කියලා මට පෙන්නපු නිසදැස්. අන්න ඒවා. මෙයා ඒ වගේ නිසදැස් තොගයක් ලියලා හාෆ් ෂීට් පැක් එකක් ඉවර වෙන්නම. ඒ හැම එකක් යටින්ම දැහැමි කියලත් ලියලා තිබුණා. ඒ අත් අකුරු මෙයාගෙ කියලා දන්න නිසා දැහැමි කියන්නෙ කවුද කියලා මං හිතා ගත්තා. ''

'' ඔයා හරි නරකයි අයියා... ''

චූටි ඒක කිව්වෙ යාන්තමට ඇස් උස්සලා බලලා.

'' එතකොට තමුසෙ මෙච්චර දවස් අපිව ගොනාට අන්දපු එක හොඳයි. මේං මේ පින්තූරෙ අහුඋනේ නැත්තං මං තාමත් ඒ ගොනාම තමයි... ''

ගිවන්ත සාක්කුවෙ තිබිලා අතට ගත්තු ෆොටෝ එක මං උදුරගත්තෙ ගත්තෙ කිසි දෙයක් තේරුම් ගන්න බැරුව. කිරි අප්පට බල්ලො පැනපි කිව්වලු. මේ මගේම ෆොටෝ එකක්නෙ. මේක

aralivihara@gmail.com

කොහොමද ගිවන්ත ළඟට ගියේ...

'' මං මේක හොයාගත්තෙ මෙයාගෙ රිවිෂන් පොතක් ඇතුළෙ තිබිලා. ''

'' ඔයානං අයියෙ හරි නරකයි... ''

මෙච්චර වෙලා පූස් පැටියෙක් වගේ මගේ අස්සට වෙලා හැංගිලා හිටපු කෙල්ල ඒ ෆොටෝ එක උදුරගන්න අත දික් කළා විතරයි කෙල්ලට කලින් ගිවා ඉස්සර උනා.

'' දැන් ඉතිං උඹට ෆොටෝ ඕනෙ නැනෙ නංගියෙ. මේකව අපේ ගෙදර නවත්ත ගනින්... ''

'' ඒ කියන්නෙ උඹ මේ සම්බන්ධෙට විරුද්ධ නෑ කියන එකද...? ''

මං ඇහුවෙ මගේ අභිජාත මිත්‍රයගෙ කරට අත දාගන්න ගමන්.

'' මොනවා අහනවද මචෝ... මේ ගැන මං තරම් සතුටු වෙන කිසිම කෙනෙක් නැතුව ඇති... කොහොමටත් මගේ යාළුවයි, මගේ සහෝදරයයි, මගේ මස්සිනයි හැමදේම උඹ තමයි... ''

අපි දෙන්නගෙ අත් වලින් අල්ලලා නැගිට්ටවලා ගිවා කාමරෙන් එළියට ගියා. ඒත් චූටි මට යන්නෙ දුන්නෙ නැතුව මගේ මූණට එබුනෙ මොකක්දෝ මන්දා රහසක් කියන්න.

'' ඔය ඇඳුම අදම අඳින්න තියාගත්තෙ ඇයි... අයියෙ? ''

'' ඔයාට ගොඩක් ආදරේ නිසා... ''

මං එහෙම කිව්වා විතරයි චූටි ඇස් පුංචි කරලා හරිම ආදරේ හිතෙන විදියට හිනා උනා.

The End

* * * * * * *

Chamodi Madhuprabha

# දෑස්

Deas

Gayana s. Lakmali

ගයනා එස්. ලක්මාලි

අප්පට සිරි... නයෙක්...
නිකම් නයෙක් නෙමෙයි දාර සයිස් බඩුවක්.
"අර තානායම් වත්තේ ඉඳලා හාට් ඇටැක් එකකින් නැති උනේ.
ඒ මහත්තයා එංගලන්තෙ ඉඳලා එද්දි ගෙනාවයි කියන නයා තමයි මූ.."
ඔන්න සහන් තවත් කෙබරයක් අතෑරියා.
එංගලන්තෙ ඉඳලා එහෙම හිතුමතේට නයි ගේන්න පුළුවන්යෑ.
මොකෝ නයින්ට පාස්පෝට් හදලා ගේන්නද...?
එකපාරටම නයා ආච්චිට පෙනේ දික් කළා. හූහ්...
ඒ පෙනේ පීරිසියක් විතර ලොකුයි. ඒකෙ තිබුණෙ තඩි සයිස් 'ප'
යන්නක්. එතකොටම සහන් ආඩම්බර ලීලාවෙන් මගේ දිහා බැලුවා.
"මූ කොහොමද පිටරට නයෙක් වෙන්නෙ...
ඔය අගේට 'ප' යන්න තියෙන්නෙ ඔළුවෙ..."
ඔන්න ඒ පාර අපේ ගෙදර උදවියගෙ
ඇස් හෙමීට මගේ දිහාට හැරුණා.
"නයින්ට 'ප' යන්න තියෙනවා තේන්නං.."
සහන් කිව්වෙ ඇස් දෙක නළලෙ
තියාගෙන.
'ප' යන්න තියෙන්නෙ ලංකාවෙ
නයින්ටනෙ. එංගලන්තෙ
නයින්ට තියෙන්න ඕනෙ '**P**' අකුර
මං ඇහැකුත් වහලා එහෙම කියද්දි
අපේ කට්ටියගෙ මූණු හිනාවෙන්
පිරිලා ගියා. කොටින්ම සහන්ගෙ
යාළුවො දෙන්නටත් හිනා.
"උඹේ කටේ සූකිරි කැටයක්
දාන්න වටිනවා චූටි පුතේ...
මාත් මේ කැරකි කැරකි
බැලුවෙ මූගෙ ඇඟේ
කොයි හරියෙද ඉංගිරිසි
අකුරක් තියෙන්නෙ
කියලා...."
අපේ ආච්චිත් ලොඹු කට
නටව නටව කියද්දි
සහන්ගෙ මූණ නිකං
ඇද ගහපු කොණ්ඩ
කැවුමක් වගේ උනා...



මිල-400/=

DEAS
G033
9789550929092
SADEEPA BOOKSHOP
Rs. 400.00
0616

ISBN -978-955-0929-09-2

ප්‍ර කා ශ න ය
ගයා
ක්‍රියේෂන්ස්
GAYAA CREATIONS

ගයනා එස්. ලක්මාලි
නො, 891/F ගැමුණු මාවත,
හෙයියන්තුඩුව.

Cover design by: AYOMALEE LOKUARACHCHIGA